# දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන්නේ කෙසේද? . . . . . 3

කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා . . . . . . . 4

හැඳින්වීම . . . . . . . . . 5

පාඨමාලාවේ අරමුණු . . . . . . . . 7

1. දෙවියන්වහන්සේගේ කටහඬ දැනගැනීම . . . . 8

2. මනුෂ්‍යයෙකු කරයි නම්...ඔහු දැනගනු ඇත. . . . . . 18

3. දෙවියන්වහන්සේගේ කැමැත්ත . . . . . . . 30

4. වැරදි දිශාවට යොමු වීම . . . . . . . 41

5. දේව කැමැත්තෙහි රටාවන් . . . . . . . 50

6. දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හට කතාකරන ක්‍රමය . . . 66

7. පඳුර තවම දැවේ . . . . . . . . 79

8. සැක සහිත ක්‍රියාවන් . . . . . . . . 91

9. තීරණ ගැනීම පිළිබඳ බයිබලීය ආකෘතිය . . . . 101

10. උත්සාහකර අසාර්ථකවීද? . . . . . . . 107

11. දෙවියන්වහන්සේගේ කැමැත්ත හා දුක්විඳීම . . . . 115

12. එළිදරව්වීමේ අදියර හයක් . . . . . . . 133

ස්වයං පරීක්ෂණය . . . . . . . . 139

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජිවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**මොඩියුලය : නියෝජනය කිරීම.**

**පාඩමාලාව : දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම.**

# හැඳින්වීම

“මා උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද?”

මෙම ප්‍රශ්නය ඇදහිලිවන්තයෝ බොහොම දෙනෙකු නිරන්තරව අසන එක් පොදු ප්‍රශ්නයකි . එසේම කිතුනු නායකයෝ වෙත පැමිණෙන ජනතාව තිරණ ගැනීම සදහා ඔවුන්ගෙන් මඟපෙන්වීමක් අපේක්ෂාකරමින් නිරතුරුවම නඟන ප්‍රශ්නයකි.

එදිනෙදා ජිවිතයෙහි සිදුවීම් වලදී ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත ඉටුකරනවාද නැද්ද කියා තිරණය වන තෝරාගැනීම් සිදු කරති. දිනපතාම නිවැරදි තිරණ ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ හඬ ඇසිමත්, එතුමාගේ කැමැත්ත තේරුම්ගැනීමත් අත්‍යවශ්‍ය වේ. එය වැදගත් වනුයේ සෑම කුඩා තිරණයක් පවා මුළු ජිවිත කාලය උදෙසාම දේව කැමැත්ත සොයා ගැනීමට බලපෑමක් ඇති කරන බැවිනි.

දේව කැමැත්ත හා සම්බන්ධව මිනිසා තෝරාගැනීම් කළයුතුවේ. දෙවියන්වහන්සේ ආදම් සහ ඒව ඒදන් උයනෙහි තැබූ කල මෙම සැලසුම පිහිටුවන ලදී (උප්පත්ති 1-3). ආදම් සහ ඒව උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත වූයේ සතුන් නම් කොට, උයන බලාගෙන, එකිනෙකා සමග මිත්‍රත්වයක් ඇති කරගන ,පොළොව ජනාවාස කිරීම සඳහා බෝවී වැඩිවීමය. වැදගත්ම කාර්යය වූයේ ඔවුන් දෙවියන්වහන්සේ හා සමඟ ඉතා සමීප සහභාගිකමක් දැරීම වේ. එසේම දේව කැමැත්ත <u>නොවන</u> දෙය කුමක් දැයි ආදම් සහ ඒවට අනතුරු ඇඟවීමක් ලබා දෙන ලදී. ඔව්හු යහපත සහ නපුර දැනගැනීමේ ගසින් කෑම තහනම් කොට තිබුණි.

ආදම් සහ ඒවගේ කතන්දරය ඇතුළුව මුළු බයිබලයම පුද්ගලයින් සහ ජාතින් දේව කැමැත්ත හා සම්බන්ධව ගනු ලැබූ තිරණවල ඉතිහාසයයයි. මෙම ගැහැණු පිරිමි දෙපාර්ශවයම ලත් ජයග්‍රහණ මෙන්ම පරාජය ඇසුරින් ඔබට බොහෝ දේ උගත හැකිය.

බයිබලයෙහි ඇතුළත් එක් උද්යෝගජනක එළිදරව්වක් නම් සෑම මනුෂ්‍යයෙකු උදෙසාම මෙම ජිවිත කාලය වෙනුවෙන්ද සදාකාලය වෙනුවෙන්ද දෙවියන්වහන්සේ සතුව නියත වූ සැලසුමක් පවතින බවය. එබැවින් එම සැලසුම සම්පූර්ණ වශයෙන් ඉටු කිරීම සඳහා ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමට පැමිණිය යුතුය. උන්වහන්සේ පෙර කාලයේ කතාබස් කර ඇති අන්දමත් වර්තමානයෙහි කතා කරන අන්දමත් කුමනාකාරදැයි ඉගෙන ගත යුතු වේ.

මෙම පාඩමාලාව දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතාකරන ක්‍රමය ඔබට පැහැදිලි කර දෙන අතරම ඔබට දේව කැමැත්ත සොයා ගත හැකි ක්‍රමය පැහැදිලි කර දෙනු ඇත. දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමටත් එතුමාගේ කැමැත්ත තිරණය කිරීමටත් උපදෙස් සපයා දෙනු ඇත. දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි රටාවත් එතුමාගේ කැමැත්ත හෙළිදරව් කර දෙන ආකාරයත් ශුද්ධ ලියවිලි නිදසුන් ඇසුරින් සාකච්ඡා කරනු ඇත.

තිරණ ගැනීම සඳහා ශුද්ධ ලියවිල්ලට අනුකූලවූ ආකෘතියක් පැහැදිලි කර දෙනු ඇත. වැරදි තිරණ අභිබවා ජයගැනීමට උපකාර වන්නාවූ උපදෙස් සපයා ඇත. ඔබට දේව කැමැත්ත අතපසු වී තිබේ නම් කළ යුතු කුමක්ද යන්නත් ප්‍රශ්න සහිත හුරු පුරුදු සමග ක්‍රියාකළ යුතු අන්දම ගැනත් උපදෙස් සැපයේ. මෙහිදී දෙවියන්වහන්සේගේ සැලැස්මක් එළිදරව් වන්නාවූ පියවර හයක් හඳුනාගනු ලැබේ.

භාවස්ටයිම් ජත්‍යාන්තර ආයතනය සකසා ඇත්තේ තමා ජීවත්වන ලෝකය වෙතට යේසුස්වහන්සේගේ ශුභාරංචිය රැගෙන යාමට උන්වහන්සේ උගන්වා ඇති කාරණා ඇසුරින් කාන්තා හා පුරුෂයන් යන දෙපක්ෂයටම සන්නද්ධ කිරීම සඳහාය.

උන්වහන්සේ හෙළිදරව් කර දුන්නාවූ එක් ශ්‍රේෂ්ඨ සත්‍යයක් නම් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කථා කරන බවය.

> **මම යහපත් බැටළු එඬේරාය: පියාණන්වහන්සේ මා අඳුනන්නාක්මෙන්ද, මා පියාණන්වහන්සේ අඳුනන්නාක්මෙන්ද, මම මාගේ බැටළුවන් අඳුනමි. තවද මේ ගාලට අයිති නොවූ වෙනත් බැටළුවෝ මට ඇත්තාහ. ඔවුන්ද මා විසින් ගෙනෙන්ට ඕනෑය, ඔව්හු මාගේ හඬ අසන්නෝය: එසේ එක රැළක්ද එක එඬේරෙක්ද වන්නාහ. මාගේ බැටළුවෝ මාගේ හඬ අසති, මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ එති. (යොහාන් 10:14,16,27)**

දෙවියන්වහන්සේට මනුෂ්‍ය සංහතිය සමඟ සමීප සම්බන්ධතාවයක් පැවැත්වීම සඳහා සැලසුමක් තිබේ. මනුෂ්‍යයාව දෙවියන්වහන්සේ දන්නා අතර මනුෂ්‍යයා හට දෙවියන්වහන්සේව දැනගත හැකිය.

ඔබට දෙවියන්වහන්සේගේ හඬ දැන ගත හැකිය !

# පාඨමාලාවෙහි අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කළ පසු ඔබ හට කළහැකි වන කාරණා නම් :

- දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම හා එතුමාගේ කැමැත්ත තීරණය කිරීම අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කිරීමට.
- දේව කැමැත්ත දැනගැනීමෙහි වැදගත්කම සාකච්ජා කිරීමට.
- දෙවියන්වහන්සේ ස්වකීය කැමැත්ත හෙළිදරව් කරදෙන ක්‍රමය පැහැදිලි කිරීමට.
- දේව වචනයෙහි එළිදරව් කර දී ඇති පරිදි දෙවියන්වහන්සේගේ කැමැත්ත අවබෝධ කරගැනීමට.
- ශුද්ධ ලියවිල්ලෙහි නියත ලෙසම කරුණු පහදා දී නොමැති කාරණා සම්බන්ධව දේව කැමැත්ත තීරණය කිරීමට.
- තීරණ ගැනීම සඳහා ශුද්ධලියවිලි ක්‍රමය භාවිතා කිරීම.
- වැරදි තීරණ නිවැරදි කිරීමට.
- එළිදරව්වෙහි පියවර හය පැහැදිලි කරදීම.
- දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම සඳහා බයිබලීය උපදෙස් අන් අය සමග බෙදාගැනීමට.

## පෞද්ගලික අරමුණු

මෙම පාඨමාලාව දේව කැමැත්ත හා දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම සම්බන්ධ පාඩමක් බැවින් මේ සඳහා ඔබගේ පෞද්ගලික අරමුණක්ද තබාගන්නා මෙන් යෝජනා කරමු. ඔබගේ අරමුණ, විශේෂ කරුණක් උදෙසා දේව කැමැත්ත දැනගැනීම, යම් ගැටළුවක් උදෙසා දෙවියන්වහන්සේගේ පිළිතුරු සොයාගැනීම, ඔබගේ ජීවිතය සහ සේවය උදෙසා දේව කැමැත්ත තීරණය කිරීම යනාදි ලෙස විය හැක. පහතින් සපයා දී ඇති හිස්තැනෙහි ඔබගේ පෞද්ගලික අරමුණු ලියන්න. ඔබ පාඩම ඉගෙන ගන්නා අතර තුර, ලියා ඇති එක් එක් ගැටළුව, ප්‍රශ්නය සඳහා ඔබ ඉගෙන ගත් කාරණා අදාල කරගන්න.

පහත සඳහන් වාක්‍යය සම්පූර්ණ කරන්න.

"මට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට හා දේව කැමැත්ත දැනගැනීමට අවශ්‍ය වනුයේ.....

යන කාරණා උදෙසාය"

# පළමුවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ කටහඬ දැනගැනීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- ශුද්ධ ලියවිල්ල අසුරින් දෙවියන්වහන්සේ ස්ත්‍රී පුරුෂයන්ට කතාකරන බව ඔප්පු කර දීමට.
- දෙවියන්වහන්සේගේ කටහඬ දැනගැනීමත් එතුමාගේ කැමැත්ත තීරණය කිරීමත් අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කිරීමට.
- දෙවියන්වහන්සේගේ "රීමා" වචනයත් "ලෝගෝස්" වචනයත් අතර වෙනස හඳුනාගැනීමට
- "දේව කැමැත්ත" යන්නෙන් අදහස් කරනදේ පැහැදිලි කිරීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

**මාගේ බැටළුවෝ මාගේ හඬ අසති, මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ එති. (යොහන් 10:27)**

## හැඳින්වීම

*"දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම"* නම් මෙම අධ්‍යයනයෙහි මාතෘකාවට බොහෝ කරුණු ඇතුල් වේ.

ඒවානම්:

**පළමුව** : දෙවිකෙනෙක් සිටින බව.

**දෙවනුව** : උන්වහන්සේ මනුෂ්‍යා සමග කතා බහ කරන බව.

**තුන්වෙනුව** : උන්වහන්සේ කතා කරන කළ මිනිසාට එම හඬ හඳුනාගත හැකි බව.

**හතරවනුව** : දෙවියන්වහන්සේට කීමට යමක් ඇති බව .

මෙම එක් එක් ප්‍රකාශනය අපි දැන් සෝදිසිකොට බලමු:

**පළමුව :** මෙම පාඩම් මාලාව පදනම් වී ඇත්තේ දෙවිකෙනෙක් සිටින බවටත් එතුමාගේ ලිඛිත වචනය වූ බයිබලය තුළින් එතුමා මනුෂ්‍යයාට හෙළිදරව් වන සත්‍යය මතය.

**දෙවනුව :** බයිබලය යනු දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හා සමඟ පැවති අදහස් හුවමාරුවෙහි ආනුභාවය ලත් ලිඛිත දේව වචනයෙහි වාර්තාවයි. එහි දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට හා ජාතීන්ට කතාකළ ආකාරයත් මනුෂ්‍යයන් මෙන්ම ජාතීන් එතුමාගේ හඬට ප්‍රතිචාර දැක්වූ ආකාරයත් විස්තර සහිතව සඳහන් කරයි. බයිබලය බොහෝ අවස්ථාවලදී මනුෂ්‍යයන්ට කතා

කළ අවස්ථා පෙන්නුම් කිරීමට "ස්වාමීන්වහන්සේ මෙසේ කී සේක..." යන යෙදුම භාවිතා කරයි. මෙමගින් තහවුරුවන්නේ දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් සමඟ කතාබස් කරන බවය.

උදාහරණයක් ලෙසට ගණන් කථාව 22 වන පර්ච්ඡේදයෙහි සඳහන් බාලම්ගේ කතාව කියවන්න. දෙවියන්වහන්සේ බාලම්ට කථා කළ නමුත් ඔහු ඇහුම්කන්දීම ප්‍රතික්ෂේප කළේය. දෙවියන්වහන්සේ හට බාලාම්ට කතාකිරීමට කොපමණ අවශ්‍ය වීද යත් උන්වහන්සේ බූරුවෙක්ව ඒ සඳහා පාවිච්චි කිරීමට කිරණය කළසේක

**නුමුත් ඔහු තමාගේම අපරාධය ගැන තරවටුකරනු ලැබුවේය. ගොළු කොටළුවෙක් මනුෂ්‍ය හඬින් කථාකොට අනාගතවක්තෘගේ උමතුව වැලැක්වූයේය. (2 පේත්‍රුස් 2:16)**

**තුන්වනුව** : ඇදහිලිවතුන් හට දෙවියන්වහන්සේගේ හඬ හඳුනා ගතහැකි බව බයිබලය පැහැදිලිව සඳහන් කරයි. යේසුස්වහන්සේ පැවසුසේක :

**මම යහපත් බැටළු එඬේරාය : පියාණන්වහන්සේ මා අඳුනන්නාක්මෙන්ද මා පියාණන්වහන්සේ අඳුනන්නාක්මෙන්ද මම මාගේ බැටළුවන් අඳුනමි. තවද මේ ගාලට අයිති නොවූ වෙනත් බැටළුවෝ මට ඇත්තාහ. ඔවුන්ද මා විසින් ගෙනෙන්ට ඕනැය. ඔව්හු මාගේ හඬ අසන්නෝය. එසේ එක රැළක්ද එක එඬේරෙක්ද වන්නාහ. මාගේ බැටළුවෝ මාගේ හඬ අසති, මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ එති. (යොහන් 10:14,16,27)**

**හතරවනුව** : මනුෂ්‍යය සංහතිය උදෙසා පැවසීමට කිසියම් වැදගත් කරුණක් දෙවියන්වහන්සේ සතුව පවතී. අප හට අනතුරු හඟවා ඇත්තේ:

**"එබැවින් ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: අද නුඹලා උන්වහන්සේගේ හඬ අසන්නහු නම්, කාන්තාරයේදී පරීක්ෂා කිරීමේ දවසේ උදහස් ඉපදවීමේදී මෙන් නුඹලාගේ සිත් දැඩිකර නොගනිල්ලා. මක්නිසාද, අද නුඹලා උන්වහන්සේගේ හඬ අසන්නහු නම් උදහස් ඉපදවීමේදී මෙන් නුඹලාගේ සිත් දැඩිකර නොගනිල්ලායයි කියා තිබෙන හැටියට"**
**(හෙබ්‍රෙව් 3:7,8,15)**

"කාන්තාරයෙහි පරීක්ෂාකිරීමෙන්" සහ "උදහස් ඉපදවීම" එනම් දෙවියන්වහන්සේව උදහස් කිරීම යන පදවලින් ප්‍රකාශ වනුයේ ඉශ්‍රායෙල් ජාතියෙහි අකීකරුකම වේ.

ඉශ්‍රායෙල් ජාතිය මිසරයෙහි වහල්කමින් මුදාගත් පසුව දෙවියන්වහන්සේ ඔවුනට කතාකළාවූ බොහෝ අවස්ථාවල ඔව්හු නැවත නැවතත් අකීකරු වූහ. ඉශ්‍රායෙල්වරු කළාක් මෙන් අකීකරු නොවන ලෙසත් එතුමා කතා කළවිට එයට ප්‍රතිචාර දක්වන ලෙසත් දෙවියන්වහන්සේ මෙහිදී අපට අවවාද කොට තිබේ.

"අද නුඹලා උන්වහන්සේගේ හඬ අසන්නහු නම්"... යන වාක්‍යාංශයෙන් තහවුරු වන්නේ අතීතයෙහි උන්වහන්සේ මනුෂ්‍යයාට කථා කළ අයුරින්ම අද දිනද (වර්තමානයෙහිද) මනුෂ්‍යයාට කථා කරන බවය. එසේම ඇහුම්කන් දීමට අවවාදයක් නිකුත් කිරීමෙන් පෙන්නුම් වන්නේ එතුමාට පැවසීමට ඇති දෙය ඉතා වැදගත් බවය.

## හඬවල් රාශියක්

තමා කෙරෙහි අවධානය යොමුකරගැනීමට කෑගසන විවිධ හඬවල් රාශියක් පවතින බව බයිබලය පෙන්වා දෙයි:

**"යම් පමණ වෙනස්වූ භාෂාවල් ලෝකයේ ඇද්ද, එයින් එකක්වත් අර්ථ රහිත නැත."**
**(1 කොරින්ති 14:10)**

ලෝකයෙහි පවතින මෙම කටහඬවල් මොනවාද ?

## මනුෂ්‍යයාගේ හඬ :

මිනිස් කටහඬ හඳුනාගැනීම පහසුය. එය තවත් එක් මනුෂ්‍යයෙකු නිකුත් කරන කණට ඇසෙන ශබ්දයකි.

> **පේත්‍රුස්ද ප්‍රේරිතයෝද උත්තරදෙමින්: මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට අප විසින් කීකරු විය යුතුය. (ක්‍රියා 5:29)**

සමහර අවස්ථාවලදී මනුෂ්‍යයාගේ හඬ ඥානවන්ත උපදෙස් ලබාදෙයි. එහෙත් මනුෂ්‍යයන්ගේ හඬ කිසියම් අවස්ථාවක දෙවියන්වහන්සේගේ හඬට පරස්පර වේනම් එවිට ඔබ ඇහුම්කන් දිය යුත්තේ දෙවියන්වහන්සේගේ හඬටය.

## සාතන්ගේ කටහඬ

සාතන්ගේ කටහඬ පළමු වතාවට මිනිසාට අසන්නට ලැබුනේ ඒදන් උයනෙහිදී ඒවාට කතාකළ අවස්ථාවෙහිය (උත්පත්ති 3:1,4,5). සාතන්ගේ කටහඬ සැමවිටම බොරු කියයි, රවටයි, සැමවිටම මනුෂ්‍යයාව දෙවියන්වහන්සේගෙන් ඈත් කොට පාපය කෙරෙහි මගපෙන්වයි. මතෙව් 4:1-13 සාතන් විසින් දෙවියන්වහන්සේව පරීක්ෂාවට ලක් කළාවූ කොටස කියවීමෙන් ඔබහට මෙය පහසුවෙන් හඳුනාගතහැකි වේ. සාතන් දෙවියන්වහන්සේ සමග පැවති කතාබස් පිළිබඳව ඔබට යෝබ් 1:7-12 සහ 2:1-6 කියවා අධ්‍යයනය කළ හැකිය.

අශුද්ධ ආත්ම වලට (සාතන්ගේ යක්ෂයින්) කටහඬක් ඇත.

> **කුමක්හෙයින්ද අශුද්ධාත්මයන් වැහී සිටි බොහෝ දෙනෙකුගෙන් ඒ ආත්මයෝ මහත් හඬින් මොරගසමින් අහක්ව ගියෝය. බොහෝ අංශභාග රෝගීහුද කොරුද සුව කරනු ලැබුවෝය. (ක්‍රියා 8:7)**
>
> **අශුද්ධ යක්ෂ ආත්මයක් ආවේශවූ මනුෂ්‍යයෙක් සිනගෝගයෙහි සිටියේය: ඔහු මහත් හඬින් මොරගසමින් : අහෝ ! නාසරීය යේසුස්වහන්ස, ඔබට අපෙන් කම මොකද? ඔබ අප විනාශකරන්ට ආසේක්ද? ඔබ කවුද කියා දනිමි, ඔබ දෙවියන්වහන්සේගේ ශුද්ධවූ තැනැන්වහන්සේයයි කීවේය. (ලූක් 4:33,34)**

සමහර අවස්ථාවලදී යක්ෂාවේශ වූ කාන්තාවකගේ හෝ පුරුෂයෙකුගේ උගුරෙහි ස්වර තන්තු භාවිතාකොට යක්ෂයින් කතාකරන විට යක්ෂයාගේ කටහඬ ඇසෙන්නට පුළුවන. එහෙත් බොහෝ අවස්ථාවලදී යක්ෂයා කතාකරන්නේ කණට නෑසෙන හඬිනි. යක්ෂයා ඔබගේ මනසට බොරු කියයි, රවටයි, පාපිෂ්ඨ සිතුවිලි කතාකරයි.

## තමාගේ හඬ :

තමාගේම හඬනම් මනුෂ්‍යයා තමාටම කතාකර ගැනීමය. මෙවන් ස්වයං-කතාබහ පිළිබඳ උදාහරණ ඔබහට ලූක් 16:3 සහ 18:4 මෙන්ම යෝනා තමා මැරුණා නම් හොඳයයි පැතූ ආකාරය යෝනා 4:8 හි කියවිය හැකිය. තමාගේම ස්වයං හඬ පිළිබඳව බයිබලය අනතුරු අගවයි.

> **ස්වාමින්වහන්ස, මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත. (යෙරමියා 10:23)**

**දෙවියන්වහන්සේගේ හඬ :**

යේසුස්වහන්සේ පැවසුයේ ඇදහිලිවතුන් හට දෙවියන්වහන්සේගේ හඬ දැන ගත හැකි බවත් එය අනෙකුත් හඬවල්වලින් වෙන්කර හඳුනාගත හැකි බවත්ය.

> **ඔහුට දොරටුපාලයා දොර හරියි; බැටළුවෝ ඔහුගේ හඬ අසති. ඔහු තමාගේම බැටළුවන්ගේ නම් කියා අඬගසා උන් පිටතට ගෙනයයි, ඔහු තමාගේම සියලු බැටළුවන් පිටතට හැරියාම ඔහු උන්ට පෙරටුව යයි, බැටළුවෝද ඔහුගේ හඬ අඳුනන බැවින් ඔහු පස්සේ යති. උන් අන්‍යයන්ගේ හඬ නාඳුනන බැවින් අන්‍යයෙකු පස්සේ නොගොස් ඔහු වෙතින් පලායන්නේයයි කීසේක. (යොහන් 10:3-5)**

මෙහිදී ඇදහිලිවන්තයෝ බැටළුවන්ට සමාන කොට තිබේ. බැටළුවන්ගේ චරිත ගුණාංගයක් නම්, උන් යන්නේ කොහේදැයි නොදැනීමය. සැමවිටම බැටළුවන්ට මඟ පෙන්වා දිය යුතුය. යේසුස්වහන්සේ තමා බැටළුවන්ගේ නායකයා නොහොත් එඬේරා යයි පැවසූ සේක. තමාගේ බැටළුවෝ තමාගේ හඬ හඳුනන බවත්, අනෙකුත් හඬවල් එනම්, මනුෂ්‍යයාගේ, තමාගේ හෝ සාතන්ගේ හඬ අනුගමනය නොකොට තමාව අනුගමනය කරනු ඇතැයි යේසුස්වහන්සේ පැවසූ සේක.

## දෙවියන්වහන්සේගේ හඬ ඇසීම.

ඔබගේ බයිබලය විවෘත කොට උත්පත්ති 1-3 පරිච්ඡේද කියවන්න. මෙහි ලෝකය මැවීම හා මුල්ම මනුෂ්‍යයන් දෙදෙනා වන ආදම් සහ ඒවා මැවීම සඳහන් වේ. ලෝකයෙහි ආරම්භයේ සිටම දෙවියන්වහන්සේ තම කැමැත්ත මිනිස් සංහතියට ප්‍රකාශ කොට තිබුණි. ආදම් සහ ඒවාට එතුමා නියත උපදෙස් සැපයූ සේක. ඔව්හු සතුන් නම්කොට, උයන රැක බලාගෙන, එකිනෙකා සමඟ සම්බන්ධතාවය පවත්වාගෙන, බෝවී පොළොව ජනාකීර්ණ කළ යුතු විය. ඒ සියල්ලට ඉහළින් වඩා වැදගත් වූයේ දෙවියන්වහන්සේ සමඟ සමීප ඇසුරක් පැවැත්වීමය. දෙවියන්වහන්සේ සමඟ පැවති මෙම සමීප සම්බන්ධතාවය නිසා ඔවුනට දෙවියන්වහන්සේගේ හඬ අසන්නට ලැබුණි. දෙවියන්වහන්සේ ඔවුන් සමඟ කතාකරන විට උන්වහන්සේගේ සැලැස්ම ඔවුන්ට කියා දුන්සේක.

> **ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥාකරමින්: නුඹට උයනේ ඇති සියලුම ගස්වලින් කෑමට පුළුවන; එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය; මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහියයි කීසේක. (උත්පත්ති 2:16-17)**

දෙවියන්වහන්සේගේ හඬින් දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට දේව කැමැත්ත එළිදරව් කර දුන් සේක. මුළු උයනේ තිබූ සියලුම ගස් වලින් නිදහසේ තමාට රිසි පරිදි කෑ හැකි වුවත් යහපත හා නපුර දැනගැනීමේ ගසෙන් කෑමට තහනම් විය.

ආදම් සහ ඒවා දෙවියන්වහන්සේගේ සැළැස්ම අනුගමනය නොකළහ. ඔව්හු සාතන්ගේ හඬට ඇහුම්කන් දී තහනම් කර තිබූ ගසෙන් කෑවෝය. ඔව්හු තමුන් කළ දේ වටහාගත් කල දෙවියන්වහන්සේගෙන් සැඟවුණෝය.

> **ඉක්බිති දිවාභාගයේ සිසිල් වේලේ ස්වාමිවූ දෙවියනවහන්සේ උයනේ සක්මන්කරන ශබ්දය ඔවුන්ට ඇසුණේය. එවිට මනුෂ්‍යයා හා ඔහුගේ භාර්යාව ස්වාමිවූ දෙවියනවහන්සේ ඉදිරියෙන් උයනේ ගස් අතරෙහි සැඟවුණෝය. ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට හඬගසමින්, නුඹ කොහේදැයි ඔහුට කීසේක. (උත්පත්ති 3:8-9)**

මනුෂ්‍යයාව දෙවියන්වහන්සේගෙන් වෙන් කරන තබනුයේ පාපයයි. දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සිටි ස්ථානයෙන් තමාගේ අභිමුඛය ඉවත් කරගත්තේ නැත. නමුත් පාපය නිසා මිනිසා දේව අභිමුඛයෙන් සැඟවුණේය. පාපය මගින් සිත දැඩි කර ගැනීම ඇති වේ.

**බයිබලය මේ පිළිබඳ අනතුරු අඟවමින් :**

> **මක්නිසාද, අද නුඹලා උන්වහන්සේගේ හඬ අසන්නහු නම් උදහස් ඉපදවීමේදී මෙන් නුඹලාගේ සිත් දැඩිකර නොගනිල්ලා... (හෙබ්‍රෙව් 3:14)**

දෙවියන්වහන්සේට මනුෂ්‍යයා සමඟ කතා කිරීමට අවශ්‍යයි. එහෙත් කතා කිරීමට නම් සම්බන්ධතාවයක් අවශ්‍ය වේ. පාපය මනුෂ්‍යයාව දෙවියන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකින් ඈත් කොට, හදවත දැඩිකොට, ඔහුට දෙවියන්වහන්සේ හඬ දැනගැනීමට බාධා කරයි.

## කට හඬ සහ කැමැත්ත.

ඇදහිලිවන්තයෝ බොහෝ විට “මා උදෙසා දේව කැමැත්ත කුමක්ද.?” යැයි ප්‍රශ්න කරති. අපහට දේව කැමැත්ත දැනගැනීමට අවශ්‍ය යැයි අප පවසන කල එයින් අර්ථවත් වන්නේ කුමක්ද? එහි අර්ථය නම්, අපගේ ජීවිත උදෙසා එතුමාගේ පොදු සැලැස්ම දනගැනීමට අවශ්‍ය බවය. සුවිශේෂී වූ තෝරාගැනීම් වලදී අපි ඥානවන්ත තීරණ ගැනීම සඳහා අපට එතුමාගේ මග පෙන්වීම අවශ්‍ය බවය. අපගේ ජීවිතයෙහි නොයෙක් වාතාවරණයන්හිදී එතුමාගේ මග පෙන්වීම අපි අපේක්ෂා කරමු. එසේ නම්, අපි ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ “මට දෙවියන්වහන්සේගේ හඬ ඇසෙන්නට හැකි වන්නේ කෙසේද?” යන්නය. දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමෙන් එතුමාගේ කැමැත්ත සොයා ගැනීමට හැකි වේ.

දෙවියන්වහන්සේට අවශ්‍ය වනුයේ ඔබ දේව කැමැත්ත දැනගැනීමටය :

> **මේ නිසා, නුඹලා අඥානයෝ නොවී ස්වාමින්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම්ගනිල්ලා. (එපීස 5:17)**

ඔබ එතුමාගේ හඬ දනී නම්, එතුමා කතා කරන විට දේව කැමැත්ත කුමක් දැයි ඔබට වැටහෙනු ඇත. දිව්‍යමය මග පෙන්වීම ලබාගැනීමට ඉගෙනීම නම් දෙවියන්වහන්සේ සමග සමීපතම ලෙස ගමන් කිරීමට ඉගෙන ගැනීම වේ. බයිබලය මෙසේ පවසයි :

> **උන්වහන්සේ උත්තරදෙමින්, මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචනවලින් ජීවත්වෙනවා මිස, රොටි පමණකින් ජීවත්නොවන්නේය කියා ලියා තිබේයයි කීසේක (මතෙව් 4:4)**

“නික්මෙන” යන වචනය දිගටම සිදු කරගෙන යන ක්‍රියාවක් සනිටුහන් කරයි. එයින් අර්ථවත්වනුයේ පෙර කල සිදුවූ, වර්තමානයෙහි සිදුවන හා අනාගතයෙහිදී සිදු විය හැකි දිගටම පවතින ක්‍රියාවක් බවය. දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍යයා හට පැවසීමට කතාකරන සේක. දෙවියන්වහන්සේගේ හඬ හඳුනා ගැනීම ඉතා වැදගත් වනුයේ එබැවිනි.

## දෙවියන්වහන්සේ කතා කරන කල.

බයිබලයෙහි, “වචනය” ලෙස පරිවර්ථනය කර ඇති ග්‍රීක වචන දෙකක් ඇත. එම වචන දෙක නම් “ලෝගොස්” සහ “රීමා” ය. “ලෝගොස්” යනු දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයයි. “රීමා” යනු දෙවියන්වහන්සේගේ ජීවමාන වචනය නැතහොත් ජීවනය ගෙන දෙන වචනයයි. බෙරියේ විසූ ඇදහිලිවතුන් පිළිබඳව මෙසේ පවසා ඇත. එනම් :

**"ඔව්හු තෙසලෝනිකයෙහි අයවලුන්ට වඩා උතුම් වූවෝය. මක්නිසාද ඔව්හු මේ කාරණා මෙසේදැයි දැනගන්නා පිණිස දවස්පතා ලියවිලි (ලෝගොස්) සොයමින්, සිතේ මුළු කැමැත්තෙන් වචනය (රීමා) පිළිගත්තෝය. (ක්‍රියා 17:11)**

මෙම පදයෙන් "ලෝගොස්" හා "රීමා" වචනයෙහි පවතින සම්බන්ධතාවය පැහැදිලි කරදෙයි. ලිඛිත වචනය වූ "ලෝගොස්" කතාකරන ජීවමාන වචනය වූ "රීමා" වචනය සමඟ නිරතුරුවම එකඟ වේ. ඔබට ඇසුන හඬ ස්වාමීන්වහන්සේගෙන්දැයි ඔබට දැනගත හැක්කේ මෙයාකාරයෙනි. සාමාන්‍යයෙන් දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නාවූ "රීමා" වචනයක් විශේෂිත සිදුවීමකට, පෞද්ගලික අවශ්‍යතාවයක් සැපිරීමට හෝ පෞද්ගලික මග පෙන්වීමක් සඳහාය. ඔබට ලැබුණු එම වචනය ඔබගේ විශේෂිත අවශ්‍යතාවය සඳහා අදාළ වන දේව වචනයක් ලෙස ඔබ හඳුනාගැනීම නිසා ඔබට එය ජීවනය ගෙන දෙන වචනයක් වේ.

"රීමා" වචනයක් ඔබහට හදිස්සියේම දේශනාවක් තුළදී හෝ බයිබලය කියවීමෙහිදී කතාකළ හැකිය. එය ඔබට බොහෝ අර්ථවත් වනු ඇත. එය ඔබහට ආත්මික දීමනා කරණකොටගෙන ලැබිය හැක. සමහර විට ඔබගේ අභ්‍යන්තරයෙහි ආත්මයට ස්වාමීන්වහන්සේම කතා කරනු ඇත. (පසු පරිච්ජේදවලදී අපි ආත්මික දීමනා තුළින් හා අභ්‍යන්තර ආත්මයට කතාකරන ආකාරය පැහැදිලිව ඉගෙන ගනු ඇත)

නමුත් හොඳින් මතක තබාගත යුතු දෙය නම් "රීමා" වචනය සැමවිටම ලිඛිත දේව වචනය හා එකඟවිය යුතුය. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය සර්වසම්පූර්ණය. එයට කිසිවක් එකතු කිරීමට හෝ කිසිවක් අඩුකිරීමට නොහැක (එළිදරව් 22:18-19). දෙවියන්වහන්සේ "රීමා" වචනයෙන් ඔබට කතාකරන කල එය සැමවිටම ලිඛිත වචනයට එකග සුහදතාවයෙන් යුක්ත විය යුතුය.

## අසන්නන් වර්ග කිහිපයක්

බයිබලයෙහි අසන්නන් ප්‍රධාන වශයෙන් දෙවර්ගයක් පිළිබඳව පවසයි :

**"එහෙයින් යමෙක් මාගේ මේ වචන අසා ඒවා පිළිපදිද්ද, ඔහු පර්වතය පිට තමාගේ ගෙය සාදාගත් නුවණ ඇති මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය, යමෙක් මාගේ මේ වචන අසා, ඒවා පිළි නොපදිද්ද, ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදාගත් නුවණ නැති මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය. (මතෙව් 7:24,26)**

අනුවණ අසන්නෙක් දෙවියන්වහන්සේගේ හඬ අසා, ඒ අනුව ක්‍රියා නොකරයි. එහෙත් නුවණැති අසන්නෙක් දෙවියන්වහන්සේගේ පණිවුඩය අසා ඒ අනුව ක්‍රියාකරයි. එක අසන්නෙක් "වචනය අසන්නෙක්" පමණක් වී ඇත. අනෙක් අසන්නා, "අසන්නෙක් හා ඒ අනුව ක්‍රියාකරන්නෙක්" වී ඇත.

ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමට පමණක් සීමා විය යුතු නොවේ. ඔබ එම හඬට කීකරු කමින් ප්‍රතිචාර දැක්වීමට ඉගෙන ගත යුතු වේ.

**නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙයල්ලා. මක්නිසාද යමෙක් වචනය අසන නුමුත් එය පිළිපදින්නේ නැත්නම්, ඔහු කැඩපතකින් තමාගේ ස්වාභාවික මුහුණ බලන මනුෂ්‍යයෙකුට සමානය. මක්නිසාද ඔහු තමාම බලාගනිමින් සිට අහක්ව ගිය කල, තමා කෙබඳු මනුෂ්‍යයෙක්ව සිටියේදැයි එවලේම මතක නැතිකරයි. නුමුත් නිදහස්කමේ සම්පූර්ණ ව්‍යවස්ථාව දෙස බලාගන, මතක නැතිකරන අසන්නෙක් නොවී, ක්‍රියාකරන කෙනෙක්ව, එසේ පවතින්නාවූ තැනැත්තේම තමාගේ ක්‍රියාකිරීමෙහිදී ආශිර්වාද ලබන්නේය. (යාකොබ් 1:22-25)**

විවිධ වර්ග වල අසන්නන් පැහැදිලි කිරීමට යේසුස්වහන්සේ විවිධ පස් මත වැපිරූ බීජ පිළිබඳ කතාවක් පැවසූ සේක. මතෙව් 13:1-9 දක්වා කතාව කියවන්න. එම කතාව මතෙව් 13:18-23 හි

උන්වහන්සේ පැහැදිලිකර දෙයි. උන්වහන්සේ මෙහිදී දේව වචනය අසා එයට ප්‍රතිචාර දක්වන විවිධාකාරයේ අසන්නන්ව පස් වර්ග සමඟ සසඳා දක්වන සේක.

### මග අසල වැටුන බීජ :

සමහර බීජ මග අසල වැටුන අතර, එය මුල් ඇදීමට පෙර කුරුල්ලෝ පැමිණ ඩැහැගත්තේය. මෙය දෙවියන්වහන්සේගේ හඬ අසන නමුත් එම වචන ඔහුගේ සිත තුළ මුල් නාදින මිනිසා වැනිය. සාතන් පැමිණ ඔහුගෙන් දේව වචනය උදුරාගනී.

### ගල් බිමෙහි වැටුන බීජ :

සමහර බීජ ගල් අතර වැටී ඉක්මනින්ම පැලවිය. නමුත් දිවා භාගයේ අව් රශ්මිය පැමිණි කල මුල් නොමැති කමින් එම ගස වියලී මිය ගියේය. මෙය දෙවියන්වහන්සේගේ හඬ ප්‍රීතියෙන් යුක්තව අසා පිළිගන්නා නමුත් ඔහුගේ සිත තුළ මුල් ඇද නැති මිනිසා වැනිය. තමාගේ වටපිටාව දුෂ්කරවන විට ඔහු බාධාවට පැමිණ, දෙවියන්වහන්සේගේ හඬට ප්‍රතිචාර දැක්වීම නවතා දමයි.

### කටු අතරෙහි වැටුන බීජ :

සමහර බීජ කටු පඳුරු අතර වැටී පැළවූ නමුත් කටු ගස් වැවී ඒවා යට කර දැමීය. මෙය දෙවියන්වහන්සේගේ හඬ, ලෝකයෙහි වස්තුව හා අනෙකුත් කාරණා ගැන වෙහෙසීමෙන් යටපත් වීම පිළිබඳ උදාහරණයකි.

### සරු බිමේ වැටුන බීජ :

සමහර බීජ සරු බිමේ වැටී සශ්‍රීක අස්වැන්නක් නිපදවාලිය. මෙය දේව වචනය ලබා, දෙවියන්වහන්සේගේ හඬට සවන් දී එම එළිදරව්වෙහි මුල් ඇදගන්නා වූ මනුෂ්‍යයාට සමානය. මොහු ආත්මිකව පරිණත වී, නැවත ඵල දරන්නාවූ, සඵලවත් ඇදහිලිවන්තයෙකු බවට පත්වෙනු ඇත.

## ඔබට දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගත හැක්කේ කෙසේද?

ඔබට දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමට අවශ්‍යද? ඔබගේ ජීවිතය උදෙසා එතුමාගේ කැමැත්ත දැන ගැනීමට ඕනෑද? මීළඟ පරිච්ඡේදයෙහිදී දෙවියන්වහන්සේගේ හඬ අසන පිණිස ඔබව සූදානම් කිරීමට අවශ්‍ය වන කරුණු පිළිබඳවත් ඔබගේ ජීවිතය උදෙසා දේව කැමැත්ත සොයාගැනීමටත් ඉගෙන ගත හැකිය.

## ස්වයං - පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න

_______________________________________________

_______________________________________________

2. දෙවියන්වහන්සේගේ “රීමා” වචනය යන්නෙහි තේරුම කුමක්ද?

_______________________________________________

3. දෙවියන්වහන්සේගේ “ලෝගොස්” වචනය යන්නෙහි තේරුම කුමක්ද?

_______________________________________________

4. ඔබගේ ජිවිතයෙහි දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමත්, ඔබ උදෙසා එතුමාගේ කැමැත්ත තිරණය කිරීමත් අතර සම්බන්ධතාවය කුමක්ද?

_______________________________________________

5. දෙවියන්වහන්සේගේ අතීතයෙහි මනුෂ්‍යයන්ට කතාකළ බවත්, අද දින පවා කතා කරන බවත් තහවුරු කිරීමට හෙබ්‍රෙව් පොතෙන් පදයක් උපුටා දක්වන්න.

_______________________________________________

6. “දේව කැමැත්ත” යන්නෙහි තේරුම කුමක්ද?

_______________________________________________

_______________________________________________

7. දෙවියන්වහන්සේගේ “රීමා” වචනය නිරන්තරයෙන්ම එකගතාවය දක්වන්නේ කුමක් සමගද?

_______________________________________________

8. මනුෂ්‍යයාව දේව අභිමුඛයෙන් වෙන් කරන ලද්දේ කුමක් විසින්ද? ___________________________

9. ඔබ දේව වචනය ___________________ පමණක් නොවී ____________________එය විය යුතුය.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දෙවියන්වහන්සේගේ හඬ විස්තර කර දෙන්නාවූ බයිබල් පද කිහිපයක් තිබේ. එක් එක් පදය සොයා බලා, දෙවියන්වහන්සේගේ හඬ විස්තර කර දී ඇති වචන ලියන්න. පළමු වැන්න ඔබ හට දී ඇත. එය අනුගමනය කොට ඉතිරිය පුරවන්න. ඔබගේම බයිබල් අධ්‍යයනය තුළින් ඔබ ඉගෙන ගන්නා වූ දෙවියන්වහන්සේගේ හඬ පිළිබඳ ඇති උපුටා ගැනීම් මෙම වගුවට අලුතින් එකතු කරගන්න.

| **බයිබල් පදය.** | **දෙවියන්වහන්සේගේ හඬ විස්තර කරදීම.** |
|---|---|
| 2 සාමුවෙල් 22:14 | ස්වර්ගයෙන් පැමිණි ගර්ජනාව. |
| 1 රාජාවලිය 19:12-13 | |
| ගීතාවලිය 18:13 | |
| ගීතාවලිය 29:3-9 | |
| ගීතාවලිය 68:33 | |
| දානියෙල් 10:6-9 | |

2. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ පිළිබඳව කතා කළසේක. පහත සඳහන් කොටස් වල උන්වහන්සේ පැවසූ දෙය පිළිබඳව ඔබට කියවිය හැක. 2 පේත්‍රුස් 1:17-18; මතෙව් 3:17; මාර්ක් 1:11

3. දෙවියන්වහන්සේ පැවසූ දෙය ඉෂ්ට වේ. එසකියෙල් 12:25-28 බලන්න.

4. යේසුස්වහන්සේගේ වචන මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් පොතෙන් ඉගෙන ගන්න.
   යේසුස්වහන්සේ කතා කරන විට ප්‍රශ්න වලින්, පිළිතුරුවලින්, උදාහරණ වලින්, සමාන කිරීම් වලින්, උපමා වලින් හා දේශනා වලින් කතා කළ ආකාරය නිරීක්ෂණය කරන්න.

5. දෙවියන්වහන්සේ පෞද්ගලිකව එකිනෙකා හට පමණක් නොව මුළු ජාතීන්ටද කතා කරනසේක. යෙරමියා 18:7-10 බලන්න.

6. පහත සඳහන් පද වල සඳහන් ආකාරයට දෙවියන්වහන්සේගේ හඬට අකීකරු වීමෙහි ප්‍රතිඵල කියවා බලන්න. දී ඇති වගුවෙහි අකීකරු කමෙහි ප්‍රතිඵල සටහන් කරන්න.

| **බයිබල් පද** | **අකීකරු කමෙහි ප්‍රතිඵල** |
|---|---|
| නික්මයාම 15:26 | |
| ද්විතීය කතාව 28:15-68 | |
| 1 සාමුවෙල් 12:15 | |

7. පහත සඳහන් බයිබල් පද කියවා බලා දෙවියන්වහන්සේගේ හඬට කීකරු වීමෙහි ප්‍රතිඵල සටහන් කරන්න.

   ද්විතිය කතාව 28:1-14

   1 සාමුවෙල් 12:14

8. මුළු බයිබලයම පාහේ දෙවියන්වහන්සේගේ හඬට පුද්ගලයින් මෙන්ම ජාතින් ප්‍රතිචාර දැක්වූ ආකාරයෙහි වාර්තාවකි. දෙවියන්වහන්සේගේ හඬට මිනිසා දැක්වූ ප්‍රතිචාර පිළිබඳව අධ්‍යයනය කරන අතර පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. පළමු වැන්න ඔබ හට නිදර්ශනයක් ලෙස ඉදිරිපත් කර ඇත. මෙම වගුව සම්පූර්ණ කිරීම සඳහා ඔබහට සපයා ඇති පදයෙහි ඉදිරියට හා පසුපසට පද කිහිපයක් කියවීමට සිදුවනු ඇත. මීට පෙර වගුවේදී මෙන්ම ඔබගේම දේව වචනයෙහි අධ්‍යයනය ඇසුරින් වගුවට අළුතින් කරුණු එකතු කළ හැකිය.

| **බයිබල් පදය.** | **ජනතාව.** | **ප්‍රතිචාරය.** | **ප්‍රතිඵලය.** |
|---|---|---|---|
| උත්පත්ති 26:5 | ආබ්‍රහම් | කීකරුකම | ඔහුගේ බීජය සහ ලෝකයෙහි ජාතින් ආශිර්වාද ලැබීය. |
| උත්පත්ති 22:18 | | | |
| ද්විතිය කතාව 8:20 | | | |
| විනිශ්චයකාරයාගේ පොත 2:2,4,20-23 | | | |
| විනිශ්චයකාරයාගේ පොත 6:10 | | | |
| 1 සාමුවෙල් 15:1,19,22,24 | | | |
| 1 සාමුවෙල් 28:18 | | | |
| ගීතාවලිය 106:25 | | | |
| දානියෙල් 9:10-14 | | | |
| ශෙපනියා 3:2 | | | |
| හග්ගයි 1:12 | | | |

# දෙවන පරිච්ඡේදය

## මනුෂ්‍යයෙකු කරයි නම්...ඔහු දැනගනු ඇත.

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- කටපාඩමින් ප්‍රධාන පදය ලිවීමට.
- "පෙර අවශ්‍යතා" යන පදය අර්ථ දැක්වීමට
- දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම සඳහා "පෙර අවශ්‍යතා" නම් කිරීමට
- නැවත උත්පාදනය ලැබීම යන්නෙහි අරුත පැහැදිලි කිරීමට හැකි වනු ඇත.
- දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමෙහිදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇති වැදගත් කම වටහා ගැනීමට.
- "ආත්මික පරිණත බව" හා "විපර්යාසයකට භාජනය වීම" පිළිබඳව අවබෝධයක් විදහා දැක්වීමට. හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)**

### හැඳින්වීම.

ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැනගන්නා ස්ථානයට පැමිණීමට "පෙර අවශ්‍යතා" කිහිපයක් ඇත. "පෙර අවශ්‍යතාවයක් නම් කිසියම් කාර්යයක් කිරීමට කලින්, කළ යුතු දෙයකි. ඔබ කිසියම් ඉලක්කයක් කරා ළඟාවීමට පෙර ඔබ තුළ තිබිය යුතු දෙයකි.

මෙම පාඨමාලාවෙහිදී ඔබගේ ඉලක්කය වනුයේ දෙවියන්වහන්සේගේ හඬ දැනගන්නා ස්ථානයට පැමිණීමය. ඔබහට එම ඉලක්කය සපුරා ගැනීමට පෙර ඒ සඳහා ඔබ සතු විය යුතු "පෙර අවශ්‍යතා" මෙම පරිච්ඡේදයෙහිදී පැහැදිලි කරදෙනු ඇත. යේසුස්වහන්සේ පවසන සේක් :

> **යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම්, ඔහු ඒ ඉගැන්වීම දෙවියන්වහන්සේගෙන් වූ ඉගැන්වීමක්ද නොහොත් මා විසින් උපදවා කියනවාදැයි දනගන්නේය. (යොහන් 7:17)**

මෙම පරිච්ඡේදයෙහි ප්‍රධාන පදය වන රෝම 12:1-2 හි ඔබ කළ යුතු වන දෙවියන්වහන්සේගේ කැමැත්ත වන කරුණු ලැයිස්තුවක් සඳහන් වේ. ඔබට මෙම "පෙර අවශ්‍යතා " සැපරිය හැකි නම් එවිට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට හා ඔබගේ ජීවිතය උදෙසා දේව කැමැත්ත දැනගත හැකිවේ.

## නැවත - උත්පාදනය ලැබීමෙහි අත්දැකීම.

**එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ ආත්මික සේවය වේ. (රෝම 12:1)**

මීට පෙර පරිච්ඡේදයෙහිදී ඔබ ඉගෙනගත් පරිදි පාපය ඔබව දේව අභිමුඛයෙන් වෙන් කොට තබයි. පාපය නිසා ඔබ හට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට හා එයට නියමාකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට ඔබට අපහසු වේ.

ස්වාභාවික ලෝකයෙහි ඔබ හට අමුත්තෙකුගේ කටහඬ හඳුනාගැනීම කළ නොහැක. ඔබ දන්නා හඳුනන, සම්බන්ධතාවයක් ගොඩ නගාගෙන ඇති අයගේ කටහඬ ඔබ හඳුනනු ඇත. ආත්මික ලොවෙහිදීද එය එසේමය. ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැන හඳුනා ගැනීමට නම්, පළමුව ඔබ එතුමාව දැනගත යුතුය. එතුමා සමග සමීප මිතුරු දමක් ඇතිකරගත යුතුය. නමුත් ඔබගේ ජීවිතයෙහි පාපය තබාගෙන මෙය කළ නොහැක.

රෝම 12:1 අපේක්ෂා කරන පරිදි ඔබ දෙවියන්වහන්සේ වෙතට යොමු වීමේ පළමු පියවර ලෙස ජීවිතය එතුමාට භාර කළ යුතුය. දෙවියන්වහන්සේ දැනටම ඔබ සමග සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම එතුමාගේ කැමැත්ත බව ලිඛිත දේව වචනය තුළින් ඔබට පෙන්වා දී තිබේ.

**ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමීන්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසනසේක. (2 පේත්‍රුස් 3:9)**

දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය පාපයෙහි ගෙවී යාමට ප්‍රිය නොකරන සේක. උන්වහන්සේට අවශ්‍යවනුයේ ඔබගේ ජීවිතය එතුමාගේ සැලැස්මට අනුව ගත කිරීමටය.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජීවත්වෙන පිණිස එම සිත ආයුධයක් කොට පැළඳගනිල්ලා . මක්නිසාද මාංසයෙන් වධවින්ද තැනැත්තේ පාපයෙන් නිදහස්වී සිටියි. (1 පේත්‍රුස් 4:2)**

දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි දොරටුව ඉදිරිපිට සිටිමින් ඔබගේ ජීවිතයට ඇතුළුවීමටත් ඔබ සමඟ සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමටත් ආගාවෙන් සිටින ලෙස චිත්‍රයක් මැවී ඇත.

**මෙන්න, මම දොර ළඟ සිට තට්ටුකරමි, යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්, ඔහු වෙතට ඇතුල්ව, ඔහු සමග කෑම කන්නෙමි, ඔහුද මා සමග කන්නේය. (එළිදරව් 3:20)**

ලෝකය ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේගේ ප්‍රකාශිත පරමාර්ථය වූයේ සියලූ මනුෂ්‍යයන්ව යේසුස් ක්‍රිස්තුස්වහන්සේව දැන ගැනීමට ගෙන ඒමය.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

ඔබ දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකයෙකු වීම තුළින් "ක්‍රිස්තුස්වහන්සේ තුළට එකමුතු කරනු " ලැබේ. ඔබ ස්වාභාවික උපත මගින් ස්වාභාවික පවුලට ඇතුළු වූවාක් මෙන්ම ආත්මිකව "නැවත-උපත ලැබීම" තුළින් ආත්මික පවුලට එකතු වනු ඇත.

යොහන් 3 පරිච්ඡේදය කියවන්න. නැවත-උපත ලැබීම යනු කුමක් දැයි මෙම ඡේදය මනාව පැහැදිලිකරදෙයි. අළුත් උපත අත් දැකීමට නම් ඔබ :

1. පව්කරුවෙක් බව පිළිගතයුතු වේ.

> **මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

2. පාපයෙහි වන්දිය මරණය බව හඳුනාගත යුතුය.

ආදම් සහ ඒවට පව් කළහොත් ඔවුන් මිය යන බවට දෙවියන්වහන්සේ අනතුරු අඟවා තිබුණි. එනම් ආත්මිකව (දේව අභිමුඛයෙන් වෙන් කරනු ලැබීම.) මරණය හා ශාරීරික මරණය යන දෙකමය. යේසුස්වහන්සේ කුරුසියෙහි මිය ගිය කල උන්වහන්සේ ගත්තේ ඔබගේ ස්ථානයයි. උන්වහන්සේ ඔබගේ පාපය වෙනුවෙන් මිය ගොස් ඔබට සදාකාල ජීවනය ලබා දුන් සේක.

> **මක්නිසාද පාපයේ කුලී නම් මරණයය; නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය. (රෝම 6:23)**

උන්වහන්සේ ඔබගේ පාප උදෙසා කළාවූ පූජාව පිළිගනී නම්, ඔබ තව දුරටත් මරණයෙහි දඬුවමට යටත්ව නොසිටී.

3. ඔබගේ පාපය කියා දෙන්න, සමාව අයදින්න, යේසුස්වහන්සේ ඔබ උදෙසා මිය ගිය බව විශ්වාස කරන්න.

> **අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර- කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:8-9)**

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. (යොහන් 3:16)**

ඔබ මෙයාකාරයෙන් ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේට ඔප්පු කළ විට, ඔබ ආත්මිකව "නැවත-උපත" ලබනු ඇත.

> **එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත්වී තිබේ. (2 කොරින්ති 5:17)**

ඔබ නැවත- උපත ලැබූ කල දෙවියන්වහන්සේගේ ආත්මික පවුලෙහි සාමාජිකයෙකු බවට පත්වේ. ඔබ තවදුරටත් දේව අභිමුඛයෙන් වෙන් කරනු ලැබ නොසිටියි. ඔබ ශාරීරිකව මිය ගිය පසුව එතුමා සමඟ සදාකල් ජීවත් වනු ඇත.

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයක් පිහිටුවාගෙන ඇත. ඔබ ශුභාරංචියෙහි සත්‍යයට ඇහුම්කන් දී එයට ප්‍රතිචාර දක්වා ඇත. දැන් ඔබ දෙවියන්වහන්සේගේ හඬ හඳුනා ගැනීමට ඉගෙන ගත හැකි තැනක සිටී.

> **...සත්‍යයෙන්වූ සියල්ලෝ මාගේ හඬ අසතියි කීසේක. (යොහන් 18:37)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම.

ඔබට දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීමට උපකාර වන්නාවූ තවත් පෙර-අවශ්‍යතාවයක් තිබේ. බයිබලය ශුද්ධාත්ම බව්තීස්මය නම් අත්දැකීමක් පිළිබඳව කතා කරයි. එම අත්දැකීම නම් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ වැඩ වාසය කරමින්, දෙවියන්වහන්සේට පිළිගතහැකි ආකාරයේ ශුද්ධවූ ජීවිතයක් ඔබට ගතකිරීමට හැකියාව ලබා දෙන අත්දැකීමකි.

ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ ඉටු කරන සේවා භාරය මෙම පාඩමේ විස්තර කර අවසන් කිරීමට නොහැකි තරම් විශාලය. හාවස්ටයිම් ජාත්‍යාන්තර ආයතනය මගින් නිකුත් කර ඇති *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය"* නම් පාඨමාලාව මෙම විෂය පුළුල් ලෙස ආවරණය කරන අතර ශුද්ධාත්මයාණන්වහන්සේගේ බව්තිස්මය ලබන ක්‍රමය පිළිබඳව උපදෙස් සපයයි.

අප තුළ වැඩ වාසය කරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ එක් වැදගත් මෙහෙයක් නම් ඇදහිලිවන්තයාව දේව කැමැත්තට යොමු කරවීමය.

> **එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආකල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වනසේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරනසේක. උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශකරනසේක. (යොහන් 16:13-14)**

බයිබලය පවසන්නේ :

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙනයනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:14)**

දෙවියන්වහන්සේගේ දරුවකු වීමට (නැවත-උත්පාදනය ලැබ) සහ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මග පෙන්වනු ලැබීම අතර නියත සම්බන්ධතාවයක් පවතී. ජම්මික මනුෂ්‍යයා (නැවත -උත්පාදනය නොලැබූ) ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම නොලබයි. එයට හේතුව අළුත් උපතෙහි අත්දැකීම තුළින් ඔහු "ආත්මික මිනිසෙකු" බවට පත් වී නොමැති කමයි. එබැවින් ඔහු දෙවියන්වහන්සේගේ හඬ හඳුනා නොගනියි.

> **නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය: ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)**

ක්‍රියා පොතෙන් උපුටා ගත් පහත සඳහන් උදාහරණ මගින් ඇදහිලිවන්තයින්ගේ ජීවිතයෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වන ක්‍රමය විදහා දක්වා ඇත.

### පිලිප් :

පිලිප් නම්වූ සභාවෙහි උපස්ථායකයෙක්, ගාසාට යන කාන්තාර පාරෙහි දුටු අශ්ව රථයකට එකතුවන පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේ මගපෙන්වූ සේක.

> **එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට කථාකොට: නුඹ මේ රථය ළඟට ගොස් එක්වෙන්නැයි කීසේක. (ක්‍රියා 8:29)**

පිලිප් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මග පෙන්වීමට කීකරු විය. එහි ප්‍රතිඵලය වූයේ එම රටයෙහි ගමන් කරමින් සිටි ඉතියෝපියානු ජාතිකයා ගැළවීම ලබා වතුර බව්තීස්මය ලැබීමය.

## පේත්‍රුස්

පේත්‍රුස් හට කායිසාරියෙහි සිට පැමිණි මනුෂ්‍යයන් තිදෙනෙකු සමග යන ලෙසට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුට පැවසූ සේක.

පේත්‍රුස් කතාකොට :

> **ආත්මයාණන්වහන්සේද, ප්‍රභේදයක් නොකොට ඔවුන් සමග යන ලෙස මට අණකළසේක. (ක්‍රියා 11:12)**

පේත්‍රුස් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම හඳුනාගත්තේය. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුගේ ඇතුලාන්තයට කතාකොට දෙවියන්වහන්සේගේ කැමැත්ත එළිදරව්කර දුන් කල ඔහුට කිසි සැකයක් නොවීය. පේත්‍රුස් එකගවී කීකරු වීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස පලමු අන්තර්-සංස්කෘතිකමය සේවාවක් අන්‍යජාතීන් වෙතට සැපයුනි.

## පාවුල්:

පාවුල් බොහෝවිට ඔහුගේ ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ සේවාවෙහි කාල සටහන ශුද්ධාත්මයාණන්වහන්සේගේ සිහින් හඬට අනුකූලව වෙනස් කළේය.

> **ඔවුහු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සහ කළෝය; නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්සේක. (ක්‍රියා 16:7)**

පාවුල් මිසියට යාමට සැලසුම් කළේය, නමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහුව වෙනතකට යොමු කරවූසේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබහට දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට උපකාර කරන්නාවූ ආකාරය පිළිබඳ නිදර්ශන රාශියක් බයිබලයෙහි ඇත. ඉන් ඉහතින් දැක්වූයේ උදාහරණ තුනක් පමණි. යේසුස්වහන්සේ පොරොන්දු වූ පරිදි ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ගෙන එය ඔබට එළිදරව් කර දෙනු ඇත.

# ආත්මික පරිනතභාවය.

> **නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:2)**

ස්වාභාවික ලෝකයෙහි බිළිඳෙකු උපත ලද විට තම දෙමව්පියන්ගේ කටහඬ එම දරුවා හඳුනාගැනීමට නම්, ඔහු කිසියම් පරිණතබවකට පත්විය යුතුවේ. ආත්මික ලොවෙහිද මෙය සත්‍යයකි. ඔබ නැවත-උත්පාදනය ලැබූ අලුත දෙවියන්වහන්සේ ඔබට කතාකරන විට, එතුමාගේ හඬ ඔබ හඳුනා ගැනීමට නොහැකි වන්නට පුළුවනි. ඔබ මුලින්ම ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගත්විට, දෙවියන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කර දෙන විට ඔබට එය වටහාගත නොහැකි වන්නට පුළුවනි. එනමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ දිගටම ඔබහට දේව කැමැත්ත එළිදරව් කරදීමටත් ඔබව මගපෙන්වීම ලබාදීමටත් ක්‍රියා කරනු ඇත. ඔබ ආත්මිකව පරිණත වන කල ඔබ කෙමෙන් ඔබගේ ආත්මය තුළ මෙම හඬ හඳුනාගැනීමට පැමිණෙනු ඇත.

බයිබලය මෙහි ආත්මික හා ස්වාභාවික සමාන්තර බව පිළිබඳ පවසයි.

**ඉතින් කිරි බොන සෑමදෙනම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දෑඩි ආහාර ඕනෑවන්නේ යහපත සහ අයහපත විමසා බලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ තැනැත්තන්ටය. (හෙබ්‍රෙව් 5:13-14)**

මෙහි "කිරි" සහ "මස්" ලෙස නම් කර ඇත්තේ ලිඛිත දේව වචනයටය. ඔබ මුලින්ම නැවත-උපත ලබා ඉගෙනීමට ආරම්භ කිරීමේදී ලිඛිත දේව වචනයෙන් සරල සත්‍යයන් කිහිපයක් (කිරි) ඉගෙන ගත්තේය. ක්‍රමයෙන් ඔබ වර්ධනය වනවාත් සමගම දේව වචනයෙහි වඩා ගැඹුරු සත්‍යයන් (මස්) අවබෝධ කරගනු ඇත.

ඔබ දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය ඉගෙන ගැනීම දිගටම කරගෙන යාමෙහිදී ඔබගේ ආත්මික සංවේදීතාවය වර්ධනය වනු ඇත. ඔබහට නපුර සහ යහපත අවබෝධ කර ගැනීම සඳහා එය භාවිතා කළ හැකි වෙනු ඇත. එහි අරුත නම්, ඔබහට දෙවියන්වහන්සේගේ නිවැරදි මාර්ගයන් හා දේව කැමැත්ත ජීවිතයෙහි වැරදි මාර්ගවලින් වෙන් කර හඳුනා ගැනීමට හැකි වීමය. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය අධ්‍යයනය කිරීම ඔබහට වැදගත් වනුයේ එබැවිනි.

ඔබ ආත්මිකව පරිණත වීමත් සමගම තවදුරටත් ලෝකයෙහි ආකාරයට "සමාන" නොවී සිටිනු ඇත. මෙහි "සමානවීම" යනුවෙන් අදහස් කරනුයේ කිසියම් ප්‍රමිතියකට අනුව එම මෝස්තරයට හෝ හැඩයට අනුගත වීමය. ආත්මිකව පරිනත වූ විට ඔබ ලෝකයෙහි ප්‍රමිතීන් වලට අනුගත වීම වෙනුවට ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමානත්වයට අනුගත වනු ඇත.

ආත්මික පරිණතභාවය ඔබහට හැගීම්වලින් පරිනත වීමටද උපකාරී වේ. ඔබ හැගීම්වලින් පරිණතවී නොමැති නම්, වැදගත් තිරණ පවා තරහා ඇති වූ මොහොතක හෝ ආත්මානුකම්පාව නිසා වැරදි අයුරින් තිරණයකට එළැඹිය හැකිවේ. මෙහි ප්‍රතිඵල දිගු කාලීන හා විවිධ ක්ෂේත්‍රයන්හි භයානකව විහිදී ගිය බලපෑම් ගෙනදිය හැක.

ඔබ ආත්මිකව පරිනත වීමත් සමගම "ආත්මයාණන්වහන්සේගේ ඵල" ඔබ තුළ වර්ධනය වනු ඇත. එය ආත්මික පරිණතභාවයට සාක්ෂියක් ලෙසම හැගීම්වල පරිණත භාවයද ඇතිකරයි.

**නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම්-ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දේට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත. (ගලාති 5:22-23)**

## විපර්යාසය (අන්‍යාකාර ඇත්තෝ විම)

**නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:2)**

ආත්මික පරිණතභාවය ඔබව අවසානයෙහි වෙනස් වීමකට ලක්කරවයි. මෙය ඔබට දෙවියන්වහන්සේගේ හඬ ඇසීම පිණිස පෙර-අවශ්‍යතාවයන්ගෙන් එකකි. ස්වාභාවික මනුෂ්‍යයා (මිනිස් ස්වාභවය) කිරීමට ආශාවන දෙයත්, දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා ආශාවන දෙයත් වෙනස්ය. එබැවින් මේ දෙක අතර එනම් මාංශය (ස්වාභාවික මිනිසා) හා ආත්මය (ආත්මික මිනිසා) අතර ගැටුමක් හටගනී.

පාවුල් මෙම ගැටුම පිළිබඳ ලියමින්:

**මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි. නුඹලා කැමතිවන දේ නොකරන ලෙස මොව්හු එකිනෙකාට විරුද්ධවෙති. (ගලාති 5:17)**

දේව කැමැත්ත සම්පූර්ණ කිරීමේ කාරණා සම්බන්ධයෙන් මාංශය හා ආත්මය අතර නිරන්තර ගැටුමක් ඇතිබව පාවුල් හඳුනාගත්තේය. මෙය මනසෙහි ඇතිවන ගැටුමක් ලෙස ඔහු හඳුනාගත්තේය.

**නුමුත් මාගේ සිතේ ව්‍යවස්ථාවට විරුද්ධව යුද්ධකරන්නාවූ, මාගේ අවයව තුළ තිබෙන පාපයාගේ ව්‍යවස්ථාව යටතෙහි මා වහල්කමට පමුණුවන්නාවූ අන්‍ය ව්‍යවස්ථාවක් මාගේ අවයව තුළ තිබෙන බව මට පෙනේ. (රෝම 7:23)**

මේ නිසා ඔහු උනන්දු කරවූයේ :

**එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)** ලෙසටය.

නුඹලාගෙන් "ඉල්ලමි": යන පදයෙහි තේරුම බැගෑපත්වීම, යැදීම හා ආයාචනය ඇතුළත් වේ., "නුඹලාගේ ශරීර ජීවමාන යාගයක් කොට ඔප්පු කරන්න" යන වාක්‍යාංශයෙන් දෙවියන්වහන්සේට කිසිම වලක්වා ගැනීමකින් තොරව සම්පූර්ණ භාරවීමක් පෙන්නුම් කරයි.

යම් දෙයක් යාගයක් කොට පූජා කිරීම නම් එය සම්පූර්ණයෙන්ම අත් හැරීමකි. පැරණි ගිවිසුමට අනුව ව්‍යවස්ථාවෙහි පෙන්වාදී ඇති පරිදි දෙවියන්වහන්සේට කිසියම් යාගයක් පූජා කළ විට එය සම්පූර්ණයෙන්ම ගින්නෙන් දැවීමට හෝ පූජකවරුන් විසින් භාවිතා කරන පිණිස හෝ එම කරුණු දෙකම සඳහා මුළුමනින්ම භාර කරන ලදී. යාගය පූජා කළාවූ පුද්ගලයා හට ඉන්පසු පූජාව කෙරෙහි කිසිම අයිතියක් නොමැත.

අප දෙවියන්වහන්සේට භාරවීමද එලෙසම විය යුතුය. පරණ මනුෂ්‍යයා එනම් ආත්මාර්ථකාමී ස්වාභාවික ජීවිත ක්‍රමය, ලෝකයට හා මාංශයට මිය යා යුතුය. "අන්‍යාකාරවීම" යන්නෙන් අදහස් කරනුයේ එයයි. එනම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට වෙනස් වූ අලුත් ස්වරූපයකට මාරු වීමයි.

**මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි: (ගලාති 2:20)**

**තවද ක්‍රිස්තුස්වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමග කුරුසියෙහි ඇණගැසුවෝය. (ගලාති 5:24)**

**නුමුත් මාගේ ශරීරය දමනය කර වහල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයිලෙසකින්වත් මම එපාකරනු නොලබන පිණිසය. (1 කොරින්ති 9:27)**

**එබැවින් නුඹලා නුඹලාගේ මරණීයවූ ශරීරයේ තෘෂ්ණාවලට කීකරුවන ලෙස පාපය එහි අධිපතිකම් නොකෙරේවා. (රෝම 6:12)**

**එබැවින්, ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද ආත්මයේද සියලු කිලුටුකම්වලින් අපම පවිත්‍රකර ගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුක්තව, ශුද්ධකම සම්පූර්ණකර ගනිමු. (2 කොරින්ති 7:1)**

**එලෙසම නුඹලාත් පාපයට මැරී සිටින්නන් කොටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද සිතාගනිල්ලා. (රෝම 6:11)**

ඇත්ත වශයෙන්ම ශාරීරිකව යේසුස්වහන්සේ අත්දුටු අයුරින් කුරුසිපත් කිරීම අස්වාභාවික මරණයකි. එබැවින් තමකම උදෙසා නියම කර ඇති මරණයද කුරුසිපත් කිරීම, වීම කිසියම් අන්දමකින් සුවිශේෂී වේ. මිනිසාගේ මාංශික වූ ස්වභාවය කිසිවිටෙක ස්වාභාවිකව මිය යන්නේ නැත. එය ස්වෙච්ජාවෙන් මිය නොයයි. ස්වාභාවික ලෝකයෙහි කුරුසිපත් කිරීම බලහත් කාරයෙන් ඉටු කරන්නක් මෙන් මාංශයද බලහත් කාරයෙන් අල්ලා කුරුසිපත්කොට මරා දැමිය යුතුවේ.

රෝම 12:1-2 ට අනුව, එවැනි යටහත් භාරවීමකින් පසුව දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම පැමිණෙනු ඇත. ඔබට දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීමටත් දේව කැමැත්ත දැනගැනීමටත් අවශ්‍ය නම්, පළමුව යටහත් වී භාරවිය යුතුය. බොහෝ විට අපි මෙම ක්‍රියාදාමය කණපිට පෙරලා අපේක්ෂා කරමු. පළමුව අපට දේව කැමැත්ත දැනගැනීමටද ඉන්පසුව අපි එතුමාට යටත් වෙනවාද කියා තීරණය කිරීමට බලාපොරොත්තු වෙමු. නුමුත් රෝම 12:1-2 පෙන්වා දෙන්නේ භාරවීම යටත්වීම මුලින් පැමිණිය යුතු බවය.

අපි දේව කැමැත්ත සැමවිටම පිළිගත හැකිවුත්, යහපත් වුත් සම්පූර්ණවුත් එකක් බව නොදන්නා බැවින් උන්වහන්සේට යටහත්ව භාරවීමට මැලිවෙමු. අපි සම්පූර්ණයෙන්ම දෙවියන්වහන්සේට යටත්වී භාරවීමට බය වන්නේ මෙම මූලික පදනම අවබෝධ කරගෙන නොමැති කමිනි.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමීනවහන්සේ කියනසේක. (යෙරමියා 29:11)**

## මනස අලුත් කරගැනීම.

ඔබගේ මනස ස්වාභාවයෙන්ම ඔබ අවට ලෝකයෙහි පවතින මූලධර්ම වලට එකගතාවය දක්වයි. එසේ වීමට හේතුව නම් ඔබ තුළ ඇත්තාවූ මූලික පාපයෙහි ස්වභාවය වීමය. එසේම ඔබගේ සංස්කෘතියෙහි බලපෑම මතද එසේ සිදුවේ.

නමුත් දෙවියන්වහන්සේ පවසන්නේ මේ ලෝකයෙහි ආකාරයට සමාන නොවී අන්‍යාකාර ඇත්තෝ වීමටය. “අන්‍යාකාර ඇත්තෝ වීම” යනු අලුත් ස්වරූපයකට මාරුවීමකි. එම අලුත් ස්වරූපය සඳහා ආදර්ශය වනුයේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

> **අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව. (2 කොරින්ති 3:18)**

රෝම 12:2 ට අනුව වෙනස්වීම ඇතිවන්නේ ඔබගේ මනස අලුත් කර ගැනීමෙනි. එහි තේරුම නම් ඔබ ලෝකයෙහි ප්‍රමිතීන් හා ප්‍රතිපත්ති වලින් මිදී ලිඛිත දේව වචනයෙහි එළිදරව් කරදී ඇති ප්‍රතිපත්ති වලට එකගවිය යුතු බවය.

ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ මනස තුළ වර්ධනය කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෙක් වනු ඇත.

> **ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා. (පිලිප්පි 2:5)**

“තිබේවා” යන වචනයෙන් පෙන්නුම් කරනුයේ ක්‍රිස්තුස්වහන්සේගේ මනස ඔබ තුළ තබාගැනීම සඳහා ඔබ තෝරාගැනීමක් කළයුතු බවය. ඔබ මනස වෙනස් වීමට ඉඩ දිය යුතුය. වෙනස් වූ මනස වැඩි දියුණුකර ගැනීමේ වගකීම ඔබ සතුය. එය දෙවියන්වහන්සේ විසින් ඔබ උදෙසා ස්වයං-ක්‍රියව සිදුකරන්නාවූ දෙයක් නොවේ.

**ඉන්නිසා නුඹලාගේ සිත් නැමැති කටි බැඳගෙන සිහි ඇතුව සිට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී නුඹලා වෙතට පමුණුවනු ලබන්ට තිබෙන අනුග්‍රහය පිට නුඹලාගේ බලාපොරොත්තුව සම්පූර්ණලෙස පිහිටුවාපල්ලා. (1 පේතෘස් 1:13)**

සිත් “බැඳගෙන” යන්නෙන් අදහස් කරනුයේ ඔබගේ මානසික බලය ආරක්ෂාකරගෙන එයට වස්ත්‍රයක් අන්දවා මෙන් සුරැකීමය. මනස වෙනස් කිරීමට හා “බැඳගෙන” තබාගනීමට නම් එය දේව වචනයෙහි ගිල්වා තැබීම අවශ්‍ය වේ. ක්‍රිස්තුස්වහන්සේ තුළ තිබූ මනස කුමනාකාරදැයි දැනගැනීම පිණිස බයිබලය සොයා බලන්න. (මෙම පරිච්ඡේදයෙහි “තව දුරටත් අධ්‍යයනය” නම් කොටස ඔබට මේ සඳහා උපකාරී වේවි.)

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ව්‍යවස්ථාව ඔබගේ මනසෙහි තැන්පත් කරන විට ඔබගේ මනස වෙනස් වේ.

**එසේය, ඒ දවස්වලට පසු මා විසින් ඉශ්‍රායෙල් වංශය සමග කරන ගිවිසුම නම්: මාගේ ව්‍යවස්ථා ඔවුන්ගේ සිහියේ තබමින්, ඒවා ඔවුන්ගේ සිත්වලද ලියන්නෙමි. මම ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔවුහුද මාගේ සෙනඟක් වන්නෝය. (හෙබ්‍රෙව් 8:10)**

සියලු වැරදි සිතුවිලි හෙලා දමා ඒවා අල්ලා බැඳ තැබීමට ඔබගේ මනසෙහි ඇති බය පාවිච්චි කරන්න.

**අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස්වන්නාවූ සියලු දේවල්ද බිඳහෙළා, සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වහල්කරදෙමුව. (2 කොරින්ති 10:5)**

ඔබගේ සිතුවිලි පාලනය කිරීමට ඔබට වගකීමක් ඇත.

**ඉතින්, සහෝදරයෙනි, යම් පමණ දේ සැබෑද, යම් පමණ දේ ගරුකටයුතුද, යම් පමණ දේ සාධාරණද, යම් පමණ දේ පිරිසිදුද, යම් පමණ දේ ආදරණීයද, යම් පමණ දේ යහපත් කීර්තියක් ඇතිව තිබේද, යම් ගුණයක්, යම් ප්‍රශංසාවක් ඇද්ද, ඒ දේවල් මෙනෙහි කරපල්ලා. (පිලිප්පි 4:8)**

එවිට ඔබහට පාවුල් සමග මෙලෙස පැවසිය හැකිය.

**නුමුත් අපට ක්‍රිස්තුස්වහන්සේගේ සිත ඇත්තේය. (1 කොරින්ති 2:16)**

ක්‍රිස්තුස්වහන්සේගේ මනස දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම සඳහා අධිෂ්ඨානය කොටගෙන සැදී පැහැදී තිබිය.

# දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔප්පු කිරීම

පහත සඳහන් වගුව අධ්‍යයනය කරන්න. මෙම පරිච්ඡේදය පුරා සාකච්ජා කළාවූ සෑම පෙර-අවශ්‍යතාවයක්ම පාහේ රෝම 12:1-2 හි ඇතුළත්ව ඇති බව ඔබට පෙනී යයි.

**දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔප්පු කිරීම.**

| | |
|---|---|
| එබැවින් සහෝදරයෙනි...<br>දෙවියන්වහන්සේගේ දයාවන්<br>නිසා නුඹලාගෙන් ඉල්ලමි. | ඔබ දෙවියන්වහන්සේ වෙතට පැමිණෙන්නේ<br>ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාව තුළින්<br>අප වෙත යොමු වූ දයාව නිසාය. |
| නුඹලාගේ ශරීරයෙන් ජීවමාන වූ<br>ශුද්ධවූ දෙවියන්වහන්සේ විසින්<br>පිළිගත හැකිවූ යාගයක් කොට<br>ඔප්පු කරන හැටියට... | ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාවන් තුළින්<br>ආත්මික පරිණත බව ඔබගේ ජීවිතය තුළ<br>ඇතිකරනු ලැබේ. |
| නුඹලා මේ ලෝකයේ ආකාරයට<br>සමාන නොවී...සිත අලුත් කර<br>ගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. | වචනය මගින් වෙනස් කරනු ලැබ:<br>මනස අලුත් කර ගැනීම. |

අලුත් උපතේ අත්දැකීම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ වාසය කිරීම, ආත්මික පරිණතබව, මනස අලුත්කරගැනීම... මේ සියල්ල දේව කැමැත්ත දැනගැනීම කෙරෙහි ඇති සම්බන්ධතාවය කුමක්ද?

රෝම 12:1-2 ට අනුව ඒ සියල්ලම දේව කැමැත්ත දැන ගැනීම වෙතට යොමු කරවන්නාවූ "පෙර-අවශ්‍යතාවයන්ය"

> **නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:2)**

මෙහි "දැනගන්නා පිණිස" යන වචනයෙහි අරුත නම් තිරණය කිරීම, ඒ අනුව එකඟවීම හෝ කිසියම් දෙයක් පිළිබඳ නිසැක බව පලකිරීම යනාදි ලෙස වේ.

"දෙවියන්වහන්සේගේ කැමැත්ත" යන්නෙන් අර්ථවත් වනුයේ කුමක්ද? "යහපත් වූත්, පිළිගතහැකිවූත්, සම්පූර්ණවූත්, දේවල් මොනවාද? දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම නැතහොත් ඔප්පු කර පෙන්වීම වැදගත් වන්නේ ඇයි?

මෙවන් ප්‍රශ්නවලට පිළිතුරු අපි මීළග පරිච්ඡේදයෙහිදී සොයා බලමු.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. "පෙර-අවශ්‍යතා" යන වචනයෙහි තේරුම කුමක්ද?

3. දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම සඳහා තිබිය යුතු පෙර අවශ්‍යතා මෙම පාඩමෙහි දක්වා ඇති පරිදි මොනවාද?

4. දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම සම්බන්ධයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රධාන මෙහෙය කුමක්ද?

5. නැවත-උත්පාදනය ලැබීම යනු කුමක්ද?

6. දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීමට නැවත-උත්පාදනය ලැබීම අවශ්‍ය වනුයේ ඇයි?

7. ආත්මිකව පරිණත වීම යන්නෙහි අර්ථය කුමක්ද?

8. මෙම පරිච්ඡේදයෙහි භාවිතා කළ ආකාරයම "අන්‍යාකාර ඇත්තෝ වීම " අර්ථ දක්වන්න.

9. මෙම ප්‍රකාශය සත්‍යද අසත්‍යද? රෝම 12:1-2 ට අනුව දේව කැමැත්ත දැනගැනීමට පෙර යටත්වී බාරවීම සිදුවිය යුතුය. මෙම ප්‍රකාශයය. ______________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නව උපත හා ආත්මික පරිණත භාවය පිළිබඳ වැඩිදුර ඉගෙනීම සඳහා භාවස්ටයිම් ජයාතන්තර පාඨමාලාවෙහි *"ඇදහිල්ලේ පදනම්"* නම් පාඨමාලාව ලබාගන්න. ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය"* නම් පාඨමාලාව ලබා ගන්න.

2. මෙම පරිච්ඡේදයෙහි මනස අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වීම පිළිබඳ පැවසිය. ඇදහිලිවතුන්ට තිබිය **නොයුතු** යයි ශුද්ධ ලියවිල්ල පවසන මනස නම්:

| | |
|---|---|
| දැඩි වූ | දානියෙල් 5:20 |
| ජඩ | රෝම 1:28 |
| කාමුක | රෝම 8:6 |
| සැකසහිත | ලූක් 12:29 |
| අන්ධ වූ | 2 කොරින්ති 3:14; 4:1 |
| දූෂ්‍යවූ | 2 කොරින්ති 11:3 |
| මාංශික | එපීස 2:3; කොලොස්සි 2:18 |
| නිෂ්ඵලකම | එපීස 4:17 |
| භෞමික | පිලිප්පි 3:19 |
| නපුරු ක්‍රියා නිසා | |
| තනිකරන ලද | කොලොස්සි 1:21 |
| දෙබිඩි මනස | යාකොබ් 1:8;4:8 |
| පිලිකුල් වූ | තිතස් 1:15 |

3. ඇදහිලිවන්තයන්ගේ වෙනස් වූ මනස තිබිය යුතු ලෙස බයිබලය පෙන්වා දෙනුයේ :

| | |
|---|---|
| ආත්මික වූ | රෝම 8:6 |
| සූදානම්වූ | 1 පේතෘස් 5:2 |
| පවිත්‍ර | 2 පේතෘස් 3:1 |
| රැඳී පවතින්නාවූ | යෙසායා 26:3 |
| සාමකාමී | පිලිප්පි 4:7 |
| නැවුම්කරන ලද | එපීස 4:23 |
| යටහත් | කොලොස්සි 3:12 |
| නිවුන පහැදිලි මනසක් ඇති | තිතස් 2:6 |
| හික්මවනලද | 2 තිමෝති 1:7 |
| ප්‍රේමණීය | මතෙව් 22:37 |
| සේවක | රෝම 7:25 |
| නිසැකවූ | රෝම 14:5 |
| එක්සිත්වූ | 1 පේතෘස් 3:8;4:1; රෝම 15:6; 1 කොරින්ති 1:10 |
| අවංක සහ කැමැත්තෙන් සිටින | 1 ලේකම් 28:9 |
| වැඩකිරීමට හික්මවනු ලැබූ | නෙහෙමියා 4:6 |

# තුන්වන පරිච්ඡේදය.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත.

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- කටපාඩමින් ප්‍රධාන පදය ලිවීම.
- "කැමැත්ත" යන වචනය අර්ථ දැක්වීමට.
- අද දවසේ ලෝකයෙහි ක්‍රියාත්මක වන්නාවූ කැමැත්තේ ආකාර තුන හඳුනාගැනීමට.
- දේව කැමැත්තෙහි අර්ථ තුන පැහැදිලි කිරීමට.
- දේව කැමැත්ත කිරීම වැදගත් වීමට හේතු කාරණා දැක්වීමට.
- දේව කැමැත්ත කිරීම සඳහා නිවැරදි පෙළඹවීම හඳුනා ගැනීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. (යොහන් 6:38)**

## හැඳින්වීම.

අද දවසේ ලෝකයෙහි ක්‍රියාත්මක වන්නාවූ කැමැත්තේ ආකාර තුනක් මෙම පරිච්ඡේදය හඳුන්වා දෙයි. එසේම "දේව කැමැත්ත" යන්න අර්ථ දක්වයි: මේ ඇසුරින් යේසුස්වහන්සේගේ ජීවිතය විමසා බලා දේව කැමැත්තෙහි ඇති වැදගත් කම අවධාරණය කොට දක්වයි.

## "කැමැත්ත" යන්නෙහි අරුත.

සාමාන්‍ය පොදු ව්‍යවහාරයෙහි "කැමැත්ත" යනු කැමැත්ත පදනම් කරගෙන යමක් තීරණය කිරීම හෝ නිර්ණය කිරීමය. කැමැත්ත යනු තෝරා ගැනීමේ බලයයි. ලෝකයෙහි ක්‍රියාත්මක වන කැමැත්තෙහි ආකාර තුනකි.

**ස්ව-කැමැත්ත :**

මෙය නම් තමාගේම ආශාවට අනුව හැසිරෙන සාමාන්‍ය මිනිස් කැමැත්ත වන ආත්මාර්ථකාමී කැමැත්තය. ඔබ ඔබගේ ජීවිතයට මග පෙන්වාගන්නා කල ඔබ දෙවියන්වහන්සේගෙන් තොරව ඔබගේම කැමැත්තට රිසි පරිදි තෝරාගැනීම් කරයි.

ස්ව-කැමැත්ත පිළිබඳව බයිබලය අනතුරු අඟවයි.

> **ස්වාමින්වහන්ස මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත. (යෙරමියා 10:23)**

ස්ව-කැමැත්ත යනු මනුෂ්‍යයාගේ මාංශික ස්වභාවය ක්‍රියාත්මක කිරීමයි.

**දඬුවම යටතේ විනිශ්චය දවස දක්වා තබන්ටත් ස්වාමීන්වහන්සේ දන්නාසේක. භය නැත්තාවූ හිතුවක්කාරවූ මොව්හු උත්තමයන්ට නින්දා කරන්ට තැති නොගනිති.** (2 පේත්‍රුස් 2:10)

ස්ව කැමැත්තෙහි ප්‍රතිඵල බයිබලය වාර්තා කරයි.

**එහෙයින් ඔවුන් තමුන්ගේ මන්ත්‍රණවල හැසිරෙන ලෙස ඔවුන්ගේ සිත් දැඩි කමෙහි ඔවුන් අත්හැරියෙමි. (ගීතාවලිය 81:12)**

අද දවසේ ලෝකයෙහි ඇති පාපය, දුක්විදීම හා කරදර සියල්ලම මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ කැමැත්තට අකීකරුව ජීවත්වීමේ ඵල විපාකය වේ. දුෂ්ඨ මනුෂ්‍යයන්ගේ සිත් තුළ ක්‍රියාකරන ස්ව කැමැත්ත පිළිබඳව දාවිත් පවසයි.

**මාගේ එදිරිකාරයන්ගේ කැමැත්තට මා භාරනුදුන මැනව. මක්නිසාද බොරු සාක්ෂිකාරයෝද කෲරකමින් තර්ජන කරන්නෝ ද මට විරුද්ධ ව නැගිට සිටිති. (ගීතාවලිය 27:12)**

සභාවේ නායකයෝ ස්ව-කැමැත්තෙන් ක්‍රියාකරන අය නොවිය යුතු බව බයිබලය සඳහන් කරයි.

**මක්නිසාද නායකයා දෙවියන්වහන්සේගේ ගබඩාකාරයෙක්මෙන් නිදොස්වූ, හිතුවක්කාර නොවූ, නොකිපෙන්නාවූ, බේබද්දෙක් නොවූ, ගහගන්නෙක් නොවූ, නින්දිත ලාභයට ගිජු නොවූ, (තීතස් 1:7)**

**සාතන්ගේ කැමැත්ත :**

සාතන්ට කැමැත්තක් තිබේ. ඔහුගේ ආශාව නම් ඔබගේ ජීවිතයෙහි ඇති සියලුම යහපත් කාරණා විනාශ කර දැමීමය. යේසුස්වහන්සේ පේතෘස් හට මේ පිළිබඳව අනතුරු ඇගවූ සේක.

**සීමොන්, සීමොන්, බලව, නුඹලා ගෝධුම මෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. (ලූක් 22:31)**

සාතන්ට අවශ්‍යවනුයේ ඔබගේ ජීවිතයෙහි ඇති සියලුම යහපත් දෙය ඔබෙන් පොලා ඉවතලෑමටය. යේසුස්වහන්සේ පැවසුයේ:

**සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

පාවුල් පැවසුයේ සමහර ඇදහිලිවතුන් සාතන්ගේ කැමැත්තට අසුවී ඇති බවය.

**ඔහුගේ මලපතෙන් මිදෙන පිණිසද, දෙවියන්වහන්සේ ඔවුන්ට පසුතැවිල්ල දෙනසේක්දෝයි බලමින් මෘදුකමින් ඔවුන්ට තරවටුකරන්ට ඕනෑය.** (2 තිමෝති 2:26)

## දෙවියන්වහන්සේගේ කැමැත්ත.

ලෝකයෙහි ක්‍රියාත්මක වන තුන්වන කැමැත්ත නම් දෙවියන්වහන්සේගේ කැමැත්තය. අපගේ අධ්‍යයනයෙහි විෂය මෙය වේ.

## දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි අර්ථය.

අලුත් ගිවිසුම මුලින්ම ලියන ලද්දේ ග්‍රීක භාෂාවෙනි. ග්‍රීක භාෂාවෙන් "කැමැත්ත" යන්න දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්බන්ධව පවසන කල භාවිතා කර ඇති වචන දෙකකි.

එක් වචනයක් නම් "බුලේමා" (boulema) වේ. දෙවියන්වහන්සේගේ සර්වබලධාරී කැමැත්ත ඉන් ප්‍රකාශවේ. මුළු විශ්වයෙහි සිදුවන සෑම දෙයක් සඳහාම උන්වහන්සේගේ කලින් නියමකර තිබූ සැලැස්ම එයට ඇතුළුවේ. මෙම දේව කැමැත්ත ඔබගේ තෝරාගැනීම මත රැඳී නොපවතී. එය නිතැතින්ම කලින් නියම කර තිබූ ලෙසම ඉටුවේ. එය ලෝකය උදෙසා දෙවියන්වහන්සේගේ ප්‍රධාන මූලික සැලැස්ම වේ.

දෙවියන්වහන්සේගේ "බුලේමා" කැමැත්ත සඳහා මනුෂ්‍යයාගේ සහයෝගය අවශ්‍ය නොවේ. "බුලේමා" දේව කැමැත්තෙහි ප්‍රතිඵල කලින් තීරණය වී හමාරය. "බුලේමා" දේව කැමැත්ත දේව වචනයෙහි ලියා ඇති අතර එය ඉතා පැහැදිලිය. එබැවින් මේ සඳහා දේව කැමැත්ත සෙවීමට අවශ්‍ය නොවේ. මන්ද එය දේව වචනයෙහි එළිදරව් කර දී ඇති බැවිනි.

අනෙක් වචනය නම් "තෙලේමා" (thelema) වන අතර ඉන් ප්‍රකාශ වනුයේ මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි ජීවත්වීම හා අත්දැකීමට උන්වහන්සේගේ ආශාවය. මෙහි සඳහන් වන්නේ එක් එක් කාන්තාව හා පුරුෂයෙකු උදෙසා එතුමා සතු දේව සැලැස්මය. දෙවියන්වහන්සේ හට ඔබගේ ජීවිතය තුළ මෙම "තෙලේමා" දේව කැමැත්ත සම්පූර්ණ වීමට නම් ඔබගේ සහයෝගයද අවශ්‍ය වේ. දෙවියන්වහන්සේ හට ඔබගේ ජීවිතය තුළ මෙම "තෙලේමා" දේව කැමැත්ත අනුව ඔබගේ ජීවිතය හසුරනවාද නැතිද යන වග තෝරාගැනීමේ බලය ඔබ සතුය. අපි දේව කැමැත්ත සෙවීම පිළිබඳව කථාකිරීමේදී, අප සඳහන් කරනුයේ මෙම "තෙලේමා" කැමැත්ත, එනම් ඔබ එක් එක්කෙනා උදෙසා එතුමාගේ සැලසුම්කරන ලද කැමැත්තය.

දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි තවත් අකාරයක් නම් දෙවියන්වහන්සේගේ "සදාචාරාත්මක" කැමැත්තය. මෙය ඇදහිලිවන්තයන් හැසිරිය යුතු ආකාරය ලිඛිත දේව වචනයෙහි එළිදරව් කරදී ඇති අණ පනත් මගින් පෙන්වාදී තිබේ. දේව වචනයෙහි එළිදරව් කර දී ඇති දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක නීති කිසිවිටක එතුමාගේ සර්වබලධාරී කැමැත්ත සමග හෝ මනුෂ්‍යයාට ඇති පුද්ගලික කැමැත්ත සමග ගැටුම් ඇති නොවේ.

පහත සඳහන් වගුව "දේව කැමැත්ත" යන්නෙහි විවිධ පැහැදිලි කරදීම් සාරාංශ කොට දක්වයි.

**"දේව කැමැත්තෙහි" අර්ථ තුන.**

| **සර්වබලධාරී (බුලේමා)** | **පුද්ගලයකු සඳහා (තෙලේමා)** | **සදාචාරාත්මක.** |
|---|---|---|
| විශ්වය උදෙසා දෙවියන්වහන්සේගේ කලින් නියමකරනලද සැලසුම | එක් එක් පුද්ගලයා උදෙසා දෙවියන්වහන්සේ සැලසුම් කර ඇති සවිස්තරාත්මක සැලසුම | දේව වචනයෙහි එළිදරව් කර දී ඇති පරිදි විශ්වාස කොට ජීවත්විය යුතු ක්‍රමය උගන්වා ඇත. |
| මනුෂ්‍යයා ගන්නාවූ තීරණ මත කිසිදු බලපෑමක් සිදු නොවේ. | මනුෂ්‍යයා ගන්නාවූ තීරණ මත බලපෑමක් ඇතිවේ. | දෙවියන්වහන්සේගේ පුද්ගලයෙකු සඳහා දේවකැමැත්ත නිරතුරුවම එතුමාගේ සදාචාරාත්මක කැමැත්ත හා එකගව පවතී. |

# යේසුස්වහන්සේ සහ දේව කැමැත්ත.

යේසුස්වහන්සේගේ මිහිපිට සේවාවෙහිදී ප්‍රධානතම සැලකිල්ල වූයේ දේව කැමැත්තය. උන්වහන්සේ ප්‍රකාශකළේ :

> **මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේ මට දුන් සියල්ලෙන් කිසිවක් නැතිවෙන්ට නැර මා විසින් අන්තිම දවසේදී එය නැගිටුවීමය. (යොහන් 6: 38,39)**

දේව කැමැත්ත වූයේ කාන්තාවන් හා පුරුෂයින් දෙවියන්වහන්සේ සමග නිවැරදි සම්බන්ධතාවයකට රැගෙන ඒමය.

> **මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. (යොහන් 6:38)**

> **මක්නිසාද මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත නම්, පුත්‍රයාණන් බලා, ඔහු කෙරෙහි අදහන්නාවූ සැමදෙනම සදාකාල ජීවනය ලැබීමය; මමද අන්තිම දවසේදී ඔහු නැගුටුවන්නෙමියි කීසේක. (යොහන් 6:40)**

ක්‍රිස්තුස්වහන්සේගේ ජිවිතයෙහි පරමාර්ථය වූයේ දේව කැමැත්ත ඉටු කිරීමය. දරුවෙකු වශයෙන්ද උන්වහන්සේ දේව කැමැත්ත පිළිබඳව සැලකිලිමත් වූසේක. යේසුස්වහන්සේ දේව මාළිගාවෙහි නැවති සිටියදී උන්වහන්සේ සොයමින් දෙමව්පියන් පැමිණි කල උන්වහන්සේ ඔවුනට පැවසුයේ :

> **එවිට උන්වහන්සේ: නුඹලා මා සෙවුවේ මක්නිසාද? මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි මා සිටින්ට ඕනෑ බව නුඹලා දැන සිටියේ නැද්දැයි ඔවුන්ට කීසේක. (ලූක් 2:49)**

උන්වහන්සේගේ ආත්මික ශක්තියෙහි රහස රැදී පැවතියේ දේව කැමැත්ත ඉටු කිරීම තුළය.

> **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනන්වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

යේසුස්වහන්සේගේ ජිවිතයෙන් හා සේවයෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ කිරීම පිළිබඳ දැක්වූ සැලකිල්ල මෙම පදයෙන් හෙළි වේ.

ක්‍රිස්තුස්වහන්සේගේ මිහිපිට සේවයෙහි දක්නට ලැබුණාවූ බලය දේව කැමැත්ත හා බැදී පැවතිනි.

> **මට තනියම කිසිවක් කරන්ට නුපුළුවන. මම අසන පරිද්දෙන්ම විනිශ්චය කරමි. මාගේ විනිශ්චය ධර්මිෂ්ඨය; මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත සොයමි. (යොහන් 5:30)**

ක්‍රිස්තුස්වහන්සේගේ වචන සහ ක්‍රියා එතුමාගෙන්ම නොවේ. උන්වහන්සේ කතාකළේත් ක්‍රියාකළේත් පියාණන්ගේ කැමැත්ත අනුවය:

> **එහෙයින් යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: මාගේ ඉගැන්වීම මාගේ නොව මා එවූ තැනන්වහන්සේගේය. (යොහන් 7:16)**

> **... නුඹලා අසන වචනය මාගේ නොව මා එවූ පියාණන්වහන්සේගේය. (යොහන් 14:24)**

**එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා මනුෂ්‍ය පුත්‍රයා එසවූ කල, මා ඔහුම බවත් මාගේම කැමැත්තෙන් මා කිසිවක් නොකර මාගේ පියාණන්වහන්සේ මට ඉගැන්වූ ලෙස මේ දේවල් කියන බවත් නුඹලා දැනගන්නවා ඇත. (යොහන් 8:28)**

**... මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත සොයමි. (යොහන් 5:30)**

යේසුස්වහන්සේ කුරුසිපත් කරනු ලැබ මිය යෑමට මුහුණ පෑ අවස්ථාවෙහි පවා උන්වහන්සේ යාච්ඤා කර සිටියේ :

**"උන්වහන්සේ මදක් ඉස්සරහට ගොස් මුහුණින් වැටී: අහෝ මාගේ පියාණෙනි, මේ කුසලාන මා කෙරෙන් පහවෙන්ට පුළුවන් නම් එසේ වේවා. එසේවී නුමුත් මා කැමතිලෙස නොව ඔබ කැමතිලෙස වේවයි කියා යාච්ඤා කළසේක." (මතෙව් 26:39)**

දෙවියන්වහන්සේගේ කැමැත්ත තමා මිය යෑම නම්, ක්‍රිස්තුස්වහන්සේ මිය යාමට පවා කැමැත්තෙන් සිටිසේක. දෙවියන්වහන්සේගේ සර්වබලධාරී සදාචාරාත්මක හා පුද්ගලික සම්පූර්ණ කැමැත්තට එකහෙලාම එකගවූ ඒ අනුව ක්‍රියාකළාවූ හොඳම ආදර්ශය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේමය.

## දේව කැමැත්තෙහි වැදගත්කම.

දේව කැමැත්ත වැදගත් වනුයේ :

### එය ඔබගේ සදාකාලික ඉරණම තීරණය කරන බැවිනි:

ඔබගේ සදාකාලික ඉරණම රැඳී පවතිනුයේ දේව කැමැත්ත ඉටු කිරීම මතය. ඔබගේ ජීවිතය මුදා ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ සැලැස්මට ඔබ සුබදායි ලෙස ප්‍රතිචාර දැක්විය යුතුය.

**මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය, පාර අවහිරය, ඒක සම්බවන්නේ ස්වල්ප දෙනෙකුටය. (මතෙව් 7:14)**

**ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමිනි, ස්වාමිනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය. (මතෙව් 7:21)**

**ලෝකයත් ලෝකයේ තෘෂ්ණාවත් පහවයන්නේය. නුමුත් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන්නා සදාකාලේටම පවතින්නේය. (1 යොහන් 2:17)**

### එය ඔබ දෙවියන්වහන්සේ සමග ඇති සම්බන්ධතාවයෙහි පදනම වේ:

ඔබ යේසුස්වහන්සේ හට දක්වන්නාවූ සම්බන්ධතාවය එතුමාගේ කැමැත්ත කිරීම මත පදනම් වී ඇත.

**මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමැත්ත කරන කවරෙක් නුමුත් මාගේ සහෝදරයාත් සහෝදරීත් මෑණියොත්යයි වදාළ සේක. (මාර්ක් 3:35, සහ මතෙව් 12:50 බලන්න)**

## එමගින් මගපෙන්වීම ලබාදෙයි:

ඔබහට ඔබටම මගපෙන්වා ගත නොහැකි බැවින් දේව කැමැත්ත ඉතා වැදගත් වේ.

> **ස්වාමීන්වහන්ස මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත. (යෙරමියා 10:23)**

ඔබගේම පියවර ඔබහට මගපෙන්වා ගැනීමට ඇති හැකියාව මදිය. දෙවියන්වහන්සේ ඔබව මග නොපෙන්නුවහොත් ඔබගේම මාවතේ ගොස් දෙවියන්වහන්සේගේ සැලැස්මෙන් ඉවතට යා හැකිය.

> **අපි සියල්ලෝම බැටළුවන් මෙන් මුළාවී, එකිනෙකා තම තමාගේම මාර්ගයට හැරී ගියෙමුව; ස්වාමීන්වහන්සේද අප සියල්ලන්ගේ අයුතුකම උන්වහන්සේ පිට තැබූසේක. (යෙසායා 53:6)**

## එය අනාගතය පිළිබඳ දැනුම ලබාදෙයි:

ඉදිරි අනාගතය පිළිබඳ දැනුම ඇති එකම තැනැත්තා දෙවියන්වහන්සේ පමණකි. ඔබව අල්ලා ගැනීමට සාතන් තබා ඇති උගුල් උන්වහන්සේ දන්නා සේක. උන්වහන්සේ අනාගත ආර්ථික හා දේශපාලන තත්වය දන්නා සේක. අනාගතයෙහි ඔබහට සිදුවීමට යන සෑම දෙයක්ම උන්වහන්සේ දන්නා සේක.

> **පුරාණයේ පළමු කාරණා සිහිකරපල්ලා. මක්නිසාද මමම දෙවියන්වහන්සේය, වෙන කෙනෙක් නැත; මම දෙවියන්වහන්සේය, මා සමාන කෙනෙක් නැත. මම වනාහි අන්තිමය මුල පටන්ද තවම සිද්ධනුණු දේ පුරාණයේ පටන් දන්නාවූ මාගේ මන්ත්‍රණ පවත්නේය කියාත් මාගේ මුළු කැමැත්ත ඉෂ්ට කරන්නෙමියි කියාත් කියන්නාවූ තැනන්වහන්සේය. (යෙසායා 46:9-10)**

මනුෂ්‍යයා හට වර්තමානයෙහි ක්‍රියාකළ හැකි අතර අතීතය ආවර්ජනය කළ හැක. ඔහුට අනාගතය සැලසුම් කිරීමටද පුළුවන. එහෙත් අනාගතය පිළිබඳව ඇත්තට දැනුමක් තිබෙන්නේ දෙවියන්වහන්සේට පමණකි.

සමහර මනුෂ්‍යයෝ, සාතන්ට අනාගතය පිළිබඳ දැනුවත් කමක් තිබේයයි සිතති. එහෙත් සාතන් හට එවැනි දැනුමක් නොමැත. සාතන් අනාගතය පිළිබඳව දැන සිටියා නම් යේසුස්වහන්සේගේ කුරුසිපත් කිරීම කිසිම අයුරකින් පොළඹවන්නේ නැත. ඔහුට අනාගතය පිළිබඳව යම් දැනුමක් තිබුණානම්, මෙම කුරුසිපත්වීමේ ක්‍රියාව තුළින් පාපයට මිදීමක් ලැබීම යථාර්ථයක් වන බව දැනගන්නට තිබුණි. සාතන් දන්නේ අනාගතය පිළිබඳව දෙවියන්වහන්සේගේ එළිදරව් කිරීමට කැමතිවන තොරතුරු ප්‍රමාණය පමණකි. සාතන් තමාගේ සදාකාලික ඉරණම පාතාලය බව දනී. මන්ද දෙවියන්වහන්සේ එය එළිදරව් කරදී ඇති බැවිනි.

## ඔබ එය දැනගන්නා ලෙස අණ කොට තිබේ:

දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම වැදගත් වන්නේ ඔබ එය දැනගත යුතු බවට ආඥා කොට තිබෙන බැවිනි.

> **මේ නිසා නුඹලා අනුවණයෝ නොවී, ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම්ගනිල්ලා . (එපීස 5:17)**

> **මනුෂ්‍යයන් සතුටු කරන්නන් මෙන් පෙනීමට වැඩ නොකොට, ක්‍රිස්තුස්වහන්සේගේ දාසයන් මෙන් සිතින් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරපල්ලා. (එපීස 6:6)**

ඔබ දෙවියන්වහන්සේට දෙන්නාවූ පූජාවට හෝ ප්‍රශංසාවට වඩා එතුමාගේ කැමැත්තට ඔබ කීකරුවීම උන්වහන්සේ ආශාකරන සේක.

**සාමුවෙල්ද: ස්වාමින්වහන්සේගේ හඬට කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග පූජාවලටත් ස්වාමින්වහන්සේ ප්‍රසන්න වනසේක්ද? පූජාවට වඩා කීකරුවීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන්දීමත් හොඳය. මක්නිසාද කැරළිකාරකම පේනකීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමටත් සමානය... (1 සාමුවෙල් 15:22-23)**

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි සම්පූර්ණවත්, පරිපූර්ණවත් නැගී සිටීම දක්නට එතුමාට අවශ්‍යය.

**නුඹලාගෙන් එක්කෙනෙක්වූ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ දාසයෙක්වූ එපප්‍රස් නුඹලාට ආචාරකරන්නේය: නුඹලා දෙවියන්වහන්සේගේ මුළු කැමැත්තෙහි සම්පූර්ණව නිසැකව සිටින පිණිස ඔහු යාච්ඤාවලින් නුඹලා ගැන නිතරම වීර්යකරන්නේය. (කොලොස්සි 4:12)**

## දේවධර්මය පිළිබඳ නිවැරදි මතයක් ඉන් ඇතිවේ:

යේසුස්වහන්සේ පැවසුවේ:

**යමෙක් උන්වහන්සේගේ කැමැත්ත කරන්ට කැමති නම්, ඔහු ඒ ඉගැන්වීම දෙවියන්වහන්සේගෙන් වූ ඉගැන්වීමක්ද නොහොත් මා විසින් උපදවා කියනවාදැයි දැනගන්නේය. (යොහන් 7:17)**

ඔබහට එළිදරව් කරදී ඇති පරිදි ඔබ දේව කැමැත්ත ඉටු කළහොත්, එවිට ඔබ නිවැරදි දේව ධර්මය විනිශ්චය කර දැනගත හැකි ආත්මික පරිණත භාවයට වර්ධනය වනු ඇත. එමගින් වැරදි ඉගැන්වීම් මගින් ඔබව රැවටීමට ලක්වීම වළක්වයි.

## එහි ප්‍රතිඵලයක් ලෙස යාච්ඤාවලට පිළිතුරු ලැබේ:

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව ජීවත් වන කල ඔබ හට නිසැක කමින් යුතුව යාච්ඤා කළ හැකි අතර ඔබගේ යාච්ඤාවට පිළිතුරු ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

**තවද අපි උන්වහන්සේගේ ආඥා රක්ෂාකරමින් උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දේ කරන බැවින් අපි උන්වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමුව. (1 යොහන් 3:22)**

**දෙවියන්වහන්සේ පව්කාරයන්ගේ බස් නොඅසන බවත් යමෙක් දෙවියන්වහන්සේට නමස්කාරකරන්නෙක්ව උන්වහන්සේගේ කැමැත්තකරන්නේ නම් ඒ අයගේ බස් අසන බවත් අපි දනිමුව. (යොහන් 9:31)**

**උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. (1 යොහන් 5:14)**

## එය ආත්මික ආශිර්වාද ගෙන දෙයි:

ඔබ දේව කැමැත්ත කළහොත් ආත්මික ආශිර්වාද ඔබ සතු වන බවට පොරොන්දු වී තිබේ.

**මක්නිසාද දෙවියන්වහන්සේගේ කැමැත්ත කළ පසු පොරොන්දුව ලබන පිණිස නුඹලාට ඉවසිල්ල ඕනෑය. (හෙබ්‍රෙව් 10:36)**

ඇත්තෙන්ම ආශිර්වාද ඔබව සොයාගෙන ඒවි.

**"තවද මා විසින් අද නුඹට අණකරන නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ සියලු ආඥා රක්ෂාකරන්ට බලාගන්න ලෙස උන්වහන්සේගේ හඬට ඕනෑ කමින් කන්දෙන්නෙහි නම් නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ නුඹ උසස් කොට තබනසේක. නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේගේ හඬට නුඹ කන්දෙන්නෙහි නම් මේ සියලු ආශිර්වාද නුඹ කරා පැමිණ නුඹ සමග වන්නේය." (ද්විතිය කථාව 28:1-2)**

## එය ඔබට දඬුවම් විඳීමෙන් වැලකී සිටීමට උපකාරීවේ:

හික්මවීම (දඬුවම) ලෙස මෙහි සඳහන් වන්නේ විනයානුකූල කිරීම, නිවැරදි කරනු ලැබීම, දොස් තැබීම යනාදියයි. දෙවියන්වහන්සේගේ එළිදරව් කරදී ඇති කැමැත්තට, ඕනෑකමින් පිටුපා යන අයට හික්මවීමට යටත්කිරීම කරනු ලැබේ.

**"නුමුත් මා විසින් අද නුඹට අණ කරන නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ සියලු ආඥාද පණත්ද පවත්වන්ට බලාගන්න හැටියට නුඹ උන්වහන්සේගේ හඬට කන් නොදෙන්නෙහිනම්, මේ සියලු ශාප නුඹ පිට පැමිණ නුඹ අසුකර ගන්නේය." (ද්විතිය කථාව 28:15)**

**ඇරත් පුත්‍රයාන්ට මෙන් නුඹලාට කියන අවවාද වචනය නුඹලා මතකනැතිකළහුය. ඒ කවරද යත්: මාගේ පුත්‍රය, ස්වාමීන්වහන්සේගේ දඬුවම සුළු නොකරන්න, උන්වහන්සේගෙන් තරවටු ලබන කල ක්ලාන්ත නොවන්න; මක්නිසාද ස්වාමීන්වහන්සේ ප්‍රේමකරන අයට උන්වහන්සේ දඬුවම් කරනසේක, උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට තළනසේක යනුයි. නුඹලා ඉවසන්නේ දඬුවම් පිණිසය; දෙවියන්වහන්සේ පුත්‍රයන්ට මෙන් නුඹලා කෙරෙහි ක්‍රියාකරනසේක; මක්නිසාද පියා දඬුවම් නොකරන පුත්‍රයා කවුද? එහෙත් සියල්ලන් ලබන දඬුවමට නුඹලා පංගුකාරයෝ නොවන්නහු නම්, නුඹලා පුත්‍රයෝ නොව අවජාතකයෝය. තවද අපට දඬුවම්කළාවූ මාංසයේ පියවරු අපට සිටියෝය. අපි ඔවුන්ට ගෞරවකළෙමුව. ඊට බොහෝ වැඩියෙන් අප විසින් ආත්මවල පියාණන්වහන්සේට යටත්ව ජීවත්වෙන්ට යුතු නොවේද? (හෙබ්‍රෙව් 12:5-9)**

යේසුස්වහන්සේ අනතුරු හැගවූයේ :

**තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගත් සූදානම් නොකළාවූ, ඔහුගේ කැමැත්ත ලෙස නොකළාවූ, දාසයා බොහෝ පහර ලබන්නේය. (ලූක් 12:47)**

අධික ජීවනය අත්විඳීමට සහ හික්මවනු ලැබීමෙන් වැලකී සිටීමට කැමති පුද්ගලයන් හට දේව කැමැත්ත දැන ක්‍රියා කිරීම බරපතල කරුණකි.

## එයින් සාර්ථක බව ගෙනදෙයි :

යෝෂුවා ඉශ්‍රායෙල් ජාතියෙහි නායකත්වයට පත්වූ පසුව ඔහුට මුලින්ම ලැබූ උපදෙස් වලින් එකක් නම් දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂාකිරීමටත්, උන්වහන්සේගේ මාර්ගයෙහි හැසිරීමටත්ය. යෝෂුවා මෙය ඉටු කළහොත් ඔහුට නිසැක ලෙසම ලැබෙන බවට සහතික වූ දෙය නම්:

**මේ ව්‍යවස්ථා පොත නුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභ සිද්ධවන්නේය. (යෝෂුවා 1:8)**

දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි හැසිරෙන මනුෂ්‍යයා සාර්ථක වන බව "ඔහු අත තබන සියල්ල සඵලවත් වන බවත්" (ගීතා 1:3) ගීතාවලියෙහි වාර්තාවේ. අසමත්වීම් හා පරාජයෙන් පිරි ලොවෙහි සඵලවත් ජීවිතයකට රහස නම් දේව කැමැත්ත දැනගෙන එය ඉටු කිරීමය.

# නිවැරදි පෙලඹවීම

ඔබ දේව කැමැත්ත කිරීමට පෙළඹවිය යුත්තේ එතුමා කෙරෙහි ඔබ තුළ ඇති ආදරයයි. අපි යමකට ආදරය කරන කල ආදරයට භාජනය වූ පුද්ගලයා ප්‍රසන්න කිරීමට ආශාවෙමු.

**නුඹලා මට ප්‍රේම කරනවා නම් මාගේ ආඥා රක්ෂාකරන්නහුය. (යොහන් 14:15)**

**යමෙක් මාගේ ආඥා පිළිගෙන රක්ෂාකෙරේද, මට ප්‍රේමකරන්නේ ඔහුය. මට ප්‍රේමකරන්නා මාගේ පියාණන් විසින් ප්‍රේමකරනු ලබන්නේය, මමද ඔහුට ප්‍රේමකොට ඔහුට ප්‍රකාශවන්නෙමියි කීසේක. (යොහන් 14:21)**

**යේසුස්වහන්සේ ඔහුට උත්තරදෙමින්: යමෙක් මට ප්‍රේමකරන්නේ නම්, ඔහු මාගේ වචනය රක්ෂාකරන්නේය. මාගේ පියාණන්වහන්සේද ඔහුට ප්‍රේමකරනසේක. අපි ඔහු ළඟට ඇවිත් ඔහු සමග වාසය කරමුව. (යොහන් 14:23)**

## ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

_______________________________________________

2. දේව කැමැත්ත ඉටු කිරීම සඳහා නිවැරදි පෙලඹවීම කුමක්ද?

_______________________________________________

3. දේව කැමැත්ත කිරීම වැදගත් වීමට හේතු 10 ක් නම් කරන්න.

_______________ _______________ _______________

_______________ _______________ _______________

_______________ _______________ _______________

_______________

4. "කැමැත්ත" යන පදය අර්ථ දක්වන්න. _______________________

5. දෙවියන්වහන්සේගේ කැමැත්ත යන්නෙහි අර්ථ තුන නම් කරන්න.

_______________________________________________

6. අද දවසෙහි ලෝකයෙහි ක්‍රියාත්මක වන්නාවූ කැමැත්තෙහි ආකාර තුන මොනවාද?

_______________________________________________

7. පහත සඳහන් ප්‍රකාශ කියවන්න. ප්‍රකාශනය සත්‍යය නම් **ස** යන්නද අසත්‍ය නම් **අ** යන්නද ප්‍රකාශනය ඉදිරියෙන් සටහන් කරන්න.

අ.______________ යේසුස්වහන්සේ දේව කැමැත්ත ඉටු කිරීම පිළිබඳ සැලකුවේ නැත.

ආ.______________ මනුෂ්‍යයා හට තමාගේම නිවැරදි මග යොමුවීමට ඇති හැකියාව මද බව බයිබලය පෙන්වා දෙයි.

ඇ.______________ සමහර අවස්ථාවලදී පුද්ගලයෙකු සඳහා දෙවියන්වහන්සේගේ කමැත්ත දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක කැමැත්තට එකඟ නොවේ.

ඈ.______________ අනාගතය පිළිබඳ සම්පූර්ණ දැනීම ඇත්තේ දෙවියන්වහන්සේට පමණකි.

ඉ.______________ ඔබගේම ස්වයං-කැමැත්තෙහි හැසිරෙමින් ඔබට මහත් ආත්මික ආශිර්වාද අත් විඳිය හැකිවේ.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දේව කැමැත්ත කෙරෙහි ප්‍රේරිත පාවුල් මහත් අවධානය යොමු කළේය. පහත සඳහන් පද අධ්‍යයනය කරන්න. ක්‍රියා 16:6-10; රෝම 1:10; 15:32; 1 කොරින්ති 1:1; 4:19, 16:7; 2 කොරින්ති 1:1; එපීස 1:1; කොලොස්සි 1:1; 2 තිමෝති 1:1.

2. මෙම පරිච්ඡේදයෙහි :දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි අර්ථ තුන නම් වගුව අමතර බයිබල් පද ඇතුළත් කොට විස්තර කර දක්වා තිබේ. දෙවියන්වහන්සේගේ සර්වබලධාරී, පුද්ගලයෙකු සඳහා සහ සදාචාරාත්මක කැමැත්ත වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා මෙම බයිබල් පද අධ්‍යයනය කරන්න.

| "දේව කැමැත්තෙහි" අර්ථ තුන. | | |
|---|---|---|
| **සර්වබලධාරී (බුලේමා)** | **ඒක පුද්ගල (තෙලේමා)** | **සදාචාරාත්මක.** |
| විශ්වය උදෙසා දෙවියන්වහන්සේගේ කලින් නියමකරනලද සැලසුම | එක් එක් පුද්ගලයා උදෙසා දෙවියන්වහන්සේ සැලසුම් කර ඇති සවිස්තරාත්මක සැලසුම | දේව වචනයෙහි එළිදරව් කර දී ඇති පරිදි විශ්වාස කොට ජීවත්විය යුතු ක්‍රමය උගන්වා ඇත. |
| මනුෂ්‍යයා ගන්නාවූ තිරණ මත කිසිදු බලපෑමක් සිදු නොවේ. | මනුෂ්‍යයා ගන්නාවූ තිරණ මත බලපෑමක් ඇතිවේ. | දෙවියන්වහන්සේගේ ඒක පුද්ගල දේව කැමැත්ත නිරතුරුවම එතුමාගේ සදාචාරාත්මක කැමැත්ත හා එකගව පවතී. |
| රෝම 11:33-36<br>ක්‍රියා 2:23<br>ක්‍රියා 4:27-28<br>රෝම 9:19<br>හිතෝපදේශ 16:33<br>එපීස 1:11<br>එළිදරව් 4:11<br>හිතෝපදේශ 21:1<br>දානියෙල් 4:35 | උත්පත්ති 24<br>හිතෝපදේශ 16:9<br>ගීතාවලිය 32:8<br>හිතෝපදේශ 3:5-6<br>එපීස 5:17<br>එපීස 6:6<br>රෝම 12:2<br>කොලොස්සි 1:9<br>කොලොස්සි 4:12 | උදාහරණ:<br>2 කොරින්ති 6:14<br>රෝම 2:18<br>1 තෙසලෝනික 5:18<br>1 තෙසලෝනික 4:3<br>(ලිඛිත දේව වචනයෙහි අන්තර්ගත අන් සියලුම පොරොන්දු එකතු කරගන්න.) |

# හතරවන පරිච්ඡේදය

## වැරදි දිශාවට යොමු වීම

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- කටපාඩමින් ප්‍රධාන පදය ලිවීමට
- මග පෙන්වීම ලබාගැනීම සඳහා භාවිතා කරන බයිබලීය නොවන ක්‍රම හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ සැබෑ අනාගතවක්තෲවරු හා බොරු අනාගතවක්තෲවරු අතර වෙනස හඳුනාගැනීම
- "අනුකරණය" යන පදය අර්ථ දැක්වීමට කළ හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

**ස්වාමීන්වහන්ස, මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යයාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත. (යෙරමියා 10:23)**

### හැඳින්වීම

යමක් හරිහැටි කරන ක්‍රමය දැන සිටීම තරමටම යමක් නොකර සිටින ක්‍රමය දැන සිටීම වැදගත් වේ.

අමෙරිකා එක්සත් ජන පදයෙහි විසූ ශ්‍රේෂ්ඨ ගවේශකයෙකු වූ තෝමස් එඩිසන් විදුලිය සොයා ගැනීමට සාර්ථක වීමට පෙර පරීක්ෂණ 1,000 කට වඩා සිදුකළේය. ඔහු මෙසේ අසමත් වූ වාර කාලය හා ශ්‍රමය අපතේ යාමක් සේ සලකා දුක්වෙනවාදැයි කෙනෙක් ඔහුගෙන් විමසූ කල, ඔහු දුන් පිළිතුර වූයේ "අපොයි නැත යනුය. "මම විදුලිය ජනනය **නොවන** ක්‍රම දහසකට වඩා සොයාගත්තෙමි" යන්න ඔහුගේ පිළිතුර විය. අනාගතයෙහිදී, ක්‍රියාත්මක නොවන ක්‍රම භාවිතා කරමින් කාලය නාස්ති කිරීමට ඔහුට අනවශ්‍ය විය.

ඔබගේ ජීවිතය උදෙසා මගපෙන්වීම සඳහා භාවිතා **නොකළ** යුතු ලෙසට දෙවියන්වහන්සේ අවවාද කර ඇති ක්‍රම බයිබලයෙහි සඳහන් වේ. ඔබ මෙම අනතුරු ඇඟවීම් වලට ඇහුම්කන් දෙනවා නම්, දෙවියන්වහන්සේ අනුමත නොකරන, බයිබලීය නොවන ක්‍රම භාවිතයෙන් කාලය නාස්ති කොට මග පෙන්වීම නොසොයනු ඇත. මෙමගින් ඔබ වැරදි තීරණ ගැනීමෙන් හා වැරදි දිශාවකට යොමුවීමෙන් වළක්වා ගත හැකිය.

අනෙකුත් පරිච්ඡේද වලදී අතීතයෙහිදී දෙවියන්වහන්සේ තම කැමැත්ත මනුෂ්‍යයන්ට එළිදරව් කළ ආකාරයත් ඔවුන්ට කථා කළ ආකාරයත් ඉගෙන ගනු ඇත. එහෙත් පළමුව අපි වැරදි මත ඉවත් කර යුතුය. ඔබ මගපෙන්වීම සෙවිය යුතු නැති ක්‍රම-මේවාය.

### ගුප්ත බලවේග

ගුප්ත බලවේග යටතෙහි සාතන්ගේ විවිධාකාර ක්‍රියාකාරකම් සිදුකරන්නාවූ කණ්ඩ රාශියක් ඇත. මෙම ක්‍රියාකාරකම් බොහෝ විට මගපෙන්වීම් ලබා ගැනීම් සඳහා යොදාගනී. රටින් රටට ගුප්ත බලවේග භාවිතා වන ක්‍රමය වෙනස් විය හැක. එනමුත් සමස්ථයක් ලෙස යන්ත්‍ර මන්ත්‍ර, යකැදුරු, මායාකාරීන්, ජේන

කියන්නෝ, විජ්ජාකරුවෝ, සාස්තරකියන්නෝ, නක්ෂස්ත්‍රකරුවෝ, හඳහන්, තේ කොළ කියවීම්, වීදුරු බෝල, කාඩ් වර්ග, අත බලා පලාපලකීම් යනාදිය මෙයට ඇතුළත් වේ. ගුප්ත බලවේග ඇසුරින් කෙරෙන සියලුම ක්‍රියාකාරකම් අධිස්වභාවික සම්බන්ධකම් ඇති නමුත් ඒවා දෙවියන්වහන්සේගෙන් නොවේ. එවන් ක්‍රියාකාරකම් සාතන්ගේ පෙලඹවීමෙන් සිදුකරන දේවල් වේ.

දෙවියන්වහන්සේ තම ජනතාවට ගුප්ත ක්‍රියාවල් සමග ගනුදෙනු නොකරන ලෙස අනතුරු ඇඟවූසේක. ද්විතිය කතාවෙහි 18:9-14 සහ නික්මයාම 22:18 හි ඔබට මෙම අවවාද කියවා දැනගත හැකිය.

මායාකාරකම්වලට විජ්ජා, යන්ත්‍ර මන්ත්‍ර, නක්ෂත්‍රය, වූඩෝ, අණ වින, කොඩිවින, බන්ධන, තොවිල් සහ මත් ද්‍රව්‍ය භාවිතය ඇතුළත් වේ. එයට ඒ හා සමාන සියලු යක්ෂයන් සමග ගනු දෙනු හා නමස්කාර ක්‍රම ඇතුළත්ය. මායාකාර ක්‍රියා ඇතුළු සාතන්ගේ සියලු ඇදහිලි වන්දනා ක්‍රම දෙවියන්වහන්සේට එරෙහිව මුරණ්ඩුකාරකමය.

> **මක්නිසාද, කැරලිකාරකම ජේනකීමේ පාපයටත් මුරණ්ඩුකම දේවතාවන් රූප ඇදහීමටත් සමානය... (1 සාමුවෙල් 15:23)**

මායාකාරයෝ මනුෂ්‍යයන්ව ශුභාරංචියෙන් ඉවතට හැරවීමට උත්සාහ දැරූ බව බයිබලය වාර්තා කරයි.

> **නුමුත් මායාකාර යන අර්ථ ඇති එලිමස් නම් තැනැත්තේ අධිපතියා ඇදහීමෙන් ඉවතට හරවාගන්ට අදහස්කරමින්, ඔවුන්ට විරුද්ධව සිටියේය. (ක්‍රියා 13:8)**

මායාකාරකම මනුෂ්‍යයන්ව රවටයි :

> **...තිගේ මායමින්ද සියලු ජාතිහු රැවටුණෝය. (එළිදරව් 18:23)**

මයාකාරයෝ ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝය :

> **"...පිටත සිටින්නෝ නම්..මායම්කාරයෝද.." (එළිදරව් 22:15)**

සාතන්ගේ ක්‍රියාවන් භාවිතා කරන අයගේ අවසානය කෙබඳුවේදැයි එළිදරව් පොත හෙළි කරයි :

> **"නුමුත්...මායාකාරයන්ටත්...ගින්නෙනුත් ගෙන්දගම්නුත් දැවෙන විලෙහි තමුන්ගේ කොටස වන්නේය." (එළිදරව් 21:8)**

දෙවියන්වහන්සේගේ සැබෑ දරුවෝ මොනම කාරණයක් නිසාවත් මගපෙන්වීම ලැබීමට හෝ වෙනයම් හේතුවකට සාතන්ගේ ක්‍රියාකාරකම් සමග සම්බන්ධ විය යුතු නැත.

## අහඹු සිදුවීම් යොදාගැනීමේ ක්‍රමය.

පැරණි ගිවිසුමෙහි කිසියම් කාරණයක් සම්බන්ධයෙන් මගපෙන්වීමක් සොයාගැනීමට දාදු කැට දැමීමේ ක්‍රමය භාවිතා විය. මෙම ක්‍රමයේ භාවිතය පිළිබඳව ලෙවී කතාව 16:7-10, ගණන් 26:55; 27:21 සහ යෝෂුවා 18:10 හි කියවිය හැක.

දාදු දැමීම අවදානමක් ගැනීමේ ක්‍රමයකි. මෙහිදී සම්මතය වූයේ දාදු කැටය පාලනය කිරීම දෙවියන්වහන්සේ කරන බවත් එහි ප්‍රතිඵලය විශ්වාස කටයුතු බවත්ය. දාදු දැමීම නූතන යුගයේ කැට දමීම හෝ කාසියක් උඩ දැමීම හා සමානය.

පැරණි ගිවිසුම් යුගයේ දාදු දැමීමේ ක්‍රමය මගින් මගපෙන්වීම සෙවීම පිළිගත් ක්‍රමයක් විය. අලුත් ගිවිසුමෙහි මෙම ක්‍රමය ඇදහිලිවතුන් භාවිතා කළේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමට පෙර පමණකි. යුදස් විසින් යේසුස්වහන්සේ පාවාදීමෙන් පසුව සියදිවි හානි කරගැනීම නිසා හිස්වූ ප්‍රේරිත තැන පිරවීමට යේසුස්වහන්සේගේ ගෝලයෝ තවත් කෙනෙකු සෙවූහ. එම තනතුර සඳහා නාම යෝජනා දෙකක් ලැබී තිබුණි.

> **ඔවුන් ගැන පස ඇට දැමුවෝය. එවිට පසඇටය මත්තියස්ට වැටුණේය. ඔහු ප්‍රේරිතයන් එකොළොස්දෙනා සමග ගණන්ගන්නා ලද්දේය. (ක්‍රියා 1:26)**

යුදස්ගෙන් හිස් වූ තැන පිරවීමට තෝරාගන්නාවූ මත්තියස් පිළිබඳව අලුත් ගිවිසුමෙහි ඉන්පසු කිසිම වාර්තාවක් සඳහන් නොවේ. සැබවින්ම ප්‍රේරිතයන් මධ්‍යයෙහි අඩුව පිරවූයේ පාවුල්ය. මත්තියස් දාදු දැමීමෙන් මනුෂ්‍යයෝ විසින් තෝරාගත් පුද්ගලයා විය. ප්‍රේරිත වූ පාවුල් ශුද්ධාත්මයාණන්ගේ කැමැත්ත පරිදි දෙවියන්වහන්සේගේ තේරීම විය.

ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමෙන් පසුව (ක්‍රියා 2 වාර්තාවන පරිදි) මගපෙන්වීම ලබාගැනීම සඳහා ඇදහිලිවන්තයෝ තවදුරටත් දාදු දැමීමේ ක්‍රමය භාවිතා නොකළහ. මෙම පැරණි ගිවිසුම් ක්‍රමය ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම මගින් පිරවිනි. එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත තීරණය කිරීම පිණිස අහඹු සිදුවීම් ක්‍රමය ඔබ කිසිවිටක භාවිතා නොකළ යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැනගෙන ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මග පෙන්වනු ලැබිය යුතුය.

## ලොම් මිටිය

දේව කැමැත්ත තීරණය කිරීම සඳහා "ලොම් මිටියක්" භාවිතා කිරීමේ එකම එක සිද්ධියක් පැරණි ගිවිසුමෙහි සඳහන් වේ. විනිශ්චයකාරයා පොතේ 6:36-40 දක්වා ගිඩියොන් ලොම් මිටිය භාවිතා කිරීමේ කතාව කියවා දැනගත හැකිය.

දෙවියන්වහන්සේගේ ගිඩියොන්ට කතාකොට උන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කළසේක. උන්වහන්සේ පැවසූ දෙය සනාථ කරන පිණිස ගිඩියොන් ලෝම මිටියක් වත්තේ දැමීය. එක් දවසක් ඔහු දෙවියන්වහන්සේට පැවසූවේ ලෝම මිටිය හැර ඒ වටා භූමිය පින්නෙන් තෙමන ලෙසය. ඊළඟ දින ලෝම මිටිය පිට පිනි වැස්සෙන ලෙසත් අවට භූමිය වියළිව තබන ලෙසත් ගිඩියොන් ඉල්ලීය.

තම ජාතිය මහත් අර්බුදයකට මුහුණ දී සිටින්නාවූ අවස්ථාවක ගිඩියොන් පිට මහත් වගකීමක් පැවරී තිබූ විටක ගිඩියොන් ක්‍රියා කළ ආකාරයට අපටත් ක්‍රියා කරන ලෙස බයිබලයෙහි කිසිම තැනක ඇදහිලිවතුන්හට උපදෙස් දී නොමැත. දාදු කැට දැමීමේ ක්‍රමය මෙන් මෙම ක්‍රමයද භාවිතා කර ඇත්තේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැගිරීමට පෙරය. "ලොම් භාවිතය" පාවිච්චි කර ඇත්තේ එකම එක් වරක් පමණකි.

අප දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීමට "ලොම් මිටි" පිටත දැමීමේ ක්‍රමය භාවිතා නොකළ යුතුය. නූතන යුගයේ "ලොම් මිටි" දැමීම සාමාන්‍යයෙන් සිදුකරනුයේ "මෙන්න මේක සිදුවුනොත් එය දෙවියන්වහන්සේගේ කැමැත්ත බව මම දන්නවා" කීමය. එහෙත් බොහෝ විට භාවිතා කරන දෙය ස්වාභාවිකව වුවද සිදුවිය හැකි දෙයකි.

"ලොම් මිටියක්" මගින් එක් වතාවක් පමණක් දේව කැමැත්ත සෙවීමේදී ගිඩියොන් දෙවියන්වහන්සේගේ හඬ කලින්ම අසා දේව කැමැත්ත දැනගෙන සිටියෝය. ලොම් මිටිය භාවිතා කළේ දැන සිටි දෙය සනාථ කරගැනීමට පමණකි. යා යුතු මග දැනගැනීමට නොවේ. එසේම ඔහු ඉල්ලූ දෙය සිදුකළ හැකි වූයේද අති සුවිශේෂී පුදුමයක් මගින් පමණකි.

අලුත් ගිවිසුම කාලයේ යොහන් බව්තීස්තගේ උපත පිළිබඳ දෙවියන්වහන්සේ දුන් පණිවුඩය ස්ථිර කරන පිණිස සලකුණක් දෙන්නැයි සෙකරියස් ඉල්ලා සිටි කල ඔහු ගොළු විය. මෙයට හේතුව වූයේ දෙවියන්වහන්සේ ඔහුට කතා කළ විට ඔහු විශ්වාස නොකොට සලකුණක් සෙව්මය. (ලූක් 1:18-20)

යේසුස්වහන්සේ පැවසුයේ "නපුරු වූ කාම මිත්‍යාචාරිකවූ පරම්පරාවක් ලකුණක් සොයයි" (මතෙව් 12:39) කියාය. "ලොම් මිටිය" පිටත දැමීම දෙවියන්වහන්සේ එළිදරව් කර දී ඇති දේ ඉටු කිරීමට අකමැති බව හෝ අවිශ්වාසයෙහි සලකුණක් විය හැකිය. ස්වාභාවික ක්‍රම මගින් පිළිතුරු ලැබිය හැකි "ලොම් මිටි" භාවිතය රැවටිලි සහගත මෙන්ම වැරදි මගපෙන්වීමක් විය හැකිය.

සමහර අවස්ථාවලදී තමුන් කළ යුතු දෙය දැනගැනීම පිණිස කිසියම් සනාථ කිරීමේ සලකුණක් දෙන ලෙස හෝ "ලොම් මිටි" ක්‍රමය හෝ ඉල්ලා සිටි අයට දෙවියන්වහන්සේ කාරුණිකව පිළිතුරු දී තිබේ. එනමුත් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ශුද්ධවන්තයෝ තම ජීවිතවලදී මගපෙන්වීම ලැබීම සඳහා මෙවන් ක්‍රම භාවිතා නොකළහ. මතක තබාගන්න...දෙවියන්වහන්සේට අවශ්‍ය ඇදහිල්ලේ මනුෂ්‍යයෝ මිස "ලොම් මිටි" දමන අය නොවේ. උන්වහන්සේට අවශ්‍යවන්නේ උන්වහන්සේ කතාකරන විට එය එතුමාගේ හඬ බව දැනගන්නාවූ කාන්තාවන් හා පුරුෂයන්ය. එම හඬ දෙවියන්වහන්සේගේ බව තහවුරු කරගැනීමට පරීක්ෂාකර බැලීමට අවශ්‍ය නොවන ආකාරයේ මනුෂ්‍යයන්ය.

## බොරු අනාගතවක්තෘවරු

බයිබලයෙහි දෙවියන්වහන්සේගේ බොහෝ අනාගතවක්තෘවරු පිළිබඳ කතා වාර්තා වෙයි. දෙවියන්වහන්සේ සභාවෙහි නායකයන් ලෙස අනාගතවක්තෘවරු නමින් හැඳින්වෙන කොටසක් පත් කර තිබෙන බවත්, ශුද්ධාත්ම දීමනාවක් වන අනාගතවක්‍ය පැවසීමේ දීමනාව පිළිබඳවත් විස්තර සපයා දෙයි. (එපීස 4:11, සහ 1 කොරින්ති 12:10)

"අනාගතවාක්‍ය පැවසීම" යනු දෙවියන්වහන්සේගේ විශේෂ මගපෙන්වීම යටතෙහි කතාකිරීමය. එය නම් දෙවියන්වහන්සේගේ දෙන ලද පණිවුඩය රැගෙන එතුමාගේ ජනතාව වෙතට ආලේපලත් ප්‍රකාශ කිරීමක් ලෙසින් එවෙලෙහිම එම පණිවුඩය කීමට හැකි විශේෂ හැකියාවකි. දෙවියන්වහන්සේගේ දිව්‍යමය මගපෙන්වීම යටතේ අනාගතවක්තෘවරයෙකු විසින් ප්‍රකාශ කරන වචන අනාගතවාක්‍යය ලෙසට හැඳින්වේ. අනාගතවාක්‍ය පැවසීම නම් විවෘත ආකාරයේ කෙනෙකු දිරිගැන්වීමට, උද්යෝගිමත් කිරීමට සහ සහනය ලබාදීමට හැකි වචන ප්‍රකාශ කිරීමය.

> **නුමුත් ධර්මවාක්‍ය පවසන්නා වර්ධනයවීමද දැනමුතුකමද සැනසීමද පිණිස මනුෂ්‍යයන්ට කථාකරන්නේය. (1 කොරින්ති 14:3)**

අනාගතවාක්‍යය කිසිවිටක දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය ඉවත් කොට ඒ තැනට පත් නොවේ. බයිබලය පවසන පරිදි අනාගතවාක්‍යය පහව් ගිය හැකි නුමුත් දෙවියන්වහන්සේගේ වචනය සදාකාලයටම පවතින්නේය. (1 කොරින්ති 13:8 සහ 1 පේත්‍රුස් 1:25)

පැරණි ගිවිසුමෙහි ශුද්ධාත්මයෙන් පූර්ණත්වය තවමත් මනුෂ්‍යයන් වෙත ප්‍රදානය කර නොතිබූ බැවින් මනුෂ්‍යයෝ මග පෙන්වීම ලබාගැනීම සඳහා අනාගතවක්තෘවරු වෙත ගියහ. දැන් කාලයේ ආත්මික මග පෙන්වීම ලැබීම සඳහා අනාගතවක්තෘවරු සොයා යාම අවශ්‍ය නොවේ. මෙය දැන් ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ ඉටු කරන්නාවූ එක් කාර්යයකි. සෑම ඇදහිලිවන්තයෙකුම දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් මග පෙන්වනු ලැබීමට ඉගෙන ගත යුතුය.

අලුත් ගිවිසුමෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවෙන් පසුව ඇදහිලිවන්තයෝ මගපෙන්වීම සෙවීමට අනාගතවක්තෘවරු සොයාගිය බව සඳහන් නොවේ. එහෙත් තවමත් අනාගතය තහවුරු කිරීමට දෙවියන්වහන්සේ මෙම දීමනාව පාවිච්චි කරනවා ඇත. එවැනි උදාහරණයක් පිළිබඳව ඔබහට ක්‍රියා

21:1-14 හි කියවිය හැකිය. අගබස් පාවුල් හට පෞද්ගලික වූ අනාගත වාක්‍යයක් දුන්නේය. එය විශේෂයෙන්ම පාවුල් සඳහා විය.

පාවුල් ඒ වනවිටත් ඔහු උදෙසා යෙරුසලමෙහිදී සිදුවීමට යන දෙය දැන සිටියේය. අනාගතවාක්‍යය සිදුවීමට යන දෙය සනාථ කළා පමණකි. එම අනාගතවාක්‍යය පාවුල්හට යෙරුසලමට යන්නට හෝ නොයන්නට කියා මග පෙන්වීමක් නොවීය.

ලෝකයෙහි බොරු අනාගතවක්තෘවරු සිටින බවට බයිබලය අනතුරු දක්වයි. (මතෙව් 2:11, 24: මාර්ක් 13:22). මේ නිසා සැබෑ අනාගතවක්තෘවරු හඳුනාගැනීම සඳහා මාර්ග දෙවියන්වහන්සේ සපයා දී තිබේ. බයිබලයේ පවසන පරිදි:

> **එහෙයින් අපට දෙනලද අනුග්‍රහය ලෙස වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ අනාගතකීම නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණයට අනාගත වචන කියමු. (රෝම 12:6)**

"ඇදහිල්ලේ ප්‍රමාණයට" යන්නෙහි අර්ථය නම් ඇදහිල්ලට නිවැරදි සම්බන්ධතාවයක් අනුවය. සැබෑ අනාගතකීම් හඳුනාගැනීමට ක්‍රමය නම් එය බයිබලය සමග එකගතාවයෙන් යුක්තද යන්න සොයා බලීමය.

බයිබලය ප්‍රකාශ කරන්නේ :

> **ධර්මවාක්‍ය කියන්නෝ දෙදෙනෙක් නොහොත් තුන්දෙනෙක් කථා කරත්වා, අනික් අය විමසාබලත්වා. (1 කොරින්ති 14:29)**

අනාගත වාක්‍යය විමසා බැලීමට යයි අපට කියා තිබේ. විමසා බැලීමට මිනුම් දණ්ඩ නම් දේව වචනයයි.

බොරු අනාගතවක්තෘවරු හඳුනාගැනීමට දෙවියන්වහන්සේ බොහෝ ක්‍රම ඉදිරිපත් කොට තිබේ. බොරු අනාගතවක්තෘවරු පවසන දෑ සිදු නොවන බැවින් ඔවුන්ව පහසුවෙන් හඳුනාගත හැක.

> එහෙත් කියන්ට මා විසින් අණ නොකළ වචනයක් මාගේ නමින් හිතුවක්කාරකමින් කථා කරන්නාවූ නොහොත් අන් දෙවිවරුන්ගේ නාමයෙන් කතා කරන්නාවූ අනාගතවක්තෘ කෙනෙක් වේ නම් ඒ තෙමේ මරනු ලබන්නේය. ඉදින් ස්වාමින්වහන්සේ නොකී වචනය අපි කෙසේ දනිමුදැයි නුඹේ සිතින් කියන්නෙහිනම්,- අනාගතවක්තෘ ස්වාමින්වන්සේගේ නාමයෙන් කථාකරනදේ ඉෂ්ටනොවන්නේ නම්, නොපැමිණෙන්නේ නම්, ඒ වනාහි ස්වාමින්වහන්සේ නොකී කාරණයය. ඒ අනාගතවක්තෘතෙම ඒක හිතුවක්කාරකමින් කිවේය, ඔහුට භයනොවන්නැයි මට කීසේක. (ද්විතිය කථාව 18:20-22)

බොරු අනාගතවක්තෘවරුන් හඳුනාගනීමට ඔබට උපකාර විය හැකි තවත් ක්‍රම ඉගෙනීමට පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.

බොරු අනාගතවක්තෘවරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය ප්‍රකාශ නොකරති :1 යොහන් 4:1-3

බොරු අනාගතවක්තෘවරු බොරු දේව ධර්ම උගන්වති. : 2 පේත්‍රුස් 2:1-3

බොරු අනාගතවක්තෘවරු මනුෂ්‍යයාව දේව වචනයට කීකරුවීමෙන් වලක්වා තබති : ද්විතිය කථාව 13:1-5

බොරු අනාගතවක්තෘවරු මනුෂ්‍යයන්ව ආශ්චර්යමත් ලකුණු මගින් රවටති : මතෙව් 24:11-24

බොරු අනාගතවක්තෘවරු බොරු ප්‍රකාශන කරති : මතෙව් 24 :23-24

ඔවුන් ඵල මගින් ඔවුන්ගේ වැරුද්ද පෙන්වා දේවි : බොරු අනාගතවක්තෘවරු හා සැබෑ අනාගතවක්තෘවරු අතර වෙනස පහසුවෙන් වටහාගැනීමට ඔවුන්ගේ ජීවිත රටාව නිරීක්ෂණය කර බලන්න. කෙනෙකුගේ ඵල වලින් ඔබට ඔවුන්ව හඳුනාගත හැකිවේයැයි බයිබලය පවසයි. බොරු අනාගතවක්තෘවරු තම ජීවිතයෙහි ආත්මික ඵල දරණ බව පෙන්නුම් නොකරයි : මතෙව් 7:16

ලෝකයෙහි බොරු අනාගතවක්තෘවරු සිටින බැවින් ඔබ අනාගතවාක්‍යය පිළිගැනීමෙහිදී ප්‍රවේසමෙන් එය කළයුතුය. බොහෝ විට ඇදහිලිවතුන්ව මගපෙන්වීමට හා පාලනය කිරීමට අනාගතකීම් වැරදි අයුරින් භාවිතා කර තිබේ. ඔබහට පෞද්ගලිකව අනාගතකීමක් ලැබුනහොත් එය ලිඛිත දේව වචනය හා සමග සසඳා බලන්න. එය නිවැරදි නම්, ලිඛිත දේව වචනය හා එකගතාවයක් තිබිය යුතුයි. මගපෙන්වීමක් පිළිබඳව අනාගතකීම් යම් දෙයක් සනාථ කිරීමට මිස කෙනෙකු දිශාවකට යොමු කිරීමට හෝ පාලනයට භාවිතා නොකළ යුතුය.

ආත්මික දීමනා වැරදි අන්දමින් භාවිතා කිරීම නිසා සමහර ඇදහිලිවන්තයෝ මෙය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරති. ඔව්හු අනාගත පැවසීමේ දිව්‍යමය දීමනාව පිළිනොගනිති. දීමනාව භාවිතා කළාවූ මිනිසුන් කිහිප දෙනෙක් එය මාංශිකව භාවිතා කිරීම දුටු පමණින් ඔබ ශුදධාත්මයාණන්වහන්සේගේ සේවය ප්‍රතික්ෂේප නොකළ යුතුය.

## වැරදි උපදේශනය

වෙන කෙනෙකු උදෙසා දේව කැමැත්ත තීරණය කිරීමට කිසිම මනුෂ්‍යයෙකුට නොහැක. එසේ කළ හැක්කේ නියත ලෙසම බයිබලයෙහි එළිදරව් කරදී ඇති විෂයන් පිළිබඳව පමණකි. උදාහරණයක් ලෙස : සියලුම මනුෂ්‍යයන් පසුතැවිලිවීම දේව කැමැත්ත බව අපි දනිමු. මන්ද එය ශුද්ධ ලියවිල්ලෙහි හෙළිකර තිබේ.

දේව භක්තික නායකයන් විසින් ඇදහිලිවතුන් හට ලබාදෙන ආත්මික උපදේශන ඔවුන්ගේ ජීවිත වලට මගපෙන්වීම ලබා දීමෙහිදී සුවිශේෂී ස්ථානයක් හිමිකරගනී. එහෙත් ශුද්ධ ලියවිල්ලෙහි පැහැදිලිව ලිඛිතව සඳහන් කර නැති කාරණා සම්බන්ධයෙන් වෙන කෙනෙකු උදෙසා දේව කමැත්ත තීරණය කිරීමට හෝ එම පුද්ගලයාව පාලනය කිරීමට කිසිම උපදේශකවරයෙකුට අයිතියක් නැත.

ප්‍රේරිත වූ පාවුල් යෙරුසලමට යායුතු බව දැඩිව තීරණය කර තිබූ කල කායිසාරියෙහි සිටි ඔහුගේ මිත්‍රයෝ ඔහුව යෙරුසලමට යෑමෙන් වැලැක්වීමට උත්සාහ දැරුවෝය. එහිදී ඔහුට සිදුවිය හැකි භයානක දේ පිළිබඳව ඔව්හු අනතුරු ඇඟවූහ. එහෙත් පාවුල් එම අවවාද අනුශාසනා සියල්ල ප්‍රතික්ෂේප කොට යෙරුසලමට ගිය විට ඔව්හු ඔහුගේ තීරණය පිළිගත්තෝය. ඒ පිළිබඳව මෙසේ පැවසූහ. එනම් :

> **ඔහු එකග නුවූකළ; ස්වාමීන්වහන්සේගේ කැමැත්ත වේවයි කියමින් අපි නැවතුණෙමුව. (ක්‍රියා 21:14)**

ඔව්හු පෞද්ගලිකව පාවුල් යෙරුසලමට යාම පිළිබඳ අකමැති වුවත්, පාවුල් ඔහු උදෙසා දේව කැමැත්ත සෙවිය යුතු බව ඔව්හු වටහා ගත්තෝය.

ඔබම ඔබ උදෙසා දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට, දැනගැනීමට පැමිණීම වැදගත්ය. ඔබගේ ජීවිතයට මග පෙන්වීම සඳහා අනුන් කෙරෙහි විශ්වාසය රඳවා සිටීමට ඔබට නොහැක. මන්ද මනුෂ්‍යයන්ව රැවටීමට අපේක්ෂා කරන්නාවූ දුෂ්ඨ ආත්ම ලෝකයෙහි සිටින බැවිනි. අපට අවවාද කර ඇත්තේ :

> **ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන්දැයි පරීක්ෂාකරපල්ලා. (1 යොහන් 4:1)**

ඔබට වෙන පුද්ගලයෙකුගෙන් උපදේශනයක් ලැබුණ විට, දේව කැමැත්ත නිශ්චිත කර ගැනීමට භාවිතා කරන අනෙක් ක්‍රම මගින් එම පණිවුඩය පරීක්ෂා කර බැලිය යුතුය. මෙම අධ්‍යයනයෙහි වෙනත් පරිච්ඡේදයකදී අපි එම විෂය සවිස්තරව ඉගෙන ගන්නෙමු.

## අනුකරණය

ගලාති 5:20 හි මාංශයේ ක්‍රියා ලැයිස්තුවට අයත් ක්‍රියාවක් ලෙස අනුකරණය ඇතුළත් කර තිබේ. මාංශයේ ක්‍රියා නම් දෙවියන්වහන්සේ ප්‍රසන්න නොවන්නාවූ විවිධ පාපිෂ්ඨ ක්‍රියාවන්ය.

අනුකරණය යනු අනෙක් අයව කොපි කිරීම ඔවුන් හා සමාන වීමට හෝ ඔවුනට ඉහළින් නැගී සිටීමට ඇති ආශාවයි. එය තරගකාරීත්වයේ ආත්මයෙන් ආරම්භ වේ. එහි ඊර්ෂ්‍යාවද අන්තර්ගතව පවතී. සමහර ඇදහිලිවන්තයෝ තමුන් උදෙසා දේව සැලැස්ම සොයා බලා දැනගන්නේ නැතිව වෙනත් අයගේ සාර්ථක සේවාවන් අනුකරණය කරති. ඇදහිලිවතුන් දෙදෙනෙකුට එකම සේවාව නොමැත. ශුද්ධාත්මයාණන්වහන්සේ මනුෂ්‍යයන්ව නියත වූ සුවිශේෂී සේවාවන් සඳහා කැඳවන සේක.

> **ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායැයි කීසේක. (ක්‍රියා 13:2)**

ඇදහිලිවතුන්හට විවිධ වූ ආත්මික දීමනා පවතින බව බයිබලය ප්‍රකාශකරයි.

> **ඉතින් නානාප්‍රකාර දීමනා ඇත්තේය, නුමුත් එක ආත්මයාණන්වහන්සේය, නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදාදෙමින්, මේ සියල්ල කරවනසේක. (1 කොරින්ති 12:4,11)**

"ඉතා හොඳ දීමනාවලට ආශාවෙන්න" (1 කොරින්ති 12:31) කියා පැවසුවත් "ආත්මික දීමනාවලට ආශාවෙන්න" (1 කොරින්ති 14:1) කියා පවසා ඇතත් එයින් අදහස්වන්නේ සුවිශේෂී සේවාවන් ඇති අනෙක් අයව අනුගමනය කරන්න කියා නොවේ. පේත්‍රුස්, යොහන්ගේ සේවය ගැන තැකීමක් කළ විට යේසුස්වහන්සේ ඔහුට පැවසුයේ :

> **යේසුස්වහන්සේද: මා එන තුරු ඔහු සිටිනවාට මා කැමති නම් නුඹට මොකද? නුඹ මා අනුව එන්නැයි ඔහුට කීසේක. (යොහන් 21:22)**

දෙවියන්වහන්සේ නෝවාට නැවක් සෑදීමට සැලැස්ම දුන්සේක. උන්වහන්සේ මෝසෙස්ට කූඩාරම සෑදීමට සැලැස්ම දුන්සේක. එතුමා සලමොන්ට දේවමාළිගය සෑදීමට නමස්කාර ස්ථානයේ සැලැස්ම දුන්සේක. යෙරුසලමෙහි පවුරු නැවත ගොඩනැගීමට සැලැස්ම එතුමා දුන්නේ නෙහෙමියාටය. දෙවියන්වහන්සේ ඔබට නැවක් සෑදීමට කියා නැත, දේව මාළිගාවක් ගොඩනගන්නට පවරා නැත, එසේම යෙරුසලම වටා පවුරක් ගොඩනගන්නට කියාද නැත. නමුත් උන්වහන්සේ සතුව ඔබ උදෙසා විශේෂ සැලැස්මක් තිබේ ! එනිසා ඔබ වෙන අයෙකුගේ සේවය අනුකරණය කිරීමේ පාපයට හෝ ඒ අයට වඩා ඉහළින් එම සේවය කිරීමට යාමේ පාපයට අහුවුණොත් එතුමාගේ සැලසුම ඔබට අතපසුවේවි.

ඔබගේ ජීවිතය වෙනයම් පුද්ගලයෙකුගේ ජීවිතය අනුව හැඩගස්වා ගත් කල ඔබ මනුෂ්‍ය සම්ප්‍රදායන්වල සිරවී සිටිනු ඇත. මනුෂ්‍ය චාරිත්‍ර සම්ප්‍රදායන් හෙළිදරව්ව වසාගෙන තබනු ඇත.

## ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

---

---

2. "අනුකරණය" යන වචනයෙන් අර්ථවත් වන්නේ කුමක්ද?

---

3. පහත සඳහන් ප්‍රකාශන කියවන්න. ප්‍රකාශනය සත්‍යය නම් වාක්‍යය ඉදිරියේ **ස** යන්නද අසත්‍යනම් **අ** යන්නද හිස්තැනෙහි ලියන්න.

අ.---- මිත්‍යාදෘෂ්ටික ක්‍රම වලින් මගපෙන්වීම ලබාගැනීම පිළිගත හැකි දෙයක් බව බයිබලය උගන්වයි.

ආ.--- ඔබ උදෙසා ඔබටම දෙවියන්වහන්සේගෙන් මගපෙන්වීම ලබාගත නොහැකි නම්, ඔබේ ජීවිතයට මග පෙන්වීම ලබාගැනීමට අන් අය මත යැපීම ආරක්ෂාකාරී වේ.

ඇ.--- ඔබහට අනාගතවක්තෘවරයෙකු කියන හැමදෙයක්ම හැමවිටම සත්‍යය බවත් එය ඔබගේ ජීවිතය උදෙසා දේව කැමැත්ත බවත් පිළිගත යුතුය.

ඈ.--- මනුෂ්‍ය සම්ප්‍රදායන් දිව්‍යමය හෙළිදරව්ව වසා තබයි.

ඉ.--- දේව කැමැත්ත තීරණය කරගැනීමට "දාදු දැමීම" සහ වෙනත් අහඹු සිදුවීම් භාවිතා කිරීම හොඳ ක්‍රම වේ.

ඊ.--- දෙවියන්වහන්සේගේ කැමැත්ත නිසැකවම තීරණය කිරීමට "ලොම් මිටිය" දැමීමේ ක්‍රමය එක නිසැක ක්‍රමයක් බව බයිබලය උගන්වයි.

උ.--- බොරු අනාගතවක්තෘවරයෙකු හා සැබෑ අනාගතවක්තෘවරයෙකු අතර වෙනස වටහා ගැනීමට හොඳම ක්‍රමය නම් ඔවුන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීමය.

ඌ.--- සත්‍යවූ අනාවැකි නිතරම ලිඛිත දේව වචනය හා එකගවේ.

එ. ---පෞද්ගලික අනාවැකි සැමවිටම යම් කාරනාවක් තහවුරු කිරීමට මිස මගපෙන්වීමට හෝ උපදෙස් දීමට නොවිය යුතුය.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

දෙවියන්වහන්සේගේ හඬට ඇහුම් කන් නොදීම නිසා වැරදි දිශාවට ගමන් කළාවූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් පිළිබඳව කතා බයිබලය වාර්තා කරයි. එම කතා කියවා බලා එයින් ඔබට ඉගෙන ගත හැකි කරුණු කෙටියෙන් ලියන්න.

මගපෙන්වීම ලබාගැනීම සඳහා මායාකාරියක් වෙතට ගියාවූ සාවුල් රජ : 1 සාමුවෙල් 28.

___

___

___

දිවැස් බලන්නෙක් වෙතට ගිය මනස්සේ 2 ලේකම් 33:6.

___

___

___

දෙවියන්වහන්සේ ඔහුට කී දෙයට කීකරු නොවී, තමා අනාගතවක්තෘ කෙනෙකුයයි කියා ගත්තාවූ මනුෂ්‍යයෙකුට ඇහුම්කන් දුන් නම සඳහන් නොවන දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා. 1 රාජාවලිය 13.

___

___

___

මනුෂ්‍යයන්ගේ වැරදි මන්ත්‍රණ වලට සවන් දුන් බාලම්: ගණන් කථාව 22.

___

___

___

# පස්වෙනි පරිච්ඡේදය

# දේව කැමැත්තෙහි රටාවන්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- දේව කැමැත්ත සම්බන්ධ මූලික කරුණු නම් කිරීමට
- දේව කැමැත්තෙහි ප්‍රධාන අංශ දෙක හඳුනාගැනීමට
- ජීවිතයේ අවස්ථාවන්හිදී තීරණ ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය භාවිත කිරීමට
- දේව කැමැත්තෙහි රටාව පැහැදිලි කරදීමට
- ඇදහිලිවන්තයා ක්‍රමයෙන් දෙවියන්වහන්සේගේ කැමැත්තට එකඟතාවය ක්‍රමානුකූලව දැක්වීම හඳුනාගැනීමට හා උදාහරණයක් දීමට
- දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙන් එළිදරව් කර දී ඇති දේව කැමැත්ත පිළිබඳ වැඩිදුර අධ්‍යයන කිරීමට කළ හැකි වනු ඇත.

**ප්‍රධාන පදය:**

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:9-11)**

## හැඳින්වීම

දෙවියන්වහන්සේ තම කැමැත්ත මනුෂ්‍යා හට එළිදරව් කරදීමට භාවිත කරන්නාවූ ක්‍රම සොයාබැලීමට පෙර ඔබ සතුව දේව කැමැත්ත පිළිබඳව මූලික දැනුමක් තිබිය යුතුය. මීට පෙර පරිච්ඡේදවලදී "දේව කැමැත්ත" යන්නෙහි තේරුම අර්ථ දැක්වීමු. එසේම වැරදි අයුරින් මඟපෙන්වීම සොයන ක්‍රම හඳුනාගනිමු.

මෙම පරිච්ඡේදයෙහිදී දේව කැමැත්ත පිළිබඳ මූලික කරුණු ඉදිරිපත් කරන අතර දේව කැමැත්තෙහි ප්‍රධාන අංශ දෙක පැහැදිලි කරදෙයි. දේව කැමැත්තෙහි රටාව සෝදිසි කර බලන අතරම දෙවියන්වහන්සේගේ හඬ දැන ගැනීමෙහිදී ඇදහිලිවන්තයාගේ ක්‍රමානුකූල වැඩිදියුණුවීම සාකච්ඡාවට භාජනය වේ.

# දේව කැමැත්ත පිළිබඳ සත්‍ය කරුණු

දේව කැමැත්ත පිළිබඳ මූලික කරුණු කිහිපයක් නම්:

## ඔබ දේව කැමැත්ත දැනගැනීම එතුමාට අවශ්‍යය:

දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට හැකිය යන ඇදහිල්ල රැඳී පවතිනුයේ මූලික පදනම් දෙකක් මතය:

පළමුව: ඔබ උදෙසා දෙවියන්වහන්සේට සැලැස්මක් ඇති බව විශ්වාස කිරීම තුළ

දෙවනුව: ඔබ සමග කතාබස් කිරීමට දෙවියන්වහන්සේ සතු හැකියාව

මීළඟ පරිච්ඡේද දෙකෙහි දෙවියන්වහන්සේ මිනිසා සමග සන්නිවේදනය කරන (කතාබස් කරන) පිළිවෙළ පැහැදිලි කරදේ. මීට පෙර පාඩමකදී අප සඳහන් කළ ආකාරයට දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හට කතා කිරීමට කෙතරම් ආශාවෙන් සිටීද කියතොත්, එක අවස්ථාවක අනාගතවක්තෘවරයෙකුට පණිවුඩයක් දීමට බූරුවෙක් තුළින් උන්වහන්සේ කතා කළ සේක. (ගණන් කථාව 22)

බයිබලය අණ කොට ඇත්තේ:

> **මේ නිසා, නුඹලා අනුවණයෝ නොවී, ස්වාමින්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම්ගනිල්ලා. (එපීස 5:17)**

පාවුල් කොලොස්සිවරුන්ට ලියමින්:

> **එබැවින් අපිත් ඒ ඇසූ දා පටන් නුඹලා උදෙසා නොකඩවම යාච්ඤාකරමින්, නුඹලා සියලු ආකාර ප්‍රඥාවද ආත්මික නුවණද ලබන ලෙස උන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමෙන් පූර්ණවී, (කොලොස්සි 1:9)**

ක්‍රියා පොතේදී පාවුල් එක මනුෂ්‍යයෙකුට කතාකරමින් මෙසේ පැවසීය:

> **ඔහු කථාකොට: අපේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ, තමන්වහන්සේගේ කැමැත්ත දැනගන්ටත් ධර්මිෂ්ඨ තැනැන්වහන්සේව දකින්ටත් උන්වහන්සේගේ මුඛයෙන් හඬක් අසන්ටත් නුඹව නියමකළ සේක. (ක්‍රියා 22:14)**

මෙම පදවලට අමතරව දෙවියන්වහන්සේ එතුමාගේ ලිඛිත වචනයෙහි මගපෙන්වීමේ බොහෝ පොරොන්දු සපයා දී තිබේ. (මෙයින් සමහරක් ඔබ පසුව ඉගෙන ගනු ඇත.) මෙම බයිබල් පද පදනම් කරගෙන එළැඹිය හැකි නිගමනය නම්, දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබ දැනගැනීම එතුමාට අවශ්‍ය බවය.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත සැලසුම් කොට තිබේ:

දෙවියන්වහන්සේ තම සැලැස්මෙහි පදනම මත එහි ඇති සියලුම කාරණා මේ ලෝකයෙහි ඉටුවන පිණිස ක්‍රියා කරමින් සිටින සේක.

> **එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:11)**

දෙවියන්වහන්සේ හට මුළු විශ්වයම ආවරණය වන පරිදි සැලැස්මක් තිබේ. උන්වහන්සේ එය ක්‍රියාත්මක කරමින් සිටී. අපි මෙයට උන්වහන්සේගේ ප්‍රධාන සැලසුම යයි පවසමු. එසේම එක් එක් පුද්ගලයා උදෙසාද එතුමා සතුව ඒක පුද්ගල සැලසුමක්ද තිබේ. එම සැලසුම් උන්වහන්සේගේ සර්වබලධාරී සැලැස්ම හා සදාචාරාත්මක සැලසුම ඇතුලත අඩංගු වේ.

## දේව සැලැස්ම ඒක පුද්ගලික හා පෞද්ගලික වූවකි

සෑම පුද්ගලයෙකු සඳහාම ඇති දෙවියන්වහන්සේගේ කැමැත්ත උන්වහන්සේගේ සර්වබලධාරීවූ මිදීමේ සැලැස්ම ඇතුළත් වේ.

> **ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක, නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක. (2 පේත්‍රැස් 3:9)**

දේව සැලැස්ම උන්වහන්සේගේ සර්වබලධාරීවූත්, සදාචාරාත්මකවූත් කැමැත්ත එළිකිරීමට ඔබ්බෙන් යයි. දෙවියන්වහන්සේ සතුව එක් එක් පුද්ගලයා වෙනුවෙන් සැලසුමක් පවතින අතර එය එම මිනිසා සමග පැවසීමට එතුමා කැමැත්තෙන් සිටී. බයිබලයෙහි සඳහන් වන මනුෂ්‍යයන් එක් එක්කෙනා සමග දෙවියන්වහන්සේ ක්‍රියා කළ ආකාරය බලන කල එම කථා තුළින් මෙම සත්‍යය සනාථ වේ. දෙවියන්වහන්සේ විශේෂ පරමාර්ථයන් සහිතව විශේෂ වූ මිනිසුන් නියමාකාරයෙන් නියම අවස්ථාවල පිහිටවූ සේක. බයිබලයෙහි වාර්තාකොට ඇති සෑම එක් එක් ජීවිත කතාවක්ම අද්විතිය වේ.

දෙවියන්වහන්සේ අනාගතවක්තෘ යෙරමියාට කීවේ:

> **මම නුඹ ගර්භයෙහි සාදන්ට පළමුවෙන් නුඹ හඳුනාගෙන සිටියෙමි, නුඹ කුසෙන් නික්මෙන්ට පළමුවෙන් මම නුඹ කැපකොට, ජාතීන්ට අනාගතවක්තෘ කෙනෙකු කොට නුඹ නියමකළෙමියි කීය. (යෙරමියා 1:5)**

දෙවියන්වහන්සේ සතුව එක් එක් පුද්ගලයා උදෙසා පෞද්ගලික සැලසුමක් පවතින බවට මීට වඩා හොඳ සාක්ෂි තිබේද?

යොහන් කරන්නට යන්නේ කුමන සේවයදැයි ප්‍රේරිත පේත්‍රැස් ඕනෑවට වඩා සැලකිලිමත් වූ විට යේසුස්වහන්සේ ඔහුට කීවේ:

> **යේසුස්වහන්සේද, මා එන තුරු ඔහු සිටිනවාට මා කැමති නම් නුඹට මොකද? නුඹ මා අනුව වරෙන්නැයි ඔහුට කීසේක. (යොහන් 21:22)**

යොහන්ගේ හා පේත්‍රැස්ගේ ජීවිත සඳහා යේසුස්වහන්සේ සතුව වෙනස් ආකාර සැලසුම් පැවතිය.

අප ලෝකයෙහි බලන සෑම තැනකම පාහේ බුද්ධිමත් සැලසුම් කිරීම දක්නට ලැබේ. ග්‍රහලෝකවල පිහිටීම, තාරකා, සෑම හිම කැටියකම අන්තර්ගත විශේෂිත රටාවන්, මල් ජාති මේ සියල්ල එම සැලසුම එළිදරව් කරයි. මෙසේ දී ඇති සාක්ෂිවලට අනුව දිව්‍යමය වූ මැවුම්කරුවාණෝ සතුව එතුමාගේ මැවිල්ලේ මුදුන් මල්කඩ වූ මිනිසා උදෙසා පෞද්ගලික ඒක පුද්ගල සැලැස්මක් ඇති බව අප නිගමනය කළ යුතු වේ.

දෙවියන්වහන්සේ පොරොන්දු වූයේ:

> **ඔබට උගන්වන්නෙමි, ඔබ විසින් යා යුතු මාර්ගයෙහි ඔබට ගුරුකම් දෙන්නෙමි. මාගේ ඇස ඔබ කෙරේ යොමුකොට ඔබට දැනමිතිකම් දෙන්නෙමි. (ගීතාවලිය 32:8)**

ඒක පුද්ගල මාර්ගයක් මෙහි සඳහන් වේ.

ගීතාවලිය 37 පවසන්නේ ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකුගේ සෑම පියවරක්ම දෙවියන්වහන්සේ විසින් සූදානම් කර ඇති බවය.

**මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමින් කරණකොටගෙන ස්ථිරවෙයි, උන්වහන්සේ ඔහුගේ මාර්ගය ගැන ප්‍රීතිවන සේක. (ගීතාවලිය 37:23)**

මෙහි යොදාගෙන ඇති "ස්ථිරවෙයි" යන පදයම ගීතාවලිය 8:3 හිද දෙවියන්වහන්සේ මැවූ හඳ හා තරු සම්බන්ධව භාවිත කර ඇත. ග්‍රහලෝක පිළිබඳ විද්‍යාව මගින් ස්වර්ගයීය වස්තූන්වල නියමාකාර පිහිටීම කෙතරම් ආශ්චර්යමත් ලෙස පවතිද යන වග වාර්තා කොට පෙන්වා ඇත.

සියලු ග්‍රහලෝක වල නිවැරදි ගමන් මාර්ගය නියම කළාවූ, පවත්වාගෙන යන්නාවූ එම නිරවද්‍යතාවයම ඇදහිලිවන්තයාගේද ගමන් මග නියම කරන සේක.

උන්වහන්සේ පොරොන්දු වූයේ:

**නුඹලා දකුණට හැරෙන විටද නුඹලා වමට හැරෙන විටද මාර්ගය මේය, මෙහි හැසිරෙන්නැයි නුඹට පස්සෙන් කියන හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත් යෙදෙනවා ඇත. (යෙසායා 30:21)**

දෙවියන්වහන්සේ පිළිවෙළකට ස්ථිර කරන්නේ ජීවිතයේ මහත් සිදුවීම් පමණක් නොව, සෑම පියවරක්මය.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍යයාගේ මාර්ගය නොවේ:

බොහෝ අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍යයාගේ මාර්ගවලට ප්‍රතිවිරුද්ධය.

**මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය, නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේයයි ස්වාමින්වහන්සේ කියනසේක. අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක්මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ. (යෙසායා 55:8-9)**

දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබ සාමාන්‍යයෙන් නිතරම පාහේ තෝරාගන්නාවූ මාවතද නොවේ. දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීම වැදගත් වනුයේ මේ නිසාය. එයින් කියන්නේ දේව කැමැත්ත යනු සැමවිටම අසතුට ගෙන දෙන දෙයක් වන බව නොවේ. මේ බව මීළඟ කරුණේ පෙන්නුම් වේ.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත යහපත්ය:

දේව කැමැත්ත සැමවිටම යහපත් බව බයිබලය උගන්වයි. ඔබ තෝරාගන්නාවූ දෙය එතුමාගේ මාර්ගය නොවිය හැකි වුවත්, වඩාත්ම හොඳ දෙය කුමක්දැයි දෙවියන්වහන්සේ දන්නා සේක. ගීතාවලිය 37:23 හි පවසන්නේ දෙවියන්වහන්සේ ස්ථිර කළාවූ මාර්ගයෙහිදී ඔබ ප්‍රීතිමත් වනු ඇති බවය.

දෙවියන්වහන්සේගේ කැමැත්ත යහපත් බව පාවුල් සනාථ කරයි.

**නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:2)**

### දෙවියන්වහන්සේගේ සැලසුම දියුණුව කරා යන්නකි:

එපිස 2:10 හි සඳහන් වන්නේ “අපි දෙවියන්වහන්සේගේ කර්මාන්තයව සිටිමුව” කියාය. “සිටිමුව” යන පදය වර්තමාන ක්‍රියා පදයකි. දෙවියන්වහන්සේ නිරතුරුම අප ජීවිත තුළ ක්‍රියාකරමින් සිටී. දෙවියන්වහන්සේගේ කැමැත්ත හෙළිකිරීම දිගටම ක්‍රමානුකූලව සංවර්ධනය වෙන්නාවූ ක්‍රියාවලියකි.

> **මක්නිසාද තමන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා, කැමතිවෙන්ටත් වැඩ කරන්ටත් නුඹලා තුළ ක්‍රියාකරන්නේ දෙවියන්වහන්සේමය. (පිලිප්පි 2:13)**

පාවුල් හෙබ්‍රෙව් ඇදහිලිවතුන්ට දෙවියන්වහන්සේගේ ආශාව ලෙස ලියන ලද්දේ:

> **තමන් ඉදිරියෙහි ප්‍රසන්නව තිබෙනදේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අප තුළ කරමින්, නුඹලා උන්වහන්සේගේ කැමැත්ත කරන පිණිස සියලු යහපත් ක්‍රියාවලට නුඹලා සම්පූර්ණකරනසේක්වා, උන්වහන්සේට සදාකාලේටම ගෞරවය වේවා. ආමෙන්. (හෙබ්‍රෙව් 13:21)**

“කරමින්” යනු වර්තමාන ක්‍රියාපදයකි. දෙවියන්වහන්සේ නිරතුරු මගපෙන්වමින් සංවර්ධනය කරමින්, ඔබහට දේව සැලැස්ම පිළිබඳව කතාකරන සේක. ඔබහට නොනවතින මගපෙන්වීමක් පොරොන්දු වී තිබේ.

> **ස්වාමින්වහන්සේ නිතරම නුඹට මගපෙන්වා, වියළි තැන්වලදී නුඹේ ප්‍රාණය තෘප්තියට පමුණුවා, නුඹේ ඇටද ශක්තිමත්කරන සේක. නුඹ වතුර ඇති උයනක් මෙන්ද දිය සිඳී නොයන උල්පතක් මෙන්ද වන්නෙහිය. (යෙසායා 58:11)**

## දේව කැමැත්තෙහි අංශ දෙක

දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම පිළිබඳව අප කථාකරන විට, දේව කැමැත්තෙහි අංශ දෙකක් පවතින බව අප තේරුම්ගත යුතුය. එම අංශ දෙක එකිනෙකා හා සමග එකඟතාවයෙන් පවතී.

### පළමුව: උන්වහන්සේගේ ලිඛිත වචනයෙහි එළිදරව් කර ඇති දේ:

දේව කැමැත්තෙහි පළමු අංශය නම් බයිබලයෙහි විශේෂිත අයුරින් හෙළි කර ඇති කාරණ කොටසය. මීට පෙර පරිච්ඡේදයකදී “දේව කැමැත්තෙහි” තේරුම් තුනක් අපි ඉගෙනගත්තෙමු. ඒවා නම්, දෙවියන්වහන්සේගේ සර්වපරාක්‍රම කැමැත්ත, පෞද්ගලික ඒක පුද්ගල කැමැත්ත හා සදාචාරාත්මක කැමැත්ත වේ. ඒවා පහත සඳහන් රූප සටහනෙහි පෙන්වා දී තිබේ.



මෙම රූප සටහනෙන් පෙන්වා දී ඇති පරිදි එක් එක් පුද්ගලයා සඳහා තිබෙන දෙවියන්වහන්සේගේ ඒකපුද්ගල කැමැත්ත, සැමවිටම දේව වචනයෙහි ලිඛිතව එළිදරව්වී තිබෙන පරිදි එතුමාගේ සර්වපරාක්‍රම කැමැත්ත හා සදාචාරාත්මක කැමැත්ත ඇතුලත පවතී. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙහි සදාචාරාත්මක කැමැත්ත සම්පූර්ණයෙන්ම එළිදරව්ව කර දී තිබේ. මෙහි ඔබ ජීවත්විය යුත්තේ කෙසේද කියා සියලු ආඥා අන්තර්ගත වේ. රූප සටහනෙන් ඔබට දැකිය හැකි පරිදි දෙවියන්වහන්සේගේ සර්වබලධාරී කැමැත්තට එතුමාගේ සදාචාරාත්මක කැමැත්තද ඇතුළත් වේ. සෑම කාන්තාවක් සහ සෑම පුරුෂයෙක්ම දේව වචනයෙහි ලියා තිබෙන සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූලව ජීවත්වීම දෙවියන්වහන්සේගේ සර්වපරාක්‍රම කැමැත්ත වේ. ලිඛිත දේව වචනයෙහි දෙවියන්වහන්සේගේ සර්වපරාක්‍රම කැමැත්තෙහි එතුමා එළිදරව් කිරීමට කැමති වූ කොටස් ඇතුළත් කර ඇති අතර එහි මනුෂ්‍යයා උදෙසාත් ලෝකය උදෙසාත් එතුමාගේ මූලික සැලසුමේ සාමාන්‍ය කටු සටහන එළිදරව් කර දී තිබේ.

මෙම සැලැස්මෙහි හොඳම සාරාංශය නම් මෙම පරිච්ඡේදයේ ප්‍රධාන ප්‍රධාන පදයය.

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:9-11)**

මෙම පරිච්ඡේදයෙහි 'තවදුරටත් අධ්‍යයනය' කොටස යටතේ ලිඛිත දේව වචනයෙහි එළිදරව් කර දී තිබෙන දේව කැමැත්ත ඇතුළත් උදාහරණ කොටස් කිහිපයක් සපයා තිබේ.

## දෙවනුව: දේව වචනයෙහි එළිදරව් කර නොමැති දෙය

දේව කැමැත්තෙහි දෙවන අංශය නම් දේව වචනයෙහි එළිදරව් කර දී නොමැති කොටසය. මෙය එක් එක් ඇදහිලිවන්තයා සඳහා දෙවියන්වහන්සේ සතුව පවතින ඒක පුද්ගල කැමැත්ත ඇතුළත් වේ. දේව වචනයෙහි ඔබ කළ යුතු විශේෂ රැකියාව කුමක්ද, සේවය කුමක්ද, ඔබ සහභාගිවිය යුතු පල්ලිය කුමක්ද කියාවත්, ඔබ විවාහවිය යුතු කා සමගද කියාවත්, ඔබ ජීවත්විය යුතු කුමන පලාතේද යනාදී කාරණ බයිබලයේ එළිදරව් කරදී නැත. නමුත් මේ සෑම තීරණයක්ම වැදගත්ය. එනිසා මෙම තීරණ සඳහා ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබ සොයාගන වටහාගැනීම සඳහා දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට පුරුදු විය යුතුය.

## දෙක සන්සන්දනය කිරීම:

ජීවිතයෙහි යම් කාරණාවක් සම්බන්ධයෙන් ඔබට දේව කැමැත්ත දැනගැනීමට ආශාවක් ඇතිවිට, පළමුවෙන්ම එම විෂය සම්බන්ධව ලිඛිත දේව වචනයෙහි විශේෂිත උපදෙස් දී තිබේදැයි දැනගැනීමට ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කරන්න. කිසියම් කාරණයක් සම්බන්ධයෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනටම ලිඛිත දේව වචනයෙහි එළිදරව් කර තිබෙන්නේ නම් එම කාරණ සම්බන්ධයෙන් "දේව කැමැත්ත සෙවීම" හෝ දෙවියන්වහන්සේගෙන් ස්ථිර කරගැනීම් ඉල්ලා සිටීමට අවශ්‍ය නොවේ. දැනටම විශේෂිත උපදෙස් මගපෙන්වීම ලබා දී තිබේ නම් ඒවා ප්‍රවේසමෙන් සෝදිසිකොට බලන්න. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය, දෙවියන්වහන්සේගේ හඬ ඔබට කතාකිරීම ලෙසට පිළිගන්න. දෙවියන්වහන්සේගේ වචනයෙහි දී ඇති ලිඛිත උපදෙස් ඔබ ප්‍රතික්ෂේප කළහොත් ඔබ රැවටීමකට ඔබගේ ජීවිතය විවෘත කරදෙයි.

බොහෝ අවස්ථාවල බයිබලය පොදු ප්‍රතිපත්ති සපයා දෙයි. එවැනි ප්‍රතිපත්ති අවබෝධ කරගෙන අදාළ කරගත් විට දේව කැමැත්ත හා එකඟවන තීරණයකට එළැඹිය හැකිය. මෙවැනි ප්‍රතිපත්ති විවිධ වූ අවස්ථාවනට අදාළ කරගත හැකිය. උදාහරණ ලෙස පාවුල්තුමා අවවාද කළේ:

> **නොඇදහිලිකාරයන් සමග අසම ලෙස සම්බන්ධ නොවෙල්ලා, ධර්මිෂ්ඨකමෙත් අධර්මිෂ්ඨකමෙත් ඇති සහභාගිකම මොකද? නොහොත් අන්ධකාරය සමග ආලෝකයේ ඇති පංගුකාරකම මොකද? බෙලියෙල් සමග ක්‍රිස්තුස්වහන්සේගේ ඇති එකමුතුකම මොකද? නොහොත් නොඅදහන කෙනෙකු සමග ඇදහිලිවන්තයෙකුගේ ඇති කොටස මොකද? (2 කොරින්ති 6:14-15)**

මෙහිදී බයිබලය අපට සපයන පොදු ප්‍රතිපත්තිය නම් ඇදහිලිවතුන් නොඇදහිලිවතුන් සමග එකට සම්බන්ධවිය නොවිය යුතු බවය. ජීවිතයෙහි විවිධාකාර සිදුවීම්වලට මෙම ප්‍රතිපත්තිය අදාළ කරගත හැකිය. එවන් අවස්ථාවන් නම්: නොඇදහිලිවන්තයෙක් සමග විවාහවීම, නොඇදහිලිවන්තයන් සමග හවුල් ව්‍යාපාරවලට සම්බන්ධවීම, නොඇදහිලිවන්තයෙක් ඔබගේ සමීපතම මිතුරා බවට පත් කර ගැනීම යනාදිය වේ.

ඔබ මුහුණ දී සිටින තත්වය හා සමාන බයිබලීය චරිත ශුද්ධ ලියවිල්ලෙහි සොයන්න. ඒ අය එවන් අවස්ථාවලදී ගත් තීරණ, එම තීරණ දේව කැමැත්ත හා සමග එකඟවූවාද යන කරුණු විමසා බලන්න. ඔබට ඒවායින් අදාළ කරගත හැකි සත්‍ය සොයා බලන්න.

ලිඛිත දේව වචනයෙහි මගපෙන්වීම් සඳහන් කර නොමැති කාරණාවලදී මිනිසාට කතාකිරීමට ස්වාමීන්වහන්සේ වෙනත් උපක්‍රම උපයෝගී කරගනු ඇත. මීළඟ පරිච්ජේද දෙකෙහි අපි මේ පිළිබඳව සොයා බලනු ඇත. **මතක තබාගත යුතු** දෙය නම්, ජීවිතයෙහි පෞද්ගලික සිදුවීම් සඳහා ලැබෙන මගපෙන්වීම් සැමවිටම ලිඛිත දේව වචනය හා එකඟතාවයෙන් යුක්ත විය යුතුය. දෙවියන්වහන්සේගේ හඬ මගපෙන්වීම කරනුයේ ලිඛිත වචනයේ සීමා තුළය.

අප දැන් සාකච්ඡා කළාවූ දේව කැමැත්තෙහි අංග දෙක පහත සඳහන් වගුවෙන් සාරාංශ ගත කොට දැක්වේ.

**දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි ප්‍රධාන අංග දෙක**

| **එළිදරව් කරන ලද** (ලිඛිත වචනය) | **එළිදරව් නොකරන ලද** |
|---|---|
| උන්වහන්සේගේ ලිඛිත වචනයෙහි එළිකර දී ඇති සර්වපරාක්‍රම කැමැත්ත සහ සදාචාරාත්මක කැමැත්ත | එක් එක් ඇදහිලිවන්තයාගේ ජීවිත උදෙසා ඒක පුද්ගල සැලැස්ම |
| සියලු මිනිස් සංහතිය උදෙසා එතුමාගේ පොදු කැමැත්ත ඇතුළත් වේ. ලෝකය උදෙසා උතුම් සැලැස්මද ඇතුළත්ය. | ජීවිතයෙහි විශේෂිත තීරණ එනම් ජීවන වෘත්තිය, සේවය, වාසස්ථානය, විවාහය හා වෙනත් විශේෂ අවස්ථා සඳහා මගපෙන්වීම ඇතුළත් වේ. |
| ජීවිතය පාලනය වන්නාවූ විශේෂිත ආඥා සහ පොරොන්දු ඇතුළත් වේ. විශේෂිත තීරණ සඳහා පදනම් කරගත හැකි පොදු ප්‍රතිපත්ති ඇතුළත් වේ. | සමහර ඒක පුද්ගල තීරණ දේව වචනයේ සඳහන් පොදු ප්‍රතිපත්ති උදාහරණ හා විශේෂ ආඥාවන් මත පදනම් කරගෙන සිදුකළ හැකිය. |

# දෙවියන්වහන්සේගේ කැමැත්තේ රටාව

මෙම පාඩමාලාවේ පළමුවන පරිච්ඡේදයේ අවධානය යොමුකර ඇත්තේ රෝම 12:1-2 දක්වාය.

> **එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම්, යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)**

අපි යහපත්වූ පිළිගත හැකිවූ සම්පූර්ණ වූ දේව කැමැත්ත යනු කුමක්දැයි ප්‍රශ්නයක් ඇසුවෙමු. අපි දැන් එම ප්‍රශ්නයට පිළිතුරු සොයමු. එසේ කිරීමෙන් දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි රටාව සොයාගනිමු.

## දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්ත:

දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්ත ඉටුවනුයේ ඇදහිලිවන්තයෙකු තුළ දෙවියන්වහන්සේගේ සදාචාරාත්මක, සර්වබලධාරී හා ඒක පුද්ගල කැමැත්ත යන තුනම එකමුතුකමින් පවතින විටය.

ඇදහිලිවන්තයා නව උපත අත්දැකීමෙන් දෙවියන්වහන්සේගේ සර්වපරාක්‍රම කැමැත්ත වන ගැළවීම පිළිගෙන තිබේ. ඔහු දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙහි සඳහන් සදාචාර අණපනත් සමග එකඟතාවයෙන් සිටී. එසේම ඔහුගේ පෞද්ගලික ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ ඒක පුද්ගල සැලැස්ම අධිෂ්ඨානය කරගෙන ඇත.

## දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්ත:

දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්තෙහිදී ඇදහිලිවන්තයා ඔහුගේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්තෙහි නොමැත. එහෙත් ඔහු දෙවියන්වහන්සේගේ සර්වපරාක්‍රම කැමැත්ත හා සදාචාරාත්මක කැමැත්ත ඇතුලත සිටී. ඔහු දෙවියන්වහන්සේගේ එළිදරව් කරන ලද කැමැත්තට අකීකරු නැත. ඔහු තවමත් තම පෞද්ගලික ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත සොයමින් සිටී.

## දෙවියන්වහන්සේගේ පිළිගත හැකිවූ කැමැත්ත:

මෙවන් ඇදහිලිවන්තයා තම ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත අහිමි කරගෙන ඇත. නමුත් තවමත් ඔහු පිළිගත හැකි ක්ෂේත්‍රයක සිටී. ඔහු දෙවියන්වහන්සේගේ අවසරලත් දේව කැමැත්තෙහි ජීවත් වේ. ඔහු සමහරවිට තමා උදෙසා දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්ත පිළිබඳව තැකීමක්වත් නොකරයි. මෙය ඔහු උදෙසා දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කැමත්ත නොවූවත් දෙවියන්වහන්සේ ඔහුට එම ක්ෂේත්‍රයෙහි සිටීමට අවසර සපයා දී තිබේ.

## දේව කැමැත්තට පිටතින්:

මෙම ක්ෂේත්‍රයෙහි ජීවත්වන ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේගේ එළිදරව් කරන ලද කැමැත්තට සෘජුවම අකීකරු කමින් ජීවත් වේ.

## ශුද්ධ ලියවිල්ලෙන් උදාහරණයක්

ගණන්කථාව 22 පරිච්ඡේදයෙහි සඳහන් බාලාම්ගේ කතාව, දෙවියන්වහන්සේගේ මෙම කැමැත්තේ කාලයන් පැහැදිලිව උදාහරණවත් කරයි. මෙම පාඩම තවදුරටත් ඉගෙනීමට පෙර කතාව කියවා බලන්න. මෝවබ්හි විසූ මනුෂ්‍යයෝ දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු වූ බාලාම් නම් තැනැත්තාට කතාකොට දෙවියන්වහන්සේගේ ජනතාව වන ඉශ්‍රායෙල්ට විරුද්ධව අනාගතවාක්‍යය පවසන ලෙස කිවෝය. දෙවියන්වහන්සේ බාලාම්ට කතාකොට එම ගමන නොයන ලෙස පැවසූ සේක.

> **දෙවියන්වහන්සේ: ඔවුන් සමග නොයන්න: ඒ සෙනඟට ශාපනොකරන්න. මක්නිසාද ඔව්හු ආශිර්වාදලත් සෙනඟක් යයි බාලාම්ට කීසේක. (ගණන් කථාව 22:12)**

දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත වූයේ බාලාම් මෝවබ් වැසියන් සමග නොයෑමය. නමුත් බාලාම් දෙවියන්වහන්සේගේ හඬට අකීකරුවී එම මිනිසුන් සමග ගියේය. ඔහු එසේ කිරීමෙන් දෙවියන්වහන්සේගේ හෙළිදරව් කරදී ඇති කැමැත්තට එරෙහිව විරුද්ධව ක්‍රියාකළේය.

දෙවියන්වහන්සේ බාලාම් හට දේව කැමැත්ත දැනගැනීම කෙතරම් අපේක්ෂාකළාද කිවහොත් ඔහුගේ පාපය ඒත්තු ගැන්වීමට ඔහුට කතාකිරීම සඳහා බූරුවෙකු පාවිච්චි කළ සේක. ඉන්පසුව දෙවියන්වහන්සේ බාලාම්හට මෝවබ්වරු සමග යාමට දෙවියන්වහන්සේ ඉඩහළ සේක. නමුත් ඔහු ගොස් ඉශ්‍රායෙල්ට ශාප කිරීම වෙනුවට ආශිර්වාද කළ යුතු විය. දැන් බාලාම් දෙවියන්වහන්ස්ගේ අවසරලත් කැමැත්තෙහි ක්‍රියාත්මක විය.

එම ගමනේදී බාලාක් නම් මනුෂ්‍යයෙකු මුණගැසී විවිධ පරීක්ෂාවලට මුහුණදීමට සිදුවිය. දෙවියන්වහන්සේගේ හඬට කීකරුවී එම ගමන නොගියේ නම් මේ ගැටලු සියල්ල මගහරවා ගැනීමට හැකි වනු ඇත.


දැන් මෙම කතාව “දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි රටාව” නම් රූප සටහන හා සසඳා බලන්න. දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත වූයේ බාලාම් මෝවබ්වරු සමග නොයෑමය. බාලාම් අකීකරුවී දෙවියන්වහන්සේගේ කැමැත්තට පිටතින් ක්‍රියාකළේය. දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත අභිමිවූ ඇදහිලිවන්තයෙකු දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්ත සොයමින් සිටින තත්වයෙහිවත් ඔහු නොවිය. ඔහු දෙවියන්වහන්සේගේ හඬට සම්පූර්ණයෙන්ම අකීකරුව සිටියේය. ඔහුගේ ගමන දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත නොවූවත් දෙවියන්වහන්සේගේ අවසරලත් කැමැත්ත අනුව ගමන යාමට ඔහුට අවසර ලැබුණි.

## කැමැත්තෙහි හැසිරීම

ඇදහිලිවන්තයෙකු නැවත උත්පාදනය වීමේ අත්දැකීම ලැබීමෙන් අනතුරුව දේව ප්‍රේමය මගින් පොලඹවනු ලැබ ඔහුගේ ජීවිතයෙහි ඉලක්කය වනුයේ දේව කැමැත්තට අනුව ජීවත්වීමය. බොහෝවිට ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේගේ කැමැත්තට එකඟතාවයෙන් හැසිරීම පහත සඳහන් රූපය අනුසාරයෙන් පෙන්වා දිය හැකිය.

**<u>දේව කැමැත්තෙහි හැසිරීම</u>**

**<u>පළමුවන රූපය</u>**




මෙම රූපයෙහි නොකැඩී දිගටම පවතින රේඛාවෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත නියෝජනය වේ. (____________________)

එම කැමැත්තට සාපේක්ෂව මනුෂ්‍යයාගේ හැසිරීම ඊතලය මගින් නියෝජනය වේ. ( ⟶ )

නව උපතට පෙර මිනිසා දෙවියන්වහන්සේගේ කැමැත්තට එකහෙළා විරුද්ධවූ තමාගේම මාර්ගයෙහි හැසිරෙයි. නව උපතෙන් පසුව ඇදහිලිවන්තයා බොහෝවිට දෙවියන්වහන්සේගේ කැමැත්ත හා එකඟව සම්පූර්ණ සහයෝගයෙන් ජීවත්වීමට අපේක්ෂා කරයි. ඔහු දැන් ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවියෙකු බවට පත් වී සිටින බැවින් දෙවියන්වහන්සේගේ කැමැත්තට එකඟව නිසියාකාරව ජීවත්විය හැකියැයි විශ්වාස කරයි. නමුත් සැබෑ ලොවෙහි යතාර්ථයට අනුව, ඔහුගේ ස්ථිරවීමේ රටාව මෙයාකාරයෙන් දිස්වෙනු ඇත. එනම්,

**<u>කැමැත්තෙහි හැසිරීම</u>**

**<u>දෙවන රූපය</u>**




ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේගේ කැමැත්තට නියත වශයෙන්ම එකඟතාවය දැක්වීම වෙනුවට ඔහු ඉහළ පහළ යන අත්දැකීමක් ලබයි. සමහර අවස්ථාවලදී ඔහුට දෙවියන්වහන්සේගේ හඬ ඇසී දේව කැමැත්ත ඉටු කරයි. අනෙක් වෙලාවට එසේ නොවේ. ඔහුට දෙවියන්වහන්සේගේ කැමැත්ත මගහැරුන විට හා වැරැද්දක් වූ විට මහත්සේ අධෛර්යට පත් වෙයි. සමහරු දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට තිබෙන ආශාව අත්හැර දැමීම පවා කරති.

නුමුත් මෙම රූපය නැවත බලන්න. අපට මෙහිදී වැදගත් යමක් අතපසු වී ඇත ! ඇදහිලිවන්තයාට සමහර අවස්ථාවලදී දේව කැමැත්ත අතපසු වු නමුත් ඔහුගේ ජීවිතයේ ගමන් මග පෙන්නුම් කරන රේඛාව ඉදිරියට ඉහළට යමින් තිබෙන බව පෙනී යනු ඇත. ඔහු සමහර අවස්ථාවලදී දේව කැමැත්තෙන් පහතට වැටී සිටියත්, මුළු මනින්ම ගෙන බැලූ විට ඔහු පවතිනුයේ වර්ධනය වන රටාවකය.


තිත් ඉරි වලින් ඔහු දේව කැමැත්තෙන් අහක්ව ගොස් ඇති අයුරු ඔබට දැකිය හැකිය. ඉන්පසු ඔහු එය වටහා ගෙන, එම අත්දැකීමෙන් යමක් ඉගෙන ගෙන, දේව සැලැස්මට නැවතත් එකඟතාවයකට පැමිණ සිටී. මෙම ඇදහිලිවන්තයා තම අසමත්කම් තුළින් මෙන්ම සාර්ථකත්වය මගින්ද දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් දීමට ඉගෙන ගනී. ඔහු සුබවාදී මෙන්ම අසුබවාදී අත්දැකීම් තුළින් දෙවියන්වහන්සේ විසින් මගපෙන්වන්නාවූ ජීවිතයක් පිළිබඳ මූලධර්මය තේරුම් ගැනීමෙහි වර්ධනය වෙමින් සිටී.

මෙයාකාරයෙන් දේව කැමැත්ත සොයාගන්නා කල ඔබ එතුමා සමග දරණ සම්බන්ධතාවය ඔබව නිවහල් කරන්නාවූ, වරප්‍රසාදලත් ජීවිත ක්‍රමයක් බවට පත් වනු ඇත. එවිට දේව කැමැත්ත යනු නිකම්ම තහංචි පද්ධතියක් හෝ ආඥා රැසක් පමණක් වීම නවතිනු ඇත. ඔබගේ ජීවිතය එතුමාගේ සැලැස්ම හා එක එල්ලේ පවත්වාගැනීමේ අභියෝගයක් බවට පත්වනු ඇත.

# බයිබලීය උදාහරණයක්

දාවිත් රජතුමාගේ උදාහරණය සලකා බලන්න. ඔහුගේ ජීවිතයේ මුල් කාලයෙහි ඔහු දේව කැමැත්තට දැක්වූ එකඟතාවය මෙවන් රූපයකින් පෙන්වා දිය හැකි වනු ඇත.

**දේව කැමැත්තට දාවිත් දැක්වූ එකඟතාවය.**



දාවිත් මුලින්ම රජවූ අවස්ථාවෙහිදී දේව කැමැත්තට එකඟව හැසිරුණේය. දෙවියන්වහන්සේ දාවිත්ට තමාගේ සිතට එකඟ මනුෂ්‍යයා යයි නම් කළ සේක. නමුත් පසුව ඔබ අන් පුරුෂයෙකුගේ භාර්යාව සමග පව් කොට අවජාතක දරුවෙකු බිහිකළේය. මෙය දෙවියන්වහන්සේගේ ලිඛිත දේව වචනයට එකහෙලාම විරුද්ධ වූ අකීකරුකමකි. දාවිත් දෙවියන්වහන්සේගේ ඉදිරිපිටට පසුතැවීමෙන් ඇවිත්, සමාව ලැබ, නැවත දෙවියන්වහන්සේ සමග නිසි සම්බන්ධතාවයකට පැමිණුනේය.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් හට කථාකරන්නාවූ ක්‍රම සෝදිසි කර බලන්නාවූ ඊළඟ පරිච්ඡේද දෙකෙහිදී දෙවෙනි චිත්‍රය ඔබේ මතකයේ රඳවා තබාගන්න. වැදගත් වන්නේ දේව කැමැත්තට ඔබගේ එකගතාවය සම්පූර්ණ ඒකකයක් ලෙස ගත් කළ ඔබ රැඳී සිටින රටාවයි.

දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට ඉගෙනගන්නාවූ අත්දැකීම තුළ ඔබ ලබන සුබවාදී මෙන්ම අසුබවාදී කරුණු සියල්ල තුළ දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්ත සොයා ගැනීමේ ඉදිරියටම යාමට හැකිය. ඉදහිට ඔබ අසමත් වූවත් ඒ ගැන නොතකා තවත් එකගතාවයට පත්වීමට ප්‍රයත්න දරන්න. කිසි විටක අත්හැර දමන්න එපා !

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

___

___

___

2. පහත සඳහන් වාක්‍යය සුදුසු වචන යොදා හිස්තැන් පුරවා සම්පූර්ණ කරන්න.

මෙම පරිච්ඡේදයෙහි සාකච්ඡා කළාවූ දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි

අංශ දෙක නම්, ________________, ______________________යෙහි එළිදරව් කරදී ඇති සහ ________________, ______________________යෙහි එළිදරව් කර දී නොමැති කැමැත්තය.

3. පහත සඳහන් අවස්ථාවට උචිත බයිබලීය ප්‍රතිපත්තියක් සපයන්න.

> "මම ගැළවීම නොලබපු පිරිමියෙකු විවාහ ගිවිස ගෙන සිටිමි. ඔහු කාරුණිකයි, ගුණගරුකයි, උසස් සදාචාරාත්මක ප්‍රමිතීන් රකින්නෙකි. මම ඇදහිලිවන්තයෙකු වුවත් ඔහු එසේ නොවේ. අපි විවාහ වුවාට පසුව මම දේවස්ථානයට යාම ගැන ඔහු කිසි විරුද්ධත්වයක් නැති බවත් සමහර විට ඔහුත් මා සමග එන්න පුළුවනැයි ඔහු කියයි. අප දෙදෙනාගේ යෝජිත විවාහය සම්බන්ධයෙන් දේව කැමැත්ත ඉටු වේවා යැයි මම යාච්ඤා කරමි"

මෙයට අදාළ වන බයිබලීය ප්‍රතිපත්තිය නම්...

___

___

___

4. මෙම පරිච්ඡේදයෙහි සාකච්ඡා කළාවූ දේව කැමැත්ත පිළිබඳ සාධක හය නම් කරන්න.

___

___

___

___


___

___


5. මෙම ප්‍රකාශය සත්‍යයද අසත්‍යයද : දෙවියන්වහන්සේගේ වචනයෙහි යම් කිසි කාරණාවක් සම්බන්ධව දේව කැමැත්ත එළිදරව් කරදී තිබියදී පවා ඔබ තවදුරටත් එය ස්ථිර කරගැනිමටසනාථවීමක් සෙවිය යුතුය. මෙම ප්‍රකාශය ______________________ .

6. පහත සඳහන් රූප සටහන් දෙකෙන් දේව කැමැත්තට ඇදහිලිවන්තයාගේ සැබෑ එකඟතාවය පෙන්නුම් වන්නේ කුමන රූප සටහනින්ද?

1. රූප සටහන:



2. රූප සටහන:



7. මෙම පරිච්ඡේදයෙහි දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි රටාව ලෙස ඉදිරිපත් කර ඇති ක්ෂේත්‍ර හතර මොනවාද?

______________________ ______________________

______________________ ______________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

දෙවියන්වහන්සේ තම කැමැත්ත මිනිසාට සන්නිවේදනය කිරීමට දේව වචනයෙහි පොදු ප්‍රතිපත්ති සහ උදාහරණ ඇතුළත් කොට තිබේ. එසේම බොහෝ කාරණා පිළිබඳව දෙවියන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කර දෙන්නාවූ විශේෂිත උපදෙස් ලිඛිත දේව වචනයෙහි සපයා දී ඇත. මෙයට බයිබලයෙහි ඇතුළත් සියලු පොරොන්දු සහ ආඥා අයිති වේ. සමහර කාරණාවලදී දෙවියන්වහන්සේ "මෙය ඔබ උදෙසා මාගේ කමැත්තය..." කියා පැහැදිලිව ප්‍රකාශ කර තිබේ. ඔබගේ අධ්‍යයනය සඳහා එම පද පහතින් දී ඇත. එම ලැයිස්තුවට ඔබ සොයාගන්න බයිබල් පාඨ ද එකතු කරගන්න.

දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙසට එතුමා එළිදරව් කර ඇති කාරණා කිහිපයක් මොනවාද? පහත සඳහන් පද අධ්‍යයනය කර බලන්න.

ඔබ උදෙසා එතුමාගේ සැලැස්ම:

**මක්නිසාද මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත නම්, පුත්‍රයාණන් බලා, ඔහු කෙරෙහි අදහාගන්නාවූ සැමදෙනම සදාකාල ජීවනය ලැබීමය: මමද අන්තිම දවසේදී ඔහු නැගිටුවන්නෙමියි කීසේක. (යොහන් 6:40)**

**මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේ මට දුන් සියල්ලෙන් කිසිවක් නැතිවෙන්ට නැර මා විසින් අන්තිම දවසේදී එය නැගුටුවීමය. (යොහන් 6:39)**

**පියාණන්වහන්සේ මට දෙන සියල්ලෝම මා වෙතට එන්නෝය: මා ළඟට එන තැනැත්තා මා විසින් කිසිසේත් අහක දමන්නේ නැත. (යොහන් 6:37)**

**උන්වහන්සේ දැන් තිබෙන නපුරු ලෝකයෙන් අප ගළවන පිණිස අපගේ පියවූ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස අපේ පව් නිසා තමන්ම පාවාදුන්සේක. (ගලාති 1:4)**

**උන්වහන්සේ විසින් ප්‍රේමවන්තයාණන්වහන්සේ තුළ අපට නොමිළයේ දුන්නාවූ තමන්වහන්සේගේ කරුණාවේ මහිමයේ ප්‍රශංසාව සඳහා, එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන් වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්න කමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:5,9-11)**

**අප උන්වහන්සේගේ මැවිලිවල නාඹුල් ඵල විශේෂයක්වන පිණිස තමන්ගේම කැමැත්ත ලෙස සත්‍යතාවේ වචනයෙන් අප ඉපදවූසේක. (යාකොබ් 1:18)**

## ඔබගේ ප්‍රේමණීයයන් උදෙසා එතුමාගේ කැමැත්ත:

**ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමීන්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව, නුඹලා කෙරෙහි බොහෝකල් ඉවසනසේක. (2 පේත්‍රුස් 3:9)**

## ඔබගේ පවිත්‍රවීම පිළිබඳව එතුමාගේ කැමැත්ත :

දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, නුඹලා ශුද්ධව සිටීමය. නුඹලා වේශ්‍යාකමින් වැලකී. (1තෙසලෝනික 4:3)

## යාච්ඤාව සහ ස්තුතිදීම පිළිබඳ එතුමාගේ කැමැත්ත.

නොකඩව යාච්ඤාකරපල්ලා. සියල්ලේදී ස්තුතිකරපල්ලා මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලා ගැන දෙවියන්වහන්සේගේ කැමැත්ත මේය. (1 තෙසලෝනික 5:17-18)

ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය. නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. (මතෙව් 16:19)

## ඔබගේ ජීවිතරටාව පිළිබඳව එතුමාගේ කැමැත්ත.

මක්නිසාද මෙසේ නුඹලා යහපත කිරීමෙන් අඥුවන මනුෂ්‍යයන්ගේ අඥානකම නිශ්ශබ්දකිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තය. (1 පේත්‍රුස් 2:15)

## ශුද්ධාත්මයාණන්වහන්සේ සම්බන්ධයෙන් ඔබ උදෙසා එතුමාගේ කැමැත්ත.

අන්තිම දවස්වලදී මාගේ ආත්මය සියලු මනුෂ්‍යයන් පිට වගුරුවන්නෙමි. නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ තරුණයෝද දර්ශන දකින්නෝය, නුඹලාගේ මහල්ලන්ද ස්වප්න දකිනවා ඇත. එසේය: ඒ දවස්වලදී මාගේ දාසදාසීන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි: ඔව්හු අනාගතවාක්‍යය කියන්නෝය. (ක්‍රියා 2:17-18)

## ඔබගේ ක්‍රිස්තියානි සාක්ෂිය සම්බන්ධයෙන් එතුමාගේ කැමැත්ත:

මා අනුව වරෙල්ලා, මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් වෙන්ට සලස්වන්නෙමියි ඔවුන්ට කී සේක. (මාර්ක් 1:17)

නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)

## ක්‍රිස්තුස්වහන්සේ තුළ ළදරුවන් හා බාලයන් පිළිබඳ එතුමාගේ කැමැත්ත.

එසේම මේ බාලයන්ගෙන් එක්කෙනෙක්වත් විනාශවෙනවාට ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ කැමති නොවනසේක. (මතෙව් 18:14)

## දුක්විඳීම පිළිබඳ එතුමාගේ කැමැත්ත :

එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින්නෝ යහපත කරමින්, විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා. (1 පේත්‍රුස් 4:19)

## භාණ්ඩ සම්පත් පිළිබඳව එතුමාගේ කැමැත්ත.

නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨ කමද සොයපල්ලා: මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)

දීපල්ලා, එවිට නුඹලාටත් දෙනු ලබන්නේය... (ලූක් 6:38)

## ඔබගේ සදාකාලික ඉරණම පිළිබඳව එතුමාගේ කැමැත්ත.

පියාණෙනි, ඔබ මට දුන් මහිමය ඔබ මට දුන්නාවුන් විසිනුත් දක්නා පිණිස මා සිටින තැන ඔවුනුත් මා සමග සිටිනවාට කැමැත්තෙමි. මක්නිසාද ලෝකය මැවීමට පළමුවෙන් ඔබ මට ප්‍රේමකළසේක. (යොහන් 17:24)

# හයවන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හට කතාකරන ක්‍රමය

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හට කතාකරන විවිධ ක්‍රම නම් කිරීමට.
- දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හට කතාකිරීමේ ක්‍රම සදහා සීමා වී නොමැති බව වටහාගැනීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මේ නිසා, නුඹලා අනුවණයෝ නොවී, ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම් ගනිල්ලා. (එපීස 5:17)**

### හැඳින්වීම

මෙම පාඩමාලාවෙහි හැඳින්වීමෙහිදී අපි ප්‍රකාශකළ ආකාරයට බයිබලය යනු දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමග කතාබස් කළ ආකාරයත් දෙවියන්වහන්සේගේ හඬට මිනිසා ප්‍රතිචාර දැක්වූ ආකාරයත් පිළිබද ඉතිහාසයයි. මෙම පරිච්ඡේදයෙහිදී බයිබලීය වාර්තා සොයා බලා දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමග අදහස් හුවමාරු කළ ආකාරය සොයා බලමු.

### ලිඛිත වචනය

මීට පෙර පාඩම් වලදී අපි ඉගෙන ගත් පරිදි දෙවියන්වහන්සේ තම ලිඛිත වචනයෙන් මනුෂ්‍යයන්ට කතා කරන සේක. දැනටම දේව වචනයෙහි එළිදරව් කරදී ඇති කාරණා පිළිබඳව එතුමා මනුෂ්‍යයා හට නැවත කතාකිරීම අවශ්‍ය නොවේ. දෙවියන්වහන්සේ ඔබට කතාකිරීමට අනෙකුත් ක්‍රම භාවිතා කරන කල කිසිවිටකත් එය ලිඛිත වචනයට ප්‍රතිවිරුද්ධ නොවේ.

### යාච්ඤාව

යාච්ඤාවට පිළිතුරු දීමක් ලෙස දෙවියන්වහන්සේ කතාකළ අවස්ථා පිළිබඳ බොහෝ බයිබලීය ආදර්ශ දැකිය හැක. පාවුල් සහ බාර්ණබස් යාච්ඤාවෙන්ද නිරාහාරයෙන්ද (ආත්මික හේතු උදෙසා ආහාර නොගෙන සිටීම) ගත කළ විට දෙවියන්වහන්සේ ඔවුනට කතා කළ සේක.

> **ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට: මා විසින් බාර්ණබස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලායයි කීසේක. එවිට ඔව්හු නිරාහාරයෙන් හිඳ යාච්ඤාකොට ඔවුන් පිට අත් තබා, ඔවුන් පිටත්කර හැරියෝය. (ක්‍රියා 13:2-3)**

යාච්ඤාව නම් දෙවියන්වහන්සේගේ කැමැත්ත මිහිපිට ඉටුවීමට කරන ඉල්ලීමකි. යේසුස්වහන්සේ තම ගෝලයන්ට යාච්ඤා කිරීමට උගන්වමින් :

**ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. (මතෙව් 6:10)**

යේසුස්වහන්සේ තම ගෝලයන් තෝරාගැනීමට පෙර පියාණන්වහන්සේගෙන් මග පෙන්වීම ඉල්ලා යාච්ඤා කළ සේක.

**තවද ඒ දවස්වලදී උන්වහන්සේ යාච්ඤාකරන පිණිස කන්දකට ගොස් දෙවියන්වහන්සේට යාච්ඤාකරමින් මුළු රාත්‍රිය ගතකළසේක. පහන්වූ කල උන්වහන්සේ තමන්ගේ ගෝලයන් කැඳවා ඔවුන්ගෙන් දොළොස් දෙනෙකු තෝරාගෙන, ඔවුන්ට ප්‍රේරිතයෝයයි නම් තැබූසේක. (ලූක් 6:12-13)**

යේසුස්වහන්සේගේ මරණයට පෙරද දෙවියන්වහන්සේගේ කැමැත්ත උදෙසා යාච්ඤා කළ සේක.

**පියාණෙනි ඔබ කැමතිසේක් නම්, මේ කුසලාන මගෙන් පහකළ මැනව. එසේවී නුමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවයි කීසේක. (ලූක් 22:42)**

## උපදේශකවරු

දෙවියන්වහන්සේ තම කැමැත්ත ක්‍රිස්තියානි උපදේශකවරු තුළින් ප්‍රකාශකරන සේක. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් තුළින් උපදෙස් පැතු බොහෝ අවස්ථාවන් පිළිබඳව බයිබලය උදාහරණ ඉදිරිපත් කරයි.

**ඥාණවන්ත පාලනයක් නැති විට සෙනඟ වැටෙති: එහෙත් මන්ත්‍රීවරුන් රාශියක් කරණ කොටගෙන ආරක්ෂාව ඇත්තේය. (හිතෝපදේශ 11:14)**

**මෝඩයාගේ මාර්ගය තමාගේ ඇස්වලට නම් හරිව පෙනෙන්නේය. එහෙත් ඥාණවන්තයා දැනමිතිකම් අසන්නේය. (හිතෝපදේශ 12:15)**

## බාහිර අවස්ථා

දෙවියන්වහන්සේ තම සැලසුම බාහිර අවස්ථා අනුවද ප්‍රකාශයට පත් කරන සේක. මේ පිළිබද ඉතා හොඳ උදාහරණයක් නම් උප්පත්ති 37-50 දක්වා වාර්තාකර ඇති යෝසෙප්ගේ ජීවිත කතාවයි.

යෝසප්ගේ සොහොයුරෝ ඔහුව මිසර දේශයට වහල්කමට වික්කෝය. නමුත් ඔහු එය දුටුවේ දෙවියන්වහන්සේගේ මග පෙන්වීමක් ලෙසටය.

**නුඹලා මේ රටට මා වික්ක නිසා ශෝකනොවෙල්ලා, නුඹලාටම කෝප නොවෙල්ලා. මක්නිසාද දෙවියන්වහන්සේ ජීවිත ආරක්ෂාකරන පිණිස නුඹලාට පෙරටුව මා එවූ සේක. කුමක්හෙයින්ද මේ දෑවුරුද්දේ දේශයෙහි සාගතය පැවතුණේය. සීසෑමක්වත් කැපීමක්වත් නැත්තාවූ තවත් පස් අවුරුද්දක් වන්නේය. දෙවියන්වහන්සේ නුඹලා පොළොවෙහි ඉතිරි කරන පිණිසද මහත්වූ ගැළවීමකින් නුඹලාගේ ජීවිත ආරක්ෂාකරන පිණිසද නුඹලාට පෙරටුව මා එවූ සේක. එබැවින් මා මෙහි එවූවේ නුඹලා නොව දෙවියන්වහන්සේය. උන්වහන්සේ මා ඵාරාවෝට පියෙක්ද ඔහුගේ මුළු ගෙදරට ස්වාමියෙක්ද මුළු මිසර දේශයට ආණ්ඩුකාරයෙක්ද කළ සේක. (උප්පත්ති 45:5-8)**

යෝසෙප්ගේ ජීවිතයෙහි ඔහුට කිසි ලෙසකින්වත් පාලනය කළ නොහැකි වූ සිදුවීම් සමූහයක් තුළින් දෙවියන්වහන්සේ ඔහුව පාවිච්චි කළේ දරුණු සාගත කාලයකින් දහස් ගණනක් ජනතාව බේරා ගැනීමටය.

පාවුල්, 1 තෙසලෝනික 2:18 හි ඉතා වැදගත් වචන කිහිපයක් ලියයි. තෙසලෝනිකයේ ඇදහිලිවතුන්ට ඔහු පැවසුයේ සාතන් තමාට අවහිර කළ බැවින් ඔවුන් බැහැදැකීමට ඒමට නොහැකි වූ බවය. ඔහුට යන්ට නොහැකි වූ බැවින් තෙසලෝනිකයෙහි සභාවට ලිපි ලිවීය. සාතන්ගේ බාධාකිරීම නිසා බිහිවූ 1 තෙසලෝනික පොත ඔහුගේ එක් සංචාරයකින් තෙසලෝනියේ සභාව ලබන්නාවූ ප්‍රයෝජනයට වඩා අති මහත් ප්‍රයෝජනයක් සදාකාලිකව සපයා දුනි. එය දැන් සියවස් ගණනාවක සිට කිතුනුවන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතාවේ යෙදේ.

දෙවියන්වහන්සේගේ අනුදැනුමෙන් තොරව කිසිවක් සිදු නොවේ. ඔබ දේව කැමැත්ත යයි සිතන්නාවූ සමහර කාරණාවලට බාධා පැමිණෙන විට පවා දෙවියන්වහන්සේ පාලනයෙහි සිටි සේක. දෙවියන්වහන්සේට මනුෂ්‍යයාගේ හෝ සාතන්ගේ ඕනෑම ක්‍රියාවක් රැගෙන, උන්වහන්සේගේ පරමාර්ථය සඳහා එය උපයෝගිකරගත හැකිය. ඇතිවන්නාවූ සිදුවීම් සම්බන්ධයෙන් දෙවියන්වහන්සේගෙන් අපට පුදුමාකාර පොරොන්දුවක් හිමිව පවතී.

> **තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව. (රෝම 8:28)**

(අනතුරු ඇඟවීමේ වචනයක් එකතු කරමු: දේව කැමැත්ත නිර්ණය කිරීම සඳහා සිදුවීම් පමණක් භාවිතා කිරීම පිළිබඳව ප්‍රවේසම් විය යුතුය. උදාහරණයක් ලෙස දෙවියන්වහන්සේ යෝනා නම් අනාගතවක්තෘතුමාට කතාකොට නිනිවයට ගොස් දේශනා කරන්නට පැවසූ සේක. ඔහු වරාය අසලට ආ කල තාර්ෂස් බලා පිටත්ව යන නැවක් එහි සූදානම්ව තිබුණි. ඔහු තමාටම කතාකරගෙන "මේ බෝට්ටුවේ නම් මට යන්න ඉඩක් තියෙනවා. ඒක යන්නේ විරුද්ධ දිශාවට වුනත්, මම එහේ යන එක දේව කැමැත්ත වෙන්න ඇතැ'යි කියා ගන්නට ඇත.)

ජීවිතයෙහි සිදුවීම් දෙස බැලිය යුත්තේ අනෙකුත් ක්‍රම මගින් දෙවියන්වහන්සේ දැනටම එළිදරව් කරදී ඇති කරුණු අනුසාරයෙනි. දෙවියන්වහන්සේ ඒ වනවිටත් තම කැමැත්ත යෝනාට ප්‍රකාශ කරදී තිබුණි. යෝනා තමාගේ ආශාව ඉටු කරගැනීමට අවස්ථාවාදී විය.

## විවර වූ සහ වැසුනු දොරවල්

ජීවිතයෙහි බාහිර තත්වයන් අනුව "විවෘත වූ හෝ වැසුනු දොරක්" ලෙස අපි සිදුවීම් නම් කිරීමට පුරුදුව සිටිමු. පාවුල් කොරින්තිවරුන්ට ලියමින් :

> **නුමුත් පෙන්තකොස්තය වෙන තුරු එපීසයෙහි නවතින්නෙමි· මක්නිසාද මහත්වූ බලවත් දොරක් මට ඇර තිබේ, බොහෝ විරුද්ධකාරයෝද සිටිති. (1 කොරින්ති 16:8-9)**

පාවුල් තුමා එපීසයෙහි නැවතී සිටීමට තීරණය කළේ දෙවියන්වහන්සේ විසින් සූදානම් කරන ලද සිදුවීම් අනුව ඔහුට කිතුනු සේවාව සඳහා මහඟු අවස්ථාවක් ලැබීම නිසාය. ඔහු මෙය විවර වූ දොරටුවක් ලෙස නම් කළේය.

තවත් සමහර අවස්ථාවලදී පාවුල් කිසියම් ප්‍රදේශයක සේවය කිරීමට කැමතිව සිටියත්, එහි දොරටු වැසී තිබුණු බව සඳහන් කරයි.

> **ඔවුහු ආසියාවේදී වචනය කියාදෙන්ට ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ, පිරිගිය සහ ගලාතිය පළාත මැදින් ගියෝය· ඔවුහු මිසිය ඉදිරියට ඇවිත්, බිතිනියට යන්ට උත්සාහකළෝය· නුමුත් යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන් සේක. (ක්‍රියා 16:6-7)**

දොරටුවක් වැසී තිබීම ඔබ දේව කැමැත්ත මගහැර ගොස් ඇති බව නොපවසයි. එසේම එයින් පැවසෙන්නේ එය දේව කැමැත්ත නොවන බවද නොවේ. පසු කලෙක පාවුල් ආසියාවට ශුභාරංචිය දේශනා කළේය. දෙවියන්වහන්සේ දොරටුවක් වැසීමෙන්ද ඔබව මගපෙන්වනු ඇත. උන්වහන්සේ වැසුනු දොරටු මෙන්ම ඇරුණු දොරටු මගින්ද මග පෙන්වන සේක. සමහර අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ සැලැස්මට අනුව නියමිත වේලාව නොවන බැවින් දොරවල් වසා තබනු ඇත. පසු කලෙක එම දොරටු ඔබට විවර වනු ඇත.

## දේව දූතයෝ

සොදෙම්හි තම නිවසට පැමිණි දර්ශනය වූ දේව දූතයෝ ලොත්ට මග පෙන්වූහ. දේව දූතයෝ ඔහුට පැවසුයේ සොදොම කෙරෙහි දේව විනිශ්චය පතිත වීමට නියමිත බැවින් සොදොම අත් හැර යන ලෙසටය (උත්පත්ති 19). දේව දූතයෙක් පිලිප්ට කතාකොට සමාරියට යන ලෙස පැවසීය (ක්‍රියා 8:26). යොහන් බව්තිස්තගේ හා යේසුස්වහන්සේගේ උපත ප්‍රකාශ කළේ දේව දූතයෝය (ලූක් 1).

දෙවියන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍යයන්ට ප්‍රකාශ කර දීමට දේව දූතයෝ පැමිණි අවස්ථාවන් රාශියක් පිළිබඳ බයිබලයේ වාර්තා වේ. ඔබ ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කිරීමේදී තවත් උදාහරණ සොයා ගත හැකි වනු ඇත.

## හාස්කම්

හාස්කමක් යනු මනුෂ්‍යය හැකියාවෙන් කිසිසේත්ම ඉටු කළ නොහැකි අධි ස්වාභාවික සිදුවීමකි.

1 රාජාවලිය 18 පරිච්ඡේදයෙහි වාර්තාවී ඇති සිදුවීමේදී හාස්කමක් තුළින් දෙවියන්වහන්සේ කතා කළ සේක. ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි පූජාසනයක් සූදානම් කිරීමට එලියා අනාගතවක්තෘතුමාට පැවරිණි. එලියා පූජාසනය සාදා මෙසේ හඬ ගැසීය:

> **තවද සවස යාගය ඔප්පු කරන වේලාවේ එලියා අනාගතවක්තෘ තෙමේ ළංවී කථාකොට: ආබ්‍රහම්ගේද ඊසාක්ගේද ඉශ්‍රායෙල්ගේද දෙවිවූ ස්වාමීන්වහන්ස, ඔබ ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ බවද මා ඔබගේ සේවකයා බවද මා මේ කළේ ඔබගේ වචනය ලෙස බවද අද දැනගන්ට ලැබේවා. එවිට ස්වාමීන්වහන්සේ වෙතින් ගිනි බැස පූජාවත් දරත් ගලුත් ධූලිත් දවා අගලේ වතුරත් වියළවා දැම්මේය. මුළු සෙනග ඒ දැක මුහුණින් වැටී: ස්වාමීන්වහන්සේම දෙවියන්වහන්සේය, ස්වාමීන්වහන්සේම දෙවියන්වහන්සේයයි කීවෝය.** (1 රාජාවලිය 18:36,38,39)

දෙවියන්වහන්සේ මෙම හාස්කම රූප නමස්කාර කළාවූ ජනතාවට කතාකිරීමටත් සැබෑවූ එකම ජීවමාන දෙවියන්වහන්සේ තමා පමණක් බව ජනතාවට එළි කිරීමටත් භාවිතා කළ සේක.

දෙවියන්වහන්සේ ස්වභාව ධර්මයෙහි ඇති කළ හාස්කම් තුළින් තම කැමැත්ත හෙළිකොට තිබේ. ඉශ්‍රායෙල් ජනතාව කාන්තාරයෙහි ගමන් කළාවූ කාලය තුළ දවාලේ වළාකුලකින්ද රාත්‍රියේ ගිනි ටැඹකින්ද දෙවියන්වහන්සේ ඔවුනට මග පෙන්වූ සේක.

> **තවද ඔවුන් දවාලේත් රාත්‍රියේත් ගමන් කරන පිණිස ස්වාමීන්වහන්සේ ඔවුන්ට මග පෙන්වීමට දාවල් වලා ටැඹකින්ද රාත්‍රියේ ඔවුන්ට එළිය දීමට ගිනි ටැඹකින්ද ඔවුන්ට පෙරටුව ගිය සේක. දාවල් වලා ටැඹද රාත්‍රියේ ගිනි ටැඹද සෙනග ඉදිරියෙන් පහව නොගියේය. (නික්මයාම 13:21-22)**

දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ට හාස්කම් තුළින් කතාකළාවූ තව බොහෝ උදාහරණ බයිබලයෙන් සොයාගත හැකිය. ඔබගේ පෞද්ගලික අධ්‍යයනයෙහිදී මේවා සොයා බලන්න.

# සිහින

දෙවියන්වහන්සේ අප සමග කතා බහ කිරීමට කෙතරම් ආශාවෙන් සිටිනවාදයත් අප නිදා සිටින අතරද එතුමා අපට කථාකරන සේක! දෙවියන්වහන්සේ සිහින තුළින් කතාකරන සේක. මේ සිහින සාමාන්‍යයෙන් හැමෝම අත්දකින ස්වාභාවික සිහින නොවේ. එම සිහින දෙවියන්වහන්සේ විසින් සපයන අධි ස්වාභාවික වූ සිහින වේ. එවන් සිහින සවිස්තරාත්මකව, සුවිශේෂී දේව කැමැත්ත හෙළිදරව් කර දෙන සිහින වේ.

එවන් සිහින පිලිබඳව බයිබලිය උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- දෙවියන්වහන්සේ අබිමෙලෙක්ට සිහිනයකින් අනතුරු අඟවමින් ආබ්‍රහම්ගේ භාර්යාව වූ සාරා ගැනීමේ පාපය ප්‍රකාශ කළ සේක. උත්පත්ති 20:3

- යාකොබ් හට, තමා දෙවියන්වහන්සේට වූ භාරය පිළිබඳ මතක් කර දීමට සිහිනයකින් දේව දූතයෙක් ඔහුට කතාකළේය. උත්පත්ති 31:11-13.

- දෙවියන්වහන්සේ යෝසෙප් හට දේව කැමැත්ත හෙළිකර දීමට සිහිනයක් භාවිතා කළ සේක. උත්පත්ති 37.

- දෙවියන්වහන්සේ සිහිනයකින් සාලමොන්ට දර්ශනය වී ඔහු කැමති ඕනෑම දෙයක් ඉල්ලීමට අවස්ථාව සපයාදුනි. 1 රාජාවලිය 3:5.

- දුෂ්ට රජ කෙනෙකු සිටි බැවින් එඬේරුන්ට වෙනත් මාර්ගයකින් හැරී යන ලෙස දැන්වීමට සිහිනයක් උපයෝගී කරගන්නා ලදි. මතෙව් 2:12-13.

ඉහතින් දැක්වූයේ දෙවියන්වහන්සේ සිහින තුළින් කතාකිරීම පිළිබද උදාහරණ කිහිපයක් පමණකි. දේව වචනයෙන් මෙම ක්‍රමය අධ්‍යයනය කිරීම දිගටම කරගෙන යන අතර ඔබට තවත් උදාහරණ හමුවේවි.

# දර්ශන

දර්ශන සිහින හා සමාන නමුත් දර්ශන දකින්නේ ඔබ නිදාගෙන සිටින විට නොව අවදියෙන් සිටින විටය. එය නින්ද නොගොස් සිහින දකිනවා වැනිය. දර්ශන ස්වාභාවික දෑසින් මෙන්ම ආත්මික දෑසින්ද දැකිය හැකිය. එනම්, ඔබගේ පියවී දෑසින් යමක් නොදැක්කත් දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයට යම් චිත්‍රයක් සැපයීමය.

දෙවියන්වහන්සේ මිනිසා සමග කතා කිරීමට දර්ශන භාවිතා කළ අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ.

- දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පෙන්නුම් වී ඔහුට මහත් පොරොන්දුවක් දුන් සේක. උත්පත්ති 15.

- දානියෙල් පොත දර්ශන (සහ සිහින) වලින් පිරී ඇත. දෙවියන්වහන්සේ ලෝකයෙහි අනාගතය හෙළිදරව් කරදීමට එම දර්ශන යොදාගත් සේක. දෙවියන්වහන්සේ පරණ ගිවිසුමෙහි තව බොහෝ අනාගතවක්තෘවරුනට කතාකිරීමට දර්ශන යොදාගත් සේක.

- දෙවියන්වහන්සේ පේතෘස් හට අන්‍යජාතීන් වෙත ශුභාරංචිය ගෙන යාමේ අවශ්‍යතාවය පෙන්වා දීමට දර්ශනයක් භාවිතා කළ සේක. ක්‍රියා 10.

- දෙවියන්වහන්සේ පාවුල්ව මකිදෝනියට කැඳවූයේ දර්ශනයක් මගිනි. ක්‍රියා 16:9

- දෙවියන්වහන්සේ රාත්‍රියේ දර්ශනයකින් පාවුල්ට කතාකළ සේක. ක්‍රියා 18:9-10.

- බයිබලයෙහි අවසාන පොත වන එළිදරව් පොත යොහන් දුටු දර්ශනයක් මත පදනම් වී ඇත.

## කනට ඇසෙන හඬ

දෙවියන්වහන්සේ දමස්කයට යන මාවතෙහිදී පාවුල්ට ඇසෙනසේ හඬකින් කතාකළ සේක. මෙම කථාව ක්‍රියා 9 වෙනි පරිච්ඡේදයෙහි ඔබට කියවිය හැකිය.

> **ඔහු බිම වැටුණේය, එවිට: සාවුල්, සාවුල්, නුඹ මට පීඩාකරන්නේ මක්නිසාදැයි තමාට කියන හඬක් ඔහුට ඇසුණේය. ස්වාමීනි, ඔබ කවුදැයි ඔහු ඇසීය. උන්වහන්සේද, මම වනාහි නුඹ පීඩාකරන යේසුස්ය. (ක්‍රියා 9:4-5)**

දෙවියන්වහන්සේ කනට ඇසෙන හඬින් සාමුවෙල්ට ද කතාකළ සේක.

> **ස්වාමීන්වහන්සේ ඇවිත් සිට වෙන වතාවලදී මෙන්: සාමුවෙල්, සාමුවෙල් කියා හඬගැසූ සේක. එවිට සාමුවෙල්: කථාකළ මැනව: ඔබවහන්සේගේ මෙහෙකරුවා අසාගන ඉන්නවායයි කීවේය. (1 සාමුවෙල් 3:10)**

බයිබලයෙහි "දෙවියන්වහන්සේ මෙසේ කී සේක" හෝ "මෙසේ ආඥාකළ සේක" යනුවෙන් සඳහන් වන බොහෝ වදන් වැකි ඇත. මේ සියල්ල උන්වහන්සේ බොහෝ විට ඇසෙන පරිදි කතා කළ වදන්ය. දෙවියන්වහන්සේ කතාකරන්නාවූ තවත් ක්‍රමයක් තිබේ. එනම්:

## ශුද්ධාත්මයාණන්ගේ අභ්‍යන්තරික හඬය

බොහෝ අවස්ථාවලදී දෙවියන්වහන්සේ කණට ඇසෙන හඬට වැඩිය ශුද්ධාත්මයාණන්ගේ ඇතුළාන්ත හඬ මිනිසාට කතාකිරීමට යොදා ගනී. මෙය "ආත්මයාණන් විසින් මග පෙන්වනු ලැබීම" ලෙසට නම් කෙරේ.

> **මක්නිසාද දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය. (රෝම 8:14)**

"ආත්මයාණන් විසින් මගපෙන්වනු ලැබීමට" නම් මග පෙන්වීම ලබන තැනැත්තා ආත්මික ජීවිතයක් ගෙවිය යුතුය. පාපයෙහි මැරී සිටින ප්‍රාණයක්, ආත්මික ජීවනයෙන් තොර ජීවිතයක් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මගපෙන්වනු ලැබිය නොහැකිය. ආත්මයාණන් විසින් මගපෙන්වනු ලැබීම පෙන්නුම් කරන්නේ ඔබටම ඔබව මගපෙන්විය නොහැකි බවය. මෙය සත්‍යයක් බව ඔබ මීට පෙර පරිච්ඡේදවලදී ඉගෙනගෙන ඇත.

ඔබ ගැළවීමෙන් අළුත් උපත අත්දුටු කල දෙවියන්වහන්සේ ඔබහට එතුමාගේ කතාබහට සංවේදී ග්‍රාහක ආත්මයක් ඔබට ලබා දෙන සේක.

> **මම අලුත් සිතක් නුඹලාට දී, අලුත් ආත්මයක් නුඹලාට තුළ තබා, නුඹලාගේ මාංසයෙන් ගල් සිත පහ කොට, මාංසමය වූ සිතක් නුඹලාට දෙන්නෙමි. මාගේ ආත්මය නුඹලා තුළ තබා, නුඹලා මාගේ පනත් ප්‍රකාර හැසිර මාගේ විනිශ්චයන් පවත්වමින් ඒවා කරන්ට සලස්වන්නෙමි. (එසකියෙල් 36:26-27)**

ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මග පෙන්වනු ලබන කල ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ඔබගේ ආත්මයට දේව කැමැත්ත එළිකර දෙනු ඇත. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවාවන්ගෙන් එකක් වනුයේ මග පෙන්වීමය.

**එසේවී නුමුත් උන්වහන්සේ එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කළ, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථානොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරන සේක. (යොහන් 16:13)**

මනුෂ්‍යයාගේ ආත්මය පේත්‍රුස් සඳහන් කරන ආකාරයට "හදවතෙහි සැඟවී සිටින මිනිසාය" (1 පේත්‍රුස් 3:4). දෙවියන්වහන්සේ අභ්‍යන්තර මිනිසාට කථාකරන විට කතාකරන්නේ ඔබගේ ආත්මයටය. හිතෝපදේශ පොතෙහි ලේඛකයා පවසන්නේ මනුෂ්‍යයාගේ ආත්මය ස්වාමීන්වහන්සේගේ පහන හෝ ඉටිපන්දම බවය:

**මනුෂ්‍යයාගේ ආත්මය ස්වාමීන්වහන්සේගේ පහනය, එය සියලුම ඇතුල් කොට්ඨාස සෝදිසි කරන්නේය. (හිතෝපදේශ 20:27)**

ස්වාභාවික ලෝකයෙහි ඉටිපන්දමකින් ඔබට අඳුරෙහිදී දකින්නට උපකාරී වේ. ආත්මික ලොවෙහිදී දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයෙහි ඉටිපන්දම භාවිතා කොට ඔබගේ පියවර එතුමාගේ කැමැත්තට යොමු කරවන සේක. ඔබගේ ආත්මය තුළින් උන්වහන්සේ ඔබව මග පෙන්වා දැනුවත් කරන සේක.

වරක් ප්‍රේරිත පාවුල් නැවක ගමන් කරන අතරතුර නැවේ කපිතාන්වරයාට අනතුරු ඇඟවූසේය.

**මනුෂ්‍යයෙනි, මේ ගමන බඩුවලට සහ නැවට පමණක් නොව අපේ ජීවිත වලටත් අන්තරාය සහ බොහෝ අලාගත් පමුණුවන එකක් බව මට පෙනේයයි කීවේය. (ක්‍රියා 27:10)**

පාවුල් තමාට "දර්ශනයක් ලැබුණා" යැයි නොපැවසීය. ඔහුට සිහිනයක් හෝ දෙවියන්වහන්සේගේ කටහඬ ඇසුණු බව හෝ නොපවසයි. ඔහුගේ ආත්මයට දෙවියන්වහන්සේගෙන් සාක්ෂියක් ලැබුණු අතර එය නිවැරදි බව ඔප්පු විය.

ඔබගේ ආත්මය දෙවියන්වහන්සේට සංවේදී වීමට පුහුණු කළ යුතුය. අධ්‍යාපනය තුළින් බුද්ධිය සංවර්ධනය කිරීමට අපි බොහෝ කාලයක් වැය කරමු. ක්‍රීඩා හා ශාරීරික ව්‍යායාම මගින් ශාරීරික සංවර්ධනය සඳහා බොහෝ කාලයක් ගත කරමු. නමුත් බොහෝ විට ආත්මික සංවර්ධනය සඳහා ගත කරනුයේ ඉතාම සුළු කාලයකි. ඔබගේ මනස වාගේම ආත්මයටද අධ්‍යාපනය ලබා දිය හැකිය. ඔබගේ ශරීරය පුහුණු කොට සංවර්ධනය කළහැකි අයුරින්ම ඔබගේ ආත්මික ශක්තියද සංවර්ධනය කළ හැකිය. ඔබගේ ආත්මය පුහුණු කළ හැක්කේ දේව වචනය මෙනෙහි කිරීමෙනි.

**මේ ව්‍යවස්ථා පොත නුඹේ මුඛයෙන් පහනොවේවා, එහි ලියා තිබෙන සියල්ල කරන්ට බලාගන්න පිණිස රෑ දාවල් ඒ ගැන මෙනෙහි කරපන්න. එවිට නුඹේ මාර්ගය සඵලවී නුඹට ශුභ සිද්ධවන්නේය. (යෝෂුවා 1:8)**

ඔබගේ හෘදසාක්ෂියට නොයෙක් කරුණු ඒත්තු ගැන්වීමට දෙවියන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇතුලාන්ත හඬ පාවිච්චිකරන සේක. හෘද සාක්ෂිය නම් හරි වැරැද්ද පිළිබඳ දැනීම සඳහා දෙවියන්වහන්සේ දී ඇති ඇතුලාන්ත දැනීමකි.

*හැඟීම් :* ශරීර භාෂාවෙහි හඬයි. ඔබට හැඟෙන දෙය මගින් දෙවියන්වහන්සේ කිසිවිටක ඔබව මගපෙන්වීම නොකරයි. මාංශය ආත්මයෙහි සතුරෙකුය. එනිසා හැඟීම් ඔබ රවටන්නට පුළුවන.

*තර්කය :* මනසෙහි හඬයි. දෙවියන්වහන්සේගේ මාර්ග බොහෝ විට මිනිස් තර්කයනට ඔබ්බෙන් පවතී. උන්වහන්සේගේ සිතුම් පැතුම් ක්‍රමය ඔබගේ සිතුවිලිවලට වඩා ඉතා උසස්ය.

*හෘද සාක්ෂිය :* මනුෂ්‍යයාගේ ආත්මයෙහි හඬය, එය ඔබට කාරණා ඒත්තුගන්වා දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ කැමැත්ත වෙතට යොමු කරවයි. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ ආත්මයට කතාකරයි. ආත්මය හෘදසාක්ෂියට ඒත්තුගන්වයි. මෙමගින් ඔබ දේව කැමැත්තට එකඟතාවයකට තහවුරු කරනු

ලබයි. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ ආත්මයට කතාකොට, හෘදසාක්ෂිය ඒත්තුගැන්නූ විට, ඔබ එය දිගටම ගණන් නොගෙන සිටියහොත් ඔබගේ හෘද සාක්ෂිය "හංවඩු ගැසිමට" පත්වේ. එහි අරුත නම් ඔබගේ හෘදසාක්ෂිය ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඒත්තුගැන්වීම් වලට ප්‍රතිචාර නොදැක්වීමට දැඩි වීමය.

**තමුන්ගේම හෘදසාක්ෂියෙහි හංවඩු ලකුණු ඇත්තාවූ, සරණපවාගැනීම තහනම්කරන්නාවූ,... (1 තිමෝති 4:2)**

හිතෝපදේශ පොත පෙන්වා දෙන පරිදි දෙවියන්වහන්සේ මිනිසාගේ සිත හා හෘදසාක්ෂිය පාලනය කරන අතර එමගින් එතුමාගේ කැමැත්ත කරා යොමු කරවන බව පෙන්වා දෙයි.

**සිත පිළියෙළකිරීම මනුෂ්‍යයාට අයිතිය. එහෙත් දිවේ උත්තරය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය. (හිතෝපදේශය 16:1)**

**මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි: එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමීන්වහන්සේය. (හිතෝපදේශ 16:9)**

**රජුගේ සිත දිය පාරවල් මෙන් ස්වාමීන්වහන්සේගේ අතෙහි පවතී: උන්වහන්සේ කැමති අතකට ඒක හරවන සේක. (හිතෝපදේශ 21:1)**

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා

දෙවියන්වහන්සේ මිනිසාට කතාකරණ පිණිස ආත්මික දීමනා භාවිතා කරන සේක. ආත්මික දීමනා යනු ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙන්නාවූ විශේෂ දීමනාවන්ය. මෙම දීමනා වලින් කිහිපයක් මගින් ඔබහට දෙවියන්වහන්සේගේ අදහස් හුවමාරු කිරීම් ලැබිය හැකිය.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතාකරන්නාවූ එක් දීමනාවක් නම් අන්‍යභාෂාවක් (ඔහු නොදන්නා භාෂාවක්) තුළින් කථාකිරීමය. එම අන්‍යභාෂාවෙන් ලද පණිවුඩය පරිවර්ථනය කර දීම ද දෙවියන්වහන්සේගෙන් ලැබේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ යාච්ඤා භාෂාව (අන් භාෂාව) ද දේව කැමැත්ත වෙතට ඔබ යොමු කරවීමට ශුද්ධාත්මයාණන්වහන්සේ භාවිතා කරන සේක. දේව කැමැත්ත පිළිබඳව ඔබ යාච්ඤා කිරීමට නොදන්නා විට, අන්‍ය භාෂාවෙන් යාච්ඤා කරන්න.

**ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම්කරන බැවින්, සිත් විමසන තැනන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක. (රෝම 8:27)**

අනාගතවාක්‍ය පැවසීමේ දීමනාව ඇත. එමගින් දෙවියන්වහන්සේගෙන් ක්ෂණික පණිවුඩයක් තම ජනතාව වෙතට ගෙන එනු ලැබේ. ආත්ම විමසීමේ දීමනාව නමින් දීමනාවක් ඇත. අන් අය තුළ ක්‍රියාකරන්නාවූ ආත්ම පිළිබඳව දෙවියන්වහන්සේ මේ දීමනාවෙන් කතාකරන සේක. එසේම දෙවියන්වහන්සේ ප්‍රඥාවේ දීමනාව හා දැනගන්මේ දීමනාව තුළින් මිනිසාට කතා කරන සේක. මෙම දීමනාව තුළින් ස්වාභාවික මනසින් දැනගත හැකි ප්‍රමාණයට ඔබ්බෙන් මිනිසුන් හා සිදුවීම් පිළිබඳ බොහෝ කාරණා දිව්‍යමය අයුරින් හෙළි කර දෙයි.

## තවත් විවිධ ක්‍රම

බයිබලයෙහි සඳහන් තවත් මගපෙන්වීම් ලබන ක්‍රම දෙකක් නම් දාදු කැට දැමීම සහ ලොම් මිටිය භාවිතාකිරීමය. අපි මෙම ක්‍රම පිළිබඳව මීට පෙර පරිච්ඡේදවලදී සාකච්ඡා කළෙමු. මීට පෙර ඉගෙන ගත් පරිදි දාදුකැට දමීම අහඹු සිදුවීමකට ඉඩ හැරීමකි. මෙම ක්‍රමය භාවිතා කරන ලද්දේ ශුද්ධාත්මයාණන්වහන්සේ අලුත් පරිමාණයකින් දීමට පෙරය. එසේම ශුද්ධාත්මයාණන්වහන්සේගේ

මගපෙන්වීමේ ක්‍රියාව ආරම්භයෙන් පසුව (ක්‍රියා 2) දාදු දැමීම භාවිතා කොට නොමැත. ලොම් භාවිතා කිරීම බයිබලයෙහි සඳහන් වන්නේ එක් වරක් පමණකි. ජාතික අර්බුදයක් පැවති අවස්ථාවකදී ගිඩියොන් මෙම ක්‍රමය භාවිතා කළේය. එය ස්ථිරතාවය තහවුරු කිරීමට මිස මගපෙන්වීම ලැබීමට භාවිතා කළ දෙයක් නොවේ.

## දෙවියන්වහන්සේ සීමා වී නොමැත

දෙවියන්වහන්සේ සැමවිටම එකම ක්‍රමයට කතාකරන්නේ නැත. අපි දෙවියන්වහන්සේ එකම රටාවකට සීමා කිරීමට උත්සාහ කරමු. දෙවියන්වහන්සේ කිසියම් ක්‍රමයකට එක් වරක් කතාකර ඇත්නම් එතුමා අපිවද එම ක්‍රමයටම මගපෙන්වයි කියා අප විශ්වාස කරනු ඇත. නමුත් අපි මෙම පරිච්ඡේදයෙහි දී ඉගෙන ගත් පරිදි මනුෂ්‍යයා සමග කතාකිරීමට දෙවියන්වහන්සේට බොහෝ ක්‍රම තිබේ. දෙවියන්වහන්සේ නියමිත රටාවකට සීමා වී නොමැත. පහත සඳහන් උදාහරණ සලකා බලන්න.

**මෝසස්. :**

මෝසස්, කාන්තාරය මැදින් දෙවියන්වහන්සේ සෙනග පොරොන්දු වූ දේශය කරා ඉශ්‍රායෙල් ජනතාව ගෙන යන අතරමගදී මිලියන දෙකක් සෙනඟට ජලය සැපයීම ප්‍රධානතම අභියෝගයක් විය. එක් අවස්ථාවකදී දෙවියන්වහන්සේ මෝසෙස්ට කතාකොට පර්වතයට ගසන්නට කීසේක. ඔහු එසේ කළ විට පර්වතයෙන් ජලය ගලා ආවේය. තවත් අවස්ථාවක ඉශ්‍රායෙල් ජනතාව සාපිපාසාවෙන් සිටින විට දෙවියන්වහන්සේ, පර්වතයට කතාකරන්නට කීසේක. එනමුත් මෝසෙස් මීට පෙර කළ ආකාරයට පර්වතයට ගැසුවේය. මෙය දෙවියන්වහන්සේට අප්‍රසන්න විය. මෝසෙස්ට දඬුවම් විඳින්නට සිදුවිය. අපහට මීට පෙර මුහුණ දී ඇති සිදුවීමක් තවත් වරක් මුහුණ දීමේදී දෙවියන්වහන්සේගේ මගපෙන්වීම සඳහා ඉවසිල්ලෙන් බලාසිටීමේ වැදගත්කම මෙම කතාවෙන් පෙන්නුම් වේ. ඔබ අත්දැක තිබෙන කිසිම අත්දැකීමකින් එකම රටාවකට දෙවියන්වහන්සේ සීමා වන්නේ නැත.

(සටහන : මෝසෙස් කළාවූ මෙවැනි සුළු වරදකට ඔහුට දඬුවම් දීම දෙවියන්වහන්සේ සාධාරණ නැතැයි ඔබට සිතේවි. එනම් පර්වතයට කතා කළ යුතු විට ගැසීම වේ. එහෙත් පර්වතය අඩයාලමක් ලෙස ගත් කල ඉතා වැදගත් දෙයකි. මෙහිදී පර්වතය සංකේතවත් කළේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. එතුමාගේ මරණය තුළින් මිදීමේ ජීවනදායක ජලය ගලා එනු ඇත. උන්වහන්සේ එක් වරක් පමණක් සියල්ලන් උදෙසා පහර ලදසේක. තවත් වරක් පහරදීමක් අවශ්‍ය නොවිය. එනිසා මෙම සංකේතාත්මක වටිනාකම අනුව බලන කල මෝසෙස්ගේ වැරැද්ද මහා භයානක එකක් වේ.)

**එළියා :**

දෙවියන්වහන්සේ අනාගතවක්තෘ එලියාට කතා කිරීමට නොයෙකුත් අධි ස්වාභාවික ක්‍රම භාවිතා කළ සේක. දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීමේ වැදගත්කම පහදා දෙන්නාවූ අද්විතීය අත්දැකීමක් වරක් එලියාට ලැබුණි. දෙවියන්වහන්සේ එලියාට කතා කරන තුරු එක්තරා කන්දකට ගොස් සිටින ලෙස එලියාට පවසන ලදි. සිදුවූ දෙය මෙලෙසය.

> **උන්වහන්සේද: පිටතට ඇවිත්, කන්ද උඩ ස්වාමීන්වහන්සේ ඉදිරියේ සිටින්නැයි කීසේක. එවිට ස්වාමීන්වහන්සේ ඒ ළඟින් ගියසේක, ස්වාමීන්වහන්සේට පෙරටුවෙන් මහත්වූ බලවත්වූ හුළඟක් කඳු දෙදරවා පර්වත බිඳගෙන ගියේය: එහෙත් ස්වාමීන්වහන්සේ හුළඟෙහි නොවූසේක. හුළඟට පසු පොළෝකම්පාවක් විය එහෙත් ස්වාමීන්වහන්සේ පොළෝකම්පාවෙහි නොවූ සේක. පොළොකම්පාවට පසු ගින්නක් විය: එහෙත් ස්වාමීන්වහන්සේ ගින්නෙහි නොවූ සේක. ගින්නට පසු සියුම් නිශ්චලතාවේ හඬක් විය. (1 රාජාවලිය 19:11-12)**

මෙම සිදුවීම තුළ අධි ස්වාභාවික සිදුවීම් කිහිපයක් ගැබ්ව ඇත. සුළඟක්, භූමි කම්පාවක්, සහ ගින්නක් විය. මීට පෙර දෙවියන්වහන්සේ එලියාට කතා කර තිබුණේ ඉහත ක්‍රම මගිනි. නුමුත් මෙවර සිදුවූ

තේජවත් සිදුවීම් එකකින්වත් දෙවියන්වහන්සේ එලියාට කතාකළේ නැත. උන්වහන්සේ සියුම් නිශ්චල හඬකින් ඔහුට කතාකළේය.

එම හඬ එලියාගේ දෙසවනට ඇසුනු හඬක් හෝ ඔහුගේ ආත්මයට ඇසුණු හඬක් විය හැකිය.

## පාවුල් :

පාවුල්තුමාගේ ධර්මදූත මෙහෙවර තුළ ඔහු මග පෙන්වීමට දෙවියන්වහන්සේ විවිධ ක්‍රම භාවිතා කළ සේක.

- දමස්කයට යන මාර්ගයෙහිදී පාවුල්හට දීප්තිමත් ආලෝකයකින් සහ ස්වර්ගයෙන් නික්මුණ හඬකින් මගපෙන්වනු ලැබීය. ක්‍රියා 9:1-8

- පාවුල් නසන පිණිස කුමන්ත්‍රණයක් කළ අවස්ථාවේදී දෙවියන්වහන්සේ විසින් ඔහුට පැනයාමට උපකාර කරන පිණිස ඇදහිලිවතුන්ව අනතුරු ඇඟවීම සඳහා භාවිතා කරගන්නා ලදී. ක්‍රියා 9:20-25.

- පාවුල් සහ අනෙකුත් ගෝලයන් සමග සම්බන්ධතාවයක් පිහිටුවාගැනීම සඳහා දෙවියන්වහන්සේ බාර්ණබස්ව භාවිතා කළ සේක. ක්‍රියා 9:20-28.

- කුපිතවූ ග්‍රීකයන්ගෙන් මිදී පාවුල් හට පැනයාමට දෙවියන්වහන්සේ ඇදහිලිවතුන්ව උපයෝගී කරගත් සේක. ක්‍රියා 9:29-30.

- පාවුල්හට මායාකාරයෙක් මුණගැසුණු විට ඔහුව හඳුනාගැනීමට හා මිදීම ගෙන දීමට දෙවියන්වහන්සේ විමසීම පාවුල්හට දුන් සේක. ක්‍රියා 13:6-12.

- යාච්ඤාව හා ශුද්ධාත්මයාණන්වහන්සේ පාවුල්ව විශේෂ ධර්මදූත සේවාවකට මග පෙන්විය. ක්‍රියා 13:2-4.

- අගබස් විසින් දෙන ලද පෞද්ගලික අනාගත වාක්‍යය මගින් යෙරුසලමෙහිදී පාවුල් හට අත් විඳීමට සිදුවන කාරණා ස්ථිර කර දෙන ලදී. ක්‍රියා 21:10-14.

- දෙවියන්වහන්සේ පාවුල් හට දර්ශන හා සිහින තුළින් කතාකළ සේක. ක්‍රියා 22:18; 26:19; 27:23-24.

- සේවය සඳහා සාර්ථක දොරටුවක් විවරවීම නිසා පාවුල් හට තම පෞද්ගලික සැලසුම වෙනස් කිරීමට සිදුවිය. 1 කොරින්ති 16:8-10.

## පිලිප් :

**එහෙත් ස්වාමින්වහන්සේගේ දූතයෙක් පිලිප්ට කථාකොට: නැගිට දකුණු දෙස යෙරුසලමේ සිට ගාසාට බහින පාරට පලයන්නැයි කීවේය. එය කාන්තාර පාරක්ය. ඔහු නැගිට ගියේය. එකල එතියෝපිය රට වැසියන්ගේ කන්දකී නම් බිසව යටතේ බොහෝ බලය ඇත්තාවූද, ඇගේ මුළු වස්තුවේ භාණ්ඩාගාරිකවූද නපුංසකවූ එතියෝපියයෙක් නමස්කාරකරන පිණිස යෙරුසලමට ගොස් ආපසු යන්නේ, තමාගේ රථයේ හිඳ, අනාගතවක්තෘවූ යෙසායාගේ පොත කියවමින් උන්නේය. එවිට ආත්මයාණන්වහන්සේ පිලිප්ට කතාකොට: නුඹ මේ රථය ළඟට ගොස් එක්වෙන්නැයි කීසේක. (ක්‍රියා 8:26-29)**

දෙවියන්වහන්සේ පළමු වර පිලිප්ට දේව දූතයෙකු මගින් කතාකළ සේක. දෙවෙනි වර ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් කතාකළ සැනෙකින් පිලිප් එයට ප්‍රතිචාර දැක්වීය. පෙර වතාවේදී දේව දූතයෙකු මගින් කතාකළ බැවින් මෙවරද පණිවුඩය ස්ථිර කරදෙන පිණිස දේව දූතයෙකු කතාකරන තුරු පිලිප් බලා සිටියේ නැත.

## දාවිත් :

දාවිත් යෞවනයෙක්ව සිටියදී දෙවියන්වහන්සේගේ ජනතාවට සතුරුව සිටි ගොලියත් සමග සටන් කළේය. ගොලියත් යෝධයෙක්ව සිටි අතර ඉතා හොඳින් සන්නද්ධව සිටියේය. එහෙත් දෙවියන්වහන්සේ දාවිත්ට පැවසුවේ ගතානුගතික යුද්ධායුධ පැළඳ නොගන්නා ලෙසටය. ඒ වෙනුවට දාවිත් ගල් පටියක් භාවිතා කළේය. මහත් තේජවත් ජයග්‍රහණයක් දාවිත්ට හිමිවිය. මනාව එල්ල කරන ලද ගලක් යෝධයාගේ නලලේ වැදී ඔහුව හෙළා දැමීය. පසු කලකදී දාවිත්ගේ ඥාති සොයුරු අභිෂයි උපකාරයට නොසිටින්නට දාවිත් ඉස්බිබෙනොත් නම් යෝධයා අතින් මැරුම් කෑමට තිබුණි. එසේනම් අප නිගමනය කළ යුත්තේ දාවිත් පළමුවර යෝධයාට මුහුණ දීමේදී දෙවියන්වහන්සේ ඔහු සමග සිටි බවත්, දෙවෙනි යෝධයාට මුහුණ දීමේදී දෙවියන්වහන්සේ ඔහු සමග නොසිටි බවත්ද? නැත. දෙවියන්වහන්සේ විවිධ ක්‍රම භාවිතා කළා පමණකි. පළමු වර දෙවියන්වහන්සේ දාවිත්ගේ ගල් විදීමේ දක්ෂතාවය භාවිතා කළ සේක. දෙවෙනි වර දෙවියන්වහන්සේ අභිෂායිගේ යුධමය දක්ෂතාවය භාවිතා කළ සේක.

දෙවියන්වහන්සේ අතීතයේදී ඔබට කතාකළ ක්‍රමයටම දැන් කතාකරන්නේ නැත්නම් අසහනයට පත් නොවන්න. ඔබ මීට පෙර අවස්ථාවකදී මුහුණ දුන් ආකාරයේම සිදුවීමකට නැවත මුහුණ දෙන විට දේව කැමැත්ත පෙර ආකාරයේම නොවේ නම්, ඒ ගැන වියවුල් නොවන්න. දෙවියන්වහන්සේ කතාකිරීම සඳහා සන්නිවේදන ක්‍රම කිහිපයකට පමණක් සීමාවී නොමැත. ශ්‍රේෂ්ඨ මැවුම්කරුවාණෝ ශ්‍රේෂ්ඨ සංනිවේදකයෙකුද වේ. එතුමාගේ ක්‍රම අසීමිතය.

# ස්වයං පරීක්ෂණය.

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දෙවියන්වහන්සේ සීමා වී නැති බවත්, එකම ක්‍රමයකට සැමවිටම කතා කරන්නේ නැති බවත් තහවුරු කිරීමට, මෙම පරිච්ජේදයෙහි සාකච්ජා කළ එක බයිබල් උදාහරණයක් සඳහන් කරන්න.

3. දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතාකිරීමට භාවිතා කරන්නාවූ, මෙම පාඩමෙහිදී සාකච්ජා කළාවූ බයිබලීය ක්‍රම දොළස නම් කරන්න.

4. පහත සඳහන් ප්‍රකාශන කියවා බලා සත්‍ය නම් එය ඉදිරියෙන් **ස** යන්නද අසත්‍ය නම් **අ** යන්නද සඳහන් කරන්න.

අ. ----ඔබට වැසුනු දොරකට මුහුන දීමට සිදුවුවහොත් එයින් තේරුම් වන්නේ ඔබට දේව කැමැත්ත මග හැරී ඇති බවය.

ආ. ----යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනටම දැනගෙන සිටි බැවින් යාච්ඤා කළේ නැත.

ඇ. ----යෝසෙප් තමා අවට සිදුවූ කාරණාවලට ගොදුරු වූවෙකු වු බවත් ඒ පිළිබඳව අප්‍රසන්නව සිටි බවත් හැගුනි.

ඈ. ----දේව කැමැත්ත දැනගැනීමට ඉතාමත් හොඳ දර්ශකය නම් අවට සිදුවන බාහිර සිදුවීම්ය.

ඉ. ----යෝනා දේව කමැත්ත වෙනුවට තමාගේම කැමැත්ත ඉටුකර ගැනීමට බාහිර සාධක ප්‍රයෝජනයට ගත්තේය.

ඊ. ----දෙවියන්වහන්සේගේ අනෙකුත් සංනිවේදන ක්‍රම සියල්ල එතුමාගේ ලිඛිත වචනය හා සමග සැමවිටම එකඟ වේ.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මගපෙන්වීම සඳහා පහත සඳහන් යාච්ඤාවල් අධ්‍යයනය කරන්න.

   ගීතාවලිය 25:4
   කොලොස්සි 1:9
   ගීතාවලිය 86:11
   කොලොස්සි 4:12
   එපීස 6:18-20

2. දෙවියන්වහන්සේ එතුමාගේ කැමැත්ත මිනිසාට සංනිවේදනය කරන නමුත් සමහර විට මිනිසා තීරණ ගැනීමට හදිස්සියෙන් ක්‍රියාකරයි. පහත සඳහන් උදාහරණ අධ්‍යයනය කර බලා දෙවියන්වහන්සේ ඔවුනට කතාකිරීමට අවස්ථාවක් නොසපයමින් හදිස්සියෙන් ක්‍රියා කළ මනුෂ්‍යයන් පිළිබඳව සලකා බලන්න.

   මෝසෙස් මිසරයාව මරා දැමීම: නික්මයාම 2

   යෝෂුවා ගිබියොන්වරු සමග ඇතිකරගත් සම්මුතිය: යෝෂුවා 9.

   ආබ්‍රහම් හා ඉෂ්මායෙල් : ආබ්‍රහම් පොරොන්දුවේ උරුමක්කාරයා එනතෙක් බලා නොසිටියේය: උත්පත්ති 16.

3. ක්‍රියා පොත කියවන්න. මුල් කාලීන සභාවෙහි සිටි ජනතාවට කතා කිරීමට දෙවියන්වහන්සේ භාවිතා කළාවූ විවිධ ක්‍රම ලැයිස්තුවක් සාදන්න.

# හත්වන පරිච්ඡේදය

## පඳුර තවම දැවේ

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- දේව කැමැත්ත සොයාගැනීමට පියවර නම් කිරීමට.
- දේව කැමැත්ත පිළිබඳ නිසැක කමක් ලැබිය හැකි ක්‍රමය පැහැදිලි කිරීමට.
- දෙවියන්වහන්සේගෙන් මගපෙන්වීම ලැබීමට ප්‍රධාන රහස් තුනක් හඳුනා ගැනීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසකරපන්න. නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න, එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලාකරනවා ඇත. (හිතෝපදේශ 3:5-6)**

## හැඳින්වීම

මීට පෙර පරිච්ඡේදයෙහිදී අපි අතීතයේදී දෙවියන්වහන්සේ මිනිසා සමග කතාකළ ආකාරය පිළිබඳ බයිබලීය වාර්තාවන් සෝදිසි කොට බැලුවෙමු. ප්‍රශ්නය නම්, දැනුත් දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට කතා කරනවාද? යන්නය. ප්‍රේරිත වූ පාවුල් මෙය සාරාංශ කොට දක්වා ඇත.

> **දෙවියන්වහන්සේ ආදී කාලයෙහි බොහෝ කොටස්වලින්ද බොහෝ අන්දම්වලින්ද ප්‍රොපේතවරුන් ලවා පියවරුන්ට කථාකරවා, මේ දවස්වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථාකෙරවූසේක. උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා කළසේක, උන්වහන්සේ කරණකොට ගෙන ලෝකවල් සෑදූ සේක. (හෙබ්‍රෙව් 1:1-2)**

අතීතයේදී දෙවියන්වහන්සේ විවිධ ක්‍රම වලින් කතාකළසේක. පාවුල්ගේ කාලයේ මනුෂ්‍යයන්ටත් උන්වහන්සේ කතාකළසේක. පාවුල් පැවසුයේ දෙවියන්වහන්සේ මිනිසාට කතාකළ ශ්‍රේෂ්ඨතම පණිවුඩය එතුමාගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් බවය.

## අතීතයේදී: ගින්නෙන් දැවෙන පඳුර

අතීතයේදී දෙවියන්වහන්සේ තම පණිවුඩය විවිධ ක්‍රම මගින් සංනිවේදනය කළ සේක. එම එක් ක්‍රමයක් නික්මයාම තුන්වන පරිච්ඡේදයෙහි වාර්තා වී තිබේ.

> **මෝසෙස් වනාහි තමාගේ මාමා වූ මිදියන්හි පූජකවූ යෙත්‍රෝගේ එළු බැටළු රැළ බලාගනිමින් සිටියේය. ඔහු එළු බැටළු රැළ වනාන්තරයේ එහා පැත්තට ගෙනගොස් දෙවියන්වහන්සේගේ කන්දට එනම් හොරේබ්ට පැමිණියේය. ස්වාමීන්වහන්සේගේ දූතයා පඳුරක් මැද ගිනිජාලාවක සිට ඔහුට පෙනුණේය. ඔහු බලා සිටියේය, බලව, පඳුර ගිනි ඇවිළ තිබුණු නුමුත් දාලා නොගියේය. එවිට මෝසෙස්: මම දැන් අහකට හැරී පඳුර දාලානොගියේ මක්නිසාද යන මේ මහත් දර්ශනය බලන්නෙමියි කීය. ඔහු බලන පිණිස හැරී යන බව ස්වාමීන්වහන්සේ දුටු කල දෙවියන්වහන්සේ**

**පඳුර මධ්‍යයෙන්: මෝසෙස්, මෝසෙස් කියා ඔහුට හඬගැසූසේක. මම මෙහියයි ඔහු කීවේය. (නික්මයාම 3:1-4)**

ගිනි ගන්නා නුමුත් දැවී අළුවී නොයන පඳුරක් තුළින් දෙවියන්වහන්සේ මෝසස්ට කතාකළ සේක. මිසරයේ වහල්කමෙන් ඉශ්‍රායෙල් ජනතාව මුදා ගන්නා පිණිස මෝසෙස් කැඳවූ සේක. සැබවින්ම අතිතයේදී දෙවියන්වහන්සේ මිනිසුන් සමග කතාබස් කළ සේක.

## වර්තමානයෙහි : පඳුර තවමත් ගිනිගනී

නුමුත් දෙවියන්වහන්සේ තවමත් එවන් විශ්මිත ක්‍රම තුළින් මිනිසාට කතාකරනවාද? මෙවන් සංනිවේදන ක්‍රම ශුද්ධාත්මයාණන්ගේ පූර්ණත්වයට පෙර, පැරණි ගිවිසුම් කාලයට සීමාවූ වන්ද?

පඳුර තවමත් ගිනිගෙන දැවෙමින් පවති ! මෝසෙස්ට ලැබුණු විශේෂිත ආකාරයෙන්ම ඔබටත් මගපෙන්වීම ලැබීම ඔබ ඇත්තටම අත් නොදැකිය හැකියඃ නුමුත් දෙවියන්වහන්සේ පැරණි ගිවිසුම් කාලයේදී සිදුකළ ආකාරයටම විශ්මිත අයුරින් තවමත් මනුෂ්‍යයන්ට කතාකරන සේක.

හෙබ්‍රෙව් 1:1-2 හි පාවුල් පවසන්නේ දෙවියන්වහන්සේ තවමත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලෝකයාට කතාකරන බවය. දෙවියන්වහන්සේ කතාකරනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජිවිතය හා ඉගැන්වීම් ඇතුළත් වන ලිඛිත දේව වචනයෙන් පමණක් නොව යේසුස්වහන්සේම පොරොන්දු වූ ප්‍රකාරයටය :

**එසේවී නුමුත්, උන්වහන්සේ, එනම් සැබෑ කමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මගපෙන්වනසේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරන සේක. (යොහන් 16:13)**

ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුස්වහන්සේගේ මාර්ගයෙන් දෙවියන්වහන්සේගේ පණිවුඩය තවදුරටත් මනුෂ්‍යයාට කතාකරන සේක.

ක්‍රියා 2 පරිච්ඡේදයෙහි සඳහන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමෙන් පසුව ද දෙවියන්වහන්සේගෙන් විශේෂ එළිදරව් වීම්, පැරණි ගිවිසුමේදී මෙන්ම තවදුරටත් පැවතියේය. මනුෂ්‍යයා තවදුරටත් සිහින දැක්කෝය, දර්ශන දුටුවෝය, දේව දූතයන් සමග කතාකළෝය, දෙවියන්වහන්සේගේ හඬ දෙසවනට ඇසුණි, දෙවියන්වහන්සේගේ නොයෙකුත් විශ්මිත එළිදරව් වීම් දුටුවෝය.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ පැමිණීමත් සමගම දෙවියන්වහන්සේගේ විශ්මිත සංනිවේදනය නිමා නොවීය. ශුද්ධාත්මයාණන්වහන්සේ මගපෙන්වීම සඳහා අලුත් මානයක් එක් කළ සේක. එම මානයට ඇතුළත් වූයේ අභ්‍යන්තර මගපෙන්වීම, දෙවියන්වහන්සේගේ කැමැත්තේ ප්‍රකාරයට මැදිහත්කාරකම් කිරීම, සහ දෙවියන්වහන්සේ කතාකිරීමට භාවිතා කරන්නාවූ විශේෂ ආත්මික දීමනාවන්ය.

බයිබලයෙහි අවසාන පොත වන එළිදරව් පොත ප්‍රේරිත වූ යොහාන් හට දෙවියන්වහන්සේ දුන්නාවූ දිගු දර්ශනයක වාර්තාවයි. දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ අවසාන පොත දක්වාම දෙවියන්වහන්සේ විශ්මිත අයුරින් මිනිසාට කතාකරන සේක.

දෙවියන්වහන්සේ තවදුරටත් එම ක්‍රම වලින් මනුෂ්‍යයාට කතා කිරීම දිගටම කරගෙන යයි. නූතන සහා ඉතිහාසයේද ඉතා හොඳින් විස්තරාත්මකව වාර්තාකර ඇති දෙවියන්වහන්සේ මිනිසා සමග කතා කළාවූ අවස්ථාවන් තිබෙනුයේ....

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයේත් අදත් සදාකාලයටත් ඒකාකාරමය. (හෙබ්‍රෙව් 13:8)** නිසා වේ.

# පඳුරක් නැත්නම් මොනවා කරන්නද?

දෙවියන්වහන්සේ ඔබට ආශ්වර්යමත් අයුරින් කතාකිරීමට තෝරා ගත්තේ නැත්නම් කුමක් කළ යුතුද? ඔබට සිහිනයකින් දර්ශනයකින් හෝ හාස්කමකින් අත් දැකීමක් නොලැබුණහොත් කුමක් කරම්ද? උන්වහන්සේ ඔබට දෙසවනට ඇසෙන පරිදි හෝ ආත්මික දීමනා වන අනාගතවක්‍යයකින්, අන් භාෂාවකින් හෝ පරිවර්තනයකින් ඔබට කතා නොකළහොත් කුමක් කරම්ද ? ගිනිගොඩක දැවෙන පඳුරක් නැත්නම් කුමක් කරම්ද ?

සමහර මනුෂ්‍යයෝ ඔවුන්ගේ මුළු ජීවිත කාලයම දෙවියන්වහන්සේගෙන් විශ්මිත වු අධි ස්වාභාවික වූ එළිදරව්වක් ලැබෙන තුරු බලා සිටිති. මහත් සමූහයක් ඇදහිලිවන්තයෝ තම ජීවිතයෙන් වැඩි කොටසක් දෙවියන්වහන්සේගෙන් අරුම පුදුම ආකාරයේ පණිවුඩයක් ලබෙන තුරු කිසිත් නොකර, අසාර්ථකව, නිකරුණේ කාලය කා දමති.

මුල් කාලින සභාව මෙසේ කළේ නැත. දෙවියන්වහන්සේ ආශ්වර්යමත් අයුරින් ඔවුන්ව මග පෙන්වීමට තෝරාගත් විට ඔව්හු ප්‍රීතිවූහ. එහෙත් එදිනෙදා ජීවිතයේ බොහෝ තීරණ සඳහා ඔවුනට දේව දූතයන්ටත් සිහින හෝ දර්ශන වලින් මගපෙන්වන තෙක් බලා නොසිටියහ. එහෙත් ඔව්හු දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ හමුදාවක් ලෙස පෙරට ගියෝය.

එසේ නම්, ගිනි ඇවිලි දැවෙන පඳුරක් නැත්නම් ඔබට කළ හැක්කේ කුමක්ද? දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයා ගැනීමට පියවර හතක් පහතින් දී තිබේ.

## 1. යාච්ඤා කරන්න.

ඔබගේ ජීවිතය උදෙසා මග පෙන්වීම ලබාදෙන ලෙසට දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න. යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූයේ දිනපතා යාච්ඤා රටාවට ඇතුළත් කළ යුතු කරුණක් වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට හැකි වීම සඳහාය.

> **ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. (මතෙව් 6:10)**

ඔබ යාච්ඤා කරන කල, දේව කැමැත්ත දැනගැනීමට ඔබ ආශා කරණ බවත්, එය එළිදරව් කර දෙන මෙන් ඉල්ලා සිටින්න. මෝසෙස් එසේ කළේය:

> **එබැවින් ඔබ මට ඉදිරියෙහි කරුණාව ලැබී තිබේ නම් ඔබ ඉදිරියෙහි මට කරුණාව ලැබෙන හැටියට මා විසින් ඔබ හැඳිනගන්නා පිණිස ඔබගේ මාර්ගයන් දැන් මට පෙන්නුව මැනව, මේ ජාතිය ඔබගේ සෙනඟ බවත් සැලකුව මැනවයි කීවේය. (නික්මයාම 33:13)**

දාවිත් මෙලෙස කළේය :

> **ස්වාමීනි ඔබගේ මාර්ගය මට දැක්වුව මැනව; ඔබගේ මාවත් මට ඉගැන්නුව මැනව. (ගීතාවලිය 25:4)**

නිවැරදි දෙය තෝරාගැනීම පිණිස ප්‍රඥාව ඉල්ලා සිටින්න.

> **නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු නම්, වරද නොතබන්නාවූ, බොහෝ කොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා; එවිට ඔහුට එය දෙනු ලැබේ. නුමුත් අනුමාන නොකරම ඇදහිල්ලෙන් ඉල්ලාවා. මක්නිසාද අනුමානකරන්නා සුළඟින් ගෙන යන්නාවූ, සෙලවෙන්නාවූ මුහුදේ රැළට සමානය. එබැවින් එබඳු මනුෂ්‍යයා තමාට ස්වාමීන්වහන්සේගෙන් යමක් ලැබේයයි නොසිතාවා. (යාකොබ් 1:5-7)**

අනෙකුත් ඇදහිලිවතුන්ගේ යාච්ඤාව අයැද සිටින්න. කණ්ඩායම් යාච්ඤා රැස්වීම් වලදී ආත්මික දීමනා ඇසුරින් දෙවියන්වහන්සේ බොහෝ විට තම කැමැත්ත එළිදරව් කර දෙන සේක. එවන් එකමුතුවකදී පාවුල් හා බාර්ණබස් හට තම ධර්ම දූත සේවයට කැඳවීමේ ස්ථිරත්වය ලැබුණි.

## 2. ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කරන්න.

ඔබගේ අවස්ථාවට ගැළපෙන විශේෂ උපදෙස් තිබේදැයි විමසා බැලීම සඳහා දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය උනන්දුවෙන් සොයාබලන්න. බයිබලයෙහි එයට අදාළ වන පොදු මූලධර්ම හෝ ජීවිත කතා වලින් ගත හැකි ආදර්ශ තිබේ දැයි සොයා බලන්න.

ශුද්ධ ලියවිල්ල සෙවීම යනු බයිබලය ඉබේම පෙරලියාමට ඉඩදී නතර වූ ස්ථානයේ ඇති පළමුව ඔබේ ඇස ගැටෙන පදය ඔබගේ පිළිතුර ලෙස භාරගැනීම නොවේ. ශුද්ධ ලියවිල්ල සෙවීම නම්, දේව වචනය විස්තරාත්මක සොයා බලා එහි සඳහන් මූල ධර්ම ඔබ ගත යුතු තීරණයට අදාළ කරගැනීමය. ඔබ සිතන පරිදි සැම විටම විවෘත වූ දොරක්, සැම අවස්ථාවක්, සැම මගපෙන්වීමක්ම පළමුකොට දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙන් සෝදිසි කර බැලිය යුතුවේ. යේසුස්වහන්සේ මෙම ප්‍රතිපත්තිය අනුගමනය කළ සේක. දෙවියන්වහන්සේගේ කැමැත්තට එරෙහිව ක්‍රියාකරන පිණිස යක්ෂයා විසින් පොළඹවනු ලැබ පරීක්ෂා කරනු ලැබූ කල උන්වහන්සේ නැවත නැවතත් පිළිතුරු දුන්නේ..."එය එසේ ලියා තිබේ..." (මතෙව් 4) කියාය. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙහි පදනම මත සියල්ල විශ්ලේෂණය කර බැලූ සේක.

ඔබ ශුද්ධ ලියවිල්ල සොයන විට, මග පෙන්වීම සඳහා ඇති පොරොන්දු රාශිය ඉගෙනීමට අමතක නොකරන්න. මෙම පරිච්ඡේදයෙහි තවදුරටත් අධ්‍යයනය කොටසෙහි මින් සමහර පොරොන්දු අපි ඇතුළත් කොට ඇත්තෙමු. ඔබ මෙම පාඩම් අධ්‍යයනය කරමින් යන අතර දෙවියන්වහන්සේ සැබවින්ම කතා කරන බවත් ඔබට එතුමාගේ හඬ දැනගැනීමට හැකි බවටත් ඔබගේ ඇදහිල්ල වර්ධනය වනු ඇත.

## 3. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇතුලාන්ත හඬට සවන් දෙන්න.

යාච්ඤාව හා ශුද්ධ ලියවිලි අධ්‍යයනය මගින්, දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයට, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇතුලාන්ත හඬින් කථාකරන සේක. අපි පසුගිය පාඩමෙහිදී මෙය විස්තරාත්මකව අධ්‍යයනය කළෙමු. "ශුද්ධාත්මයාණන්වහන්සේගේ හඬෙහි" එක් කොටසක් නම් යාච්ඤාවේ භාෂාව වූ අන්‍ය භාෂාවයි. ඔබට කිසියම් කාරණාවක් පිළිබඳව දේව කැමැත්ත නිසැකවම නොදනී නම් එවිට, ශුද්ධාත්මයාණන්වහන්සේගේ යාච්ඤාවේ භාෂාව වූ අන් භාෂාවෙන් යාච්ඤා කරන්න.

ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ සර්ව සම්පූර්ණ කැමැත්ත දන්නා බැවින් එතුමා එම කැමැත්ත හා එකගව් ඔබ තුළින් යාච්ඤා කරනු ඇත.

> **ඒ ආත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් විමසන තැනන්වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක් දැයි දන්නාසේක. (රෝම 8:27)**

ශුද්ධාත්මයාණන්වහන්සේ අපහට "පැමිණීමට තිබෙන කාරණා පෙන්වා දෙනු ඇත" කියා යේසුස්වහන්සේ පැවසූ බව මතක තබාගන්න. එහි අරුත නම් උන්වහන්සේ ඔබට දේව සැලැස්ම හෙළිකර දෙන බවය.

උන්වහන්සේ දේව කැමැත්තට අනුව මග පෙන්වනු ඇත.

## 4. ක්‍රිස්තියානි උපදේශනය සොයන්න.

මීට පෙර පරිච්ඡේදයෙහිදී අප සඳහන් කළ පරිදි දෙවියන්වහන්සේ ඇදහිලිවන්තයන්හට තීරණ ගැනීමේ ක්‍රියාදාමයෙහි දී සහාය සැපයීමට ක්‍රිස්තියානි උපදේශකයන් භාවිතා කරන සේක.

> **උදහස් දවසේදී සම්පතෙන් උපකාර නොලැබේ. එහෙත් ධර්මිෂ්ඨකම මරණයෙන් ගළවයි. (හිතෝපදේශ 11:14)**
>
> **මෝඩයාගේ මාර්ගය තමාගේ ඇස්වලට නම් හරිව පෙනෙන්නේය: එහෙත් ඥානවන්තයා දැනමිතිකම් අසන්නේය. (හිතෝපදේශ 12:15)**

ඇදහිලිවතුන් උපදේශනය පැතිය යුත්තේ පරිණත කිතුනුවන්ගෙන් පමණකි: මෙය වැදගත්ය. කිසිවිටක සාමාන්‍ය මනෝවිද්‍යාඥයන්ගෙන් හෝ මනෝචිකිත්සකයන්ගෙන් උපදේශන ලබා නොයන්න. ඔව්හු ඔබට සපයනු ඇත්තේ ලෝකාකාර වූ උපදේශනයන්ය. ඔවුහු "අන්ධයින්ට මග පෙන්වන අන්ධයෝ වෙති."

> **අන්ධවූ මගපෙන්වන්නෙනි, නුඹලාට දුක්වේ ! (මතෙව් 23:16)**
>
> **දුෂ්ඨයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයේ නොසිටින්නාවූ, නින්දාකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, (ගීතාවලිය 1:1)**

කිසිවිටකත් නවක කිතුනුවන්ගෙන් උපදෙස් නොපතන්න. ඔවුන් සතුව අත්දැකීම් හෝ පරිණතභාවයක් නොමැත.

සමහරු උපදේශකයන් වෙතට යන්නේ තමුන්ගේම අදහස් මත වලට උපදේශකයා එකඟවනු ඇතැයි අපේක්ෂාවෙනි. ඔබගේ ආකල්පය එවැනි නම් උපදේශනයෙන් ඔබට එතරම් ප්‍රයෝජනයක් නොවනු ඇත. සමහර ඇදහිලිවන්තයෝ බොහෝ උපදේශකවරු වෙත ගොස් එක් එක් උපදේශකවරයා දුන් උපදෙස් සංසන්දනය කිරීමෙහි යෙදෙති. ඔව්හු එක මතකයට එකඟතාවය දක්වන වැඩි ඡන්ද සංඛ්‍යාව මැන බලති. උපදේශනයෙහි පරමාර්ථය මෙය නොවේ. සියල්ලටම වඩා වැදගත් වනුයේ මිනිසා සපයන සියලුම උපදේශන දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය හා එකඟ විය යුතුය.

## 5. වාතාවරණය විශ්ලේෂණය කර බලන්න.

ඔබ ගත යුතු තීරණයට සම්බන්ධිත වටපිටාව බාහිර වාතාවරණ විමසා බලන්න. මෙම බාහිර වටපිටාව සිදුවීම් ඇතුළත් වතාවරණය සලකා බැලිය යුත්තේ ඔබහට දෙවියන්වහන්සේ යාච්ඤාවෙන්, දේව වචනය අධ්‍යයනයෙන්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇතුලාන්ත හඬින් හා ක්‍රිස්තියානි උපදේශනයෙන් ඔබ ලත් මගපෙන්වීම ඇසුරිනි.

දේව කැමැත්ත තීරණය කිරීම සඳහා වතාවරණය පමණක් තනිව භාවිතා කළ යුතු නොවේ. නමුත් එය ඔබ ගත යුතු තීරණයේ සන්දර්බය නිර්ණය කරනු ඇත. සමහර අවස්ථාවලදී වතාවරණය ඔබට සපයන තේරීම් ප්‍රමාණය සීමා කරනු ඇත. සමහර විට ජීවිතය උදෙසා නව මගපෙන්වීමක් සපයනු ඇත.

## 6. මගපෙන්වීම උදෙසා බයිබලිය යතුරු භාවිතා කරන්න.

ස්වාභාවික ලොවෙහි යතුරුවලින් දොරවල් විවර කළ හැකිය. ආත්මික ලොවෙහි දෙවියන්වහන්සේ එතුමාගේ කැමැත්ත නම් දොර විවර කිරීමට යතුරු සපයා දී තිබේ. එම යතුරු හිතෝපදේශ පොතෙහිද තිබේ.

**නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසකරපන්න. නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න, එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලාකරනවා ඇත. (හිතෝපදේශය 3:5-6)**

## පළමුවන යතුර : විශ්වාසය.

දෙවියන්වහන්සේ ඔබගෙන් කුමක් ඉල්ලාවිද කියා බිය නොවන්න. ඔබ උදෙසා එතුමාගේ සැලැස්ම ඉතාමත්ම හොදම දෙය බව දැන සිටින්න. තමාගේ එකම පුත්‍රයා මනුෂ්‍යයන් උදෙසා මිය යාමට දුන්නාවූ තැනන්වහන්සේව සැබවින්ම මිනිසාට විශ්වාස කළහැකි විය යුතුය. ඔබගේ විශ්වාසය ස්වාමීන්වහන්සේ කෙරෙහි මිස මනුෂ්‍යයා කෙරෙහි නොවිය යුතුය.

**ස්වාමින්වහන්සේ මෙසේ කියනසේක: මනුෂ්‍යයා කෙරෙහි විශ්වාස කරන්නාවූ, මාංසය තමාගේ හස්තය කොට තබාගන්නාවූ, සිතින් ස්වාමින්වහන්සේ කෙරෙන් පහවයන්නාවූ මනුෂ්‍යයා ශාපලද්දෙක්ය. (යෙරමියා 17:5)**

## දෙවන යතුර : ඔබගේම නුවණෙහි නොපිහිටන්න.

ඔබගේම මිනිස් තර්කය මත රැඳී නොසිටින්න. මෙයින් අදහස් කරන්නේ බුද්ධිමත් විනිශ්චයකට ඉඩක් නැත යන බව නොවේ. මුළු හිතෝපදේශ පොතම පාහේ පිරී ඇත්තේ දැනුම තේරුම හා සාමාන්‍ය බුද්ධිය භාවිතා කිරීමට අණ කිරීම් වලිනි. යහපත් විනිශ්චයන් අතහැර දමන ලෙස දෙවියන්වහන්සේ නොපවසන සේක. උන්වහන්සේ පවසන්නේ දේව කැමැත්ත සොයන කල සම්පූර්ණයෙන්ම මිනිස් දැනුම කෙරෙහි රැඳී නොසිටින ලෙසය.

දාවිත් ගිවිසුම් පෙට්ටිය ජෙරුසලමට නැවත ගෙන යන විට ඔහු දෙවියන්වහන්සේගෙන් උපදෙස් නොපැතිය. ඔහු තමාගේම අවබෝධයට අනුව එය කළ හැකි හොදම ප්‍රායෝගික ක්‍රමය අනුගමනය කළේය. (2 සාමුවෙල් 6:1-7)

එහෙත් එම ක්‍රමය දෙවියන්වහන්සේගේ ක්‍රමය නොවූ බැවින් විනිශ්චය පැමිණියේය. ගිවිසුම් පෙට්ටිය නැවත ජෙරුසලමට රැගෙන ඒම දේව කැමැත්ත වුවද, දාවිත් තමාගේ මාර්ගය දෙවියන්වහන්සේගේ කැමැත්ත හා එක එල්ලේ නොරැදවීය. මග පෙන්වීම උදෙසා මෙය වැදගත් ප්‍රතිපත්තියකි.

## තුන්වන යතුර : නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේව සැලකිල්ලට ගන්න.

සියලු මාර්ගවලදී උන්වහන්සේව සැලකිල්ලට ගන්න. එතුමාට සිතුවිල්ලෙන්, වචනයෙන් හා ක්‍රියාවෙන් ගෞරව කරන්න. ඔබගේ ජීවිතයෙහි එතුමාට පළමු ස්ථානය පිරී නමන්න.

**උන්වහන්සේ සභාව නැමති ශරීරයට හිසව සිටිනසේක. උන්වහන්සේ පටන්ගැන්මව මළවුන්ගෙන් කුළුඳුලාව සිටින සේක. එසේව සිටින්නේ උන්වහන්සේම සියල්ලට ප්‍රධානව සිටින පිණිසය. (කොලොස්සි 1:18)**

යෝෂුවා ගිබියොන්වරු සමග ගිවිසුමකට ඒමට පෙර "ස්වාමීන්වහන්සේගේ මුඛයෙහි උපදෙස් නොවිචාල" බැවින් භයානක අත්වැරැද්දක් කළේය (යෝෂුවා 9). ඔහුගේ තිරණය නිසා දේව භක්තික ජාතියක් සමග සමගි සම්මුතියක් ඇතිවිය. දෙවියන්වහන්සේ මෙය ප්‍රතික්ෂේප කොට තිබූ කරුණකි.

යතුරු තුන නම් :

- නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ විශ්වාසකරන්න.
- නුඹේම නුවෙණෙහි නොපිහිටන්න.

- නුඹේ සියලු මාර්ග වලදී උන්වහන්සේව සැලකිල්ලට ගන්න.

මෙම යතුරු දොර ඇර දෙනු ඇත...උන්වහන්සේ ඔබ උන්වහන්සේගේ මාර්ගයට යොමු කරවනු ඇත.

## 7. ප්‍රඥාවේ මාර්ගය තෝරාගන්න.

දෙවියන්වහන්සේගේ ලිඛිත දේව වචනයෙහි විශේෂයෙන්ම පෙන්වාදී ඇති කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එළිදරව් කර ඇති වචනයට එකගවූ තීරණ ඔබ ගත යුතු වේ. ඒ හැර අනෙකුත් තීරණ වලදී යාච්ඤා කොට, දේව වචනය අධ්‍යයනය කොට, ශුද්ධාත්මයාණන්වහන්සේට සවන්දී, උපදෙස් පතා, වතාවරණ විමසා බලා, ඉන්පසුව "ප්‍රඥාවේ මාර්ගයට" අනුව ඔබහට තෝරාගැනීමක් සිදුකළ හැකිය. (ඔබ දෙවියන්වහන්සේගෙන් ප්‍රඥාව ඉල්ලා යාච්ඤා කළ බව මතකනේ. දැන් එම ප්‍රඥාව පදනම් කරගෙන තෝරාගන්න.)

ප්‍රඥාවේ මාර්ගය නම් ඔබගේ ජිවිතයෙහි සියලු ක්ෂේත්‍රයන්ගෙන් ඉදිරියට යාමට ඔබට විශිෂ්ටතම අවස්ථාව සපයා දෙන තේරීම කිරීම සඳහා ජිවිතයේ නිවැරදි තීරණය තෝරාගැනීමට ඇති අවස්ථාවයි. එම තේරීම ඔබට යාච්ඤාව තුළින්, දේව වචනය තුළින්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඇතුලාන්ත හඬ තුළින් හා කිතුනු උපදේශනය තුළින් දෙවියන්වහන්සේ දැනට එළිදරව් කරදී ඇති කාරණා හා එකඟව ගන්නාවූ තේරීමය.

ප්‍රඥාවේ මාර්ගය හඳුනාගැනීමට ඇති හැකියාව ආත්මිකව පරිණතවීමත් සමගම වැඩි දියුණු වේ.

> **මක්නිසාද කාලය ප්‍රකාරයට නුඹලා ගුරුවරයෝව සිටින්ට යුතුව තිබියදීත්, දෙවියන්වහන්සේගේ වාක්‍යවල මුල් ගුරුකම් නැවත යමෙකු විසින් නුඹලාට උගන්වන්ට ඕනෑව තිබේ; නුඹලා දැඩි ආහාර නොව කිරි ඕනෑකරන අයව සිටින්නෝය. ඉතින් කිරි බොන සැමදෙනම ළදරුවන් බැවින් ඔව්හු ධර්මිෂ්ඨකමේ වචනය ගැන අසමර්ථව සිටිති. නුමුත් දැඩි ආහාර ඕනෑ වන්නේ යහපත හා අයහපත විමසාබලන්ට ව්‍යවහාරයෙන් පුරුදු පුහුණුවූ ඉන්ද්‍රියයන් ඇති, සම්පූර්ණවූ තැනත්තන්ටය. (හෙබ්‍රෙව් 5:12-14)**

ආත්මික පරිණතභාවය ඇතිවන්නේ දෙවියන්වහන්සේ සමග පවතින සම්බන්ධතාවය, යාච්ඤාව හා එතුමාගේ ලිඛිත වචනය මෙනෙහි කිරීම මගිනි.

## දේව කමැත්ත පිළිබඳ නිසැකකම.

> **ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩු කෙරේවා. ඒ පිණිස නුඹලා එක ශරීරයක්ව සිටීමට කැඳවනු ලැබුවහුය. (කොලොස්සි 3:15)**

තරග විනිසකරුවෙකු කිසියම් ක්‍රීඩාවකදී එම ක්‍රීඩාවේ නීති රීති අනුව ක්‍රීඩාව සිදුවේදැයි තීරණය කරයි.

ආත්මික ලෝකයෙහි දේව කැමැත්ත සිදුවේදැයි තීරණය කරන විනිසකරු නම් දෙවියන්වහන්සේගේ සමාදානය වේ. ඔබගේ ක්‍රියාවන් සහ තීරණ පුණරීක්ෂණය කරනු ලැබේ. ඒවා දේව කැමැත්තට එකගව පවතින විට ඔබගේ ආත්මයට සාමය ලැබෙනු ඇත. ඔබ වියවුල්වී හෝ අසහනයට පත්ව සිටී නම් ක්‍රියා නොකරන්න. ඔබ ගන්නාවූ තීරණ පිළිබඳව ඔබට සමාදානය ලැබෙන තුරු නතර වී බලා සිටින්න. සමාදානය නොමැති බව යමක් හරි නැති බවට තරග තීරකගෙන් ලැබෙන සංඥාවක්ය.

> **මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල්කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය; ශුද්ධවන්තයන්ගේ සියලු සභාවන්හි එසේමය. (1 කොරින්ති 14:33)**

# වරකට එක පියවර බැගින්

දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්බන්ධයෙන් ඔබ දැනගත යුතු අවසාන වැදගත් ප්‍රතිපත්තියක් නම්, දෙවියන්වහන්සේ තම සැලැස්ම වරකට එක පියවර බැගින් එළිදරව් කරදෙන බව වටහාගැනීමය. එයින් තේරුම් යන්නේ දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතය උදෙසා ඇති මුළු සැලැස්ම සියලු විස්තරද ඇතුළත්ව එක පාරටම හෙළි නොකරන බවය. දෙවියන්වහන්සේ මුළු ජීවිත කාලයටම ඔබ සමග එක වරක් පමණක් කතා නොකරන සේක. මුළු ජීවිත කාලයටම එක් වරක් කතා කළ පුද්ගලයෙකු සමග ඔබට සම්බන්ධතාවයක් පැවැත්විය නොහැක. සම්බන්දතාවයක් නම් දිගටම කතාබහ පැවතිය යුතුය. දෙවියන්වහන්සේ ඔබ හා සමග දිගටම කතා බස් කරන අතරම ඔබට එතුමාගේ හඬ හඳුනාගැනීමේ හැකියාවද ක්‍රමයෙන් දියුණු වේ.

දෙවියන්වහන්සේ එතුමාගේ සැලැස්ම ඔබට වරකට එක පියවර බැගින් පෙන්වා දීමට හේතු තිබේ. බොහෝ විට ඔබගේ ජීවිතය උදෙසා මුළු සැලැස්ම දැන ගැනීමට ලැබුණහොත් ඔබ එයින් තුෂ්ණීම්භූත විය හැක; එසේ නැත්නම් ඉදිරියෙහිදී කිරීමට ඇති කාර්යය භාරය දැක ඔබ ඒ සඳහා සුදුසු මදි යැයි ඔබට හැඟෙන්නට පුළුවන.

යේසුස්වහන්සේ වරක් තම ගෝලයන්ට මෙසේ පැවසූ සේක.

> **නුඹලාට කියන්ට තව බොහෝ දේවල් මට ඇත්තේය, නුමුත් දැන් ඒවා දරන්ට නුඹලාට බැරිය. (යොහන් 16:12)**

දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට පැවසුවේ කානාන්හිදී ඔවුහු තම සතුරන්ව "ටිකෙන් ටික" පරාජය කරනු ඇති බවය. ඔව්හු එතුමා දෙන්නාවූ දේශයෙහි වගකීම දැරීමට දැන් සූදානම්ව හැකියාව ඇතිව සිටින බැවින් මෙලෙස සතුරා "වරකට ස්වල්පය බැගින්" ජයගනු ඇත.

අපි අපගේ අනාගතය පිළිබඳව වද වීමට පටන්ගන්නා බැවින් දෙවියන්වහන්සේ මුළු සැලැස්ම එකවර පෙන්වා නොදෙයි. බයිබලය අනතුරු අඟවා ඇත්තේ :

> **එබැවින් හෙට දවස ගැන කනස්සලු නොවෙන්න. හෙට දවස ඒ ගැනම කරදරවන්නේය. දවසේ කරදරය ඒ දවසට සෑහෙයි. (මතෙව් 6:34)**

අනාගතය පිළිබඳව කරදර නොවන්න. අදට අවශ්‍ය තීරණ පමණක් ගන්න. අනාගතය පාලනය වන්නේ දෙවියන්වහන්සේ අතිනි. එයින් අදහස් වනුයේ අනාගතය උදෙසා ඥානවන්ත ලෙස ඔබ සැලසුම් සෑදිය යුතු නොවේ කියා නොවේ. නමුත් ඒ පිළිබඳව කරදර විය යුතු නැත කියාය. වැදගත් දෙය නම් අද උදෙසා දෙවියන්වහන්සේ එළිකර දී ඇති කැමැත්තට අනුව අද ජීවත්වීමය. ඔබගේ දිනපතා කිතුනු දිවියේ එතුමාගේ හඬ ඇසීමට ඉගෙන ගන්න. දිනපතා එතුමාගේ කැමැත්තට අනුව ජීවත්වීම මගින් මුළු දිවිය පුරාම දෙවියන්වහන්සේගේ කැමැත්තෙහි හැසිරෙන දිගු කාලීන දිවියක් ගෙවීමට හැකිවේවි.

දෙවියන්වහන්සේ ඔබහට මුළු සැලසුම එකවර එළි නොකිරීමට තවත් හේතුවක් නම් එතුමාට අවශ්‍ය ඔබ ඇදහිල්ලේ ජීවිතයක් ගතකිරීමට ඉගෙන ගැනීමය. පාරේ කෙළවර දන්නේ නම් එහි පළමු පියවර ගැනීම ඉතා පහසුය. එහෙත් නොදන්නා අනාගතයකට ඇදහිල්ලෙන් පළමු පියවර තැබීම එතරම් පහසු නොවේ.

බයිබලය ආබ්‍රහම් සම්බන්ධයෙන් මෙසේ පවසයි :

> **ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවනු ලැබූ කල තමාට උරුමයක් පිණිස පසුව ලැබෙන්ට තිබුණු ස්ථානයකට පිටත්ව යන හැටියට කීකරුවී, තමා කොතැනට යනවාදැයි නොදැන පිටත්ව ගියේය. (හෙබ්‍රෙව් 11:8)**

දෙවියන්වහන්සේ කෙරෙහි ඔබගේ ඇදහිල්ල ගොඩ නැංවීමට ඇදහිල්ලෙන් වරකට එක පියවර බැගින් ගමන් කිරීමට වැඩිය හොඳ වෙන ක්‍රමයක් නැත. දෙවියන්වහන්සේ එළිදරව් කර දෙන පරිදි වරකට එක පියවර බැගින් ගැනීමේදී ඔබට හදිස්සියේ ඉදිරියට යා නොහැක. මෝසෙස් ඉක්මන්වී ගොස් මිසරයා මැරීය. ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉෂ්ටවීමට පෙර ඉක්මන්වී, තෝරාගත් උරුමක්කාරයා වෙනුවට ඉෂ්මායෙල් ආදේශ කිරීමට උත්සාහ කළේය.

එස්තර් පොත දෙවියන්වහන්සේ කෙරෙහි බලා සිටීමේ වැදගත්කම අවධාරණය කරයි. දෙවියන්වහන්සේගේ ජනතාව හාමාන් නම් නපුරු මිනිසකුගේ අතින් විනාශවීමේ අනතුරට ලක්ව සිටියහ. ඔහු සියලු යුදෙව්වන් විනාශ කරන ලෙස රජුගෙන් ඉල්ලා සිටියේය.

එස්තර් බිසව මෙම කුමන්ත්‍රණය දැන සිටියාය. යුදෙව් ජනතාව විනාශ වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවන බව ඇය දැන සිටියත් ඇය හදිස්සියේ ක්‍රියා නොකළාය. ඇය දෙවියන්වහන්සේගෙන් සැලැස්මක් ලැබෙන තුරු බලා සිටියාය. ඉන්පසු රජ සමග කතාකිරීමට තවත් දවසක් බලා සිටියාය. එම බලාසිටීමේ කාලය තුළ කිසියම් වැදගත් කාරණාවක් සිදුවිය. මෝර්දෙකයි නම් වූ යුදෙව්වා රජතුමාව ඝාතනය කිරීමට තිබූ කුමන්ත්‍රණයකින් තමාව බේරාගත් බව රජුහට අනාවරණය වීය.

මෙය දැනගත් පසුව, එස්තර් රජහට යුදෙව්වනට එරෙහිව හාමන්ගේ කුමන්ත්‍රණය එළිකළාය. රජතුමා හාමාන්ට විරුද්ධව ක්‍රියාකළේය. යුදෙව්වෝ ගලවනු ලැබූහ, හාමාන්ගේ දුෂ්ටකමට දඬුවම් හිමිවිය. මේ සියල්ල සිදු වූයේ එස්තර් ක්‍රියා කිරීමට පෙර තව එක දවසක් ඉවසා සිටි නිසාය.

## පඳුර තවමත් දැවෙමින් පවතී

ආත්මික අන්දමින් සලකා බලන කල තවමත් පඳුර දැවෙමින් පවතී, තවමත් දෙවියන්වහන්සේ මිනිසාට මගපෙන්වීම සපයා දෙන අතර කතාකිරීමට කැමැත්තෙන් සිටී.

> **මට යාච්ඤාකරපන්න, එවිට මම නුඹට උත්තරදී, නුඹ නොදන්න මහත්වූ අමාරු දේ නුඹට පෙන්වන්නෙමි. (යෙරමියා** 33:3)

දෙවියන්වහන්සේ තම කැමැත්ත සන්නිවේදනය කිරීමටත් තම සැලැස්ම එළිදරව් කිරීමටත් කැමැත්තෙන් සිටින සේක. උන්වහන්සේ තවමත් දිගටම මගපෙන්වමින් උපදෙස් දෙන සේක. ඔබ සවන් දීමට සූදානම් නම් එතුමා තවමත් ඔබට කතාකරන්නට කැමති දෙවියන්වහන්සේය.

## ස්වයං-පරීක්ෂණය.

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

2. ඇදහිලිවන්තයෙක් සර්ව සම්පූර්ණ දේව කැමැත්තට අනුව හැසිරෙන කල දෙවියන්වහන්සේ සපයා දෙන්නාවූ නිසැකකම කුමක්ද?

______________________________________________

3. හිතෝපදේශය 3:5-6 සපයා ඇති දෙවියන්වහන්සේගේ කැමැත්ත නිර්ණය කිරීමට ඇති යතුරු තුන මොනවාද?

______________ ______________ ______________

4. සියලු කාරණා වලදී දෙවියන්වහන්සේ "සැලකිමට ගන්න" යන්නෙහි අර්ථය කුමක්ද?

______________________________________________

5. මෙම පරිච්ඡේදයෙහි සාකච්ඡා කළාවූ දේව කැමැත්ත සොයාගැනීමේ පියවර සත නම් කරන්න.

______________ ______________ ______________

______________ ______________ ______________

______________

6. පහත සඳහන් ප්‍රකාශන කියවා බලා සත්‍යය නම් ප්‍රකාශනය ඉදිරියෙන් **ස** යන්නද අසත්‍ය නම් **අ** යන්නද හිස්තැනෙහි ලියන්න.

අ.---- දේව කැමැත්ත නිර්ණය කිරීම සඳහා බයිබලය භාවිතා කළ හැකි විශිෂ්ටතම ක්‍රමයක් නම් බයිබලය පෙරලා මුලින්ම ඔබට දකින්නට ලැබෙන පදය පිළිතුර ලෙස භාර ගැනීමය.

ආ. ----දෙවියන්වහන්සේ සාමාන්‍යයෙන් ඔබගේ ජීවිතය උදෙසා මුළු සැලැස්ම සියලු විස්තර සහිතව එක් ආශ්චර්යමත් එළිදරව්වකින් එළිකරන සේක.

ඇ. ----නූතනයේ දෙවියන්වහන්සේ සිහින, දර්ශන සහ වෙනත් ආශ්චර්යමත් ක්‍රම වලින් කථා නොකරන සේක.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා.

1. හිතෝපදේශ 3:5-6 සහ රෝම 12:1-2 සංසඳනය කරන්න. මෙම එක් එක් කොටසෙහි ධනාත්මක ආඥා 2 බැගින් (කළ යුතු කාරණා) එක් ඍණාත්මක ආඥාව බැගින්ද (නොකළ යුතු කාරණාවක්) ඇතුළත් වේ. පහත සඳහන් වගුවෙහි ඒවා සඳහන් කරන්න.

| | හිතෝපදේශය 3:5-6 | රෝම 12:1-2 |
|---|---|---|
| ධනාත්මක ආඥාව : | | |
| ඍණාත්මක ආඥාව : | | |
| ධනාත්මක ආඥාව : | | |

2. දේවගැති ජෝර්ජ් මුලර් එංගලන්තයේ අනාථ දරු නිවාස අරඹා ඒවා නඩත්තු කළාවූ, ලොව පුරා විවිධාකාර ධර්මදූත සේවාවන් අරඹා පවත්වාගෙන ගියාවූ ශ්‍රේෂ්ඨ ආත්මික නායකයෙකි. ඔහුගේ ලේඛනවල ඔහු දේව කැමැත්ත නිර්ණය කර ගැනීම සඳහා කිසියම් ක්‍රමයක් ඉදිරිපත් කර තිබේ.

"කිසියම් කාරණාවක් සම්බන්ධයෙන් මම පළමු කොට මගේ සිතෙහි මගේම කැමැත්තක් තවත් නොපවතින තත්වයකට පත් කරගැනීමට සොයමි.

මනුෂ්‍යයාගේ ගැටලු වලින් දහයෙන් නවයක් රැඳී පවතිනුයේ එතැනය. අපි දේව කැමැත්ත, එය කුමක් වුවත් කිරීමට හදවතින් කැමතිවූ කල ගැටලුවෙන් දහයෙන් නවයක්ම විසඳී අවසානය. කෙනෙකු මෙම තත්වයට පැමිණි කල දේව කැමැත්ත දැනගැනීමට ඇත්තේ තව ටික දුරකි.

මෙය කළ පසුව මම ප්‍රතිඵල මගේ හැඟීම් වලට හෝ එක් කාවදින දෙයකට පමණක් සීමා නොකරමි. එසේ කළහොත් මම මහත් රැවටීමකට ඉඩ සලසා දෙනු ඇත.

මම දේව වචනය තුළින් හෝ දේව වචනය ඇසුරින් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කැමැත්ත සොයන්නෙමි. ආත්මයාණන් හා වචනය එකට සම්බන්ධ කළ යුතුය. මම දේව වචනයෙන් තොරව ආත්මය පමණක් සෙවුවොත් නැවතත් මම මහත් රැවටීමකට ඉඩ හරින්නෙමි. ශුද්ධාත්මයාණෝ අපව මගපෙන්වාවී නම්, එතුමා එය කරනුයේ ශුද්ධ ලියවිලිවලට එකගව මිස කිසිම විටක එයට පටහැනිව නම් නොවේ.

ඊළඟට මම සැපයී ඇති බාහිර අවස්ථාවන් දෙස බලන්නෙමි. බොහෝ අවස්ථාවල ඉතා සරල ලෙස දේව වචනයෙන් හා ආත්මයෙන් එළිකළ දෙය සමග බාහිර අවස්ථාවන් දේව කැමැත්ත පෙන්වා දෙනු ඇත. මම යාච්ඤාවෙන් දේව කමැත්ත මට නිසියාකාරව පෙන්වා දෙන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටිමි. මෙසේ යාච්ඤාවෙන් දේව වචනය අධ්‍යයනයෙන්, ආවර්ජනය කිරීමෙන් පසුව මම ඕනෑකමින්ම මගේ දැනුමේ හා හැකියාවේ ප්‍රමාණයට හොඳම ආකාරයෙන් විනිශ්චයකට එළැඹෙමි. එවිට මාගේ මනසට සමාදානය තිබේ නම් මෙම ක්‍රියාවලිය තව දෙවරක් හෝ තෙවරක් නැවත කිරීමෙන් පසුව මම වැඩය අරඹා ක්‍රියාකරමි.

ඉතා බැරෑරුම් කාරණාවලදී හා ඉතා සුලුවූ කරුණු සම්බන්ධ ගණු දෙනුවලදී, මෙම ක්‍රමය ඉතා සාර්ථක බව මට පෙනී ගොස් තිබේ.

3. දෙවියන්වහන්සේගේ වචනයෙහි මගපෙන්වීම පිළිබඳ බොහෝ පොරොන්දු දෙවියන්වහන්සේ සපයා දී තිබේ. පහත සඳහන් පාඨ අධ්‍යයනය කරන්න.

ගීතාවලිය : 3:8; 5:8; 25:5; 9:12; 27:11; 31:3; 32:8; 37:23; 48:14; 61:2; 73:24; 78:52,72; 85:8,13; 107:7; 139:10,24; 142:3; 143:10;

හිතෝපදේශ : 3:6; 4:11; 8:20; 11:3,15; 16:9; 21:29; 23:19.

දේශනාකාරයාගේ පොත : 10:10.

යෙසායා : 45:13; 58:11; 61:8;

යොහන් : 10:3; 16:13;

එපීස : 5:17

කොලොස්සි : 1:9; 4:12.

4. දෙවියන්වහන්සේගේ මගපෙන්වීම පිළිබඳව ශ්‍රේෂ්ඨ ආදර්ශ වලින් එකක් නම් ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ සිට පොරොන්දු දේශය දක්වා රැගෙන යාමය. ඔබට මේ පිළිබඳව පහත සඳහන් බයිබල් කොටස්වලින් අධ්‍යයනය කළ හැක.

නික්මයාම : 13:7,18,21; 15:13.

ද්විතියකතාව : 8:2,15; 29:5; 32:10.

1 ලේඛම් : 11:2

2 ලේකම් : 25:11.

2 සාමුවෙල් : 5:2.

නෙහෙමියා : 9:12.

ගීතාවලිය : 77:20; 78:14,53; 80:1; 106:9; 107:7; 136:16.

යෙසායා : 48:21; 63:12-14.

යෙරමියා : 2:6,17.

හෙබ්‍රෙව් : 8:9.

# අට වන පරිච්ඡේදය

## සැක සහිත ක්‍රියාවන්

### අරමුණු

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "සැක සහිත ක්‍රියාවන්" යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට
- සැක සහිත ක්‍රියාවන් පිළිබඳව තීරණ ගැනීමේදී බයිබලයෙන් උපදෙස් ලබා දීමට
- "දුර්වල සහෝදරයෙකු" හා "ශක්තිමත් සහෝදරයෙකු" අතර වෙනස දැක්වීමට
- "දුර්වල සහෝදරයෙකු" සමග ක්‍රියා කරන අයුරු පිළිබඳව බයිබලීය උපදෙස් ලබා දීමට
- ඇදහිලිවන්තයන් අතර ඇතිවන එකඟ නොවීමේ හැසිරවීමට බයිබලයෙන් උපදෙස් ලබා දීමට
- ඇදහිලිවන්තයන් අතර ඇතිවන අමනාපයන් විසඳීමට බයිබලයෙන් උපදෙස් ලබා දීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය

**එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. (1 කොරින්ති 10:31)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය තුළින් සලකා බලන්නේ සැක සහිත ක්‍රියාවන් පිළිබඳව තීරණ ගැනීම පිළිබඳවය. මෙමගින් අදහස් කරන දේ අර්ථ දක්වන අතර සැක සහිත ක්‍රියාවන් පිළිබඳ තීරණ ගැනීමට උපදෙස්, දුර්වල සහෝදරයන් සමග කටයුතු කිරීම, ඇදහිලිවන්තයන් අතර ඇතිවන එකඟ නොවීම් හසුරුවීම සහ අමනාපකම් විසඳීම ආදිය සාකච්ඡා කෙරේ.

## සැක සහිත ක්‍රියාවන්

සෑම සංස්කෘතියක් තුළම සැක සහිත ක්‍රියා සමහරක් පවතී. මේවා නම් යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු වශයෙන් සිදු කිරීම හරිද වැරදිද යන වග දේව වචනයේ නිශ්චිතව සඳහන් නොවන ක්‍රියාවන් වේ .

ඔබේ සංස්කෘතියේ ඇති එබඳු ක්‍රියාවක් ගැන ඔබට පහසුවෙන් සිතා ගත හැකිය. එම ක්‍රියා විවේකයට හෝ විනෝදයට කෙරෙන දේවල් විය හැකිය. ඒවා ඔබ අයත් වූ සංගම් හෝ සංවිධාන විය හැකිය. මෙම ක්‍රියාකාරකම් තුළ ඇතැම් පුරුදු හා ඔබ ආහාරයට ගන්නා හා පානය කරන ඇතැම් දේවල් පිළිබඳව කරුණු ඇතුළත් විය හැකිය. ඒවා නමස්කාර කළ යුතු දවස් හා ශුද්ධ දවස් මොනවාද යන්න පිළිබඳ ප්‍රශ්න විය හැකිය.

බයිබලයේ නිශ්චිතවම උපදෙසක් සඳහන් නොවන සැක සහිත ක්‍රියා ඇතුළත් ප්‍රශ්නයකදී ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත තේරුම් ගන්නේ කෙසේද? පහත ප්‍රශ්න ඔබෙන්ම අසාගන්න.

## එය දෙවියන්වහන්සේ මහිමයට පත් කරයිද?

සැක සහිත ප්‍රශ්නයක් විනිශ්චය කිරීමේදී වඩා වැදගත් ප්‍රතිපත්තිය, “එය දෙවියන්වහන්සේ මහිමයට පත් කරයිද?” යන ප්‍රශ්නය ඇසීම විය හැකිය.

ඔබ කරන සියලුම දේවල් දෙවියන්වහන්සේ මහිමයට පත් කළ යුතු බව බයිබලය සඳහන් කරයි.

> **එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. (1 කොරින්ති 10:31)**
>
> **තවද නුඹලා වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ මොකක් කරතත්, සියල්ලම ස්වාමිවූ යේසුස්වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොටගෙන පියවූ දෙවියන්වහන්සේට ස්තුතිකරපල්ලා. (කොලොස්සි 3:17)**
>
> **නුඹලාට නුඹලාගේ විපාකයවූ උරුමය ස්වාමින්වහන්සේගෙන් ලැබෙන බව දැන, නුඹලා කරන කොයි දෙයක් නුමුත් මනුෂ්‍යයන්ට නොව ස්වාමින්වහන්සේට මෙන් සිතෙන් කරපල්ලා. නුඹලා සේවය කරන්නේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේටය. (කොලොස්සි 3:23-24)**

## ඔබේ අභිප්‍රාය කුමක්ද?

ඔබට මෙම ක්‍රියාව කිරීමට අවශ්‍ය ඇයි? ඔබ එය සිදු කිරීමට හේතුව හෝ ඔබේ අභිප්‍රාය කුමක්ද? යහපත් ක්‍රියාවක් වුවද වැරදි අභිප්‍රායකින් සිදු කළ හැකිය. උදාහරණයක් ලෙස යාච්ඤා කිරීමේදී වැරදි අභිප්‍රායන් පැවතීම පිළිබඳව යාකොබ් ඉදිරිපත් කරයි.

> **නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදිලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

යාච්ඤා කිරීම සැබවින්ම වැරදි දෙයක් නොවන නමුත් ඇතැම් ඉල්ලීම් වලදී ඇති අභිප්‍රායන් නිවැරදි නොවේ. මෙම පදය තුළින් විස්තර කෙරෙන අභිප්‍රාය තෘෂ්ණා සහිත ආශාවන් සම්පූර්ණ කර ගැනීමයි.

## එය අවශ්‍යද?

ඇතැම් දේවල් නීත්‍යානුකුල ලෙස සැලකුවද (ලිඛිත දේව වචනයට විරුද්ධ නොවේ) ඒවා සැබවින්ම අවශ්‍යද යන්න ඔබ සලකා බැලිය යුතුයැයි පාවුල් පැවසුවේය. ඔහු මෙසේ පැවසුවේය.

> **සියලු දේ ගැන මට නිදහස තිබේ; නුමුත් සියල්ල ප්‍රයෝජන නැත. සියලු දේ ගැන මට නිදහස තිබේ; නුමුත් මම කිසිවකට වසඟ නොවන්නෙමි. (1 කොරින්ති 6:12)**

## එමඟින් ආත්මික වර්ධනයක් ඇති කරයිද?

බොහෝ ක්‍රියාකාරකම් ආත්මික වර්ධනයට බාධාවක් විය හැකිය. තවත් සමහරක් ආත්මික වර්ධනය ඇන සිටින තරම් කාලය ගතවන ඒවාය.

> **කටු අතරේ වපුරනලද අනික් අයවල් නම්, වචනය ඇසූ නුමුත්, මේ ලෝකය සම්බන්ධ කරදරද වස්තු මායාවද අනිකුත් දේවලට තෘෂ්ණාවද පැමිණීම කරණකොටගෙන වචනය යටකරනු ලැබ ඵල නොදෙන්නෝ වෙති. (මාර්ක් 4:18-19)**

**කටු අතරේ වැටුණු ඒවා නම් වචනය අසා, තමුන්ගේ ජීවිත ගමනේදී එහි වෙහෙසීම්වලින්ද වස්තුවෙන්ද සැපජීවිකාවෙන්ද වචනය යටව, සම්පූර්ණ ඵල නොදරන්නෝය. (ලූක් 8:14)**

ඔබෙන් මෙසේ අසාගන්න. මෙම ක්‍රියාව මාගේ ආත්මික වර්ධනයට බාධා කරයිද එයට අනුබල දෙයිද?

ආත්මික වර්ධනයට බාධා කරන ක්‍රියාකාරකම් දෙවියන්වහන්සේ ඔබ ඉදිරියේ තබා ඇති ආත්මික දිවීම අවහිර කරන බරකි.

**එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා, සියලු බරද පහසුවෙන් අප අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණකරන්නාදවූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු. (හෙබ්‍රෙව් 12:1)**

## එය පුරුද්දකට වහල් භාවයක් ඇති කරයිද?

සැක සහිත ක්‍රියාවක් පිළිබඳව සලකා බැලීමේදී "මෙම ක්‍රියාව පුරුද්දකට මා වහල් කර ගනීද?"යි ඔබෙන්ම අසන්න. වහල්භාවයට පත් කරන පුරුද්දක් යනු ඔබව පාලනය කරන එකකි. එය නොමැතිව ඔබට ඉදිරියට යා නොහැකි බව ඔබට හැඟෙන අතර එය අත්හැරීම ඔබට අසීරු දෙයක් වනු ඇත.

වහල්භාවයට පත් කරන පුරුදු පිළිබඳව පාවුල් මෙසේ අදහස් දක්වයි.

**සියලු දේ ගැන මට නිදහස තිබේ: නුමුත් සියල්ල ප්‍රයෝජන නැත. සියලු දේ ගැන මට නිදහස තිබේ: නුමුත් මම කිසිවකට වසඟ නොවන්නෙමි. (1 කොරින්ති 6:12)**

වටිනා කාලය වැය කරවන, ශාරීරකව, මානසිකව, ආත්මික හෝ පුරුද්දක් ලෙස වහල්භාවය ඇති කරන ඕනෑම ක්‍රියාකාරකමක් අත හැරිය යුතුය.

## එය සම්මුතියකට ඇතුල් විමක්ද?

2 කොරින්ති 6:14 දී පාවුල් මෙසේ පැවසුවේය. "...... අන්ධකාරය සමග ආලෝකයේ ඇති පංගුකාරකම කුමක්ද?"

ඔබ සලකා බලන සැක සහිත ක්‍රියාව ආත්මිකව සම්මුතියකට ඇතුල් විමක් ඇති කරයිද? මෙය සිදුකිරීමෙන් ඔබ ලෝකයේ ක්‍රියාකරකම් වල නිරත වීම හෝ ලෝකයේ ආකාරයන් පිළිගැනීමක් සිදු කරයිද? බයිබලය මෙසේ අණ කරයි.

**එබැවින් නුඹලා ඔවුන් අතරෙන් පිටතට ඇවිත්, වෙන්ව සිටපල්ලා, අපවිත්‍ර දෙයකට අත නොගසා සිටපල්ලායයි ස්වාමින්වහන්සේ කියනසේක. එවිට මම නුඹලා පිළිගෙන...
(2 කොරින්ති 6:17)**

## එය පරීක්ෂාව වෙත ගෙන යයිද?

යේසුස්වහන්සේ ඉගැන්වූයේ "අපි පරීක්ෂාවට නොපමුණුවන..." ලෙස යාච්ඤා කිරීමටය. මෙම යාච්ඤාව සිදු කර පසුව සැක සහිත ක්‍රියාවක් හේතුවෙන් ඔබ හිතා මතාම පරීක්ෂාවට ඇතුළු කර ගැනීම ප්‍රයෝජනයක් නොමැති දෙයකි. බයිබලය මෙසේ අනතුරු අඟවයි.

**යමෙක් පරීක්ෂාකරනු ලබන කල: මම දෙවියන්වහන්සේගෙන් පරීක්ෂාකරනු ලබමියි නොකියාවා. මක්නිසාද දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂාකරනු ලබන්ට නුපුළුවන, උන්වහන්සේම කිසිවෙකු පරීක්ෂා නොකරනසේක. නුමුත් එක එක මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන කල්හිද**

**පොලඹවනු ලබන කල්හිද පරීක්ෂාකරනු ලබයි. එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය වදන්නිය, පාපයද සම්පූර්ණ වූ කල්හි මරණය උපදවයි. (යාකොබ් 1:13-15).**

සාමාන්‍ය පරීක්ෂාවක් ඇදහිල්ලේ පරීක්ෂාවකට වඩා වෙනස්ය. ඇදහිල්ලේ පරීක්ෂාවක් ඇති වන්නේ ඇදහිලිවන්තයෙක් තමාගේ වරදකින් තොරව අසීරු අවස්ථාවකට මුහුණ දෙන විටය. මෙම අවස්ථාව දෙවියන්වහන්සේ කෙරෙහි ඔහුගේ ඇදහිල්ල පරීක්ෂා කර බලයි. ඔබේ ඇදහිල්ල ශක්තිමත් කිරීමට හා ආත්මික පරිණතභාවය ඇති කිරීම උදෙසා දෙවියන්වහන්සේ ඇදහිල්ලේ පරීක්ෂාවන් එන්නට ඉඩ හරී.

නමුත් දෙවියන්වහන්සේ කෙදිනකවත් මිනිසෙකු වරදට පෙළඹවීමෙන් පරීක්ෂා නොකරයි. පරීක්ෂාව යනු වරදක් කිරීමට ඇතිවන ආශාවයි. පරීක්ෂාව පැමිණෙන්නේ ඔබ ඔබේ සිතුවිලි හෝ ක්‍රියාවන් නිසි පරිදි පාලනය කර නොගැනීමෙන් හෝ සාතන් වැරදි දේවල් කිරීමට ඔබව පෙළඹවීමෙනි. ඇතැම් සැක සහිත ක්‍රියාවන් ඔබ වරදට පෙළඹවිය හැක ස්ථාන වලට දැමිය හැක. ඔබ වරද කිරීමට ඇති ආශාවට යටත් වුවහොත්, තෘෂ්ණාවෙන් පාපය ඇතිවන අතර පාපය නිසා ආත්මික විනාශය ඇති වේ.

## එහි නපුරු බවක් පෙනේද?

ඔබ සලකා බලන ක්‍රියාව අන් අයට නපුරක් ලෙස පෙන්නුම් කරයිද? බයිබලය මෙසේ අණ කරයි.

**සියලු අන්දම්වල නපුරෙන් වැලකියල්ලා. (1 තෙසලෝනික 5:22)**

## එය ඔබේ හෘදය සාක්ෂියට වද දෙයිද?

සැක සහිත පුරුද්දක් පිළිබඳව තීරණයක් ගන්නා විටදී, ඔබ කරන තේරීම නිවැරදි බව පිළිබඳව ඔබට සම්පූර්ණ අවබෝධයක් තිබිය යුතුය. පරණ ගිවිසුම් නීතියේදී මස් පූජාවන් ලෙස යොදාගත් බැවින් මස් ආහාරයට ගැනීම සුදුසුද නැද්ද යන්න පිළිබඳව නව ගිවිසුම් ඇදහිලිවන්තයන් අතර විවාදය ඇති විය. පාපය උදෙසා අවසන් හා සම්පූර්ණ පූජාවක් වශයෙන් යේසුස්වහන්සේ ජීවිතය දීමට පෙර මිනිසුන්ගේ පාපයන්ට වන්දියක් ලෙස මෙම මස් පූජාවන් යොදා ගැණුනි. මස් පූජාවන් ලෙස යොදා ගැණුනු බැවින් ඇතැම් මස් වර්ග ආහාරයට ගැනීමට විරුද්ධව නීති රීති තිබුණි. මෙම ප්‍රශ්නය පිළිබඳව පාවුල් මෙසේ ලිවේය.

**නුමුත් සැකකරමින් කන තැනැත්තා, ඇදහිල්ලෙන් යුක්තව නොකන බැවින්, වරදට පත්කරනු ලැබ සිටියි: ඇදහිල්ලෙන් නොවූ සියල්ල පාපයය. (රෝම 14:23)**

ප්‍රතිපත්තිය නම්, සැක සහිත ක්‍රියා වලදී ඔබ කරන දෙය නිවැරදිද වැරදිද යන්න පිළිබඳව ඔබට පූර්ණ වැටහීමක් තිබිය යුතු වේ. ඔබට සැකයක් තිබේ නම්, එවැනි ක්‍රියාවකට හවුල් වීම ඔබට පාපයකි.

## එය අන් අයට බලපාන්නේ කෙසේද?

සැක සහිත ක්‍රියා පිළිබඳ අවසන් උපදෙස මෙයයි. මෙම ක්‍රියාවට හවුල්වීම අන් අයට බලපාන්නේ කෙසේද? එය අන් අයව වර්ධනය කරයිද? වර්ධනය කිරීම යනු උපදෙස්දීම, ගොඩනැගීම හෝ ආත්මිකව වැඩිදියුණු කිරීමයි. බයිබලය මෙසේ සඳහන් කරයි.

**එබැවින් අපි සමාදානය උපදවන කාරණාද එකිනෙකා වැඩිදියුණුකරන්ට පුළුවන් කාරණාද අනුව යමු. (රෝම 14:19)**

මෙම ක්‍රියාව අන් අයගේ ආත්මික වර්ධනය කෙරෙහි ධනාත්මක ලෙසකින් දායක වෙයිද? පාවුල් මෙසේ ලිවේය.

**සියලු දේ ගැන නිදහස තිබේ; නුමුත් සියල්ල යෝග්‍ය නොවේ. සියල්ල ගැන නිදහස තිබේ; නුමුත් සියල්ල වර්ධනය නොකෙරේ. (1 කොරින්ති 10:23)**

ඔබ දායක වන ඇතැම් ක්‍රියාකාරකම් අනෙක් ඇදහිලිවන්තයන්ගේ ආත්මික ගමනට බාධාවන් ඇති කළ හැකිය. නැවත වතාවක් මස් ආහාරයට ගැනීම පිළිබඳ ප්‍රශ්නයේදී පාවුල් මෙසේ ලිවේය.

**එබැවින් කෑම මාගේ සහෝදරයාට බාධාවක් වේ නම්, මාගේ සහෝදරයාට බාධා නොපැමිණෙන පිණිස, කිසි කලක මාංස නොකන්නෙමි. (1 කොරින්ති 8:13)**

මස් ආහාරයට ගැනීම වැරදි බව පාවුල් සැලකුවේ නැත. නමුත් එය ස්වාමින්වහන්සේ තුළ දුර්වල සහෝදරයෙකුට බාධාවක් නම්, ඔහු ඉන් වැළකුනි. දුර්වල සහෝදරයෙකු යනු ඇදහිල්ලේ හෝ දැනගැන්මේ හෝ හෘදය සාක්ෂියේ දුර්වල වීම නිසා ශක්තිමත් සහෝදරයෙකුගේ ආදර්ශයෙන් බලපෑමක් ඇතිවිය හැකි කෙනෙකි. ඔහු ඔහුගේ හෘදය සාක්ෂියට විරුද්ධව පව් කිරීමට පොළඹවනු ලැබිය හැකි අතර එය ඔහුගේ ආත්මික වර්ධනයට බාධා ඇතිවිය හැකිය.

ශක්තිමත් ඇදහිලිවන්තයෙකු යනු ඇතැම් ක්ෂේත්‍ර වල ඇති නිදහස පිළිබඳ ඔහුගේ තේරුම්ගැනීම නිසා හා තම ස්ථිර විශ්වාසයේ ශක්තිය නිසා යහපත් හෘද සාක්ෂියක් ඇතිව නිදහස ක්‍රියාවට නංවන්නෙකි. අන් අයගේ වෙනස් අදහස් වලින් ඔහුට බලපෑමක් ඇති නොවේ.

ශක්තිමත් සහෝදරයෙකුගේ ඕනෑම ක්‍රියාවක් තුළින් දුර්වල සහෝදරයෙකු තම හෘදය සාක්ෂියට විරුද්ධව පව් කිරීමට පෙළඹවීමක් හෝ ඔහුගේ ආත්මික වර්ධනයට බාධා කිරීමක් සිදු කෙරේ නම් එය සාමාන්‍යයෙන් පාපයක් ලෙස සැලකේ. පාවුල් මෙසේ ලිවේය.

**මස් කෑමෙන්වත් මුද්‍රිකපානය බීමෙන්වත් වෙන යමකින්වත් නුඹේ සහෝදරයා බාධාවට පැමිණේද, එය නොකර සිටීම හොඳය. (රෝම 14:21)**

## සාරාංශය: සැක සහිත ක්‍රියාවන් පිළිබඳ තීරණ ගැනීම

සැක සහිත ක්‍රියාවන් පිළිබඳ තීරණ ගැනීමට අදාළ බයිබලීය උපදෙස් පහත වගුව තුළ සාරාංශ ගත කර තිබේ.

| ඔබෙන් මෙසේ අසන්න | බයිබල් පද |
|---|---|
| එය දෙවියන්වහන්සේට මහිමයට පත් කරයිද? | 1 කොරින්ති 10:31; කොලොස්සි 3:17,23 |
| ඔබේ අභිප්‍රාය කුමක්ද? | යාකොබ් 4:3 |
| එය අවශ්‍යද? | 1 කොරින්ති 6:12 |
| එය ආත්මික වර්ධනය ඇති කරයිද? | මාර්ක් 4:18,19; ලූක් 8:14; හෙබ්‍රෙව් 12:1 |
| එය වහල්භාවය ඇති කරන පුරුද්දක්ද? | 1 කොරින්ති 6:12 |
| එය සම්මුතියකට ඇතුල් වීමක් ඇති කරයිද? | 2 කොරින්ති 6:17 |
| එය පරීක්ෂාව වෙත ගෙන යයිද? | යාකොබ් 1:13-15 |
| එහි නපුරු බවක් පෙනේනට තිබේද? | 1 තෙසලෝනික 5:22 |
| එය ඔබේ හෘදය සාක්ෂියට වද දෙයිද? | රෝම 14:23 |
| එය අන් අයට බලපාන්නේ කෙසේද? | රෝම 14:19,21; 1 කොරින්ති 8:13; 10:23 |

# ඇදහිලිවන්තයන්ගේ  අදහස් වෙනස් වන විට

රෝම 14:1 සිට 15:2 දක්වා අධ්‍යයනය කරන්න. ඇදහිලිවන්තයන්ට ඇතැම් අවස්ථාවලදී වෙනස් අදහස් පැවතිය හැකි බව මෙම පද එළිදරව් කරයි. මෙම වෙනස්වීම් බොහෝ විට ඇති වන්නේ හරිද වැරදිද යන්න දේව වචනයේ නිශ්චිතව දක්වා නොමැති සැක සහිත ක්‍රියාවන් වලදීය.

අප එකිනෙකාට ප්‍රේම කරන්නේ නම් හා දිගින් දිගටම බයිබල් පද පරීක්ෂා කරන්නේ නම්, මෙවැනි වෙනස්කම් වලින් හානියක් නොවන බව මෙම කොටසින් පැහැදිලි කරයි. දේව වචනය තුළින් නිශ්චිතව අනාවරණය නොවන ගැටලු වලදී ඇදහිලිවන්තයන් අතර ඇතිවන ආරවුල් විසඳීමට අදාළව පහත උපදෙස් රෝම 14 හි සඳහන් වේ.

## ආඥාවන් හා නිදහස පිළිබඳ කරුණු අතර වෙනස හඳුනා ගැනීම.

ඇදහිලිවන්තයන් සිතන ආකාරය වෙනස් වන විට ආඥාවන් හා නිදහස පිළිබඳ කරුණු අතර වෙනස හඳුනා ගැනීම වැදගත් බව රෝම 14:14 හි සඳහන් වේ. දේව වචනයේ නිශ්චිතව සඳහන් නොවන, නිදහස පිළිබඳ ප්‍රශ්න ගැන සලකා බලමින් පාවුල් මෙසේ ලිවේය.

> **යමෙක් යම් දෙයක් අපවිත්‍රයයි සිතන්නේ නම් එය ඔහුට අපවිත්‍රවා මිස, ස්වභාවයෙන්ම අපවිත්‍ර දෙයක් නැතැයි ස්වාමිවූ යේසුස්වහන්සේ කරණකොටගෙන ඒකාන්තයෙන්ම දනිමි. (රෝම 14:14)**

දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයේ සඳහන් ආඥාවන් පිළිබඳ කරුණු වලදී, අප සියලු දෙනාම එකම ආකාරයකට හැසිරිය යුතුය. වෙනත් ගැටලු වලදී තෝරා ගැනීමේ නිදහස පැවතිය හැකිය.

## ඔබේම ඒත්තුගැන්වීම් ඇති කරගන්න.

සැක සහිත ක්‍රියාවන් පිළිබඳ ඔබේ ඒත්තුගැන්වීම් ඔබ විසින් ඇති කරගත යුතුය. ශුද්ධ දවස් පැවැත්වීම සම්බන්ධයෙන් පාවුල් මෙසේ ලිවේය.

> **එක්කෙනෙක් එක දවසකට වඩා වෙන දවසක් උතුමැයි සිතන්නේය. වෙන කෙනෙක් සියලු දවස්ම ඒකාකාරයයි සිතන්නේය. එක් එක්කෙනා තම තමාගේ සිතින් නිසැකව සිටීවා. (රෝම 14:5)**

සැක සහිත කරුණු පිළිබඳව ඔබේ ඒත්තුගැන්වීම් තීරණය කර ගැනීමට මෙම පරිච්ඡේදයේ පෙර කොටසේ ලබා දී ඇති උපදෙස් යොදා ගන්න.

## අන් අයට තම ඒත්තුගැන්වීම් ඇති කර ගැනීමට නිදහස දෙන්න.

අන් අය ඔබ සිතන ආකාරයට වඩා වෙනස් වුවත්, සැක සහිත ප්‍රශ්න වලදී ඔවුන්ගේ ඒත්තුගැන්වීම් ඇති කර ගැනීමට ඔවුන්ට නිදහස දෙන්න.

> **එසේ නම් නුඹ නුඹේ සහෝදරයා විනිශ්චය කරන්නේ මක්නිසාද? නොහොත් නුඹ නුඹේ සහෝදරයා කුමක් පිණිස සුළුකොට සිතන්නෙහිද? මක්නිසාද අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි පෙනී සිටින්නෙමුව. එබැවින් අපි තවත් එකිනෙකා විනිශ්චය නොකරමු. නුමුත් අනික් අතට තමාගේ සහෝදරයා ඉදිරියෙහි පැකිලීමට හේතුවක්වත් බාධාවක්වත් නොතබන්ට නිශ්චයකරගනිල්ලා. (රෝම 14:10 සහ 13)**

## ප්‍රේමය තුළින් නිදහස සීමා කරන්න.

රෝම 14:13-15:2 දක්වා වූ මූලික පණිවුඩය නම් කිතුනු නිදහස ප්‍රේමය තුළින් සීමා කළ යුතු බවයි.

> **අපෙන් එකිනෙකා තම තමාගේ අසල්වාසියාගේ වැඩිදියුණුව පිණිස යහපත සඳහා ඔහු සතුටුකෙරේවා. (රෝම 15:2)**

අන් ඇදහිලිවන්තයන් උදෙසා වූ ඔබේ ප්‍රේමය නිසා ඔබේ හැසිරීම පවා සීමා කරගන්නා තරම් ඔබ ඔවුන් ගැන සැලකිලිමත් විය යුතුය. ආත්මිකව ඔවුන්ට බාධා වීමට හේතුවන කිසිවක් නොකරන තරම් ඔබ ඔවුන්ට බොහෝ සෙයින් ප්‍රේම කළ යුතුය.

> **එබැවින් අපි තවත් එකිනෙකා විනිශ්චය නොකරමු. නුමුත් අනික් අතට තමාගේ සහෝදරයා ඉදිරියෙහි පැකිලීමට හේතුවක්වත් බාධාවක්වත් නොතබන්ට නිශ්චයකරගනිල්ලා. (රෝම 14:13)**

## සියලු අමනාපයන් විසඳාගන්න.

එක් සහෝදරයෙකු තවත් ඇදහිලිවන්තයෙකු සමග අමනාප වූ විට, එවැනි අමනාපයන් විසඳීමේ බයිබලීය ක්‍රමවේදය මතෙව් 18:15-17 දක්වා සඳහන් වේ.

> **තවද නුඹේ සහෝරදයා නුඹට විරුද්ධව වරදකළොත්, ගොස්, ඔහු සමග තනිව සිට ඔහුගේ වරද පෙන්වාදීපන්න, නුඹ කී දේ ඔහු ඇසුවොත් නුඹ නුඹේ සහෝදරයා දිනාගත්තෙහිය. නැසුවොත් සාක්ෂිකරයන් දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ හෝ මුඛයෙන් සියලු වචන ස්ථිරවන පිණිස නුඹ සමග තවත් එක්කෙනෙකු නොහොත් දෙදෙනෙකු කැඳවාගන පලයන්න. ඔහු ඔවුන් කී දේත් පිළිනොගත්තොත්, සභාවට කියාපන්න. සභාව කී දේත් පිළිනොගත්තොත්, ඔහු නුඹට අන්‍යජාතියෙක් මෙන්ද සුංගම් අයකරන්නෙක් මෙන්ද වේවා. (මතෙව් 18:15-17)**

සහෝදරයෙකු ඔබ හා අමනාප වූ විට ගත යුතු පියවර නම්:

01. පෞද්ගලිකව ඔහු වෙතට ගොස් ප්‍රශ්නය විසඳාගන්න. අමනාපය ගැන අන් අය සමග කතා නොකරන්න. කෙළින්ම ඔබ හා අමනාප වූ පුද්ගලයා ළඟට ගොස් ප්‍රශ්නය විසඳා ගැනීමට උත්සාහ කරන්න. යාච්ඤා කිරීම හා දේව වචනය සෙවීම එකවර සිදු කරන්න.

02. ඔහු ඔබට සවන් නොදෙන්නේ නම්, සාක්ෂිකරුවන් එක්කෙනෙකු හෝ දෙදෙනෙකු සමග ගොස් නැවත උත්සාහ කරන්න. සාක්ෂිකරුවන් අපක්ෂපාති ඇදහිලිවන්තයන් විය යුතුය. සභාවේ වැඩිමහල්ලන් හෝ නායකයන් හොඳ තේරීමක් වනු ඇත. සාක්ෂිකාරයන් රැගෙන නැවත ඔබේ සහෝදරයා ළඟට ගොස් සාකච්ඡා කිරීමට උත්සාහ කරන්න. ප්‍රශ්නය ගැන යාච්ඤා කිරීම හා දේව වචනය සෙවීම එකවර සිදු කරන්න.

03. ප්‍රශ්නය සම්පූර්ණ සභා ශරීරය ඉදිරියට ගෙන යන්න. සාක්ෂිකරුවකු සමග ඔබේ සහෝදරයා ළඟට යාමෙන් අනතුරුව ඔහු තවදුරටත් එය විසඳාගැනීම ප්‍රතික්ෂේප කරයි නම්, කාරණය සම්පූර්ණ සභා ශරීරය ඉදිරියට ගෙන යන්න. මෙය නියම අවස්ථාවේදී සිදු කළ යුතුය. මෙය සාමාන්‍ය නමස්කාර දේව මෙහෙයකදී හෝ නොඇදහිලිවන්තයන් සිටින තැනකදී සිදු නොකළ යුතුය. ප්‍රශ්නයට සවන් දීමෙන් අනතුරුව සභාවේ තීරණය ස්ථිර විය යුතු අතර එමගින් ප්‍රශ්නය විසඳිය යුතුය. එසේ නොවුවහොත් අමනාපය සහිත පුද්ගලයන් අන්‍යජාතීන් හෝ නොඇදහිලිවන්තයන් ලෙස හැසිරෙනු ඇත.

## සාරාංශය: ඇදහිලිවන්තයන්ගේ  අදහස් වෙනස් වන විට

සැක සහිත ක්‍රියාවන් සම්බන්ධයෙන් ඇදහිලිවන්තයන් විවිධ අදහස් දරන විට අනුගමනය කළ යුතු ආත්මික උපෙදස් පහත වගුවේ සාරාංශ කර ඇත.

| ඇදහිලිවන්තයන් අදහස් වෙනස් වන විට |
|---|
| රෝම 14-15:2 හා මතෙව් 18:15-17<br>ආඥාවන් හා නිදහස පිළිබඳ කරුණු අතර වෙනස හඳුනාගන්න<br>ඔබේම ඒත්තුගැන්වීම් ඇති කරගන්න.<br>අන් අයට තම ඒත්තුගැන්වීම් ඇති කර ගැනිමට නිදහස දෙන්න.<br>ප්‍රේමය තුළින් නිදහස සීමා කරන්න<br>සියලු අමනාපකම් විසඳන්න |

# ස්වයං පරීක්ෂණය

01. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

02. "සැක සහිත ක්‍රියාවන්" යන්නෙන් අදහස් වන්නේ මොනවාද?

03. මෙම පරිච්ඡේදය තුළ සැක සහිත ක්‍රියාවන් සමග කටයුතු කිරීමට අදාළව බයිබලයෙන් දී ඇති උපදෙස් දහයක් සඳහන් කරන්න.

04. "දුර්වල සහෝදරයෙකු" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

05. "ශක්තිමත් සහෝදරයෙකු" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

06. ඇදහිලිවන්තයන් අතර අදහස් වෙනස්වීම් හසුරුවීමට බයිබලයෙන් උපදෙස් පහක් ලියා දක්වන්න.

07. වෙනත් සහෝදරයෙකු ඔබ හා අමනාප වූ විට ඔබ ගත යුතු පියවර තුන මොනවාද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

එබේ ජීවිතය යාච්ඤාවෙන් යුතුව පිරික්සා බලන්න. මේ මොහොත වන විට ඔබ හවුල් වී සිටින හා සලකා බලමින් සිටින සැක සහිත ක්‍රියාවන්ගේ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

මෙම පරිච්ඡේදයේ සඳහන් පහත වගුව තුළ සාරාංශ කර ඇති බයිබලීය උපදෙස් යොදාගනිමින් ඒවා එකින් එක පිරික්සා බලන්න.

## සැක සහිත ක්‍රියාවන් පිළිබඳ තීරණ ගැනීම

| ඔබෙන් මෙසේ අසන්න | බයිබල් පද |
|---|---|
| එය දෙවියන්වහන්සේට මහිමයට පත් කරයිද? | 1 කොරින්ති 10:31; කොලොස්සි 3:17,23 |
| ඔබේ අභිප්‍රාය කුමක්ද? | යාකොබ් 4:3 |
| එය අවශ්‍යද? | 1 කොරින්ති 6:12 |
| එය ආත්මික වර්ධනය ඇති කරයිද? | මාර්ක් 4:18,19; ලූක් 8:14; හෙබ්‍රෙව් 12:1 |
| එය වහල්භාවය ඇති කරන පුරුද්දක්ද? | 1 කොරින්ති 6:12 |
| එය සම්මුතියකට ඇතුල් වීමක් ඇති කරයිද? | 2 කොරින්ති 6:17 |
| එය පරීක්ෂාව වෙත ගෙන යයිද? | යාකොබ් 1:13-15 |
| එහි නපුරු බවක් පෙනේනට තිබේද? | 1 තෙසලෝනික 5:22 |
| එය ඔබේ හෘදය සාක්ෂියට වද දෙයිද? | රෝම 14:23 |
| එය අන් අයට බලපාන්නේ කෙසේද? | රෝම 14:19,21; 1 කොරින්ති 8:13; 10:23 |

# නව වන පරිච්ඡේදය

## තීරණ ගැනීම පිළිබඳ බයිබලීය ආකෘතිය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ආකෘතියක අරමුණු පැහැදිලි කිරීමට
- තිරණ ගැනීම සඳහා ආකෘතියක වටිනාකම පැහැදිලි කිරීමට
- ඔබට බුද්ධිමත්ව තිරණ ගැනීමට බයිබලීය ආකෘතිය පාවිච්චි කිරීම හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

**මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි: එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16:9)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය තිරණ ගැනීම පිළිබඳ බයිබලීය ආකෘතියක් ඉදිරිපත් කරයි. ආකෘතියක් යනු යම් දෙයකට උදාහරණයකි. එහි අරමුණ ඔබට අනුගමනය කිරීමට ආදර්ශයක් සැපයීමයි. තීරණයක් යනු තේරීමකි. සැබෑ ජීවිත තත්වයකදී ඔබ පිළිතුරක් තීරණය කළ යුතු අතර ඔබ කරන්නේ කුමක්ද යන්න ඔබ තෝරා ගත යුතුය. තිරණ ගැනීම ලෙස හැඳින්වෙන්නේ මෙයයි. තිරණ ගැනීම පිළිබඳ ආකෘතියෙන්, තිරණ ගැනීමේදී අනුගමනය කිරීමට ආදර්ශයක් සපයයි. ජීවිතය යනු නිමක් නොමැති තේරීම් හා තිරණ සමූහයකි. තේරීමක් කිරීම වගකීමකි. තිරණයක් ගැනීම ප්‍රතික්ෂේප කිරීමත්, තිරණයකි.

මෙම පරිච්ඡේදයේ සපයා ඇති තිරණ ගැනීම පිළිබඳ බයිබලීය ආකෘතිය දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ බුද්ධිමත් තේරීමක් කිරීමට ඔබට උපකාරී වනු ඇත.

**මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි: එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16:9)**

## ආකෘතිය

පහත ඇති තීරණ ගැනීම පිලිබඳ බයිබලීය ආකෘතිය අධ්‍යයනය කරන්න. මෙම වගුව ඔබ මීට පෙර පරිච්ඡේදවලදී ඉගෙනගත් දේවල් සාරාංශගත කරයි. මීළඟට මෙම පරිච්ඡේදයේ ඉතිරි කොටස් ආකෘතිය ගැන සාකච්ඡා කිරීම ඉදිරියට කරගෙන යයි.

### තීරණ ගැනීම පිළිබඳ බයිබලීය ආදර්ශය

උපදෙස් අවශ්‍ය ගැටලුව, ප්‍රශ්නය හෝ ජිවිත සිදුවීම හඳුනාගන්න.

නිශ්චිත ආඥාවක්, පොදු ප්‍රතිපත්තියක් හෝ උදාහරණයක් තුළින් මේ පිළිබඳව දේව වචනයේ සඳහන්ව තිබේද

**ඔව්** → 1 තීරුව
**නැත** → 2 තීරුව / 3 තීරුව

**1 තීරුව**

බයිබලීය ආඥාව ප්‍රතිපත්තිය හෝ උදාහරණය මත පදනම්ව තීරණයක් ගන්න

**2 තීරුව**

එය සැක සහිත ක්‍රියාවක්ද?

මෙම ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු මත පදනම්ව තීරණයක් ගන්න

එය දෙවියන්වහන්සේට මහිමයට පත් කරයිද?

ඔබේ අභිප්‍රාය කුමක්ද?

එය අවශ්‍යද?

එය ආත්මික වර්ධනය ඇති කරයිද?

එය වහල්භාවය ඇතිකරන පුරුද්දක්ද?

එය සම්මුතියකට ඇතුල් විමක් ඇති කරයිද?

එය පරීක්ෂාව වෙත ගෙන යයිද?

එහි නපුරු බවක් පෙනේද?

එය ඔබේ හෘදය සාක්ෂියට වද දෙයිද?

එය අන් අයට බලපාන්නේ කෙසේද?

**සමාදානයේ විනිශ්වයකරුවාණන් පරීක්ෂා කරන්න**

**3 තීරුව**

එය ජිවිත සිදුවීමක්ද?

මෙම පියවර තුළින් ඉදිරියට ගන්න

යාච්ඤා කරන්න

දේව වචනය අධ්‍යයනය කරන්න

ශුද්ධාත්මයාණන්ගේ හඬට හා උන්වහන්සේ භාස්කමක් තුළින් මගපෙන්විම දෙන්නේ නම් එයට සවන් දෙන්න

කිතුනු උපදේශනය වෙත යොමුවන්න

අවස්ථාවන් විශ්ලේෂණය කරන්න

අවස්ථාවන් විශ්ලේෂණය කරන්න

මඟපෙන්විමට බයිබලීය කරුණු යොදා ගන්න.

තීරණයක් ගන්න

**සමාදානයේ විනිශ්වයකරුවාණන් පරීක්ෂා කරන්න**

ඔබට සමාදානය නොමැතිනම් ආකෘතිය යොදාගනිමින් දිගින් දිගටම දෙවියන්වහන්සේව සොයන්න

# ආකෘතිය ප්‍රයෝජනයට ගැනීම

තීරණ ගැනීම පිළිබඳ ආකෘතියේ පළමු පියවර උපදෙස් අවශ්‍ය ගැටලුව ප්‍රශ්නය හෝ ජීවිත සිදුවීම හඳුනාගැනීමයි. ඊළඟට, ආඥාවක් උදාහරණයක් හෝ පොදු ප්‍රතිපත්තියක් තුළින් එම ප්‍රශ්නය හා සම්බන්ධව දේව වචනයේ යමක් සඳහන් වේදැයි සොයා බලන්න.

## ඔව්:

ඔබේ පිළිතුර “ඔව්, දේව වචනයේ ඒ පිළිබඳව සඳහන් වේ” යන්න නම්, මෙම ලිඛිත එළිදරව්ව මත පදනම්ව තීරණයක් ගන්න (ආකෘතියේ 1 තීරුව බලන්න). ඔබගේ තීරණය දේව වචනය සමග එකඟ වන බව සැක හැර දැනගන්න.

## නැත:

ඔබේ පිළිතුර “නැත” යන්න නම්, 1 හා 2 තීරු යටතේ තීරණ ගැනීම පිළිබඳ ආකෘතියේ දිගටම සලකා බලන්න.

මෙහිදී බයිබලයේ කරුණු දක්වා නැති අවස්ථාවන් දෙකක් පිළිබඳ තේරීමක් කිරීමට ඔබට හැකිය. තීරණය ගත යුත්තේ සැක සහිත ක්‍රියාවක් පිළිබඳවද එසේ නොමැති නම් සැබෑ ජීවන අවස්ථාවක් ගැනද යන්න ඔබ තීරණය කළ යුතුය.

## සැක සහිත ක්‍රියාවන්:

සැක සහිත ක්‍රියාවක් යනු හරිද වැරදිද යන්න බයිබලයේ සඳහන් නොවන දෙයකි. ඒ තුළ විනෝදයට හෝ විවේකයට කරන ක්‍රියාවක්, පුරුද්දක්, ගැනීමට අවසර ඇති ආහාර හා පාන වර්ග, ඇඳුම් වර්ග හෝ නමස්කාර කළ යුතු දවස් මොනවාද යන දේවල් ඇතුළත් විය හැකිය.

ඔබ මුහුණ දී සිටින්නේ සැක සහිත ක්‍රියාවක් පිළිබඳව තීරණය කිරීමට නම්, ආකෘතියේ 2 තීරුව යටතේ දක්වා ඇති ප්‍රශ්න ඔබෙන්ම අසා ගන්න. මේවා අට වන පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද සැක සහිත ක්‍රියා පිළිබඳ තීරණ ගැනීමේදී උපදෙස් ලබා ගත හැකි බයිබලීය ප්‍රතිපත්තීන් වේ. එම සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලබා දී යාච්ඤා කරන්න. ඉන්පසුව ආකෘතියේ ඇති ප්‍රශ්න වලට ඔබ ලබා දුන් පිළිතුරු පදනම්ව තීරණ ගන්න.

## ජීවිත අවස්ථාවන්:

ජීවිත අවස්ථාවන් තුළ විවාහය, සේවය, රැකියාව, නවාතැන, සභාවක් තෝරා ගැනීම ආදිය පිළිබඳ තීරණ ගැනීම ඇතුළත් විය හැකි අතර ඒවාට පමණක් සීමා නොවේ. එය ඉතා ප්‍රබල ආකාරයකින් ඔබගේ අනාගත ජීවිතයට බලපෑ හැකි තේරීමකි.

ජීවන තත්වයන් පිළිබඳ තීරණ ගැනීමේදී, තීරණ ගැනීම පිළිබඳ ආකෘතියේ දකුණු පස ඇති 3 තීරුව යටතේ ඉදිරියට යන්න. පළමුව තීරණය පිළිබඳව යාච්ඤා කරන්න. ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලන්න. නිවැරදි තීරණය ලබා ගැනීමට උන්වහන්සේ ලබා දෙන උපදෙස් පිළිබඳව උන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබත් සමග යාච්ඤා කරන ලෙස අන් අයගෙන් ඉල්ලන්න. දේව වචනය අධ්‍යයනය කරන්න, ඒ අතරතුර මඟපෙන්වීම පිළිබඳව බයිබලයේ ලබා දී ඇති පොරොන්දු අත්පත් කරගන්න.

ඔබේ ඇතුළාන්තයෙන් ඇසෙන ශුද්ධාත්මයාණන්ගේ හඬ දේව කැමැත්ත ඔබට පවසන අතරතුර එයට සවන් දෙන්න. දෙවියන්වහන්සේ ඔබ වෙත එවීමට තෝරාගන්නා අධිස්වභාවික එළිදරව්වීම් පිළිගන්න. සිහින, දර්ශන, දේව දූතයන්, දෙවියන්වහන්සේගේ ශ්‍රවණය කළ හැකි හඬ හෝ දේව වචනය සමග එකඟ වන වෙනත් ආකාරයේ මඟපෙන්වීම් මේ තුළ ඇතුළත් විය හැකිය.

කිතුනු උපදේශනය සොයා යන්න. තීරණයට බලපාන අවස්ථාවන් විශ්ලේෂණය කරන්න. ඔබ පෙර පරිච්ඡේදයේ දී ඉගෙන ගත් මඟපෙන්වීම පිළිබඳ බයිබලීය කරුණු පාවිච්චි කරන්න (මේවා හිතෝපදේශ 3:5-6 දක්වා සඳහන් වේ). මෙම ක්‍රමවේදයන්ට එකඟවීමේ පදනම මත, තීරණයක් ගන්න.

# සමාදානයේ විනිශ්චයකරුවාණෝ

බයිබලීය ආඥාවක්, ප්‍රතිපත්තියක් හෝ උදාහරණයක් මගින් සෘජුව සාකච්ඡා කර නොමැති තීරණ වලදී ඔබට මඟපෙන්වන්නා වන්නේ සමාදානයේ විනිශ්චයකරුවාණන්ය. සැක සහිත ක්‍රියාවක් හෝ ජීවිතයේ අවස්ථාවක් පිළිබඳව ඔබ තීරණයක් ගැනීමේදී ඔබගේ ආත්මය තුළ සමාදානය නොමැති නම්, ආකෘතියේ පියවර පාවිච්චි කරමින් දෙවියන්වහන්සේ සෙවීම නොකඩවා සිදු කරන්න. දෙවියන්වහන්සේගේ සමාදානය ඔබගේ තේරීම තහවුරු කරන තුරු කිසිදාක ඉක්මන් නොවන්න.

> **ස්වාමින් කෙරෙහි බලාසිටුව, ශක්තිමත් වෙව, තාගේ සිත ධෛර්යමත් වේවා: එසේය, ස්වාමින් කෙරෙහි බලාසිටුව. (ගීතාවලිය 27:14)**
>
> **මාගේ ආත්මය, දෙවියන්වහන්සේ කෙරෙහි පමණක් බලා සිටුව, මක්නිසාද මාගේ බලාපොරොත්තුව උන්වහන්සේ කෙරෙන්ය. (ගීතාවලිය 62:5)**
>
> **ස්වාමින් කෙරෙහි රඳා ඉවසිල්ලෙන් උන්වහන්සේ බලා සිටුව, තමාගේ මාර්ගයෙහි දියුණුවන්නාද නපුරු ප්‍රයෝග ඉෂ්ටකරගන්නාද නිසා කල නොකිරෙව. (ගීතාවලිය 37:7)**
>
> **නුමුත් ස්වාමින්වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ සවිය අලුත්කරගන්නෝය, ඔව්හු රාජාලින් මෙන් පියඹා නගින්නෝය, ඔව්හු දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙති. ඔව්හු ඇවිදින්නෝය එහෙත් ක්ලාන්ත නොවෙති. (යෙසායා 40:31)**

සාවුල් තීරණයක් ගැනීමට ඉක්මන් වූ අතර ඉන් ප්‍රතිඵලයක් ලෙස ඔහුට ඔහුගේ රාජ්‍යය අහිමිවිය. 1 සාමුවෙල් 13 හි ඔබට ඒ පිළිබඳව කියැවිය හැකිය. නෙහෙමියා දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා නිවැරදි කාලය උදෙසා බලා සිටිය අතර ඔහු රාජ්‍යය නැවත ගොඩනැඟීමේ කොටස්කරුවෙකු විය. නෙහෙමියා පොත තුළ ඔබට ඔහුගේ කතාව කියැවිය හැකිය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ආකෘතියක අරමුණ කුමක්ද?

3. තීරණ ගැනීම පිළිබඳ ආකෘතියක් යනු කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

ඔබට මඟපෙන්වීම අවශ්‍ය ගැටලුවක් ප්‍රශ්නයක් හෝ ජීවිතයේ අවස්ථාවක් පිළිබඳව තීරණයක් ගැනීම සඳහා ඔබට උපකාරයක් ලබා ගැනීමට මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති බයිබලීය ආකෘතිය යොදාගන්න.

# දහ වන පරිච්ඡේදය

## උත්සාහකර අසාර්ථකවීද?

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කැමැත්ත වෙත ළඟාවීම සඳහා අසාර්ථකවීම් ජයගත් මිනිසුන් පිළිබඳ බයිබලීය උදාහරණ හඳුනා ගැනීමට
- දෙවියන්වහන්සේගේ කැමැත්ත අත්හැරුණු හා අසාර්ථකකම තුළින්ම ජීවිතය අවසන් වූ මිනිසුන් පිළිබඳ බයිබලීය උදාහරණ හඳුනා ගැනීමට
- ඔබ අසාර්ථක වූ විට නැවත දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙත පැමිණීමට අවශ්‍ය උපදෙස් ලයිස්තුගත කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය:**

**අහෝ මාගේ සෙනඟ මට කන් දුන්නොත් ඉශ්‍රායෙල් මාගේ මාර්ගවල හැසුරුණොත්, යහපත! (ගීතාවලිය 81:13)**

## හැඳින්වීම

දෙවියන්වහන්සේ තම කැමැත්ත මිනිසුන්ට දැක්වීම උදෙසා ඔවුන්ට කතා කරන විවිධ ආකාරයන් පිළිබඳව මෙම පාඨමාලාව තුළදී ඔබ ඉගෙනගත්තේය. නමුත් ඔබ දේව කැමැත්ත තේරුම් නොගතහොත් සිදුවන්නේ කුමක්ද? ඇතැම්විට ඔබ හිතාමතා උන්වහන්සේගේ හඬට අකීකරු වේ. ඇතැම්විට වැරදීමකින් හෝ බයිබලීය ප්‍රතිපත්ති වැරදි ලෙස තේරුම් ගැනීමෙන් ඔබට උන්වහන්සේගේ මඟපෙන්වීම මගහැරෙනු ඇත. සමහර විට උන්වහන්සේගේ මගපෙන්වීම නොමැතිව ඔබ ඉක්මන්වී ක්‍රියා කරයි. ඔබ උත්සාහ කර අසාර්ථක වූ විට ඔබ කළ යුත්තේ කුමක්ද?

## සාර්ථකත්වයට පත් අසාර්ථකවූවන්

තම ජීවිතයේ යම් අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ හඬට සවන් දීමට අපොහොසත් වූ හා උන්වහන්සේගේ කැමැත්ත මගහැරිය ශ්‍රේෂ්ඨ නායකයන් ගැන උදාහරණ රැසක් බයිබලයේ සඳහන් වේ. මෙම මිනිසුන් අසාර්ථක වුවත් ඔවුන් මහත් සාර්ථකත්වයක් ළඟා කර ගත්හ.

**ආබ්‍රහම් :** තමන්ව මරණයට පත්කරාවියැයි හා තම බිරිඳ තමාගෙන් ඈත් කරනු ඇතැයි යන බියෙන් ඔහු සාරා තම බිරිඳ වීම ගැන බොරු කීවේය. එසේ වුවත් ඔහුව හැඳින්වෙන්නේ ඇදහිල්ලේ පුරුෂයෙකු හා දෙවියන්වහන්සේගේ මිතුරෙකු ලෙසය.

**මෝසෙස් :** දෙවියන්වහන්සේ මඟ පෙන්වූ ලෙස පර්වතයට කතා කරනු වෙනුවට ඔහු එයට තම සැරයටියෙන් පහර දුන්නේය. එසේ වුවත් මෝසෙස්ට වඩා ශ්‍රේෂ්ඨ ප්‍රොපේතවරයෙකු තවත් නොවේ යැයි බයිබලයේ සඳහන් වේ.

**දාවිත් :** ඔහු වෙනත් මිනිසෙකුගේ භාර්යාවක් සමග අනාචාරයේ හැසිරුණු අතර තම පාපය වසා ගැනීමට එම මිනිසා මැරීය. එසේ වුවත් ඔහු ශ්‍රේෂ්ඨ රජ කෙනෙකු වූ අතර දෙවියන්වහන්සේගේ හදවතට සමීප මිනිසෙකු ලෙස හඳුන්වනු ලැබීය.

**යෝනා :** දෙවියන්වහන්සේ නිනිවයේ දේශනා කිරීමට කැඳවූ විට මෙම දේශකයා විරුද්ධ දිශාවට ගමන් කළේය. පසුව ඔහු ඉතිහාසයේ ඇතිවූ විශාලතම පිබිදීම උදෙසා දේශනා කළේය. මුළු නගරයම පසුතැවිලි විය.

**පේත්‍රුස් :** ඔහු යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කළ නමුත් පසුව මුල් කාලීන සභාවේ ශ්‍රේෂ්ඨ නායකයෙකු බවට පත්විය.

## අසාර්ථකත්වයේම රැඳුණු අසාර්ථකවූවන්

දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරුණු සහ අසාර්ථකවූවන් හා පරාජිතයන් ලෙස ජීවිතය අවසන් කළ මිනිසුන් පිළිබඳ උදාහරණ ද බයිබලයේ සඳහන් වේ.

**සැම්සන් :** ඔහු ඉශ්‍රායෙල් ජාතියේ වැදගත් විනිශ්චයකාරයෙකු වූ අතර දෙවියන්වහන්සේගෙන් ලද විශාල ශාරීරික ශක්තියකින් යුක්ත විය. ඔහු පිලිස්තීන සතුරන්ගෙන් ඉශ්‍රායෙලය මුදාගැනීම ආරම්භ කළේය. නමුත් අන්‍යජාතික කාන්තාවක් සමග සම්බන්ධතා පැවැත්වීම තුළින්, සැම්සන් වහලෙකු ලෙස ගෙනයනු ලැබූ අතර සතුරාගේ හිරකරුවකු ලෙස සිටින අතරතුර මරණයට පත්විය.

**උස්සියා :** මෙම රජු සැබවින්ම දෙවියන්වහන්සේගේ ඇස් හමුවේ නිවැරදි දේ කළ අතර දෙවියන්වහන්සේ ඔහුව සවිලවත් කළ සේක. නමුත් දේවමාලිගාවට ඇතුළුව පූජකයන්ට පමණක් කිරීමට අවසර තිබූ කාර්යයන් කිරීම තුළින් උස්සියා පව් කළේය. ඔහුට කුෂ්ඨයකින් පහර දෙනු ලැබ මරණයට පත්විය.

**සාවුල් :** ඉශ්‍රායෙලයේ පළමු රජුය. සාවුල් යනු දෙවියන්වහන්සේ විසින් පත් කරනු ලදුව දෙවියන්වහන්සේගේ ආලේපය ඔහු මත වගුරවනු ලැබූ මිනිසෙකි. අකීකරුකම හේතුවෙන් දෙවියන්වහන්සේ සාවුල් ප්‍රතික්ෂේප කළ අතර ඔහුගේ කාර්යය සම්පූර්ණ කිරීමට වෙනත් රජකෙනෙකු තෝරාගනු ලැබීය. සාවුල්ගේ ජීවිතය අසාර්ථකත්වය තුළ අපකීර්තිය තුළ, සියදිවි නසා ගැනීමෙන් අවසන් විය.

**ඒලි :** සැබවින්ම දෙවියන්වහන්සේගේ ගෘහයේ ශ්‍රේෂ්ඨ පූජකයෙකු වූ නමුත් ඒලි හා ඔහුගේ පුත්‍රයන් අකීකරුකම හේතුවෙන් අපකීර්තිය තුළ නසිනු ලැබීය.

**යූදස් :** යූදස් යේසුස්වහන්සේගේ මෙලොව සේවය තුළ උන්වහන්සේගේ ගෝලයෙකු විය. ඔහු යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ හාස්කම් දුටු අතර උන්වහන්සේගේ ඉගැන්වීම් වලට සවන් දුන්නේය. එසේ වුවත් ඔහු යේසුස්වහන්සේ පාවා දුන් අතර සියදිවි නසා ගැනීමෙන් ඔහුගේ ජීවිතය අවසන් විය.

## වෙනස ඇති කළේ කුමකින්ද?

තම ජීවිතයේ ඇතැම් අවස්ථාවලදී දෙවියන්වහන්සේගේ කැමැත්ත තේරුම් ගැනීමට අසමත් වූ මිනිසුන්ගේ ලැයිස්තුවක් අප විසින් දක්වා තිබේ. මොවුන්ගෙන් ඇතැම් අය අසාර්ථකත්වයෙන් යථා තත්වයට පැමිණ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ මිනිසුන් බවට පත් විය. අනෙක් අය කිසිදාක තම මාර්ගයෙන් හැරුණේ නැත. ඔවුන්ගේ ජීවිත අසාර්ථකත්වය තුළ අවසන් විය. මෙම වෙනස ඇති කළේ කුමකින්ද?

මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ඉශ්‍රායෙලයේ රජවරුන් දෙදෙනෙකු වූ දාවිත්ගේ හා සාවුල්ගේ ජීවිත පිළිබඳව අප විස්තරාත්මකව සලකා බලමු. පළමුව 2 සාමුවෙල් 11-12 දක්වා පරිච්ඡේදවල සඳහන් දාවිත් දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඈත් වීම පිළිබඳ පුවත කියවන්න. ඉන්පසු 1 සාමුවෙල් 15 පරිච්ඡේදයේ සඳහන් සාවුල්ගේ අසාර්ථකවීම පිළිබඳ පුවත කියවන්න. දාවිත්ගේ අසාර්ථකවීම සාවුල්ගේ අසාර්ථකවීමට වඩා විශාලව පෙනේ. සාවුල් කළේ දෙවියන්වහන්සේ විසින් නොකරන ලෙස පැවසූ පරිදි යුද්ධයේදී කොල්ලයක් ලෙස ගවයන් ගෙන ඒමය.

දාවිත් වෙනත් පුද්ගලයෙකුගේ භාර්යාව සමග අනාචාරයේ හැසිරුණි. ඇය ගර්භණී වූ විට ඔහු තම පාපය වසා ගැනීමට උත්සාහ කරමින් ඇගේ ස්වාමියා මරා දැමුවේය. දෙවියන්වහන්සේ විසින් සාවුල්ව රජකමෙන් පහ කරනු ලැබිය, එසේ වුවත් දාවිත් රජකමේ රැඳුණු අතර දෙවියන්වහන්සේගේ හදවතට සමීප මිනිසා ලෙස හඳුන්වනු ලැබිය. එක් මිනිසෙකුගේ ජීවිතය අසාර්ථකත්වය තුළ අවසන් විමටත් අනෙක් පුද්ගලයාගේ ජීවිතය අනාගත සාර්ථකත්වය වෙත ගමන් කළෙත් ඇයි?

අනාගතවක්තෘ සාමුවෙල් සාවුල්ට තම පාපය පෙන්වා දුන්විට, සාවුල් මෙසේ පැවසුවේය.

> **සාවුල් සාමුවෙල්ට කථාකොට: මම පව්කළෙමි, මක්නිසාද, මම සෙනඟට භයවී ඔවුන්ගේ හඬට කීකරුවූ බැවින් ස්වාමින්වහන්සේගේ ආඥාවද ඔබගේ වචනද කඩකළෙමි.**
> **එවිට, ඔහු: මම පව්කළෙමි, එහෙත් දැනට මාගේ සෙනඟගේ වැඩිමහල්ලන්ද ඉශ්‍රායෙල්වරුන්ද ඉදිරියේදී මට ගෞරවය දී, මා විසින් ඔබගේ දෙවිවූ ස්වාමින්වහන්සේට නමස්කාරකරන පිණිස මා සමග හැරී අවමැනවැයි කීවේය.** (1 සාමුවෙල් 15:24 සහ 30)

සාවුල් පාපයේ යෙදී සිටි විට හසු වූ අතර ඔහු පාපය පිළිගත්තේය. ඔහු දුක් වූ නමුත් එසේ දුක් වූයේ ඔහුගේ පාපය හසුවීම පිළිබඳවය. පාපය උදෙසා දුක්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ශෝකය තුළින් පසුතැවිලිවීමක් වෙතට යා යුතුය.

> **මක්නිසාද දේවකැමැත්තට එකඟවූ ශෝකයෙන්, තැවෙන්ට කාරණයක් නොවන්නාවූ ගැළවීමට පමුණුවන පසුතැවිලිවීම හටගන්නේය. නුමුත් ලෞකික ශෝකය මරණය උපදවන්නේය.**
> (2 කොරින්ති 7:10)

තමා අසාර්ථක වූ බව සාවුල් තේරුම්ගත් නමුත් ඔහු තම අසාර්ථකත්වය පිළිබඳව අන් අය මත වරද පැටවීය. ඔහු අපකීර්තියට පත් නොවන පිණිස නායකයන් ඉදිරියේ සාමුවෙල් ඔහුට ගෞරව කරනු දැකීම ඔහුට අවශ්‍ය විය. ඔහු තවමත් ආත්මික පුද්ගලයෙකු බව ජනතාවට පෙන්වීමට සාමුවෙල් ඔහු සමග දෙවියන්වහන්සේට නමස්කාර කරනු දැකීමට ඔහුට අවශ්‍ය විය.

සාවුල් කිසිදාක දෙවියන්වහන්සේට තම පාපය කියා දී පසුතැවිලි වී සමාව ඉල්ලා සිටියේ නැත. තම ක්‍රියාවන් පිළිබඳව පෞද්ගලිකව වගකීම භාරගැනීම ඔහු ප්‍රතික්ෂේප කළේය. දෙවියන්වහන්සේ ඔහුගෙන් පසුතැවිල්ල බලාපොරොත්තු වූ විට ඔහු උන්වහන්සේට නමස්කාරය ඔප්පු කළේය. සාවුල් දෙවියන්වහන්සේ සමග ඔහුගේ ඇති සම්බන්ධතාවයට වඩා මිනිසුන් අතර ඔහුට ඇති පිළිගැනීම ගැන සැලකිලිමත් විය. මේ හේතුවෙන්, සාමුවෙල් සාවුල්ට මෙසේ පැවසුවේය.

> **සාමුවෙල් ඔහුට කථාකොට: ස්වාමින්වහන්සේ අද ඉශ්‍රායෙල් රජකම නුඹෙන් පැහැරගෙන නුඹට වඩා යහපත්වූ නුඹේ අසල්වාසියෙකුට දී තිබේ.** (1 සාමුවෙල් 15:28)

ඉශ්‍රායෙල් හි රජකම සාවුල්ගෙන් ඉවතට ගෙන දාවිත්ට දෙනු ලැබිය.

නාතාන් අනාගතවක්තෘ දාවිත්ට තම පාපය පෙන්වා දුන් විට, දවිත් ක්ෂණිකවම එය තේරුම්ගත්තේය.

> **එවිට දාවිත්, මම ස්වාමින්වහන්සේට විරුද්ධව පව්කළෙමියි නාතාන්ට කීය. නාතාන්ද: ස්වාමින්වහන්සේ නුඹේ පාපය පහකළසේක, නුඹ නොනස්නෙහිය.** (2 සාමුවෙල් 12:13)

ඔහු අන් අයට වරද පැටවීමට උත්සාහ කළේ නැත. ඔහු බැත්ෂෙබාට වරද පැටවූයේ නැත. ඔහු තමාගේ අසාර්ථකවීම තේරුම්ගත් අතර දෙවියන්වහන්සේ ඉදිරියේ යටහත්ව පසුතැවිලි විය.

දාවිත්ගේ පසුතැවිලිවීමේ ශ්‍රේෂ්ඨ යාච්ඤාව ගීතාවලිය 51 හි දැක්වේ. ඔබේ බයිබලයෙන් මෙම සම්පූර්ණ ගීතිකාව කියවන්න. දාවිත් තම පාපය තේරුම්ගෙන සමාව ඉල්ලුවේය.

**මක්නිසාද මාගේ අපරාධ මම ඒත්තු ගනිමි. මාගේ පාපයද නිතරම මා ඉදිරියේ තිබේ.**

**ඔබට විරුද්ධව, ඔබට පමණක්ම විරුද්ධව පව්කළෙමි, ඔබගේ ඇස් හමුයෙහි නපුරුව තිබෙන දේ කළෙමි...**

**දෙවියන්වහන්ස, පවිත්‍ර සිතක් මා තුළ මැවුව මැනව: ස්ථිර ආත්මයක් මා තුළෙහි අලුතෙන් සෑදුව මැනව.**

**(ගීතාවලිය 51 න් උපුටාගත් කොටස)**

සාවුල් හා දාවිත් යන දෙදෙනාම වැරදි තෝරාගැනීම් සිදු කළහ. තම වරද පෙන්වා දුන් විට, දාවිත් පසුතැවිලි වී තම මාර්ගය වෙනස් කර ගත්තේය. සාවුල් එසේ කළේ නැත. ඔහු දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් තව තවත් ඈතට ගිය අතර ඔහුගේ ජීවිතය අසාර්ථකත්වය තුළ පරාජිතව, සියදිවි නසා ගැනීමෙන් අවසන් විය.

## උත්සාහකර අසාර්ථකවීද?

ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරුණු විට, දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙත නැවත පැමිණීමේ හැකියාව ඔබට ලබා දෙන බයිබලීය උපදෙස් තිබේ. මෙම උපදෙස් ඉදිරිපත් කිරීම උදෙසා අප යෝනාගේ උදාහරණය යොදා ගනිමු. මෙම පාඩමේ ඉදිරියට යාමට පෙර ඔබගේ බයිබලයෙන් යෝනාගේ පොත කියවන්න.

පාපිෂ්ට ජාතියක් වූ නිනිවයට ගොස් පසුතැවිලි වන ලෙස දේශනා කරන්න යැයි දෙවියන්වහන්සේ විසින් යෝනාට අණකර තිබුණි. දෙවියන්වහන්සේට කීකරුවනවා වෙනුවට, ඔහු ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කළේය. දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙතට නැවත පැමිණීමට යෝනා පහත පියවරයන් ගත්තේය. ඔබ අසාර්ථක වූ විට ගත යුතු පියවරයන් මේවාය.

### ඔබේ අසාර්ථකත්වය වටහාගන්න:

යෝනා දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් පිට සිටින බව ඔහුට ඇඟවීම උදෙසා මුහුදේ මහත් කුණාටුවක් අවශ්‍ය විය (යෝනා 1:2).

දැනගන්න: ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරුණු විට ඒ බව දැන්වීමේ මාර්ග උන්වහන්සේ සතුව තිබේ!

ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මගහැරී ඇති බව තේරුම් ගැනීමට ඔබ අපොහොසත් වන තාක් කල්, ඔබට කිසිදාක නැවත උන්වහන්සේගේ කැමැත්ත වෙතට පැමිණිය නොහැක.

ඔබව ඔබේ අසාර්ථකත්වය හඳුනාගැනීමෙන් වළකාලීමට කිසිඳු නිදහසට කරුණක් සඳහා ඉඩ නොදෙන්න. ඇතැම් සුලභ කරුණු කිහිපයක් පහත දැක්වේ.

"මිනිසුන්ට මා කෙරෙහි ඇති විශ්වාසය නැති වේවි."

"මම මාගේ අසාර්ථකත්වය තේරුම් ගැනීමෙන් සිදුවන්නේ මා වැරදි බව තේරුම් ගැනීමකි."
"මම දැනටමත් අසාර්ථක වී සිටිමි. මම දැන් මෙය අතහැර දැමිය යුතුය."
"දැන් ප්‍රමාද වැඩිය."
"මම වැරදි ආදර්ශයක්, ඒ නිසා මම නිහඬ විය යුතුය."
"කිසිදාක සියල්ල නිවැරදි කරගත නොහැකි වන පරිදි මම දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් බොහෝ ඈතට ගොස් සිටිමි."
"මට නැවත කිසිදාක දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයාගත හැකිදැයි මම නොදනිමි."

## ඔබේ පාපය ගැන පසුතැවිලිවන්න:

යෝනාගේ අනර්ඝ පසුතැවිලිවීමේ යාච්ඤාව යෝනා 2 වන පරිච්ඡේදයේ සඳහන් වේ. යෝනා දෙවියන්වහන්සේ ඉදිරියේ තම පාපය ඒත්තු ගෙන, පසුතැවිලිවී කමාව අයැද සිටියේය. ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මගහැරුණු විට, පසුතැවිල්ලෙන් දෙවියන්වහන්සේ ඉදිරියට පැමිණ ඔබට කමා කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඔබත් ඔබට සමාව දීමට මතක තබාගන්න! එය අන් අයගේ ජීවිත වලට බලපෑමක් කර නොමැතිනම් හා ඔබට ඔවුන්ගෙන් සමාව ලැබීමට අවශ්‍ය නොවේ නම්, ප්‍රසිද්ධියේ පසුතැවිලිවීමක් අවශ්‍ය නොවේ. අවශ්‍ය වන්නේ දෙවියන්වහන්සේ ඉදිරියේ සමාව ගැනීමයි.

## මගහැරීමට හේතුවූ ස්ථානය හඳුනාගන්න:

යාච්ඤාව, දේව වචනය තුළින් හා ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම තුළින් ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මගහැරුණු ස්ථානය තේරුම්ගන්න. යෝනාගේ ජීවිතයේදී දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් ඈත්වීම ආරම්භ වූයේ නිනිවයට ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කිරීමෙන් බව ඔහු තේරුම් ගත්තේය.

## වරද නිවැරදි කිරීමට නැවත හැරෙන්න.

මගහැරීම සිදුවූ ස්ථානයට නැවත හැරී ඇවිත් වරද නිවැරදි කළ හැකි නම් එසේ සිදු කරන්න. තමාගේ අසාර්ථක වීම ආරම්භ වූයේ නිනිවයට ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කිරීමෙන් බව යෝනා තේරුම් ගත්විට ඔහු තම මාර්ගය වෙනස් කළේය. ඔහු නිනිවයට ගියේය. ඔහු තම වරද නිවැරදි කරගත්තේය (යෝනා 3:3).

ඇතැම් අවස්ථාවලදී පසුතැවිලි වීම හැර වරද නිවැරදි කිරීමට ඔබට කළ හැකි කිසිවක් නැත. අප සාකච්ඡා කළ දාවිත් උදාහරණයේදී ඔහු බැත්ෂෙබා සමග අනාචාරයේ හැසිරුණු පසු ඔහුට තම පාපය පිළිබඳව කළ හැකි කිසිවක් නොවීය. වැරදීම ඒ වනවිටත් සිදුවී හමාරය. පසුතැවිලි වීම හැර එය නිවැරදි කිරීමට ඔහුට කළ හැකිවූ කිසිවක් නොවීය. ඔබට නිවැරදි පියවරක් ගත හැකි අවස්ථාවලදී එය කෙසේ හෝ කළ යුතුය.

## එළිදරව්ව.... නව මඟපෙන්වීමක් උදෙසා දෙවියන්වහන්සේ සොයා ඒ අනුව ක්‍රියා කරන්න:

ඔබ ඔබේ වැරදීම තේරුම්ගෙන කමාව අයැද සිට, වැරදීම සිදුවූ ස්ථානය හඳුනාගෙන නිවැරදි කළ හැකි වැරදි නිවැරදි කිරීමෙන් අනතුරුව නව මඟපෙන්වීමක් උදෙසා දෙවියන්වහන්සේ සොයන්න. දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට ඇති ඕනෑම බාධාවක් ඉවත් කරන්න. මේ තුළ කැරලිකාරකම, ස්වකැමැත්ත හා වැරදි ආකල්ප පිළිබඳ පාපයන් ඇතුළත් විය හැකිය. යාච්ඤා කිරීමෙන් හා දේව වචනය අධ්‍යයනය කිරීමෙන් දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට ඔබේ ආත්මික කණ නොනවත්වා පුහුණු කරන්න.

නව මඟපෙන්වීමක් උදෙසා යෝනා දෙවියන්වහන්සේ සෙවූ විට, දෙවියන්වහන්සේ දෙවන වර ඔහුට කතා කර, "නුඹ නැගිට නිනිවය නම් මහත් නුවරට ගොස්," (යෝනා 3:1-2) යි පැවසූ සේක. මෙවර, යෝනා

දෙවියන්වහන්සේගේ හඬට කීකරු වුණේය. ඔහු නිනිවයට ගොස් දෙවියන්වහන්සේගේ පණිවුඩය දේශනා කළේය. ඔහු ඉතිහාසයේ විශාලතම පිබිදීම අත්දුටුවේය. මුළු නගරයම පසුතැවිලි විය (යෝනා 3 වන පරිච්ඡේදය).

බයිබලය තුළ යෝනා වැනි මිනිසුන් රැසකගේ කතාන්දර ඇතුළත් වේ. මෙම මිනිසුන් අසාර්ථක වූ නමුත් තම අසාර්ථකත්වය තේරුම් ගෙන කමාව ඇයදූහ. ඔවුන් එසේ කළ විට, දෙවියන්වහන්සේ සැමවිටම ඔවුන්ට කමාව දී නව මඟපෙන්වීමක් ලබා දුන් සේක. උන්වහන්සේ ඔබටද එසේම කරනු ඇත! දෙවියන්වහන්සේ ඔබේ අතීතය දෙස බලන්නේ නැත. උන්වහන්සේ ඔබ දෙස බලන්නේ ඔබ දැන් සිටින ආකාරයෙන්ද නොවේ. උන්වහන්සේ බලන්නේ ඔබ උන්වහන්සේගේ හඬට කීකරුව ගමන් කළ හොත් ඔබට පත්විය හැකි මිනිසාගේ හෝ ස්ත්‍රියගේ තත්වය දෙසයි.

## සාරාංශය

ඔබට දේව කැමැත්ත මගහැරුණු විට ඔබ අනුගමනය කළ යුතු බයිබලීය උපදෙස් පහත වගුවේ සාරාංශගත කොට දක්වයි.

| <u>**ඔබට දේව කැමැත්ත මඟහැරුණු විට**</u> |
|---|
| ඔබගේ අසාර්ථකත්වය වටහාගන්න. |
| ඔබේ පාපය ගැන පසුතැවිලිවන්න. |
| මගහැරීමට හේතුවූ ස්ථානය හඳුනාගන්න. |
| වරද නිවැරදි කිරීමට නැවත හැරී එන්න. |
| එළිදරව්ව.. නව මඟපෙන්වීමක් උදෙසා දෙවියන්වහන්සේව සොයා ඒ අනුව ක්‍රියා කරන්න |

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. තම අසාර්ථකවීම් තුළින් ජයගෙන දෙවියන්වහන්සේගේ සම්පූර්ණ කැමැත්ත වෙතට නැවත පැමිණි ශ්‍රේෂ්ඨ මිනිසුන් තිදෙනෙකුට බයිබලිය උදාහරණ හඳුනාගන්න.

3. දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරුණු අසාර්ථකත්වය තුළ තම ජිවිතය අවසන් කරගත් මිනිසුන් තිදෙනෙකු පිළිබඳ බයිබලිය උදාහරණ හඳුනාගන්න.

4. ඔබ අසාර්ථක වූ විට නැවත දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙතට පැමිණීමට අවශ්‍ය උපදෙස් හයක් සඳහන් කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ලූක් 15:11-32 හි තම පියා අතහැර නාදුනන දේශයක ජිවත්විමට ගිය තරුණයෙකු පිළිබඳ යේසුස්වහන්සේ කතාන්දරයක් පැවසූ සේක. මෙම කතාව කියවා විශේෂයෙන් පුත්‍රයා නැවත තම පියාගේ නිවසට පැමිණීම දැක්වෙන කොටස ප්‍රවේසමෙන් අධ්‍යයනය කරන්න. ඔහු විසින් අප මෙම පරිච්ඡේදයේදී සාකච්ජා කළ අසාර්ථකවීම් තුළින් නැවත හැරී එන ආකාරය පිළිබඳ උපදෙස් අනුගමනය කළ බව ඔබ විසින් සොයාගනු ඇත.

2. ජීවිතයේ කිසියම් අවස්ථාවකදී දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරුණු මිනිසුන් පිළිබඳ පහත උදාහරණ අධ්‍යයනය කරන්න. තමාගේ අසාර්ථකවීම් නිවැරදි කරගත්තේ කවුද? ඔවුන් තම අසාර්ථකවීම් සාර්ථකත්වයට හරවා ගත්තේ කෙසේද? තම අසාර්ථකවීම් නිවැරදිකර නොගත්තේ කවුද? ඔවුන්ගේ ප්‍රතිඵලය කුමක්ද?

ආබ්‍රහම් : උත්පත්ති 20-21
මෝසෙස් : නික්මයාමෙ ක්‍රියා 7:20-44 දක්වාද බලන්න
බාලාම් : ගණන්කථාව 22
උස්සියා : 2 ලේකම් 26
සැම්සන් : විනිශ්චයකාරයා 13-16
දාවිත් : 2 සාමුවෙල් 11-12; ගීතාවලිය 51;
සාවුල් : 1 සාමුවෙල් 8-15
යෝනා : යෝනාගේ පොත
පේත්‍රුස් : මතෙව්, මාර්ක්, ලූක්, යොහන්, ක්‍රියා
යොහන් මාර්ක් : ක්‍රියා 12:12, 25; 15:39; 2 තිමෝති 4:11

දේව වචනය පිළිබඳ ඔබේ අධ්‍යයනයන් තුළින් ඔබට මෙම ලැයිස්තුවට තවත් උදාහරණ එකතු කළ හැකිය.

3. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත පිළිබඳව වැදගත් උපමා දෙකක් පැවසූ සේක. ලූක් 12:42-48 හා මතෙව් 21:28-32 අධ්‍යයනය කර ඔබ ඉගෙනගත් දේ සාරාංශගත කරන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

# එකළොස්වන පරිච්ඡේදය

## දෙවියන්වහන්සේගේ කැමැත්ත හා දුක්විඳීම

### අරමුණු:

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දුක් විඳීමට හේතුවන කරුණු පහක් හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ කැමැත්තේ ප්‍රතිඵලයක් ලෙස දුක්විඳීම සිදුවිය හැකි බව හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ කැමැත්ත සහිතව හා රහිතව දුක්විඳීම අතර වෙනස හඳුනාගැනීමට
- දේව කැමැත්ත තුළ දුක් විඳීමේ ධනාත්මක ප්‍රතිඵල දැක්වීමට හැකිවනු ඇත.

### ප්‍රධාන පදය:

> **එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින්නෝ යහපත කරමින් විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා.** (1 පේත්‍රුස් 4:19)

## හැඳින්වීම

ඔබට දෙවියන්වහන්සේගේ හඬ ඇසුණේය. ඔබ මඟපෙන්වීම සෙව්වේය. එය ඔබට දෙන ලද අතර දෙවියන්වහන්සේ පෙන්වා දුන් ලෙස පෙනුණු ජීවන මාවත දිගේ ඔබ ඉදිරියට ගමන් කළේය. නමුත් මෙම තීරණයේ ප්‍රතිඵලයක් ලෙස ඔබ ගමන් කරන "දේව කැමැත්ත" නමැති මාවතේ නොගියේ නම් උද්ගත නොවන ගැටලු ඔබ දැන් අත්දකිමින් සිටී.

ඔබට සැබවින්ම දෙවියන්වහන්සේගේ හඬ ඇසුණේද නැතිනම් ඔබට වැරදීමක් සිදු වුණිද? මෙම අසීරු අත්දැකීම් ඔබ දේව කැමැත්ත තුළ ජීවත් නොවන බවට දෙවියන්වහන්සේගෙන් ලැබෙන සංඥාද? දේව කැමැත්ත තුළ ධර්මිෂ්ඨව ජීවත් වන කෙනෙකුගේ ජීවිතයට දුක්විඳීම පැමිණීමට දෙවියන්වහන්සේ ඉඩහරිනවාද?

යේසුස්වහන්සේ මේලොව ජීවත් වෙත්දී කුරුසියේ තම දුක්විඳීම ගැන කතා කළ විට, උන්වහන්සේගේ අනුගාමිකයන් බොහෝදෙනා උන්වහන්සේ අතහැර ගියහ (යොහන් 6:55-66). ඔවුන් අපේක්ෂා කළේ මෙසියස්වහන්සේ බලයෙන් හා මහිමයෙන් යුතුව රජකම් කළ යුතු බවයි. ඒ වෙනුවට, උන්වහන්සේ කතා කළේ දුක්විඳීම පිළිබඳවයි. ඔවුන්ට තේරුම්ගත නොහැකි විය. එබැවින් ආපසු හැරී ගියෝය.

දුක්විඳීම හා දේවකැමැත්ත අතර සම්බන්ධතාවක් ඇති බව ඔබ හඳුනා නොගතහොත් අසීරු අවස්ථාවන්ට මුහුණ දෙන විට ඔබත් යේසුස්වහන්සේ අනුගමනය කිරීමෙන් හැරී යනු ඇත. දෙවියන්වහන්සේ දුක්විඳීම නිර්මාණය කළේ නැත. එය පළමුවෙන්ම ලෝකයට පැමිණියේ මිනිසාගේ පාපය තුළිනි (උත්පත්ති 3). නමුත් නපුර උදෙසා වූ දෙය දෙවියන්වහන්සේ ගෙන උන්වහන්සේගේ අරමුණු ඉටුකරගැනීම සඳහා එය යහපතට පාවිච්චි කිරීමට උන්වහන්සේට හැකිය.

# දුක්විඳීම සඳහා හේතු

බයිබලය දුක්විඳීම, ගැටලු හා විපත් සම්බන්ධව බොහෝ දේවල් පවසනු ඇත. එහි ඉගැන්වීම් සාරාංශගත කළ විට, ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම් පැමිණිය හැකි ආකාර පහක් අපට සොයාගත හැකිය.

## ඔබ අවට සිටින අය නිසා:

ඔබ අවට සිටින අය තුළින් දුක්විඳීම පැමිණිය හැකිය. මේ ආකාරයේ දුක්විඳීම් සඳහා යෝසෙප් උදාහරණයකි. ඔහුගේ වරදක් නොමැතිව වුවද යෝසෙප් තම සහෝදරයන් විසින් ඊජිප්තුවට විකුණන ලද අතර, පෝතිපර්ගේ බිරිඳ විසින් අසත්‍ය ලෙස සිරකරන ලදුව සිරගෙය තුළදී ඔහු විසින් උපකාර කළ පුද්ගලයන් විසින් මතක නැති කරනු ලැබීය.

නමුත් ඔහුගේ ප්‍රතිචාරයට සවන් දෙන්න. යෝසෙප් මෙසේ පැවසුවේය.

> **නුඹලා මේ රටට මා වික්ක නිසා ශෝක නොවෙල්ලා, නුඹලාටම කෝප නොවෙල්ලා, මක්නිසාදදෙවියන්වහන්සේ ජීවිත ආරක්ෂාකරන පිණිස නුඹලාට පෙරටුවෙන් මා එවූසේක. දෙවියන්වහන්සේ නුඹලා පොළොවෙහි ඉතිරිකරන පිණිසද, මහත්වූ ගැළවීමකින් නුඹලාගේ ජීවිත ආරක්ෂාකරන පිණිසද, නුඹලාට පෙරටුව මා එවූසේක. (උත්පත්ති 45:5,7)**

## ජීවිතයේ බාහිර අවස්ථාවන්

දුක්විඳීම පැමිණෙන දෙවන ආකාරය ජීවිතයේ බාහිර අවස්ථාවන් තුළිනි. බයිබලයේ රූත්ගේ පොතෙහි සඳහන් වන, තම ස්වාමිපුරුෂයාගේ හා පුතුන්ගේ මරණය අත්දුටු නයෝමිගේ උදාහරණය තුළින් මෙය ප්‍රකාශ වේ.

යේසුස්වහන්සේ නැවත පැමිණ, මරණයේ අවසන් සතුරාගෙන් ජයගන්නා තුරු, මරණය ජීවිතයේ කොටසකි. මරණය මිනිසාගේ මුල් පාපය නිසා පැමිණි දෙයක් වන අතර එය අප සියලුම දෙනාම මුහුණ දෙන ස්වභාවික අවස්ථාවකි. “එක් වරක් මරණයත්.... මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක්මෙන්ම” (හෙබ්‍රෙව් 9:27) වේ.

## ඔබේ සේවය:

දුක්විඳීම සඳහා හේතුවන තුන්වන කරුණ දෙවියන්වහන්සේ උදෙසා ඔබේ සේවයයි. උන්වහන්සේගේ නාමය උදෙසා (ක්‍රියා 9:16), ක්‍රිස්තුස්වහන්සේ උදෙසා (පිලිප්පි 1:29), දේවරාජ්‍ය උදෙසා (2 තෙසලෝනික 1:5), ශුභාරංචිය උදෙසා (2 තිමෝති 1:11-12), යහපත කිරීම උදෙසා (1 පේත්‍රුස් 2:19-20: 3:17), ධර්මිෂ්ඨකම උදෙසා (1 පේත්‍රුස් 3:14), කිතුනුවෙකු ලෙස (1 පේත්‍රුස් 4:15-16) හා දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව (1 පේත්‍රුස් 4:19) දුක්විඳීම පිළිබඳව නව ගිවිසුම කතා කරයි.

අපොස්තුළුවර පාවුල් සේවයේ ප්‍රතිඵලයක් ලෙස දුක්විඳීමට උදාහරණයකි. ඇතැම් මිනිසුන් දුක් විඳීම අසාර්ථකත්වයේ හා ඇදහිල්ල මද බවේ ලකුණක් ලෙස දකිනු ලැබේ. මෙය සත්‍යයක් නම්, අපේස්තුළුවර පාවුල්ට කිසි ඇදහිල්ලක් නොතිබුණු අතර ඔහු සහා ඉතිහාසයේ අතිශයෙන්ම අසාර්ථක වූ පුද්ගලයාය.

ආසියාවේදී ජීවිතය ගැන පවා බලාපොරොත්තුවක් නැති තරමට බලවත් ලෙස පීඩා විඳි බව පාවුල් පැවසුවේය (2 කොරින්ති 1:8). ඔහු සමාදානය හා සමෘද්ධිය පමණක් ඇදහිලිවන්තයන්ට පොරොන්දු වන උද්යෝගිමත් එවැන්ජලිස්තවරයෙකුට වඩා වෙනස් ස්වරූපයක් විදහා දැක්විය. සේවය උදෙසා දෙවියන්වහන්සේ ප්‍රථමවර පාවුල් කැඳවූ අවස්ථාවේදී, දෙවියන්වහන්සේ උදෙසා ඔහුට විඳීමට තිබූ “මහත් දේවල්” පිළිබඳව ඔහුට පවසන ලදී. (ක්‍රියා 9:16)

දුක්විඳීම පිළිබඳව පාවුල්ගේ ප්‍රතිචාරය “ක්‍රිස්තුස්වහන්සේ උදෙසා යමක් දිනා ගැනීමට සියලු දේ නැතිවීම” ඉවසා සිටීම විය. "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව, උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට වරප්‍රසාදය දෙනලද්දේය” (පිලිප්පි 1:29) යි ඔහු ඇදහිලිවන්තයන්ට ලියා යැවීය.

පාවුල් සේවය උදෙසා තනිව දුක්වින්දේ නැත. නව ගිවිසුම් සමයේදී මුළු සභාවම දුක් වින්දේය (ක්‍රියා 8). ඔවුන් ඉවසා සිටි ඇතැම් කෲර පීඩාවන් පිළිබඳ පුවත් හෙබ්‍රෙව් 11 හි සඳහන් වේ. මෙම ඇදහිල්ලේ මිනිසුන්ගෙන් හා ස්ත්‍රීන්ගෙන් බොහෝ දෙනා දෙවියන්වහන්සේගේ බලයෙන් ගළවාගනු ලැබීය. සිරදොරවල් හරිනු ලැබූ අතර ඔවුහු පිටතට පැමිණියහ. ඔවුන්ව ගිනි උදුනෙහි දමා මරා දැමීමට තීරණය කරන ලද නමුත් ගිනි දැල් වලින් ඔවුන්ට හානි නොවීය.

නමුත්, ඇදහිල්ලේ පුරුෂයන් හා ස්ත්‍රීන් ලෙස හැඳින්වූ ඇතැම් ඇදහිලිවන්තයන් මිදීම අත්දුටුවේ නැත. ශුභාරංචිය පිළිබඳ ඔවුන්ගේ සාක්ෂිය හේතුවෙන් ඔවුන් සිරගතකර, පීඩාකර, වධ හිංසා පමුණුවනු ලැබ, මරණයට පවා පත්කරනු ලැබීය (හෙබ්‍රෙව් 11:36-40). අප අවධානය යොමු කරනුයේ ඇදහිල්ලෙන් ජීවත්වීම කෙරෙහිය. නමුත් ඇදහිල්ලෙන් මරණයට පත්වීම තුළින්ද දෙවියන්වහන්සේ තම බලය එළිදරව් කරන සේක. මෙම ඇදහිල්ල යහපත් කාල වලදී පමණක් නොව, අයහපත් කාල වලදීද සැබවින් නැඟී සිටින ඇදහිල්ලකි.

## සාතන්ගේ සෘජු ක්‍රියාකාරකම්:

සාතන්ගේ සෘජු ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙසද ඔබේ ජීවිතයට දුක්විඳීම් පැමිණිය හැකිය. යෝබ්ගේ කතාව තුළින් මෙය ප්‍රකාශ වේ. මෙය “ධර්මිෂ්ඨයා දුක් විඳින්නේ ඇයි?” යන ප්‍රශ්නය සමග පොරබදන පොතකි.

යෝබ් පිළිබඳ දෙවියන්වහන්සේගේ සාක්ෂිය ඔහු ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකි යන්නයි (යෝබ් 1-2). යෝබ්ගේ මිතුරන් ප්‍රකාශ කළ පරිදි ඔහු තම පාපය නිසා දුක්වින්දා නොවේ. යෝබ් පසුතැවිලිවුවහොත් ඔහුගේ තත්වය වෙනස් වනු ඇතැයි මිතුරන් විශ්වාස කළහ. මෙම මිතුරන් විශ්වීය අදාළකරගැනීමක් පෞද්ගලික අත්දැකීමක් මත පදනම් කිරීමට උත්සාහ කළහ. එය හරියට දෙවියන්වහන්සේ ජේත්‍රුස්ව සිරගෙයින් නිදහස් කළ බැවින් ඔබටද එසේම කරනු ඇතැයි පැවසීම හා සමානය. මෙය සත්‍ය නොවේ. බොහෝ දෙනෙක් ශ්‍රේෂ්ඨ ඇදහිල්ලක් හා පාප රහිත ජීවිතයක් ඇතිව වුවද සිරගෙයි දිවි පුදා ඇත.

අප අන් අය දුක්විඳිනු දුටු විට එය ඔවුන්ගේ පාපය, ඇදහිල්ල මද බව හෝ අවිශ්වාසය නිසා වූ බවට දොස්තැබීම සිදු නොකිරීමට ප්‍රවේසම් විය යුතුය. මාංශයේ කුනුවීම උදෙසා වැපිරූ බැවින්, පාපිෂ්ට මිනිසා තිත්ත අස්වැන්නක් නෙළා ගන්නා බව බයිබලයේ දැක්වේ (ගලාති 6:8). නමුත් නිර්දෝෂ මනුෂ්‍යයෙකුගේ දුක්විඳීම විස්තර කිරීමට වැපිරීම හා නෙළාගැනීම යොදාගත නොහැකිය.

යෝබ් දුක්වින්දේ ඔහු විසින් කල කිසිදු දෙයක් නිසා නොවීය. ඔහු ධර්මිෂ්ඨ මිනිසෙකු විය. යෝබ් පිළිබඳ දෙවියන්වහන්සේගේ සාක්ෂියද, තමා පිළිබඳව යෝබ්ගේ සාක්ෂියද මිනිසුන් ඉදිරියෙහි ඔහුගේ පිළිගැනීමද මෙය විය. යෝබ්ගේ දුක්විඳීමට සැබෑ හේතුව වූයේ ආත්මික ලෝකයට පිටුපසින් වූ රහසිගත දෙයකි. යෝබ්ගේ හදවතට, මනසට හා පක්ෂපාතීත්වයට ඉහළින් ක්‍රියාත්මක වූ ආත්මික සටනක් විය.

ඔබට ඉහළින් ආත්මික ලෝකයේ සිදුවන සටනක් තිබේ. ස්වභාවික ලෝකය තුළ ඔබ අත්දකින අසිරු අවස්ථාවන් තුළින් මෙම සටන ප්‍රකාශ වේ. යෝබ්ගේ දුක්විඳීම තුළින් ප්‍රකාශ වන වැදගත් සත්‍යයක් නම්, දෙවියන්වහන්සේ නොදැන ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට කිසිවක් ඇතුළු විය නොහැකි බවය. ඔබේ දුක්විඳීම ඇතිවීමට හේතුව දෙවියන්වහන්සේ නොවේ. එය පමුණුවන්නේ සාතන් විසින් වේ. නමුත් එහි සීමාවන් තීරණය කරනුයේ දෙවියන්වහන්සේය.

**ඔබේම පාපය:**

ඔබගේ ජීවිතයට දුක්විඳීම ඇතුළු වන පස්වන ආකාරය ඔබේම පාපය නිසාය. යෝනා මේ ආකාරයේ දුක්විඳීමකට උදාහරණයකි. දෙවියන්වහන්සේට අකීකරුවෙමින්, දෙවියන්වහන්සේ යෝනාට නිනිවයට ගොස් පසුතැවිලිවන ලෙස දේශනා කරන්ට පැවසූ විට ඔහු නිනිවයට ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කළේය. ඔහුගේම පාපය නිසා ඔහු මුහුදේදී මහත් කුණාටුවකට මුහුණ දුන් අතර අවසානයේදී විශාල මාළුවෙකුගේ බඩේ සිටීමට සිදු විය (යෝනා 1-2).

ප්‍රශ්න හැමවිටම දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබගේ මාර්ග සලකා බලා ඔබගේ හදවත විමසීම උදෙසා වන කැඳවීමක් ලෙස සැලකිය යුතුය. යෝනා මෙන්ම, ඔබද දුක්විඳින්නේ ඔබේම පාපය නිසා විය හැකිය. දේව වචනයට අකීකරුව ජීවත්වන අයට දෙවියන්වහන්සේ දඬුවම් කරන බව බයිබලය එළිදරව් කරයි. දඬුවමකින් අදහස්වන්නේ හික්මවීමක්, තරවටුකිරීමක් හා නිවැරදි කිරීමකි.

> **කිසි දඬුවමක් ලබන කල ඒක ශෝකයට මිස ප්‍රීතියට කාරණාවක් මෙන් පෙනෙන්නේ නැත. නුමුත් පසුව එයින් පෙළුණු තැනැත්තන්ට ධර්මිෂ්ඨකමේ සමාදාන ඵල හටගන්නේය. (හෙබ්‍රෙව් 12:11)**

ඔබව නිවැරදි කර නැවත ඔබේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙත ඔබ ගෙන ඒම උදෙසා දෙවියන්වහන්සේ දුක්විඳීම යොදාගන්නා සේක.

> **මට විපත්ති පැමිණෙන්ට පළමුවෙන් මුළාව ගියෙමි; නමුත් දැන් ඔබගේ වචනය පවත්වමි.**
> **ඔබගේ පනත් ඉගෙනගන්නා පිණිස මට විපත්ති පැමිණුණ යහපති.**
> **ස්වාමිනි ඔබගේ විනිශ්චයන් ධර්මිෂ්ඨ බවත්, විශ්වාසකමින් ඔබ මට පීඩාකළ බවත් දනිමි. (ගීතාවලිය 119:67,71,75)**

## දුක්විඳීම පිළිබඳ නිසි ආකල්පය

නමුත් දුක්විඳීම යනු අනිවාර්යයෙන්ම දේව කැමැත්තෙන් පිටත සිටින බවට ලකුණක් නොවේ. "ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය" (ගීතාවලිය 34:19) යි බයිබලය ප්‍රකාශ කරයි. ඔබ නිර්දෝෂව හා ඔබේ පාපයක් රහිතව දුක්විඳින විට, දුක්විඳීම පිළිබඳව ඔබ නිසි ආකල්පයන් පවත්වාගත යුතුය. ඔබේ ආත්මිකත්වය පිළිබඳ නියම පරීක්ෂාව ඔබ පීඩාකාරී දවසට ප්‍රතිචාර දක්වන ආකාරයයි.

> **නුඹ විපත්ති දවසේදී කලකිරෙන්නෙහි නම් නුඹේ ශක්තිය අල්පය. (හිතෝපදේශ 24:10)**

ඇදහිලිවන්තයෙකු ලෙස දේවකැමැත්ත තුළ සිට දුක්විඳින විට ඔබට පැවතිය යුතු ආකල්ප බයිබලය විස්තර කරයි. ඔබ ලජ්ජා විය යුතු නැත.

> **නුමුත් යමෙක් ක්‍රිස්තියානිකාරයෙකු මෙන් දුක්විඳී නම්, ඔහු ලජ්ජා නොවී, ඒ නාමය සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට ගෞරවකරාවා. (1 පේතෘස් 4:16)**

උන්වහන්සේ හැම දෙයක්ම කරනුයේ ඔබේ යහපතට බව දැන, ඔබ ඔබේ ආත්මය (ඔබේ දුක්විඳීම) දෙවියන්වහන්සේට කැප කළ යුතුය.

> **එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක් විඳින්නෝ යහපත කරමින්, විශ්වාස මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා. (1 පේතෘස් 4:19)**

දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ඔබ දුක්විඳින විට ඔබ සතුටු විය යුතුය.

**එහෙයින් ඔව්හු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමු වටින්නෝයයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව, සභාව ඉදිරියෙන් පිටත්ව ගොස්, (ක්‍රියා 5:41)**

ඔබ මෙසේ කළ යුතුයැයි පාවුල් පැවසුවේය.

**බලාපොරොත්තුවෙහි ප්‍රීතිවෙයල්ලා, දුකේදී ඉවසිලිවන්තව සිටපල්ලා; යාච්ඤාවෙහි නොකඩව පැවතියල්ලා; (රෝම 12:12)**

**නින්දා ලබන කල අපි ආශිර්වාදකරමුව; පීඩා ලබන කල අපි ඉවසමුව; (1 කොරින්ති 4:12)**

**බොහෝ ඉවසීමෙන්ද පීඩාවලින්ද හිඟකම්වලින්ද, විපත්තිවලින්ද පහරකෑම්වලින්ද සිරඅඩස්සිවීම්වලින්ද කෝලාහලවලින්ද වෙහෙසවලින්ද නිදිමැරීම්වලින්ද නිරාහාරව සිටීම්වලින්ද (2 කොරින්ති 6:4,5)**

**එබැවින් අපගේ ස්වාමින්වහන්සේගේ සාක්ෂිය ගැනවත් උන්වහන්සේටෙග් හිරකාරයෙක් වන මා ගැනවත් ලජ්ජා නොවී, දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රකාරයට ශුභාරංචිය නිසා මා සමග දුක් විඳපන්න. (2 තිමෝති 1:8)**

**මක්නිසාද අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය. (1 තෙසලෝනික 3:3)**

**නුමුත් නුඹ සියලු කාරණාවලදී සිහි ඇතුව සිටපන්න, දුක් ඉවසාපන්න, ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න, නුඹේ සේවය සම්පූර්ණකරපන්න. (2 තිමෝති 4:5)**

ඔබ දුක්විඳීම් අත්දකින විට එය අමුතු දෙයක් යැයි නොසිතිය යුතුය.

**ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක්මෙන් පුදුම නොවෙල්ලා. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක්විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා. (1 පේත්‍රුස් 4:12-13)**

ඔබ සොල්දාදුවෙකු සේ දැඩි දේවල් දරා සිටිය යුතුය.

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න. (2 තිමෝති 2:3)**

2 කොරින්ති 4:9 හි දුක්විඳීම් පිළිබඳ නිසි ආකල්පය පාවුල් සාරාංශගත කර දක්වයි.

**එහෙයින් අපි ක්ලාන්ත නොවමුව; අපේ පිටත මනුෂ්‍යයා ක්ෂයවෙන නුමුත්, අපේ ඇතුල් මනුෂ්‍යයා දවසින් දවස අලුත්කරනු ලබන්නේය. මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:16-18)**

පාවුල් දුක්විඳීම දුටුවේ සේවකයෙකු ලෙසය. අප ගැටලුව දෙස බලනවා වෙනුවට එමගින් ඇති කරන සදාකාලික ප්‍රතිඵල දෙස නෙත් යොමුකළ විය එය අපට වැඩදායි බව ඔහු පැවසුවේය.

# දුක්විඳීමේ ධනාත්මක ප්‍රතිඵල

දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳීමේ යහපත් ප්‍රතිඵල කිහිපයක් පහත දැක්වේ.

## ඔබේ ඇදහිල්ල පරීක්ෂා කරනු ලැබේ:

ආත්මික ලෝකයේ සිදුවන සෑම දෙයක්ම ඇදහිල්ල මත පදනම් වේ. ඔබගේ ඇදහිල්ලේ ශක්තිය පරීක්ෂා කරනු ලැබිය යුතුවන්නේ මේ නිසාය.

> **එසේ ශෝකයට පත්වන්නේ නාස්තිවී යන්නාවූ, එසේද වුවත් ගින්නෙන් සෝදිසිකරන්නාවූ රනට වඩා අගේව තිබෙන නුඹලාගේ ඇදහිල්ල පරීක්ෂාකිරීමෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්වීමේදී ප්‍රශංසාවත් මහිමයත් ගෞරවයත් පැමිණෙන පිණිසය. (1 පේත්‍රුස් 1:7)**

යේසුස්වහන්සේ සිදු කළ ලෙසම මෙම තිත්ත කුසලානය පහකරන ලෙස ඔබ දෙවියන්වහන්සේට යාච්ඤා කළද එය එසේ නොවන විට එය ඇදහිල්ල පරීක්ෂා කිරීමකි. ඒ වෙනුවට ඔබට එහි දුක්විඳීම් ගැඹුරින් විඳීමට සිදු වේ. අපට අවශ්‍ය පරිදි අපගේ යාච්ඤාවන්ට පිළිතුරු නොලැබුණත් යාච්ඤාවන්ට පිළිතුරු ලැබී ඇති බව ඇදහිල්ල ඉගෙන ගනු ඇත.

## ඔබට අන් අය සැනසීමට හැකිවනු ඇත:

> **දයාබර කරුණාවල පියවූද සෑම සැනසිල්ලේ දෙවිවූද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසාවේවා, අපි දෙවියන්වහන්සේගෙන් යම් සැනසිල්ලක් ලැබුවෙමුද, ඒ සැනසිල්ල කරණකොටගෙන කොයි පීඩාවක් නුමුත් විඳින්නන් සනසන්ට අපට පුළුවන්වන පිණිස උන්වහන්සේ අපේ සියලු පීඩාවලදී අප සනසනසේක.**
> **(2 කොරින්ති 1:3-4)**

ඔබ දෙවියන්වහන්සේගේ සැනසීම අන් අය සමග බෙදාගන්නා විට ඔබ පහත වචනය අනුව ක්‍රියා කරනු ඇත.

> **එබැවින් හෙළා තිබෙන අත්ද බෙලහීන දණහිස්ද සවිකරගනිල්ලා, කොර කකුල් අහක්කරනු නොලැබ, සුවවෙන පිණිස, නුඹලාගේ පාදවලට සමතලා පාරවල් සාදාගනිල්ලා.**
> **(හෙබ්‍රෙව් 12:12-13)**

## ඔබ ගැන විශ්වාසය නොතැබීමට ඔබ ඉගෙන ගනී:

ආසියාවේදී පාවුල් විඳි දුක්විඳීම් ගැන කතාකරමින් මෙසේ පැවසුවේය.

> **එබැවින් සහෝදරයෙනි, ආසියාවේදී අපට පැමිණි පීඩාව ගැන නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමුව. එනම් ජීවිතය ගැන පවා අපට බලාපොරොත්තුවක් නැති තරමට, උසුලන්ට බැරි පමණ, අප පිටට බර පැමුණුණු බවය. එසේය, මළවුන් නැගුටුවන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි මිස අප කෙරෙහිම විශ්වාස නොකරන පිණිස මරණ-මුගිංචිය අප තුළේම තිබුණේය.**
> **(2 කොරින්ති 1:8-9)**

ඔබ මෙය තේරුම් ගනු ඇත...

> **නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිතිවන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල දරමුව. (2 කොරින්ති 4:7)**

## ධනාත්මක ගතිගුණ වර්ධනය වනු ඇත:

**එපමණකුත් නොව, පීඩා විඳීමෙන් ඉවසිල්ලද, ඉවසිල්ලෙන් සහතිකකමද සහතිකකමෙන් බලාපොරොත්තුවීමද උපදින බව දැන, අප විඳින පීඩාවලදීත් ප්‍රීතිමත්වෙමු. (රෝම 5:3-4)**

**එවිට ක්‍රිස්තුස්වහන්සේ තුළ තමන්ගේ සදාකාල තේජසට නුඹලා කැඳවාගත් සියලු කරුණාවේ දෙවියන්වහන්සේම, නුඹලා ස්වල්ප කලක් දුක්වින්ද පසු, නුඹලා සම්පූර්ණකර ස්ථිරකර, ශක්තිමත්කර පිහිටුවනසේක. (1 පේත්‍රුස් 5:10)**

මෙම ගතිගුණ ඔබ උදෙසා ඇති දේව සැලැස්ම පරිදි ඔබ යේසුස්වහන්සේගේ ස්වරූපයට සමාන කරනු ඇත (රෝම 8:28-29; හෙබ්‍රෙව් 2:10,18)

## දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් ප්‍රකාශ කරනු ලැබේ:

ගෝලයන් උපතින්ම අන්ධව සිටි මිනිසෙකු දුටුවිට, ඔහුගේ මෙම තත්වයට වගකිව යුත්තේ කවුදැයි විමසුවෝය. එය ඔහුගේ දෙමාපියන්ගේ පාපය නිසාද නොඑසේනම් ඔහුගේ පාපය නිසාද? යයි ඇසිය. යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක.

**යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මව්පියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:3)**

## දෙවියන්වහන්සේගේ බලය සම්පූර්ණ කරනු ලැබේ:

**උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. (2 කොරින්ති 12:9)**

## අස්ථිර දේවල් ඉවත් කරනු ලැබේ:

දුක්විඳීමේ ප්‍රතිඵලයක් ලෙස ඔබේ ජිවිතයේ සියලුම අස්ථිර දේවල් සොලවා දමනු ලැබේ. මිනිසුන් වැඩසටහන් හෝ භෞතික දේවල් යන සියලුම දේ ඔබට අවශ්‍ය මොහොතේදී අසමත් වන බැවින් ඔබ ඒවා මත රඳා පවතිම අතහැර දමනු ඇත.

දෙවියන්වහන්සේ මෙයට අවසර දෙන සේක....

**උන්වහන්සේගේ ශබ්දයෙන් ඒ කාලයේදී පොළොව සෙලවුණාය. නුමුත් දැන් උන්වහන්සේ: මම පොළොව පමණක් නොව ස්වර්ගයත් තව වරක් කම්පාකරවන්නෙමියි කියා පොරොන්දුවී තිබේ. තව වරක්ය කී වචනයෙන් පෙන්වන්නේ නොසෙල්වෙන්නාවූ දේවල් පවතින පිණිස සෙලවෙන ඒවා සෑදූ දේවල් මෙන් පහකරන බවය. (හෙබ්‍රෙව් 12:26-27)**

දෙවියන්වහන්සේ හා උන්වහන්සේගේ වචනය මත ගොඩනංවා නැති සෑමදෙයක්ම ජිවිතයේ කුණාටු ඇතිවන විට විනාශ වන්නේය. (ගිතාවලිය 119:89, මතෙව් 7:24-27)

## ඔබේ අවධානය වෙනස් වනු ඇත:

ඔබ දුක්විඳීම් අත්දකින විට සාමාන්‍යයෙන් අවධානය යොමු කරන්නේ ඊට හේතු හා එමගින් ඇතිවන බලපෑම වෙතය. අසීරු අවස්ථාව ඇති කළේ කුමන කරුණුද යන්න හා ඉන් ඔබගේ ජිවිතයට ඇතිවන

බරපතල බලපෑම් මොනවාද යන්න පිළිබඳව ඔබ සලකා බලයි. ඔබගේ අවධානය තාවකාලික දේවලින් සදාකාලික දේවල් වෙතට යොමු කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.

> **මොහොතකට පවතින අපේ සැහැල්ලුවූ දුක, පෙනෙන දේ නොව නොපෙනෙන දේ බලා සිටින්නාවූ අපට, ඉතාමත්ම වැඩි වශයෙන් සදාකාල තේජස් භාරයක් සාදාදෙන්නේය. මක්නිසාද පෙනෙන දේ කාලිකය. නොපෙනෙන දේ සදාකාලිකය. (2 කොරින්ති 4:17-18)**

> **ප්‍රේමවන්තයෙනි, නුඹලා සෝදිසි කිරීම පිණිස පැමිණෙන නුඹලා අතරේ තිබෙන ගිනිමය පීඩාව ගැන අපූර්ව කාරණාවක් නුඹලාට සිද්ධවෙන්නාක්මෙන් පුදුම නොවෙල්ලා. නුමුත් ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ එළිදරව්වීමේදීත් නුඹලා ඉතා මහත් ප්‍රීතියකින් ප්‍රීතිවන පිණිස උන්වහන්සේගේ දුක්විඳීමෙහි නුඹලා පංගුකාරයන් වන ප්‍රමාණයට ප්‍රීතිවෙයල්ලා.**
> **(1 පේත්‍රුස් 4:12-13)**

> **අපි ඉවසමු නම් උන්වහන්සේ සමග රජකම්කරන්නෙමුව. අපි උන්වහන්සේ නාඳුනමුය කියමු නම්, උන්වහන්සේත්: නුඹලා නාඳුනම්යි කියනසේක. (2 තිමෝති 2:12)**

## පැරණි පුද්ගල ස්වභාවය වෙනස් කරනු ලැබේ:

දෙවියන්වහන්සේ මෝවබ් ජාතියට මෙසේ පැවසූ සේක:

> **මෝවබ් භාජනයෙන් භාජනයට වත්කරනු නොලැබ, වාල්කමට නොගොස්, තමාගේ බාල වයසේ පටන් සුවසේ හිඳ, තමාගේ මන්ඩි පිටින් නිශ්චලවී සිටියේය. එබැවින් ඔහුගේ රස ඔහු තුළ තවම තිබේ, ඔහුගේ සුවඳ වෙනස් නොවී තිබේ. (යෙරමියා 48:11)**

හොඳ මිදියුස ලබා ගැනීමට අවශ්‍ය කරදර සහිත වැගිරීමක් හා කැලතීමක් මෝවබ් අත්දැක නොතිබූ බැවින්, ජාතිය වෙනස් වූයේ නැත. මෝබව් පහසු ලෙස හා සමෘද්ධිමත්ව සිටිය බැවින් ජාතිය ආත්මික පරිණතභාවය තුළ වර්ධනය වූයේ නැත. එම හේතුවෙන් ජාතියේ කිසිදු වෙනසක් සිදු නොවීය. ඔවුන්ගේ සුවඳ ඔවුන් තුළම පැවතුනි.

දුක්විඳීම් ඔබව ඔබේ පැරණි පුද්ගල ස්වභාවයෙන් නිදහස් කරයි. ඔබව කළඹා, කරදර විඳ, වගුරුවනු ලැබූ කළ ඔබේ ආත්මික සුවඳ ලෞකිකත්වයෙන් ආත්මිකත්වයට වෙනස් වේ.

## දෙවියන්වහන්සේ ඔබ සේවය උදෙසා සූදානම් කරයි:

ඔබට දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලැබීමට අවශ්‍යද?. වඩා යේසුස්වහන්සේ මෙන් වීමට හා උන්වහන්සේගේ භාවිතයට තෝරාගත් භාජනයක් වීමට ඔබ කැමතිද?. දෙවියන්වහන්සේ ඔබේ යාච්ඤාවට පිළිතුරු දෙන්නේ දුක්විඳීම තුළිනි.

> **බලව, මම නුඹ පවිත්‍රකළෙමි, නුමුත් රිදී මෙන් නොවේය. පීඩා නමැති උදුණේදී නුඹ තෝරාගතිමි. (යෙසායා 48:10)**

දෙවියන්වහන්සේගේ දරුවකු වීමේ සිට දෙවියන්වහන්සේ විසින් තෝරාගත් කෙනෙකුගේ තත්වය දක්වා ඔබේ කැඳවීම අබිබවා යා හැක්කේ දුක්විඳීම් තුළිනි. ස්වභාවික ලෝකය තුළදී යකඩ ගිනි උදුනේදී පවිත්‍රවන්නාක් මෙන් දෙවියන්වන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳීම ඔබව පවිත්‍ර කරයි.

## ක්‍රිස්තුස්වහන්සේ සමග රජකම් කිරීමට ඔබව සූදානම් කෙරේ:

> **අපි ඉවසමු නම් උන්වහන්සේ සමග රජකම්කරන්නෙමුව... (2 තිමෝති 2:12)**

## දුක්විඳීම ආත්මික ආශිර්වාදයන් ගෙන එයි:

යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාදලද්දෝය: මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය. මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාදලද්දෝය. ප්‍රීතිවෙයල්ලා, ඉතා සන්තෝෂවෙයල්ලා; මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය. නුඹලාට පළමුවෙන් සිටි අනාගතවක්තෘවරුන්ටත් ඔව්හු එලෙසෙම පීඩා කළෝය. (මතෙව් 5:10-12)**

## දුක්විඳීම තුළින් ඔබ කීකරුකම ඉගෙන ගනී:

> **උන්වහන්සේගේ පුත්‍රයෙක්ව සිටි නුමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙනගත්සේක. (හෙබ්‍රෙව් 5:8)**

## දුක්විඳීම තුළින් ඔබ තුළ ඇති දේව වචනය පරීක්ෂා කරයි:

> **පොළොවේ උදුනක සත් වරක් පවිත්‍රකළ රිදී මෙන් ස්වාමින්ගේ වචන පිරිසිදුය. (ගීතාවලිය 12:6)**

## දුක්විඳීම ඔබව යටහත් කරයි:

> **ගිනි සර්පයන් සහ ගෝනුස්සන් ඇත්තාවූ, වතුර නැති, නියංසායෙන් යුක්තවූ ඒ මහත් භයංකර කාන්තාරය මැදින් නුඹ ගෙනාවාවූ, ගිනිගල් පර්වතයෙන් නුඹට වතුර නික්මවා දී, නුඹේ පියවරුන් නොදත්තාවූ, මන්නාවලින් කාන්තාරයේදී නුඹ පෝෂණයකළාවූ නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ මතක නැතිකොට (ද්විතිය කථාව 8:15-16)**

## දුක්විඳීම ඔබව විශාල කරයි:

මෙහි අදහස ඔබ ආත්මිකව වර්ධනය වන බවයි:

> **මාගේ ධර්මිෂ්ඨකමේ දෙවියන්වහන්ස, මා හඬගසන කල මට උත්තර දුන මැනව. (ගීතාවලිය 4:1)**

## ඔබ ඉතා සමීප ලෙස දෙවියන්වහන්සේව දැන ගැනීමට පැමිණේ:

දුක්විඳීම තුළින් වඩා සමීප පදනමකින් ඔබ දෙවියන්වහන්සේව දැන ගැනීමට පැමිණෙයි. බොහෝ සෙයින් දුක් විඳි යෝබ් මෙම සත්‍ය ඉගෙන ගෙන මෙසේ පැවසුවේය...

> **මා ඔබ ගැන කනින් අසා තිබුණේය. නුමුත් දැන් මාගේ ඇසින් ඔබ දකිමි. එබැවින් මම මටම පිළිකුල්කොට, දූවිල්ලෙත් අලුවලත් හිඳ පශ්චාත්තාපවෙමියි කීවේය. (යෝබ් 42:5-6)**

අප අතරින් ඇතැම් අය දෙවියන්වහන්සේ දන්නේ ඉතා දුරස්ථ වශයෙනි. ඔබ ජිවිතයේ ආශිර්වාදයන් අත්දකින විට, දෙවියන්වහන්සේ අත්‍යවශ්‍ය පුද්ගලයෙක් නොව සුඛෝපභෝගී පුද්ගලයෙක් බවට පත් වේ. නමුත් අපට සැබෑ අවශ්‍යතාවයක් ඇතිවිට, දෙවියන්වහන්සේ අත්‍යවශ්‍ය වේ. යෝබ් දුක් විඳීම තුළින් ඉතා සමීප ලෙස දෙවියන්වහන්සේව දැනගත්තේය. ඔහු දුක් විඳීමට පෙර, යෝබ් දෙවියන්වහන්සේ දැනගෙන සිටියේ දේවධර්මය තුළිනි. නමුත් පසුව අත්දැකීමෙන් උන්වහන්සේ දැනගත්තේය.

පාවුල් ද ඒ ආකාරයේම ආශාවක් ගැන කතා කළේය.

**යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැමිණෙන ලෙස, උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත-නැගිටීමේ බලයත් උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය. (පිලිප්පි 3:10,11)**

ඔබට දෙවියන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය තුළ උන්වහන්සේ දැන ගත හැක්කේ දුක්විඳීම සමග පවත්වන ගැඹුරු සම්බන්ධතාවයක් තුලින් පමණි.

යෝබ් තම පරීක්ෂාව තුළදී තම දුක් විඳීමට හේතුව ගැන දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න කළේය. දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න කිරීමේ වරදක් නැත. යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණීමේ අරමුණ මනුෂ්‍ය වර්ගයාගේ පාප උදෙසා දිවි පිදීම බව උන්වහන්සේ දැන සිටි සේක. නමුත් උන්වහන්සේ දුක් විඳින මොහොතේදී “මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?” යනුවෙන් මොරගැසූ සේක. වැදගත් වන්නේ ප්‍රශ්නයෙන් අනතුරුව සිදුවන දෙයයි. යේසුස්වහන්සේගේ ඊළඟ වචන වූයේ, “ඔබගේ අතට මාගේ ආත්මය භාරදෙමි” යන්නයි.

ප්‍රශ්න වලින් අනතුරුව යෝබ්ගේ ප්‍රතිචාරය වූයේ.....

**උන්වහන්සේ මා මරනවා ඇත; මට බලාපොරොත්තුවක් නැත්තේය. එහෙත් උන්වහන්සේ ඉදිරිපිට මාගේ මාර්ග හරි බවට ඔප්පු දෙන්නෙමි. (යෝබ් 13:15)**

**එහෙයින් මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි. මේ මාගේ හම නැතුව ගියායින් පසු, මාගේ මාංසය නැතුව නුමුත් දෙවියන්වහන්සේ දකින්නෙමි. (යෝබ් 19:25-26)**

සියලු ප්‍රශ්නකිරීම් අවසන් වූ පසු, අවධාරනය “මගේ” සිට “ඔබවහන්සේ” දක්වා වෙනස් විය යුතුය. ඔබ ඔබගේ දුක්විඳීම, සියලුම පිළිතුරු නොලත් ප්‍රශ්න සමග දෙවියන්වහන්සේගේ හස්තයට භාරදිය යුතුය.

**නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසකරපන්න. (හිතෝපදේශ 3:5)**

දෙවියන්වහන්සේ ඔබේ දුක්විඳීමේ ඇතැම් අරමුණු ඔබට එළිදරව් කළ හැකිය. නමුත් ඔබට කිසිදාක එය සම්පූර්ණයෙන් තේරුම්ගත හැකි නොවනු ඇත.

**කාරණයක් සඟවාතැබීම දෙවියන්වහන්සේගේ ගෞරවයක්ය,.. (හිතෝපදේශ 25:2)**

**රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමින්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලේටම අයිතිය. (ද්විතියකථාව 29:29)**

දෙවියන්වහන්සේට පමණක් අයිති ඇතැම් රහස් දේවල් තිබේ. යෝබ් මෙන්ම ඔබද කිසිදාක ඔබේ දුක්විඳීමේ සම්පූර්ණ අදහස වටහා නොගනු ඇත.

**මනුෂ්‍යයෙකුගේ ගමන් ස්වාමින්වහන්සේගෙන් පැමිණේ; එසේ නම් මනුෂ්‍යයා තමාගේ මාර්ගය තේරුම්ගන්නේ කොහොමද? (හිතෝපදේශ 20:24)**

දෙවියන්වහන්සේ අවසානයේදී යෝබ් සමග කතා කරන විට, උන්වහන්සේ යෝබ්ට පැහැදිලි කළ නොහැකි ස්වභාවධර්මයේ ඇතැම් උදාහරණ කිහිපයක් යොදාගත් සේක. යෝබ්ට ස්වභාවික ලෝකය තුළ තමා දකින දේ තේරුම්ගත නොහැකි නම්, ආත්මික ලෝකය තුළ ඔහුට නොපෙනෙන දේවල් ඔහුට කිසිසේත්ම තේරුම්ගත නොහැකි බව දෙවියන්වහන්සේ අවධාරණය කළ සේක.

යෝබ් දෙවියන්වහන්සේට මුහුණ දුන්විට, දුක්විඳීම පිළිබඳ ඔහුගේ ප්‍රශ්න වලට පිළිතුරු නොලැබීම තව දුරටත් ගැටලුවක් වූයේ නැත. ඔහු තවදුරටත් මානුෂික හේතු දැක්වීම් වලින් පාලනය වූයේවත්, පීඩාවින්දේවත් නැත. ඔහු පිළිතුරුවලින් නොව ඇදහිල්ලෙන් ඔහුගේ ප්‍රශ්න හිලව් කරගත්තේය.

දුක්විඳීම තුළින් ඔබ ඉතා සමීප ලෙස දෙවියන්වහන්සේ දැනගැනීමට පැමිණීවිට, ඔබ ඔබේ නියම ස්වරූපයෙන්ම ඔබව දකිනු ඇත. ඔබ තවදුරටත් දුරස්ථ ලෙස දෙවියන්වහන්සේ දැන සිටින්නේ නැත. වාදකිරීම් වලට හෝ සාකච්ඡාවන්ට කළ නොහැකි දේ දෙවියන්වහන්සේ සමග මුහුණට මුහුණලා සිදුවන හමුවීමට කළ හැකිය.

යෝබ් දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගත්විට, ඔහුට නව පිළිතුරක් තිබුණේ නැත. ඔහුගේ දුක්විඳීම පිළිබඳව ඔහුට නව කරුණු ලැබී තිබුණේ නැත. නමුත් ඇදහිල්ලෙන් ඔහු තම ප්‍රශ්න හිලව් කරගත්තේය. යෝබ් දෙවියන්වහන්සේගේ සෘජු අභිමුඛයේ සිටි අතර එම අත්දැකීම් තුළ ප්‍රශ්න වලට හෝ සැකයන්ට ඉඩක් නොවීය.

## ජීවිතයේ කුණාටු

දුක්විඳීම් ඇතැම්විට ස්වභාවික කුණාටුවකට සමාන කෙරේ. ඔබ දුක්විඳින කල, ආත්මිකව බැලූවිට ඔබ කුණාටුවකට මුහුණ දෙයි. මෙම කුණාටුව ආත්මිකව, මානසිකව, ශාරීරිකව, භෞතිකව හෝ හැඟීම්වලින් ඔබට බලපෑම් කළ හැකිය.

යේසුස්වහන්සේගේ ගෝලයන් අත්දුටු කුණාටුවක් පිළිබඳව බයිබලයේ සඳහන් වේ. ඔබ බයිබලයේ මාර්ක් 4:35-41 දක්වා ඇති මෙම පුවත කියවන්න. මෙම කුණාටුව සාතන්ගේ ප්‍රහාරයක් විය. යේසුස්වහන්සේ ගෝලයන්ට අනෙක් ඉවුරට යන ලෙස පැවසූ සේක. යේසුස්වහන්සේ ඔවුන් සමග බෝට්ටුවේ සිටි සේක. ගෙදරීනයන්ගේ රටේ සිදුවීමට තිබූ ආශ්චර්යමත් ක්‍රියා ගැන සාතන් දැනසිටි බැවින් ඔවුන් අනෙක් ඉවුරට යාම වැළැක්වීමට සාතන් උත්සාහ කළේය (මාර්ක් 5). යේසුස්වහන්සේ කුණාටුවට ඉහළින් ආධිපත්‍ය දැක්වූ සේක. උන්වහන්සේ සතුරාගේ බලවේගවලට තරවටු කළ සේක. මුහුද නැවත නිශ්චල වූ අතර ඔවුන් බාධාවකින් තොරව තම ගමන ඉදිරියට ගෙන ගියෝය.

සාතන්ගේ කුණාටුවක් යනු, ඔබේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ කිරීමට ඔබට බාධා කිරීමට උත්සාහ කරන ඕනෑම දෙයකි. එය ඔබේ අකීකරුකමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන දුක්විඳීමක් නොවේ. මේ ආකාරයේ දුක්විඳීම් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස සිදුවන දෙයක්ද නොවේ. දෙවියන්වහන්සේට ඔබ උදෙසා ඇති සැලැස්මට කිසිම දෙයකින් බාධා කිරීම උන්වහන්සේට අවශ්‍ය නොවේ. ඔබ මේ ආකාරයේ කුණාටු වලට මුහුණ දෙන විට සතුරාට එරෙහිව ආධිපත්‍ය ක්‍රියාවට නංවන්න. යේසුස්වහන්සේ සාතන්ගේ සියලු බලයට ඉහළින් ආධිපත්‍ය ලබා දී තිබේ.

පාපයට දඬුවම් වශයෙන් දුක්විඳීම හා දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව දුක්විඳීම පිළිබඳව පෙන්නුම් කෙරෙන ස්වභාවික කුණාටු දෙකක් පිළිබඳ තවත් කතාවන් දෙකක් බයිබලයේ සඳහන් වේ. යෝනා 1 වන පරිච්ඡේදයේ ඇති යෝනාගේ කතාව හා ක්‍රියා 27 හි සඳහන් පාවුල් හා කුණාටුව පිළිබඳ කතාව කියවන්න. ඉන්පසු පහත වගුව අධ්‍යයනය කරන්න.

| යෝනා | පාවුල් |
|---|---|
| යෝනා විසින් තමා කුණාටුවට හෙළාගනු ලැබීය | පාවුල් එයට හෙළනු ලැබුවේ ඔහුගේ කිසිදු වැරැද්දකින් තොරවය. |
| ඔහු මුහුදු ගමනට ගාස්තුව ගෙව්වේය. | ඔහු ඔවුන් මුහුදු යෑම වැළැක්වීමට උත්සාහ කළේය. |

| | |
|---|---|
| කුණාටුවට හේතුව වුයේ ඔහුය. | ඔහු හේතුව නොව, පිළියම විය. |
| යෝනා කුණාටුව අතරතුර නිදා සිටියේය. | පාවුල් නිරාහාරව යාච්ඤා කළේය. |
| දෙවියන්වහන්සේගේ ආශිර්වාදය යෝනා සමග නොවීය. | දෙවියන්වහන්සේගේ ආශිර්වාදය පාවුල් සමග විය. |
| සමූහයා බිය වී සිටියහ | සමූහයා ජ්වලිතව සිටියහ. |
| ගැළවීම ලැබීමට: | ගැළවීම ලැබීමට: |
| යෝනාව නැවෙන් එළවා දැමිය යුතු විය. | සියලු දෙනාම නැව තුළ සිටිය යුතු විය. |

දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ජිවිතයේ කුණාටුවක් තුළ ගමන් කිරීම හා දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් තොරව කුණාටුවක් අත්දැකිම අතර වෙනසක් තිබේ. දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් තොරව ඔබ කුණාටුවක් තුළින් යන විට, එය ඔබ විසින් නිර්මාණය කරගත් අවස්ථාවකි. උදාහරණයක් ලෙස නොඇදහිලිවන්තයෙක් හා විවාහ වු ඇදහිලිවන්තයෙකුට ප්‍රශ්න අත්දැකින්නට ලැබෙනු ඇත. එයට හේතුව ඔවුන් බයිබලිය ප්‍රතිපත්තියක් කඩ කිරීමයි.

ඔබ කුණාටුවකට හේතුවක් වු විට, එය වන්නේ ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට පිටුපා උන්වහන්සේගේ ආඥාවන්ට අකිකරුවන නිසාය. බොහෝවිට ඔබ එම අවස්ථාවේ බැරැරුම්කම පිළිබඳව දන්නේ ද නැත. කුණාටුවේ රළු බව ඔබ වටා වැඩි වන තුරු ඔබ ආත්මිකව නිදා සිටී. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ මත නැති අතර ඔබ අවට සිටින අයගේ බිය වර්ධනය වේ. මෙම කුණාටුව සාතන්ගේ ප්‍රහාරයක් නොවේ. එය ඔබට ප්‍රේමකරන හා ඔබ නැවත උන්වහන්සේගේ කැමැත්තට යටත් කිරීමට ආශාවන දෙවියන්වහන්සේගේ දඬුවමකි. ඔබ "සතුරාට එරෙහි බලය" පිළිබඳ පොරොන්දු ප්‍රකාශ කළ හැකි නමුත් එමගින් තත්වය වෙනස් නොවේ.

දුක්විඳීමේ කුණාටුව, දෙවියන්වහන්සේගේ හඬට අකිකරුවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ දෙයක් ලෙස ඔබ හඳුනාගත් විට, ඇත්තේ එක් ප්‍රතිකර්මයක් පමණි. දෙවියන්වහන්සේගෙන් කමාව අයැද සිටින්න.

නමුත් ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින විට, තත්වය ඊට වඩා වෙනස් වේ. ඔබ දුක් විඳින්නේ ඔබේ කිසිදු වරදක් හෝ පාපයක් නිසා නොවේය. ඔබට ඔබ වටා ඇති ප්‍රශ්නයට හේතුවක් වෙනවා වෙනුවට ප්‍රතිකර්මයක් බවට පත් වේ. පාවුල් කළ පරිදි දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ සමග බැවින් ඔබට ආත්මික නායකත්වය දැරිය හැකිය. ඔබ කුණාටුවට හේතුවක් නොව ඊට පිළියමක් වන බැවින් ඔබට අන් අයට ධෛර්ය ගෙන දිය හැකිය. කරදරයෙන් පැනයාම සඳහා ඔබ නැවෙන් පිටතට පැන්න යුතු නැත. මේ ආකාරයේ දුක්විඳීමකදී එය දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස සිදුවන බැවින් ඔබ "නැව" තුළ රැඳී සිටිය යුතුය.

## දුක්විඳීම බලාපොරොත්තු විය යුතුය

ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින විට, ඔබ තනි වී නැති බව තේරුම්ගත යුතුය.

> **ලෝකයෙහි සිටින නුඹලාගේ සහෝදරයන් කෙරෙහි එම දුක්ම පැමිණෙන බව දැන, නුඹලාගේ ඇදහිල්ලෙහි ස්ථිරව සිට, යක්ෂයාට විරුද්ධව සිටපල්ලා. (1 පේතෘස් 5:9)**

මතෙව් 7:24-27 සඳහන් නිවාස දෙක පිළිබඳ උපමාවේ දැක්වෙන පරිදි ජිවිතයේ කුණාටු ඇතිවීම අනිවාර්ය වන අතර ඒවා පාලනය කළ නොහැකිය. දේව වචනය මත ජිවිත ගොඩනගා නොගත් අයට

මෙන්ම දේව වචනය මත ජීවිත ගොඩනගා ගත් අයටද කුණාටු ඇති වනු ඇත. කුණාටුවේ ප්‍රතිඵලය තිරණය කිරීමට හේතුවන්නේ මිනිසෙකුගේ අත්තිවාරමයි.

දුක්විඳීම දෙවියන්වහන්සේගේ කැමැත්තේ කොටසක් ලෙස භාරගත යුතු දෙයකි.

**එසේය, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වෙන්ට කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය. (2 තිමෝති 3:12)**

**මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව, උන්වහන්සේ උදෙසා දුක්විඳින්ටත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට වරප්‍රසාදය දෙනලද්දේය. (පිලිප්පි 1:29)**

**ඒ ඉවසීම වනාහි දෙවියන්වහන්සේගේ රාජ්‍ය උදෙසා දුක්විඳින නුඹලා ඒ රාජ්‍යයට සුදුස්සෝයයි ඒත්තුගනු ලැබීමට තිබෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ විනිශ්චයේ ඔප්පුවක්ය. (2 තෙසලෝනික 1:5)**

**මක්නිසාද අප දුක් විඳින්ට සිටින බව, නුඹලා සමග සිටියදී කලින් නුඹලාට කීවෙමුව: එලෙසම සිදුවුණු බව නුඹලා දන්නහුය. (1 තෙසලෝනික 3:4)**

**එකල ඔව්හු නුඹලා පීඩා විඳීමට පාවාදී මරන්නෝය. නුඹලා මාගේ නාමය නිසා සියලු ජාතීන් විසින් වෛරකරනු ලබන්නහුය. (මතෙව් 24:9)**

**නුමුත් ඒ සියල්ලට පළමුවෙන් මාගේ නාමය නිසා ඔව්හු නුඹලා පිට අත්හෙළා, සිනගෝගවලටත් හිරගෙවලටත් නුඹලා පාවාදෙමින්, නුඹලාට පීඩාකරන්නෝය, නුඹලා රජුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියට ගෙනයන්නෝය. (ලූක් 21:12)**

**දාසයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නොවේයයි නුඹලාට මා කී වචනය සිහිකරපල්ලා. ඔව්හු මට පීඩාකළෝනම් නුඹලාටත් පීඩාකරන්නෝය: මාගේ වචනය රක්ෂාකළෝ නම් නුඹලාගේ වචනයත් රක්ෂාකරන්නෝය. (යොහන් 15:20)**

මුල්කාලීන සභාව පිහිටුවීමේදී අනුගමනය කළ සැලැස්මේ කොටසක් වුයේ ඇදහිලිවන්තයන්ට දුක් විඳීමට සිදුවන බව ඔවුන්ට ඉගැන්වීමය. මෙය අද දවසේ බොහෝවිට සභාවන් තුළ මඟහැරී තිබේ.

**අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක්විඳීමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:22)**

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට දුන් කැඳවීම තම කමට මැරීම හා දුක්විඳීමේ කැඳවීමකි.

**තමාගේ කුරුසිය රැගෙන මා අනුව නේන තැනැත්තා මට සුදුසු නොවේ. (මතෙව් 10:38)**

**එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මතෙව් 16:24)**

**එවිට උන්වහන්සේ සමූහයා තමන් ගෝලයන් සමග ළඟට කැඳවා ඔවුන්ට කියනසේක්: කවරෙක් නුමුත් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේ කැමැත්ත අත්හැර, තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (මාර්ක් 8:34)**

**යේසුස්වහන්සේ ඔහු දෙස බලා, ඔහුට ප්‍රේමකොට, නුඹට එකක් අඩුය, ගොස් නුඹ සන්තක සියල්ල විකුණා දිළිඳුන්ට දීපන්න. ස්වර්ගයෙහි නුඹට වස්තු ඇතිවන්නේය. නුඹ මා අනුව වරෙන්නැයි ඔහුට කීසේක. (මාර්ක් 10:21)**

**උන්වහන්සේ සියල්ලන්ට කථාකොට: යමෙක් මා පස්සේ එන්ට කැමති නම්, ඔහු තමාගේම ආශා වලකාගෙන, දවස්පතා තමාගේ කුරුසිය රැගෙන, මා අනුව ඒවා. (ලූක් 9:23)**

**තමාගේ කුරුසිය උසුලාගෙන මා පස්සේ නේන තැනැත්තාට මාගේ ගෝලයා වෙන්ට බැරිය. (ලූක් 14:27)**

# ඔය වියළී ගිය විට

දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳීම අත්දුටු මිනිසෙකු පිළිබඳ උද්යෝගිමත් කතාවක් පරණ ගිවිසුමේ සඳහන් වේ. එය එලියාගේ කතාවයි. එලියා දෙවියන්වහන්සේගේ පණිවුඩය ඉශ්‍රායෙල් ජනයා වෙත ගෙන යාම නිසා සියලු ආකාරයේ වේදනා අත්දුටුවේය. නමුත් අපට අවධානය යොමුකිරීමට අවශ්‍ය නිශ්චිත කතා පුවත හමුවන්නේ 1 රාජාවලිය 17 ය. මෙම පාඩම ඉදිරියට කරගෙන යාමට පෙර ඔබේ බයිබලයෙන් මෙම කතාව කියවන්න.

දෙවියන්වහන්සේ මුලින්ම එලියාව කෙරිත් ඔය අසලට ගෙන ගිය විට, උන්වහන්සේ ආශ්චර්යමත් ලෙස ඔහුට සැපයූ සේක. මුළු ජාතියම නියඟය හා සාගතය අත්දකිමින් සිටි කාලයකදී ඔහුට කෑම දීමට කපුටුවන් පැමිණි අතර ඔයෙන් පිරිසිදු ජලය ලැබුණි. නමුත් ක්‍රමක්‍රමයෙන් ඔය වියළී ගියේය. වියළී යනු ඇතැයි දෙවියන්වහන්සේ දැන සිටි ඔයක් වෙතට එලියාව යැව්වේ ඇයි?

දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ ඇතැම්විට වියළුණු දිය පාරවල්ද ඇතුළත් වේ. නමුත් අප එවන් දුෂ්කරතාවන්ට මුහුණ දෙන විට එහි අදහස අපට දෙවියන්වහන්සේගේ කැමැත්ත මගහැරී ඇති බව නොවේ. එලියාට දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟහැරී තිබුණේ නැත. එලියාව කෙරිත් ඔය ළඟට ගෙන ගියේ දෙවියන්වහන්සේය. ඔහු එහි ජලය රසවින්දේය. ඔහුගේ අවශ්‍යතාවයන් සපයනු ලැබීය. ඔහුට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබුණි. නමුත් ඉදිරියට යාමට කාලය පැමිණි විට, දෙවියන්වහන්සේ ඔය වියළීමට සැලැස්වූ සේක. මෙය එලියාගේ අවධානය ලබාගත්තේය.

ඇතැම්විට දෙවියන්වහන්සේ ඔබවත් "කෙරිත් ඔය" වෙත ගෙනැවිත් තිබෙනවා විය හැකිය. ඔබට උන්වහන්සේගේ මඟපෙන්වීමේ හඬ ඇසුණු බව ඔබ දනී. ඔබේ ඔය අසළදී උන්වහන්සේ ඔබට ආශිර්වාද කළ සේක. ඔබේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරනු ලැබූ අතර ඔබ දෙවියන්වහන්සේගේ ආශිර්වාදය තුළ ප්‍රීති විය. නමුත් ඉන්පසු ඔය වියළී ගියේය. ඔබ තවදුරටත් දෙවියන්වහන්සේගේ බලය අත්දකින්නේ නැතුවා විය හැකිය. සමහර විට මිනිසුන් ඔබට විරුද්ධව සිටිනවා විය හැකිය. ඇතැම්විට ඔබට ඉහළින් ඇති නායකත්වය ඔය අවහිර කර එහි ගලා යාම නවත්වා තිබෙනවා විය හැකිය. කුමන හෝ හේතුවක් නිසා ඔබේ අලංකාර ඔය වියළී යන්නට ඇත.

ඔය වියළී ගිය විට ඔබට පහත සඳහන් දේවල් දෙකෙන් එකක් කළ හැකිය.

1. ඔබට ආත්මිකව කතාකරමින් හා ඔබේ ඉරණම ගැන චෝදනා කරමින් ඉවුරේ ඉඳගෙන සිටිය හැකිය. ඔබට එසේ සිදුවූයේ ඇයිද යන්න පිළිබඳව සිතමින් හා වියළුණු ගංගාව ගැන වැළපෙමින් ඔබේ ජිවිතයේ ඉතිරි කාලය ගෙවිය හැකිය. ඔබට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ගැන ප්‍රශ්න කළ හැකිය. මුලින්ම ඔබව මෙතැනට ගෙන ආවේ උන්වහන්සේද? ඔය වියළී යන බව උන්වහන්සේ දන්නවා නම් ඔබව මෙතැනට ගෙන ආවේ ඇයි? ඔබට දෙවියන්වහන්සේගේ කැමැත්ත මඟ හැරුණිද? නොඑසේ නම්...

2. දෙවියන්වහන්සේ ඔබව මෙම ඔය ළඟට ගෙන ආ ලෙසම දැන් උන්වහන්සේ තම කැමැත්තේ නව තත්වයක් වෙත ඔබ ගෙනයාමට සූදානම් බව ඔබට තේරුම් ගත හැකිය. උන්වහන්සේ වියළී ඔය තුළින් ඔබේ අවධානය දිනාගැනීමට උත්සාහ කරන සේක.

දියපාරවල් වියළී නොයන්නේ නම්... දෙවියන්වහන්සේ කිසිදාක අසීරු කාලයන්ට එන්නට ඉඩ නොදෙන්නේ නම්... උන්වහන්සේ කිසිදාක ඔබේ අවධානය ලබා නොගනු ඇත. එලියා මෙන්ම අපද අප සිටින තත්වයේම සිට කිසිදාක අලුත් දේවල් වෙතට නොයනු ඇත. අප කිසිදාක අපගේ ඔයේ ආරක්ෂිත ඉවුරු ඉක්මවා නොයනු ඇත. වියළෙන දියපාරවල් විශාල දේවල් වෙත ගෙන යනු ඇත. කෙරිත්හි අත්දැකීමට පෙර එලියා සේවය කර තිබුණේ තනි පුද්ගලයන්ට පමණි. මෙම ඇදහිල්ල ගොඩනඟන සම්මුඛවීමෙන් අනතුරුව එලියා සමූහයන්ට සේවය කළේය. ඔහු කර්මෙල් කන්දට නැඟ රූපවන්දනාවේ යෙදී සිටි ජාතියක් ඉදිරියේ දෙවියන්වහන්සේ සත්‍ය හා ජීවමාන දෙවිඳුන් බව ප්‍රකාශ කළේය.

ඔබ වියැළුණු දිය පහරවල් වලට මුහුණ දෙන විට, ඔබේ ඇදහිල්ල වැටීමට ඉඩ නොතැබිය යුතුය. ඔබ සිටිනුයේ දෙවියන්වහන්සේගෙන් නව එළිදරව්වක් ලැබීමට ඉවුරේ සිටගෙනය. වියළුණු ගංගා ගැන ප්‍රශ්න නොකරන්න. දෙවියන්වහන්සේගේ සැලැස්මේ මීළඟ තලයට ඇතුළු වන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

______________________________________________

______________________________________________

______________________________________________

2. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට දුක්විඳීම ඇතුලු විය හැකි ආකාරයන් පහ මොනවාද?

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳීමේ ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

4. දුක්විඳින විට ඇදහිලිවන්තයෙකුට පැවතිය යුතු ධනාත්මක ආකල්ප තුනක් සඳහන් කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

5. පහත සඳහන් ප්‍රකාශයන් කියවන්න. ප්‍රකාශය සත්‍ය නම්, ඒ ඉදිරියේ ඇති හිස්තැන මත **i** අකුර යොදන්න. ප්‍රකාශය අසත්‍ය නම්, ඒ ඉදිරියේ ඇති හිස්තැන මත **w** අකුර යොදන්න.

අ. ________________ ඔබ දුක්විඳීම කිසිදාක දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ.

ආ. ________________ ඔබ කරදර අත්දකින්නේ නම් එහි අදහස ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් පිට සිටින බවයි.

ඇ.________________ පාවුල් මුහුදේදී කුණාටුව අත්දකින විට ඔහු සිටියේ දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් පිටයි.

ඈ.________________ දෙවියන්වහන්සේගේ කැමැත්තෙන් තොරව ඔබ දුක් විදින විට, ඔබේ ගැටලුවට හේතුව ඔබේම අකීකරුකමයි.

ඉ.________________ දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකරන නිසා හා උන්වහන්සේ නැවත ඔබව උන්වහන්සේගේ කැමැත්ත වෙත ගෙන ඒමට කැමති බැවින් උන්වහන්සේ ඔබට දඬුවම් කරන සේක.

ඊ.________________ එලියා කෙරිත් ඔය අසලට ගියේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව නම්, එය කිසිදාක සිඳී නොයනු ඇත.

එ.________________ දෙවියන්වහන්සේට ඔබව නව මාවතකට ගෙනයාම අවශ්‍ය බැවින් ඇතැම්විට ඔබේ අවධානය ලබා ගැනීමට දෙවියන්වහන්සේ ප්‍රශ්න පාවිච්චි කරන සේක.

ඒ.________________ දුක්විඳින්නේ පව්කාරයන් පමණක් බව බයිබලය උගන්වයි.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දුක් විඳීම විෂය කොටගත් 1 පේත්‍රුස් පොත අධ්‍යයනය කරන්න. මෙම යැවුම් පත්‍රය තුළින් දුක්විඳීම පිළිබඳව ඔබ ඉගෙනගත් දේවල් වාර්තා කරන්න.

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

2. දුක්විඳීම පිළිබඳ පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.

**දැඩිබව:**

2 තිමෝති 2:3

**විපත්ති:**

ක්‍රියා 14:20; රෝම 5:3; 12:12; 1 තෙසලෝනික 3:4; 2 තෙසලෝනික 1:4

**පීඩාව:**

මතෙව් 5:10-12, 44; මාර්ක් 4:17; ලූක් 11:49; 21:12; යොහන් 15; 20; 1 කොරින්ති 4:12; 2 කොරින්ති 4:9; ක්‍රියා 8:1; 11:19; 13:50; 2 තිමෝති 3:12; රෝම 8:35; ගලාති 6:12.

**දුක්විඳීම:**

1 පේත්‍රුස් 5:10; පිලිප්පි 1:29; 3:8; 4:12; 2 කොරින්ති 1:6; 2 තිමෝති 2:12; 3:12; ගලාති 5:11; 6:12; ක්‍රියා 9:16; 1 තෙසලෝනික 3:4; 2 තෙසලෝනික 1:5

**හිරිහැර :**

ගීතාවලිය 34:19; 119:67, 71, 75; මතෙව් 24:9; ක්‍රියා 20:23; 2 කොරින්ති 2:4; 4:17; 6:4; 1 තෙසලෝනික 3:3; 2 තිමෝති 1:8; 3:11; 4:5; 2 කොරින්ති 1:6; යාකොබ් 5:10; හෙබ්‍රෙව් 10:32-33 හා 11 වන පරිච්ඡේදය.

# දොළොස්වන පරිච්ඡේදය

## එළිදරව්වීමේ අදියර හයක්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- දෙවියන්වහන්සේගේ සැලැස්මක් එළිදරව්වීමේ අදියර හයක් ලියා දැක්වීමට
- බයිබලිය උදාහරණ තුළ මෙම රටාව හඳුනාගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **නුඹලා දකුණට හැරෙන විටද නුඹලා වමට හැරෙන විටද: මාර්ගය මේය. මෙහි හැසිරියල්ලායයි නුඹට පස්සෙන් කියන හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත් යෙදෙනවා ඇත. (යෙසායා 30:21)**

## හැඳින්වීම

මෙම පාඩමාලාව තුළදී දෙවියන්වහන්සේගේ හඬ දැන ගැනීම ගැන ඔබ බොහෝ දේ ඉගෙනගත්තෙහිය. දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට පෙර පැවතිය යුතු අවශ්‍යතාවයන්ද ඔබ ඉගෙනගත්තේය. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත යන්නෙහි තේරුම හා එහි රටාව පිළිබඳවත් දෙවියන්වහන්සේ මිනිසා සමග කතා කරන ආකාරය පිළිබඳවත් ඉගෙන ගත්තේය.

මඟපෙන්වීමක් සෙවීමේ බයිබලයට අනුකූල නොවන මාර්ග පිළිබඳව හා සැක සහිත ක්‍රියාවන් පිළිබඳව තීරණයක් ගැනීමේදී අනුගමනය කළ යුතු උපදෙස් පිළිබඳව ඔබට අනතුරු අඟවා තිබුණි. ඔබ තීරණගැනීම පිළිබඳ බයිබලිය ආකෘතියක් අධ්‍යයනය කළ අතර අසාර්ථක වූ විට කළ යුත්තේ මොනවාදැයි ඉගෙනගත්තේය. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට සම්බන්ධ දුක්විඳීම පිළිබඳව අධ්‍යයනය කළේය.

මෙම අවසන් පරිච්ඡේදය දෙවියන්වහන්සේගේ සැලැස්මක් එළිදරව් වීමකදී ඔබ පසුකරන අදියරයන් හයක් ඉදිරිපත් කරයි. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත තුළ ගමන් කරන විට මෙම අදියරයන් අත්දකිනු ඇත.

## දැනගැන්මේ එළිදරව්ව

පැටලිලි සහගත හා වැරදි දෙසට ගමන් කරන ලෝකයක් තුළ දෙවියන්වහන්සේ තම අනුගාමිකයන්ට දැනගැන්මේ එළිදරව්වීම් පොරොන්දු වේ. මෙහි අදහස ජීවිතයේ අවස්ථාවන් වලදී උන්වහන්සේ දිව්‍යමය සැලසුම්, ප්‍රඥාව හා දැනගැන්ම එළිදරව් කරන බවයි.

> **නුඹලා දකුණට හැරෙන විටද වමට හැරෙන විටද: මාර්ගය මේය, මෙහි හැසිරියල්ලායයි නුඹට පස්සෙන් කියන හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත් යෙදෙනවා ඇත. (යෙසායා 30:21)**

දෙවියන්වහන්සේ සැලසුමක් එළිදරව් කරන විට, එම එළිදරව්ව වර්ධනය වීමේදී ඔබ පසු කර යා යුතු අදියරයන් හයක් තිබේ. මෙම අදියරයන් ලූක් 1:26-47 දක්වා ඇත. මෙම පාඩමේ ඉතිරි කොටස ඔබ

කරගෙන යාමට පෙර මෙම කොටස කියවන්න. මරියා මෙසියස්වහන්සේ හෙවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මව බවට පත්වන බවට දෙවියන්වහන්සේගෙන් ඇයට දුන් එළිදරව්ව මෙම බයිබල් කොටසේ සඳහන් වේ.

මෙම කතාන්දරය තුළ දෙවියන්වහන්සේගේ සැලැස්ම මරියාට එළිදරව් වන විට ඇය පසු කළ අදියරයන් හයක් සඳහන් වේ. දෙවියන්වහන්සේගේ ඕනෑම සැලැස්මක් මිනිසෙකුට එළිදරව් වීමේදී මෙම අදියරයන් දැක ගත හැකිය. ඔබේ ජීවිතය පිළිබඳ උන්වහන්සේගේ සැලැස්ම ගැන දැනගැන්මේ එළිදරව්ව ලැබෙන විට ඔබ පසු කර යන අදියරයන් මේවාය.

## පළමු අදියර: කැළඹීම

**ඔහු ඈ සිටි තැනට පැමිණ ... නමුත් ඈ ඔහුගේ කීමට බොහෝ සේ කැළඹී, මේ කෙබඳු වූ ආචාරයක් ද කියා කල්පනා කරමින් සිටියාය. (ලූක් 1:28-29)**

දේවදූතයා මුලින්ම මරියාට පෙණුනු විට, ඇය ඇගේ ආත්මයෙන් කරදරයට පත්ව, කැළඹී සිටියාය. දෙවියන්වහන්සේට නව මඟපෙන්වීමක් ලබාදීමට අවශ්‍ය ඕනෑම විටක, ඔබට සාමාන්‍යයෙන් කැළඹීමක් අත්දැකීමට ලැබේ. ඔබේ අවධානය ලබා ගැනීම සඳහා ජීවිතයේ අවස්ථාවන් තුළින් ඔබට ප්‍රශ්න ඇතිවීමට උන්වහන්සේ ඉඩහරී.

ඇතැම්විට ඔබ අවට ඇති ව්‍යාකූල තත්වයන් පිළිබඳව ප්‍රශ්න කරනවා විය හැකිය. ඔබට කරදර ඇති වී තිබෙන අතර ඔබේ ජීවිතය අවුල් කිරීමට මෙවැනි දේවල් ඔබ වටා සිදුවන්නේ ඇයිදැයි ඔබට වැටහී නැත. දෙවියන්වහන්සේ උත්සාහ කරනුයේ ඔබේ අවධානය ලබා ගැනීමටය. ඔබ පවතින තත්වයන් වලින් සතුටුවී තෘප්තිමත්ව සිටී නම්, ඔබ නව මඟපෙන්වීමක් උදෙසා උන්වහන්සේව සොයන්නේ නැත. එළිදරව්වීමේ මෙම පළමු අදියරේදී ඔබට කරදර වීමට උන්වහන්සේ ඉඩහරින්නේ මේ නිසාය.

## දෙවන අදියර: එළිදරව්ව

**දේවදූතයා ඈට කථාකොට: මරියා භය නොවන්න, මක්නිසාද නුඹට දෙවියන්වහන්සේගෙන් කරුණාව ලැබුණේය. බලව, නුඹ ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය. උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. (ලූක් 1:30-31)**

කැළඹීම තුළින් දෙවියන්වහන්සේ ඔබේ අවධානය ලබාගත්විට, උන්වහන්සේ තම සැලැස්ම ඔබට එළිදරව් කරනු ඇත. මෙය එළිදරව්වීමේ දෙවන අදියරයි.

**මට යාච්ඤාකරපන්න, එවිට මම නුඹට උත්තරදී, නුඹ නොදන්න මහත්වූ අමාරු දේ නුඹට පෙන්වන්නෙමි. (යෙරමියා 33:3)**

කරදරයට පත් ආත්මය මරියාගේ අවධානය දෙවියන්වහන්සේ වෙත යොමු කිරීමට හේතුවූ අතර ඉන්පසු උන්වහන්සේ තම සැලැස්ම එළිදරව් කළ සේක. ඇය මෙසියස්වහන්සේගේ හෙවත් ක්‍රිස්තුස්වහන්සේගේ මව වීමට නියමිතව තිබුණි.

## තෙවන අදියර: සැක සිතීම

**එවිට මරියා දේවදූතයාට කථාකොට: මා පුරුෂයෙකු නැඳින සිටින බැවින්, මේක වෙන්නේ කෙසේදැයි කීවාය. (ලූක් 1:34)**

මෙම මහත් එළිදරව්ව පිළිගැනීම ගැන මරියා සැක සිතුවාය. "මෙය සිදුවන්නේ කෙසේද?" යි ඇය ප්‍රශ්න කළාය.

දෙවියන්වහන්සේ ඔබේ ජීවිතයට නව මඟපෙන්වීමක් එළිදරව් කළ විට බොහෝ විට ඔබ සම්පූර්ණයෙන්ම යටපත් කර දමනු ලැබේ. ඔබ නුසුදුසු ලෙස හැඟී යා හැකිය. එය ඉදිරියට තැබීමට ඇති ඇදහිල්ලේ පියවර විශාල වැඩියයි ඔබට හැඟී යනු ඇත. සැලැස්ම ඉටු නොවීමට හේතුවිය හැකි තර්කානුකූල හේතු පිළිබඳව ඔබ සිතනු ඇත. ඔබ සැක සිතමින් දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න කරනු ඇත.

සැක සිතීමේ අවදිය තුළදී කාරණා දෙකක් සිදුවේ.

- ඔබ ඔබේ ප්‍රශ්න හේතු හා නිදහසට කරුණු ඉදිරිපත් කරයි.
- දෙවියන්වහන්සේ තම සැලැස්මේ කරුණු තුළින් මේවාට පිළිතුරු දෙයි.

ඇතැම් මිනිසුන් අන් අයට වඩා වැඩි කාලයක් සැක සිතමින් සිටී. ඇතැම් මිනිසුන් දෙවියන්වහන්සේ දුන් එළිදරව්ව භාර නොගැනීමට නිදහසට කරුණු හා හේතු ගැන සිතමින් සැක සිතීමේ අවදිය තුළ අවුරුදු ගණනාවක් ගත කරති. නමුත් ඔබ ක්‍රමානුකූලව සැක සිතීමෙන් ඉදිරියට නොගියහොත් ඔබ කිසිදාක දෙවියන්වහන්සේගේ එළිදරව්ව සම්පූර්ණ වනු නොදකිනු ඇත.

## හතරවන අදියර: යටහත්වීම

**මරියාද: බැලුව මැනව, ස්වාමින්වහන්සේගේ දාසිය: ඔබගේ වචනය ලෙස මට වේවයි කීවාය. එවිට දේවදූතයා ඈ කෙරෙන් ගියේය. (ලූක් 1:38)**

මරියා ඉක්මනින් සැකසිතීමේ අවස්ථාවේ සිට දෙවියන්වහන්සේගේ සැලැස්මට යටත්වීම දක්වා ගමන් කළාය. මෙහි අදහස ඇය තම කැමැත්ත දෙවියන්වහන්සේගේ සැලැස්මට යටත් කළ බවය. ඇය තමාගේ සැලසුම් හා ආශාවන් අත්හළ අතර ඇගේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ නව මඟපෙන්වීම පිළිගත්තාය.

## පස්වන අදියර : ස්ථිරවීම

**විශ්වාසකළ තැනැත්ති ආශිර්වාදලද්දීය, මක්නිසාද ස්වාමින්වහන්සේ කෙරෙන් ඈට කියන ලද දේ සම්පූර්ණවන්නේයයි කීවාය. (ලූක් 1:45)**

ස්ථිරවීමේ අදියර තුළ දෙවියන්වහන්සේ තම සැලැස්ම ස්ථිර කිරීම හෝ තහවුරු කිරීම සිදු කරයි. මරියා ගර්භණී වූ අතර එළිදරව්වීම ඇගේ ශරීරය තුළින්ම ස්ථිර කරනු ලැබීය. ඔබ දෙවියන්වහන්සේගේ සැලැස්මේ එළිදරව්වීමට ඔබේ කැමැත්ත යටත් කළහොත්, වැඩිකල් යාමට පෙර එම සැලැස්ම ස්ථිරවීමක් ඔබට ලැබෙනු ඇත.

## හයවන අදියර: එසැවීම

**එවිට මරියා කියන්නී, මාගේ සිත ස්වාමින්වහන්සේ වර්ණනා කෙරෙයි, (ලූක් 1:46)**

මරියා දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ප්‍රීති විය! ඇය දෙවියන්වහන්සේ එසැවීම ලූක් 1:46-55 හි කියවන්න. ඔබ ඔබේ ජීවිතය උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම පිළිගත් විට එය හැමවිටම ප්‍රීතිය ගෙන දෙන අතර එහි ප්‍රතිඵලය දෙවියන්වහන්සේ ඔසවනු ලැබීමයි.

මෙම පාඨමාලාව තුළ ඔබ ඉගෙනගත් පරිදි, දෙවියන්වහන්සේගේ සැලැස්ම අනුගමනය කිරීම යනු ගැටලුවලින් තොරවීම නොවේ. ස්වභාවික ලෝකය තුළ මරියාට සැබෑ ප්‍රශ්නයක් විය. ඇය විවාහවීමෙන් තොරව ගැබ්බරව සිටියාය. නමුත් දෙවියන්වහන්සේගේ සැලැස්ම ඒ තුළ ඇතුළත් වෙනත් ඕනෑම

තාවකාලික දුක් විඳීමකට වඩා විශාලය. අවසානයේදී එය හැමවිටම ප්‍රීතිය ගෙන දෙන අතර ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව උසස් කරයි.

## අවසන් වචනය: උන්වහන්සේගේ හඬට ඇහුම්කන් දෙන්න

මෙම පාඩමාලාව තුළදී දෙවියන්වහන්සේගේ හඬ දැන ගැනීමට ඔබට උපදෙස් ලැබී තිබේ. ඔබ උන්වහන්සේගේ හඬට සවන් දෙන විට, උන්වහන්සේගේ පොරොන්දුව මතක තබා ගන්න.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙරමියා 29:11)**

මරණය දක්වා දිගින් දිගටම දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වනු ඇත.

> **මක්නිසාද මේ දෙවියන්වහන්සේ සදාකල්හිම අපේ දෙවියන්වහන්සේය. උන්වහන්සේ මරණය දක්වා අපට මග පෙන්වනසේක. (ගීතාවලිය 48:14)**

උන්වහන්සේගේ මඟපෙන්වීම නව අහස හා පොළොව තුළදීත් පවතිනු ඇත.

> **මක්නිසාද සිංහාසනය මැද සිටින බැටළුපැටවාණෝ ඔවුන්ගේ එඬේරා වී, ජීවන-දිය-උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. දෙවියන්වහන්සේද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිසදමනසේකැයි කීවේය. (එළිදරව් 7:17)**

දෙවියන්වහන්සේ නිශ්ශබ්ද නැත. ඔබ සවන් දුන්න හොත් ලෝකයේ සියලුම කටහඬවල් වල ශබ්දය හා වියවුල් බව අබිබවා උන්වහන්සේගේ හඬ ඇසෙනු ඇත. දෙවියන්වහන්සේ කතාකරන අතර ඔබට උන්වහන්සේගේ හඬ දැනගත හැකිය.

> **ඉතින් සදාකාල ගිවිසුමේ ලේ කරණකොටගෙන බැටළුවන්ගේ මහත් එඬේරා වන අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේව මළවුන් කෙරෙන් නැවත ගෙනාවාවූ සමාදානයේ දෙවියන්වහන්සේ, තමන් ඉදිරියෙහි ප්‍රසන්නව තිබෙන දේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අප තුළ කරමින්, නුඹලා උන්වහන්සේගේ කැමැත්ත කරන පිණිස සියලු යහපත් ක්‍රියාවලට නුඹලා සම්පූර්ණකරනසේක්වා, උන්වහන්සේට සදාකාලේටම ගෞරවය වේවා. ආමෙන්. (හෙබ්‍රෙව් 13:20-21)**

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. දෙවියන්වහන්සේගේ සැලැස්මක් එළිදරව් වීමේ අදියරයන් හය ලියා දක්වන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

මෝසෙස්ගේ හා ගිඩියොන්ගේ ජිවිතය තුළ එළිදරව්වීමේ අදියරයන් හයේ රටාව අධ්‍යයනය කරන්න.

| මෝසෙස් | නික්මයාම 1-15 |
|---|---|
| කැළඹීම | ඊජිප්තුවේ අත්දුටුවේය (ඊජිප්තු වැසියෙකුව මරාදැමීය) |
| එළිදරව්වීම | ගිනි පඳුර |
| සැක සිතිම | කතාවට අදක්ෂවූ මනුෂ්‍යයෙකි |
| යටහත්වීම | යන්නට තිරණය කිරීම. |
| ස්ථිරවීම | පාරාවෝ ඉදිරියේ කළ හාස්කම් |
| එසැවීම | රතු මුහුද තරණය කළ පසුව වූ ප්‍රිතිය |

| ගිඩියොන් | විනිශ්වයකාරයා 6 |
|---|---|
| කැළඹීම | තිරිඟු මැඩීම, 13 වන පදයේ කැළඹීම පිටතට පැමිණේ |
| එළිදරව්කිරීම | 12 හා 14 වන පදවල දේවදූතයෙකු දර්ශනයවීම |
| සැකසිතිම | 15 පදය “දිළිඳු පවුල, මමද ඉතාම කුඩා තැනැත්තා” |
| යටහත්වීම | 17 වන පදය |
| ස්ථිරවීම | 17 වන පදයේ සිට 23 “මට ලකුණක් පෙන්නුව මැනව” |
| එසැවීම | 24 වන පදය පූජාසනයක් ගොඩනගා දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය. |

දේව වචනය තුළින් මෙම රටාව අඩංගු තවත් උදාහරණ ඔබට සොයාගත හැකිද?

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය:

1. මාගේ බැටළුවෝ මාගේ හඬ අසති. මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ එති. (යොහන් 10:27)

2. "රීමා" යන නිශ්චිත අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා දෙවියන්වහන්සේ විසින් සන්නිවේදනය කරන ලද ජීවනදායක වචනයයි. "රීමා" වචනයක් ඔබහට හදිස්සියේම දේශනාවක් තුළදී හෝ බයිබලය කියවීමෙහිදී කතාකළ හැකිය. එය ඔබහට ආත්මික දීමනා කරණකොටගෙන ලැබිය හැක. සමහර විට ඔබගේ අභ්‍යන්තරයෙහි ආත්මයට ස්වාමීන්වහන්සේම කතා කරනු ඇත.

3. "ලෝගොස්" යනු ශුද්ධ බයිබලයේ සඳහන් වන ලිඛිත දේව වචනයයි. එයට එකතු කිරීමට හෝ ඉන් ඉවත් කිරීමට කිසිවක් නැත.

4. ඔබ උන්වහන්සේගේ හඬ හඳුනාගන්නේ නම්, උන්වහන්සේ තම කැමැත්ත ඔබට පවසන විට ඔබ එය දැනගනු ඇත.

5. හෙබ්‍රෙව් 3:7 හෝ 15

6. ඔබේ ජීවිතය උදෙසා වූ දෙවියන්වහන්සේගේ පොදු සැලැස්ම, බුද්ධිමත් තෝරාගැනීම් සඳහා උපදෙස් හා ජීවිතයේ අවස්ථාවන් වලදී මඟපෙන්වීම.

7. එය සැම විටම "ලෝගොස්" හෙවත් ශුද්ධ බයිබලයේ වාර්තාවන ලිඛිත දේව වචනය ද සමග එකඟ වේ.

8. පාපය

9. කර්තෘ....... සවන් දෙන්නා.

## දෙවන පරිච්ඡේදය

1. එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස, සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)

2. පෙර අවශ්‍යතාවයක් නම් කිසියම් කාර්යයක් කිරීමට කලින්, කළ යුතු දෙයකි.

3. දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට පෙර අවශ්‍යතාවයන් තුළ පහත දේවල් අන්තර්ගත වේ. නැවත ඉපදීමේ අත්දැකීම, ශුද්ධාත්මයාණන් පැවතීම, ආත්මික පරිණතභාවය හා විපර්යාසය.

4. මඟපෙන්වීම. ඔබගේ ආත්මයේ අභ්‍යන්තරයට කතා කිරීම තුළින් ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත ඔබට එළිදරව් කරන සේක.

5. ඔබ පව්කාරයෙකු බව තේරුම්ගැනීම ඔබේ පාපය කියාදීම, පසුතැවිලිවීම හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම.

6. දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීමට ඔබට උන්වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවයක් පැවතිය යුතුය.

7. එහි අදහස ආත්මික ලෝකයට අදාළ දේවල් වලින් පරිණත බව ළඟා කර ගැනීම, ආත්මිකව වර්ධනය වීමයි.

8. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුව වෙනත් ස්වරූපයකට වෙනස් කරනු ලැබීම.

9. ප්‍රකාශය සත්‍යය. රෝම 12:1-2 බලන්න.

## තුන්වන පරිච්ඡේදය

1. මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව. (යොහන් 6:38)

2. ප්‍රේමය

3. තුන්වන පරිච්ඡේදයේ ඇති හේතු ලයිස්තුව නැවත බලන්න

4. බලය සහිත කෙනෙකුගේ තෝරාගැනීමක් හෝ තීරණයක්

5. සර්වබලධාරී කැමැත්ත (boulema), එක් එක්කෙනා උදෙසා එතුමාගේ සැලසුම්කරන ලද කැමැත්තය (thelema) හා “සදාචාරාත්මක” කැමැත්තය.

6. ස්වකැමැත්ත, සාතන්ගේ කැමැත්ත, දෙවියන්වහන්සේගේ කැමැත්ත

7. a. අසත්‍යː b සත්‍ය c අසත්‍යː d සත්‍ය e අසත්‍යː

## හතරවන පරිච්ඡේදය

1. ස්වාමින්වහන්ස, මනුෂ්‍යයාගේ මාර්ගය ඔහුට අයිති නැති බව දනිමි. ගමනෙහි යෙදෙන මනුෂ්‍යාට තමාගේ ගමන නියම කිරීම අයිති නැත. (යෙරමියා 10:23)

2. “ අනුකරණය ” යන වචනයේ අර්ථය අන් අයට සමාන වීම උදෙසා හෝ ඔවුන් පැරදවීම උදෙසා ඔවුන්ව තරඟය කිරීමයි. එය තරඟකාරීත්වයේ ආත්මයකින් හටගන්නා අතර ඊර්ෂ්‍යාවේ ස්වරූපයකි.

3. a. අසත්‍යː b. අසත්‍යː c. අසත්‍යː d. සත්‍යː e. අසත්‍යː f. අසත්‍යː g. සත්‍යː h. සත්‍යː i. සත්‍යː

## පස්වන පරිච්ඡේදය

1. එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව.
(එපීස 1:9-11)

2. පරිච්ඡේදය තුළ සාකච්ජා කරන ලද දෙවියන්වහන්සේගේ කැමැත්තේ කොටස් දෙක නම් දේව වචනය තුළින් එළිදරව් වන හා දේව වචනය තුළින් එළිදරව් නොවන යන්නය.

3. මෙම තීරණයට අදාළ වන ප්‍රතිපත්තිය 2 කොරින්ති 6:14-15 හි සඳහන් වේ. ඇදහිලිවන්තයන් නොඇදහිලිවන්තයන් සමග සම්බන්ධ නොවිය යුතුය.

4. ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීම උන්වහන්සේට අවශ්‍යය.
දෙවියන්වහන්සේගේ කැමැත්ත සැලසුම් කර තිබේ.
දෙවියන්වහන්සේගේ සැලැස්ම තනි පුද්ගලයන්ට අදාළවන මෙන්ම පෞද්ගලික වේ.
දෙවියන්වහන්සේගේ සැලැස්ම වර්ධනය වේ.
දෙවියන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍යයාගේ මාර්ග නොවේ
දෙවියන්වහන්සේගේ කැමැත්ත යහපත්ය

5. අසත්‍යය

6. A සටහන

7. සම්පූර්ණ කැමැත්ත, යහපත් කැමැත්ත, පිළිගත හැකි කැමැත්ත, දේව කැමැත්තෙන් පිට,

## හයවන පරිච්ඡේදය

1. මේ නිසා, නුඹලා අනුවණයෝ නොවී, ස්වාමින්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම්ගනිල්ලා. (එපීස 5:17)

2. පහත ඒවායින් ඕනෑම එකක් පාවිච්චි කළ හැකිය. මෝසෙස් හා පර්වතය, කන්ද මත එලියා , පිලිප් හා ඔහු සමාරියට ගිය ගමන, දාවිත් හා ඔහු යෝධයන් දෙදෙනෙකු මුණගැසීම.

3.

| | |
|---|---|
| දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය | භාස්කම් |
| යාච්ඤාව | සිහින |
| උපදේශකයන් | දර්ශන |
| අවස්ථාවන් | ශ්‍රවණය කළ හැකි හඬ |
| වැසුණු හා විවෘත වූ දොරවල් | ශුද්ධාත්මයාණන්ගේ අභ්‍යන්තර හඬ |
| දේවදූතයන් | ශුද්ධාත්මයාණන්ගේ දීමනා |

4. a. අසත්‍යඃ b. අසත්‍යඃ c. අසත්‍යඃ d. අසත්‍යඃ e. සත්‍යඃ f. සත්‍යඃ

## හත්වන පරිච්ඡේදය

1. නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමින්වහන්සේ කෙරෙහි විශ්වාසකරපන්න, නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න, එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලාකරනවා ඇත. (හිතෝපදේශ 3:5-6)

2. සමාදානය

3. හිතෝපදේශ 3:5-6 බලන්න

4. සිතුවිලිවලින්, වචනයෙන් හා ක්‍රියාවෙන් දෙවියන්වහන්සේ ප්‍රකාශ කිරීම, උන්වහන්සේට මුල්තැන දීම.

5. යාච්ඤා කරන්න
   දේව වචනය පරීක්ෂා කරන්න
   ශුද්ධාත්මයාණන්ගේ අභ්‍යන්තර හඬට සවන් දෙන්න
   කිතුනු උපදේශනය සොයා ගන්න
   අවස්ථාවන් විශ්ලේෂණය කරන්න
   මඟපෙන්වීම උදෙසා බයිබලිය කරුණු යොදාගන්න
   ප්‍රඥාවේ මාර්ගය තෝරාගන්න

6. a. අසත්‍යයි b. අසත්‍යයි c. අසත්‍යයි d. අසත්‍යයි e. සත්‍යයි f. සත්‍යයි

## අටවන පරිච්ඡේදය

1. එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා. (1 කොරින්ති 10:31)

2. සැකසහිත ක්‍රියාවක් යනු, හරිද වැරදිද යන්න දේව වචනයේ නිශ්චිතව සඳහන් කර නොමැති ක්‍රියාවන් හෝ හැසිරීම්ය.

3. එය දෙවියන්වහන්සේව මහිමයට පත් කරයිද?
   ඔබේ අභිප්‍රාය කුමක්ද?
   එය අවශ්‍යද?
   එය ආත්මික වර්ධනය ඇති කරයිද?
   එය වහල්භාවය ඇති කරන පුරුද්දක්ද?
   එය සම්මුතියකට ඇතුල් වීමක් ඇති කරයිද?
   එය පරීක්ෂාව වෙත ගෙන යයිද?
   එහි නපුරු බවක් පෙනේනට තිබේද?
   එය ඔබේ හෘදය සාක්ෂියට වද දෙයිද?
   එය අන් අයට බලපාන්නේ කෙසේද?

4. "දුර්වල සහෝදරයෙකු" යනු ඇදහිල්ලේ දැනගැන්මේ හෝ හෘදයසාක්ෂියේ පවතින දුර්වලතා හේතුවෙන් ශක්තිමත් සහෝදරයෙකුගේ ආදර්ශයෙන් බලපෑමක් ඇතිවන ඇදහිලිවන්තයෙකි. ඔහුට තම හෘද සාක්ෂියට විරුද්ධව පව් කිරීමට පොලඹවනු ලැබිය හැකි අතර ඔහුගේ ආත්මික වර්ධනයට බාධා සිදු විය හැකිය.

5. "ශක්තිමත්" ඇදහිලිවන්තයෙකු යනු ඇතැම් ක්ෂේත්‍රවල ඇති නිදහස පිළිබඳ ඔහුගේ තේරුම් ගැනීම නිසා හා තම ස්ථිර විශ්වාසයේ ශක්තිය නිසා යහපත් හෘද සාක්ෂියක් ඇතිව නිදහස ක්‍රියාවට නංවන්නෙකි. අන් අයගේ වෙනස් අදහස් වලින් ඔහුට බලපෑමක් ඇති නොවේ.

6. ආඥාවන් හා නිදහස සම්බන්ධ ප්‍රශ්න අතර වෙනස හඳුනා ගැනීම.
ඔබේම අවබෝධය දියුණු කරගන්න
අන් අයට තම අවබෝධය තීරණය කිරීමට නිදහස දෙන්න
ප්‍රේමයෙන් කිදහස සීමා කරන්න
සියලු අමනාපයන් විසඳන්න

7. තනිව ඔහු ළඟට යන්න. එය විසඳුනේ නැත්නම්......
සාක්ෂිකරුවන් එක්කෙනෙකු හෝ දෙදෙනෙකු සමග නැවත යන්න. එය විසඳුනේ නැත්නම්....
ගැටලුව සභාව ඉදිරියට ගෙන යන්න

## නව වන පරිච්ඡේදය

1. මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමුකරවයි: එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමින්වහන්සේය. (හිතෝපදේශ 16:9)

2. ආකෘතියෙන් ඔබට අනුගමනය කිරීමට උදාහරණයක් සපයයි.

3. තීරණ ගැනීම පිළිබඳ ආකෘතියක් යනු තේරීමක් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු උදාහරණයකි.

## දහවන පරිච්ඡේදය

1. අහෝ මාගේ සෙනඟ මට කන් දුන්නොත් ඉශ්‍රායෙල් මාගේ මාර්ගවල හැසුරුණොත්, යහපත! (ගීතාවලිය 81:13)

2. දහවන පරිච්ඡේදයේ ඇති මේවා නැවත අධ්‍යයනය කරන්න.

3. දහවන පරිච්ඡේදයේ ඇති මේවා නැවත අධ්‍යයනය කරන්න.

4. ඔබේ අසාර්ථකත්වය හඳුනාගන්න
පසුතැවිලිවන්න
මගහැරීමට සිදුවූ ස්ථානය හඳුනාගන්න
වරද නිවැරදි කිරීමට නැවත හැරෙන්න

## එකළොස්වන පරිච්ඡේදය

1. එබැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස දුක්විඳින්නෝ යහපත කරමින් විශ්වාස, මැවුම්කාරයාණන්ට තමුන්ගේ ආත්ම භාරදෙත්වා. (1 පේත්‍රුස් 4:19)

2. ඔබ අවට සිටින අය
ජීවිතයේ අවස්ථාවන්
ඔබේ සේවය
සාතන්ගේ සෘජු ක්‍රියාවන්

ඔබේම පාපය

3. එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ දුක් විඳීමේ ප්‍රතිඵල බලන්න.

4. එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ දුක්විඳීම පිළිබඳ ආකල්ප බලන්න.

5. a. අසත්‍යය b. අසත්‍යය c. අසත්‍යය d. සත්‍යය e. සත්‍යය f. අසත්‍යය g. සත්‍යය h. අසත්‍යය

## දොළොස්වන පරිච්ඡේදය

1. නුඹලා දකුණට හැරෙන විටද නුඹලා වමට හැරෙන විටද: මාර්ගය මේය, මෙහි හැසිරියල්ලායයි නුඹට පස්සෙන් කියන හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත් යෙදෙනවා ඇත. (යෙසායා 30:21)

2. කැළඹීම, එළිදරව්වීම, සැක සිතීම, යටහත්වීම, ස්ථිරවීම, එසැවීම